බුද්ධජයන්තීත්‍රිපිටකග්‍රන්ථමාලා: 38

සූත්‍රාන්තපිටකයෙහි

30 වන ග්‍රන්ථය

# පටිසම්භිදාමග්ගප්පකරණ

## ඛුද්දකනිකාය

ත්‍රයෝදශ භාගය

---


පාඨශෝධනය

**මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය
ලබුගම ලඞ්කානන්ද අනුනායක ස්ථවිරයන්වහන්සේ**

සිංහලානුවාදය

**යථෝක්ත අනුනායක ස්ථවිරයන්වහන්සේ හා උඩමාකඩවර
පුරාණ විහාරවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර
ස්ථවිරයන්වහන්සේ**


---


බු. ව. 2557

ක්‍රි. ව. 2013

Buddha Jayanti Tripitaka Series, Volume 38

The Thirty Book in the

**Suttanta-Pitaka**

**Khuddaka Nikāya (13)**

**30**

# PATISAMBHIDĀ MAGGAPPAKARANA (II)

Edited by

**Ven. Labugama Lankānanda Anunāyaka Thera**

Translated into Sinhala by

**The Said Anunāyaka Thera and**

**Pandit Karahampitigoda Sumanasāra Thera**

**Published by**

**Dharma Chakkra Child Foundation**

Rerukana Road, Veedagama, Bandaragama -12530, Sri Lanka

Tel: +94 38 2291771, Fax: +94 38 2291253, website: http:// www.samadhi-buddha.org /

**Co-published, printed and donated by**

**The Corporate Body of the Buddha Educational Foundation**

11F, 55 Hang Chow South Rd. Section 1, Taipei, Taiwan, R.O.C.

Tel: +886 2 23951198, Fax: +886 2 23913415

Email: overseas@budaedu.org; Website: http: // www.budaedu.org/

**B.E. 2557**

**C.E. 2013**

# සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණය කිරීම.

බුදු රජාණන් වහන්සේගේ ඉගැන්වීම හැඳින්වීම සඳහා අනාදිමත් කාලයක සිට විවිධ යෙදුම් යොදා ගෙන ඇත. ධම්ම, ධම්ම-විනය, බුද්ධ වචන, පාවචන බුද්ධානුසාසන ආදිය මින් සමහරකි. දම්ම - විනය වැනි යෙදුම් බුදුරජාණන් වහන්සේ විසින්ම යොදාගෙන ඇත. මේ ධම්ම විනය අඩංගු වී ඇත්තේ ත්‍රිපිටකයෙහිය. පිටක යන්න කූඩය, භාජනය යන අරුත්වල පාලි හා සංස්කෘත යන භාෂාවන් හි යෙදේ. සංස්කෘත භාෂාවෙන් ත්‍රිපිටක නැතහොත් පාලි භාෂාවෙන් තෙපිටක යන්නෙන් අදහස් කෙරෙන්නේ එවන් පිටක තුනකින් සමන්විත එකතුවකි. පාලි ත්‍රිපිටකය බුදු රජාණන් වහන්සේ ගේ ඉගැන්වීම් අඩංගු පැරණිතම මූලාශ්‍රය වශයෙන් ථෙරවාද සම්ප්‍රදාය මගින් පිළිගනු ලැබේ.

චිරාගත ථෙරවාද සම්ප්‍රදාය වන්නේ ත්‍රිපිටකය බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගතවුණු පසුව මහා කස්සප මහා රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් අජාතශත්‍රැ මහරජතුමන්ගේ ප්‍රධාන දායකත්වයෙන් රජගහ නුවර වේභාර පර්වත අසබඩ සප්තපර්ණී ගුහාවෙහි පන්සියයක් මහරහතන් වහන්සේගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු ප්‍රථම ධර්ම සංගායනාවේ දී සජ්ඣායනය කොට අනුමත කෙරුණු බවය. මෙම ත්‍රිපිටකය සමන්විත වන්නේ විනය පිටකය, සුත්ත පිටකය හා අභිධම්ම පිටකය යන පිටකත්‍රයෙනි.

මෙසේ ප්‍රථම සංගායනාවේදී ඊට සහභාගී වුණු මහා රහතන් පන්සියයක් දෙනා වහන්සේලා විසින්ම ඒකමතිකව පිළිගනු ලැබුණු ත්‍රිපිටකය එතැන් පටන් රහතන් වහන්සේලා කණ්ඩායම් මගින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු අතර, ඉන් වසර සියයකට පසු කාලාශෝක රජු දවස විශාලා මහනුවර පැවැත්වුණු දෙවන ධර්ම සංගායනාවේ දී හා ඉන් අනතුරුව ධර්මාශෝක රජු සමයේ දී පාටලී පුත්‍ර නගරයේ දී පැවැත්වුණු තුන්වන සංගායනාවේ දී ද සජ්ඣායන කොට අනුමත කරනු ලැබිණි.

මිහිඳු මහා රහතන් වහන්සේ ප්‍රමුඛව ධර්ම දූතයන් වහන්සේලා විසින් ශ්‍රී ලංකාවට ගෙන එනු ලැබුනේ මෙලෙස සංගීති තුනකදී සජ්ඣායනා කරනු ලැබ, අනුමතව කෙරුණු ත්‍රිපිටකයය. ශ්‍රී ලංකාවේ දී ද අඛණ්ඩව මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන එනු ලැබුණු සම්මා සම්බුද්ධ දේශනාව අඩංගු ත්‍රිපිටකය ක්‍රි.පූ. පළමුවන සියවසේ අගභාගයේ දී පමණ වළගම්බා රජු දවස මාතලේ අළුවිහාරයේ දී ග්‍රන්ථාරූඪ කෙරුණු බව වංස කථාවල දැක්වේ. දැනට භාවිතයේ පවතින පාලි ත්‍රිපිටකයට පාදක වී ඇත්තේ මෙලෙස මහා සංඝරත්නය විසින් ජීවිත පූජාවෙන් ඇප කැපවී නිර්මලව සුරක්ෂිත කොට ගෙන ආ මේ ත්‍රිපිටකයය.

ත්‍රිපිටකයේ විනය පිටකයට මහා විභංග හා භික්ෂුණී විභංග යන දෙකොටස අඩංගු සුත්ත විභංගය ද, මහා වග්ග හා චුල්ලවග්ග යන දෙකොටස අඩංගු ඛන්දකයන් ද පරිවාර නම් කොටස ද ඇතුළත් ය. විනය පිටකයේ ගොනු කොට ඇත්තේ භික්ෂු-භික්ෂුණී චරියාව සකසා ගැනීමට අදාල නීති මාලාවන්ය.

ධර්මය අතින් ඉතා වැදගත් වන්නේ සූත්‍ර පිටකයය. මෙයට දීඝනිකාය, මජ්ඣිමනිකාය, අංගුත්තර නිකාය සහ ඛුද්දක නිකාය අයත් ය.

සුත්ත පිටකයේ අඩංගු ධර්මයේ සාරය ඉතා ක්‍රමවත්ව ඉදිරිපත් කරමින්, විශ්ලේෂණය කොට අර්ථකථන ඉදිරිපත් කෙරෙන්නේ අභිධර්ම පිටකයෙනි. ඊට ධම්මසංගීති, විභංග, ධාතු කථා, පුග්ගලපඤ්ඤත්ති, කථාවත්ථු, යමක, පට්ඨාන යන ග්‍රන්ථ හත ඇතුළත් ය.

මෙම සම්පූර්ණ ත්‍රිපිටකය අද අපට ඉතිරිව ඇත්තේ පුරාණයේ වැඩ විසූ මහා සංඝරත්නය අප්‍රතිහත ධෛර්යයෙන් හා ඉමහත් කැපවීමෙන් එය සුරක්ෂිත කොටගෙන, ඉමහත් වෙහෙස දරා පුස්කොළ පොත්වල

ලේඛන ගතකොට ප්‍රචලිත කිරීමේ හේතුවෙනි. විනයධර - ධර්මධර පුරාණ මහා සංඝයා වහන්සේලා අනුව යමින් වත්මන් මහා සංඝපිතෘවරයන් වහන්සේලා ද ත්‍රිපිටකය ආරක්ෂා කොට ප්‍රචලිත කිරීමේ කාර්යභාරයට උරදුන් හේතුවෙන් ත්‍රිපිටකයෙහි පාලි පෙළ හා එහි සිංහල අනුවාද සකස් කොට පළ කිරීමට අවස්ථාව උදාවීම ධර්මලැදි සැමගේම භාග්‍යයක් බව අමුතුවෙන් කිවයුතු නැත. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා නම් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා රජය මගින් මුද්‍රණය කොට පළ කරන්නට යෙදුණු සිංහල අනුවාදය සහිත මෙම ත්‍රිපිටක ග්‍රන්ථමාලාව පිටපත් අවසන් වී දැන් බොහෝ කලක් ගත වී ඇත.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ ලබා ගැනීමට ඉමහත් ආශාවෙන් විශාල පිරිසක් සිටින බව අපට දැනගන්නට ලැබුණි. ත්‍රිපිටකය චිරාත් කාලයක් පවත්වාගෙන යාමට කටයුතු යෙදීමත්, දහම් ලැදි සැදැහැවත් ගිහි පැවිදි දෙපිරිසගේම ධර්මාවබෝධය සහ ධර්මසංවේගය සඳහා ත්‍රිපිටකය ප්‍රචලිත කොට සුලභ කිරීමත් වර්තමාන මහා සංඝයාවහන්සේ මත අනිවාර්යයෙන් ම පැවරෙන භාරදූර වගකීමකි. වත්මන් සමාජය දෙස බලන විට මෙවන් කර්තව්‍යයක අවශ්‍යතාව වඩා ඉස්මතු වී පෙනන බව කාහටත් පැහැදිලි වනු ඇත.

නොයෙකුත් විද්වත් බෞද්ධ පිරිස් සමඟ කතා බහ කිරීමේදී අපට ඒත්තු ගියේ මෙම අවශ්‍යතාව සපුරාලීමට ගතයුතු ඉතා ඵලදායී ක්‍රියාමාර්ගය නම්, දැනට ලබා ගැනීමට නොහැකි බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලාව නැවත මුද්‍රණද්වාරයෙන් පළ කිරීම බවයි. මෙම අති විශාල කර්තව්‍යය සඳහා මාගේ කාරුණික ඉල්ලීම අනුව තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම ඉදිරිපත් වීම සැදැහැවත් සිංහල පාඨකයින්ගේ මහත් භාග්‍යයක් බව අපේ හැඟීමයි.

මෙම ත්‍රිපිටක ග්‍රන්ථ උනන්දුවෙන් පරිශීලනය කිරීම මගින් ධර්මඥානය වර්ධනය කර ගැනීමට මෙන්ම ධාර්මික ජීවිත සකසා ගැනීමට ද සැදැහැවත් ඔබ සැම උත්සුක වනු ඇතැයි සිතමි.

*තෙරුවන් සරණයි.*

**බෝදාගම චන්දිම නායක ස්ථවිර**

**තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානාධිපති**
**බණ්ඩාරගම ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනමේ නිර්මාතෘ රත්මලාන ශ්‍රී විජයාරාම විහාර වාසී**

ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම,
විදාගම,
බණ්ඩාරගම.

2557 / 2013

බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කොට නොමිලේ
බෙදා හැරීමේ මහා පුණ්‍ය කර්මය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක
වි.ජ.මු ලොකුබණ්ඩාර මැතිතුමාගේ ඉල්ලීම පරිදි
තායිවානයේ ප්‍රධාන සංඝනායක

## ආචාර්ය බෝදාගම චන්දිම නාහිමියන්ගේ අනුශාසනා පරිදි
## තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනම

මඟින් බුද්ධ වර්ෂ 2549 (ක්‍රි. ව. 2005) දී ආරම්භ කරන ලදි.

මෙම මහා පුණ්‍ය කර්මයේ දී ඉත සිතින් කටයුතු කළ පහත සඳහන් මහා සංඝරත්නය හා උපකාරක පිංවතුන් විශේෂයෙන් සිහිපත් කරමු.

- පූජ්‍ය අත්තුඩාවේ ඥාණානන්ද නාහිමි
- පූජ්‍ය කන්ඩක්කුලමේ ධම්මකිත්ති නාහිමි
- ආචාර්ය පූජ්‍ය පල්ලේවෙල සාරද හිමි
- ශාස්ත්‍රවේදී පූජ්‍ය කුඹුක්වැවේ පඤ්ඤාකිත්ති හිමි
- දර්ශනපති පූජ්‍ය කරගහඋල්පත සුගතනන්ද හිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය නාගොඩ අමරවංශ නාහිමි
- ශාස්ත්‍රපති පූජ්‍ය මඩපාත ධම්මසාර නාහිමි
- පූජ්‍ය බඹරැන්දේ ධම්මසිරි හිමි
- පූජ්‍ය පානදුරේ පසන්න හිමි
- මිලීනා සුමතිපාල මැතිණිය
- ජගත් සුමතිපාල මැතිතුමා
- ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහත්මා
- දොස්තර අරුණ රබෙල් මහත්මා
- සුජිත් මොහොට්ටි මහත්මා
- රංජිත් අමරසිංහ මහත්මා
- ගාමිණී කාරියවසම් මහත්මා
- අධිනීතිඥ චන්ද්‍රදාස සූරියාරච්චි මහත්මා
- ආචාර්ය සෙනරත් විජේසුන්දර මහත්මා
- මහාචාර්ය චන්ද්‍ර වික්‍රමගමගේ මහතා
- සිරිසේන හේරත් මැතිතුමා
- විල්ප්‍රඩ් අබේවර්ධන මැතිතුමා

*සියලු දෙනාට රත්නත්‍රයේ ආශිර්වාදයෙන් ධර්මාවබෝධය පහලවේවායි ප්‍රාර්ථනා කරමු.*

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

තෙරසමො භාගො

සූත්‍රාන්තපිටකයෙහි

# ඛුද්දකනිකාය

ත්‍රයොදශ භාගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො"

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දේශනා කරණ ලද ධර්මය හා විනය විවෘත වූයේ බබලයි. වැසුනේ නො බබලයි."

(අඞ්ගුත්තරනිකාය - තිකනිපාත - හරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන

## CONTENTS


| | |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | IX |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... ... | XI |
| සභාපති ප්‍රකාශය .. ... ... ... | XIII |
| පාලිහෝඩිය — PĀLI ALPHABET ... ... ... | XV |
| සංක්ෂිප්ත නිරූපණය — ABBREVIATIONS ... ... | XVII |
| විෂයසූචි ... ... ... ... ... | XIX |
| පෙළ හා පරිවර්තනය .. ... ... ... | 2-245 |
| ගාථාදිපාදානුක්කමණිකා ... ... ... | 247 |
| පධානවචනසූචි ... ... ... | 249-254 |

# සංස්කාරක නිවේදනය

සූත්‍රාන්තපිටකයේ කුදුගත්සඟියට අයත් පටිසම්භිදාමග්ගප්පකරණයෙහි ද්විතීය භාගය බුද්ධජයන්තී ත්‍රිපිටකග්‍රන්ථමාලායෙහි පන්තිස් (35) වැනි ග්‍රන්ථයේ ද්විතීය භාගය යි. පටිසම්භිදාමග්ගප්පකරණය එක් මැ ග්‍රන්ථයක් ලෙස සලකනලද නමුදු ග්‍රන්ථ ප්‍රමාණයෙන් විශාල වූ හෙයින් පරිශීලනය කරනුවන්ගේ පහසුව සඳහා ප්‍රකරණයේ පළමුවැනි වූ මහාවග්ගය ප්‍රථම භාගය හැටියෙන් ද, යුගනද්ධ - පඤ්ඤා යන වග්ග ද්වය ද්විතීයභාගය හැටියෙන් ද පළකරවීමට සම්මත කරන ලද්දේ ය. එහෙයින් මෙය ඛුද්දකනිකායෙහි ත්‍රයෝදශ (13) භාගය වේ මේ ද්විතීයභාගය යුගනද්ධවග්ගයෙහි ‘යුගනද්ධකථා’ ආදි දශකථායෙකින් ද, ප්‍රඥාවග්ගයෙහි ‘පඤ්ඤාකථා’ ආදි දශකථායෙකින් දැයි විසි කථායෙකින් ප්‍රතිමණ්ඩිත වෙයි

පටිසම්භිදාමග්ගයෙහි දෙවැනි තුන්වැනි වග්ගද්වය සිංහල භාෂායෙන් අනුවාදය සඳහා ශ්‍රී ලංකා බෞද්ධමණ්ඩලය විසින් පණ්ඩිත මහාස්ථවිර දෙපොළක් වෙත පවරන ලද නමුදු එහි පාඨශෝධනය හෝ පරිවර්තනය හෝ සම්‍යක්ත්වයට නො පැමිණියෙන් එ මැ කාර්‍ය්‍යභාරය සංස්කාරකමණ්ඩලය මගින් අප වෙත පවරන ලද විය. දවරු දෙක විවිධ කාර්‍ය්‍යබාහුල්‍යයෙන් මිරිකෙමින් සිරිමිහුදු සිංහල අනුවාදය සහිත පරිශුද්ධ ත්‍රිපිටකධර්මය ඉතා ඉක්මනින් ඇස්සමූ කරනු සඳහා මේ ඉමහත් බර හිසින් පිළිගෙන 1962 දී පාඨශෝධනය හා පරිවර්තනය නිමහම් කළම්හ.

මේ දුෂ්කරයෙහි ලා අප දහම් අතැවැසි කල්‍යාණමිත්‍ර කරහම්පිටිගොඩ සුමනසාර පණ්ඩිත ස්ථවිරයන් වහන්සේගේ අත්‍යන්තෝපස්තම්භය ද, ත්‍රිපිටක සංස්කාරක උත්තරීතරමණ්ඩලයේ සහාය ද අපට ලැබුණුබව පවසම්හ. මෙතෙක් ලක්දිවැ මුද්‍රණයෙන් ප්‍රකාශයට නොපත් ත්‍රිපිටකයේ ග්‍රන්ථරත්නයක් වූ ‘පටිසම්භිදාමග්ගප්පකරණය’ පළකරවාලීමෙන් ජනිත කුශලයෙන් දිවඞ්ගත පරවාහැර ශ්‍රී වජ්‍රඥානාභිධාන නා හිමිපාණන් වහන්සේ හා ශ්‍රීලඞ්කාරජය හා සංස්කෘතික කාර්‍ය්‍යාංශයෙහි අධිකාරීහු ද මුද්‍රණකාර්‍ය්‍යයෙහි නියුක්ත වූ පින්වත්හු ද ලොවි ලොව්තුරුසුව ලබත්වා’ යි ආශංසනය කරම්හ.

මීට - ලොවසුත්වැඩ පතන්නා
ලබුගම ලඞ්කානන්ද ස්ථවිර
ත්‍රිපිටකසංස්කාරකමණ්ඩලයේ
ප්‍රධාන සම්පාදක.

1971. 8. 21 ත්‍රිපිටක කාර්‍ය්‍යාලය,
කොළඹ මහානායකවාරිකාරාමය,
115, විජේරාම මාවත,
කොළඹ 7.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

---

**උපදේශක:**

එක්සත් අමරපුරමහානිකායේ සභාපති අග්ගමහාපණ්ඩිත බලන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති:**

අහංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති පණ්ඩිත කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක - දක්ෂිණලඞ්කාමයෙහි ප්‍රධාන සඞ්ඝ නායකස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක:**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය පණ්ඩිත ලබුගම ලඞ්කානන්ද - කෝට්ටේ ශ්‍රී කල්‍යාණී සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභාවේ අනුනායකස්ථවිරයන් වහන්සේ.

දෙමටගොඩ ධර්මදූතාශ්‍රම විද්‍යාලයාධිපති පණ්ඩිත පරවාහැර පඤ්ඤානන්ද ( බී. ඒ. ලන්ඩන් ) කොළඹ නවකෝරළයේ ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ-මාකඩවර විහාරාධිවාසී පණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

**ලේඛකාධිකාරී:**

බෞද්ධාලෝක මාවතේ බෞද්ධාලෝක විහාරාධිපති පණ්ඩිත දෙරගමුවේ ධම්මපාල කොළඹ පළාතේ ප්‍රධාන නායකස්ථවිරයන් වහන්සේ.

# සභාපති ප්‍රකාශය

ආගම නාමයෙන් ප්‍රසිද්ධ පස්මහසඟියෙහි ඛුද්දකනිකායට ඇතුළත් **'පටිසම්භිදාමග්ග'** දෙවන භාගය මෙය වේ. මෙහි පළමු වන භාගය කලකට පෙරැ මුද්‍රිත විය. ප්‍රතිසම්භිදාමාර්ගප්‍රකරණය පිළිබඳ වැ කියයුතු හැම එහි සංඥපනයෙහි සඳහන් වනුයෙන් මෙහි දී ද ප්‍රකාශ කිරීම අවශ්‍ය නො වේ.

බුද්ධජයන්තිය නිමිති කොට පාළිධර්මය සියබසට අරවා මහාජනයා අත තබන්නට ලක්රජය ඉදිරිපත්වීමෙහි ප්‍රතිඵල වශයෙන් මෙතේ **'පටිසම්භිදාමග්ග'** ය ප්‍රකාශයට පත් වෙයි. මෙයට කලින් මේ ප්‍රකරණය දිවයිනෙහි මුද්‍රිත නො වී යැ. විදෙශයෙහි මුද්‍රිත පොත් ද මෙරටැ පුස්කොළපොත් ද සසඳා බලන් මැ විවිධ පාඨ ආකූලව්‍යාකූල වැ ඇති බව පෙනේ. එයින් මෙහි පරිවර්තනකාර්යයට වඩා පාඨශෝධනය අතිශය දුෂ්කර දෑයක් වැ පැවැතිණ. එසේ වුව ද, තෙල මුද්‍රණයෙහි ලා පණ්ඩිතජනයාගේ ප්‍රසාදයට හෙතු වන සැටියෙන් පාඨශෝධනය බෙහෙවින් සම්පූර්ණ වැ ඇත **'පුශනාද්ධකථාවසාන'**යෙහි සිටි ගාථාපඞ්ක්තියෙහි ශෝධන ආදිය හා තෝරා අබොලිපි කළ පාඨාන්තර හා බලන් මැ පාඨශෝධනයෙහි විශිෂ්ටභාවය වටහාගත හැකි වෙයි. මේ කාර්යයෙහි දී තර්කව්‍යාකරණාදියෙහිත් සාහිත්‍ය ත්‍රිපිටකපාළියෙහිත් හසළ බුද්ධි ඇති පණ්ඩිතාචාර්ය ලබුගම ශ්‍රී ලඞ්කානන්ද අනුනායක මහාස්ථවිරයන් වහන්සේ නියුක්ත වූ හ. පරිවර්තනකාර්යයෙහි ලා භාෂාශාස්ත්‍රාදියෙහිත් ධර්මවිනයෙහිත් පරිපක්වබුද්ධි ඇති රාජකීයපණ්ඩිත කරහම්පිටිගොඩ සුමනසාරස්ථවිරයන් වහන්සේ ඔබට සහාය වැ සිටියහ. මෙසේ මේ දෙදෙනා වහන්සේ කළ ශාසනසඞ්ග්‍රහය ඉතා උසස් කොට මෙහි දී ප්‍රකාශ කරම්හ.

මහාජනයා කෙරෙහි අප්‍රකාශ වැ පැවැති 'පටිසම්භිදාමග්ග' ය සියබසින් කියවා ශාසනය කෙරෙහි ශ්‍රද්ධාසම්පත් ඇති කොට ගෙනැ මෙලෝවැඩ හා කෙළවර නිවන්සම්පත් සිද්ධ කැරගනිත්වයි පතම්හ.

ශාසනසපීති කැමැති,
**කෝදගොඩ සිරිඤාණාලෝක නායකස්ථවිර**
ත්‍රිපිටකමණ්ඩලයෙහි සභාපති.

# THE PALI ALPHABET

### IN SINHALA CHARACTERS.

## VOWELS

අ a  ආ ā  ඉ i  ඊ ī  උ u  ඌ ū  එ e  ඔ o

## CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

ය ya  ර ra  ල la  ව va  ස sa  හ ha  ළ ḷa  අං aṃ

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ ke | කො ko |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khe | ඛො kho |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

## Conjunct - Consonants

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ණ්හ ṇha | ද්ද dda | ම්බ, ඹ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ, ඦ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ, ඦ ñja | ද්ව, ඳ dva | ම්හ mha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ wha |
| ඞ්ඛ ṅkh | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ඬ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ණ්හ ṇha | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ත tta | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ථ ttha | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | ත්ව tva | ම්ප mpa | |

ා ā  ි i  ී ī  ු u  ූ ū  ෙ e  ො o

# සඞ්කෙතනිරූපණය

## ABBREVIATIONS

| | | |
|---|---|---|
| සි. 1. | — | පවචනොදය පොත්ථකාලය - තාලපණ්ණපොත්ථකං |
| සි. 2. | — | සිරිසිද්ධත්ථාරාමපොත්ථකාලය - තාලපණ්ණපොත්ථකං |
| සි. 3. | — | 'පැල්මඩුල්ල' මහාවිහාරපොත්ථකාලය - තාලපණ්ණ-පොත්ථකං. |
| මජසං | — | මරම්මඡට්ඨසඞ්ගීතියා සොධිතපටිසම්භිදාමග්ගො. |
| ස්‍යා. | — | ස්‍යාම - තායඅක්ඛරමුද්දිත පටිසම්භිදාමග්ගො. |
| PTS. | — | Pali Text Society - Patisaṁbhidamagga |
| සං | — | මුද්දිතසංයුත්තනිකායපාළි. |
| අනි | — | මුද්දිතඅඞ්ගුත්තරනිකායපාළි. |
| ස | — | සද්ධම්මප්පකාසිනී - පටිසම්භිදාමග්ගට්ඨකථා. |
| වි | — | විසුද්ධිමග්ගො. |
| පු | — | අට්ඨකථාගතානි - පොරාණකපාඨන්තරානි. |

## සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගස්ස

## දුතියභාග - විසයසූචි


| විසයා | | | | | පිට්ඨඞ්කානි |
|---|---|---|---|---|---|
| **2. යුගනද්ධවග්ගො** | | | | | **2 - 153** |
| 1. යුගනද්ධකථා | ... | ... | ... | ... | 2 - 21 |
| 2. සච්චකථා | ... | ... | .. | ... | 20 - 37 |
| 3. බොජ්ඣඞ්ගකථා | ... | ... | ... | ... | 38 - 63 |
| 4. මෙත්තාකථා | ... | ... | ... | ... | 64 - 81 |
| 5. විරාගකථා | ... | ... | ... | ... | 80 - 91 |
| 6. පටිසම්භිදාකථා | ... | ... | ... | ... | 90 - 111 |
| 7. ධම්මචක්කකථා | ... | ... | ... | ... | 110 - 123 |
| 8. ලොකුත්තරකථා | ... | ... | ... | ... | 122 - 127 |
| 9. බලකථා | ... | ... | ... | ... | 126 - 141 |
| 10. සුඤ්ඤතාකථා | ... | ... | ... | ... | 140 - 153 |
| **3. පඤ්ඤාවග්ගො** | | | | | **154 - 245** |
| 1. පඤ්ඤාකථා | ... | ... | ... | ... | 154 - 181 |
| 2. ඉද්ධිකථා | ... | ... | ... | ... | 182 - 195 |
| 3. අභිසමයකථා | ... | ... | ... | ... | 196 - 201 |
| 4. විවෙකකථා | ... | ... | ... | ... | 202 - 207 |
| 5. චරියාකථා | ... | ... | ... | ... | 208 - 209 |
| 6. පාටිහාරියකථා | ... | ... | ... | ... | 210 - 215 |
| 7. සමසීසිකථා | ... | ... | ... | ... | 216 - 217 |
| 8. සතිපට්ඨානකථා | ... | ... | ... | ... | 218 - 225 |
| 9. විපස්සනාකථා | ... | ... | ... | ... | 226 - 239 |
| 10. මාතිකාකථා | ... | ... | ... | ... | 240 - 245 |
| ගාථාදිපාදසූචි | ... | ... | ... | ... | 247 - |
| පධානවචනසූචි | ... | ... | ... | ... | 249 - |

සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගො

දුතියො භාගො

## යුගනද්ධවග්ගො

සුත්තන්තපිටකෙ

# ඛුද්දකනිකායො

# පටිසම්භිදාමග්ගො

## 2. යුගනද්ධවග්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

## 1

## යුගනද්ධකථා

එවං මෙ සුතං: එකං සමයං ආයස්මා ආනන්දො කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තත්‍ර ඛො ආයස්මා ආනන්දො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවෙ'ති. 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො ආනන්දස්ස පච්චස්සොසුං. ආයස්මා ආනන්දො එතදවොච:

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තපත්තං[1] බ්‍යාකරොති, සබ්බො සො[2] චතූහි මග්ගෙහි එතෙසං වා අඤ්ඤතරෙන. කතමෙහි චතූහි:

ඉධාවුසො භික්ඛු සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති, තස්ස සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[3] පහීයන්ති. අනුසයා බ්‍යන්තීහොන්ති.[4]

පුනචපරං ආවුසො භික්ඛු විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති, තස්ස විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[3] පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

පුනචපරං ආවුසො භික්ඛු සමථවිපස්සනං යුගනද්ධං[5] භාවෙති, තස්ස සමථවිපස්සනං යුගනද්ධං භාවයතො මග්ගො සඤ්ජායති, සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

---

1 අරහත්තප්පත්තිං - අභි, අරහත්තපත්තිං - , අරහත්තං - ස්‍යා, අරහත්තපත්තං අත්තානං - පු  2. සබ්බසො - මජසං, ස්‍යා, PTS

3 සඤ්ඤොජනානි - මජසං, ස්‍යා, PTS  4 ව්‍යන්ති හොන්ති - අභි

5 යුගනන්ධං - ස

## සූත්‍රාන්තපිටකයෙහි

## ඛුද්දකනිකාය

# පටිසම්භිදාමාර්ගය

## 2. යුගනද්ධවර්ගය

ඒ භගවත් අර්හත් සම්මාසම්බුද්ධරජාණන් වහන්සේට නමස්කාර වේවා.

## 1

## යුගනද්ධකථා

මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කොසඹෑනුවර ඝොෂිතාරාමයෙහි වාසය කරන සේක. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි, මහණෙනි' යි භික්ෂූන් ඇමතූසේක. 'ඇවැත්නි' යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්දතෙරුනට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ආනන්දතෙරණුවෝ මේ වදාළහ:

ඇවැත්නි, යම්කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මා සමීපයෙහි තමා රහත්බවට පැමිණීම ප්‍රකාශ කෙරේ නම් සර්වප්‍රකාරයෙන් සතර ප්‍රතිපදාමාර්ගයෙන් හෝ මොවුනතුරෙහි එක්තරයෙකින් හෝ ප්‍රකාශ කෙරේ. කවර සතර ප්‍රතිපදාමාර්ගයෙකින යත්:

ඇවැත්නි, මෙ සස්නෙහි මහණ තෙම ශමථපූර්වංගම වූ විදර්ශනාව වඩයි. ශමථපූර්වංගම වූ විදර්ශනා වඩන ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත (කෙළවර) වෙත්.

තවද අනෙකක් කියමි: ඇවැත්නි, මහණ තෙම විදර්ශනා පූර්වංගම වූ ශමථය වඩයි, විදර්ශනාපූර්වංගම ශමථය වඩන ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

තවද ඇවැත්නි, මහණ තෙම ශමථ-විදර්ශනා යුගනද්ධ (යුගළ) කොට වඩයි, ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩන ඔහට මාර්ගය උපදී· හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

පුනචපරං ආවුසො භික්ඛුනො ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං[1] හොති, සො ආවුසො සමයො යං තං චිත්තං අජ්ඣත්තමෙව[2] සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති, තස්ස මග්ගො සඤ්ජායති; සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති, තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

යො හි කොචි ආවුසො භික්ඛු වා භික්ඛුනී වා මම සන්තිකෙ අරහත්තපත්තං බ්‍යාකරොති, සබ්බො සො[3] ඉමෙහි චතූහි මග්ගෙහි එතෙසං වා අඤ්ඤතරෙනාති. a

**කථං සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති:** නෙක්ඛම්මවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, තත්ථ ජාතෙ ධම්මෙ අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. ඉති පඨමං සමථො, පච්ඡා විපස්සනා. තෙන වුච්චති. "සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති[4]

**භාවෙතීති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

**මග්ගො සඤ්ජායතීති** කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මග්ගො සඤ්ජායති, පරිග්ගහට්ඨෙන සම්මාවාචා මග්ගො සඤ්ජායති, සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මග්ගො සඤ්ජායති, වොදානට්ඨෙන සම්මාආජීවො මග්ගො සඤ්ජායති, පග්ගහට්ඨෙන සම්මාවායාමො මග්ගො සඤ්ජායති, උපට්ඨානට්ඨෙන සම්මාසති මග්ගො සඤ්ජායති, අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මග්ගො සඤ්ජායති. එවං මග්ගො සඤ්ජායති.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති." **ආසෙවතීති** කථං ආසෙවති: ආවජ්ජන්තො ආසෙවති, ජානන්තො ආසෙවති, පස්සන්තො ආසෙවති, පච්චවෙක්ඛන්තො ආසෙවති, චිත්තං අධිට්ඨහන්තො ආසෙවති, සද්ධාය අධිමුච්චන්තො ආසෙවති, විරියං පග්ගණ්හන්තො ආසෙවති, සතිං උපට්ඨපෙන්තො[5] ආසෙවති, චිත්තං සමාදහන්තො ආසෙවති, පඤ්ඤාය පජානන්තො ආසෙවති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො ආසෙවති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො ආසෙවති, පහාතබ්බං පජහන්තො ආසෙවති, භාවෙතබ්බං භාවෙන්තො ආසෙවති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො ආසෙවති. එවං ආසෙවති.

---

1 ධම්මුද්ධච්චවිග්ගහිතමානසං - සෑ.
2 අජ්ඣත්තංයෙව - අභි. අජ්ඣත්තඤ්ඤෙව - සෑ, සී 1, 3, PTS
3 සබ්බසො - මජසං, සෑ, PTS.
4 භාවෙතීති - මජසං
5 උපට්ඨපෙන්තො - මජසං
a අඞ්ගුත්තරනිකාය (4.4.2.10) චතුක්ක - පටිපදාවග්ග

තවද ඇවැත්නි, මහණහට ඔභාසාදිධර්මයෙහි වික්ෂෙපසඞ්ඛ්‍යාත උද්ධතභාවයෙන් විරෝධයට පමුණුවනලද සිත වෙයි, යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැසැගෙන සිටි) සිත ගොචරජ්ඣත්ත සඞ්ඛ්‍යාත අරමුණෙහි මැ පිහිටා ද මොනොවට හිඳී ද එකඟ වේ ද මොනොවට සිටී ද, ඇවැත්නි ඒ විදර්ශනාවීථියට පිළිපත් සමය වෙයි. ඔහට මාර්ගය උපදී. හෙතෙම ඒ මාර්ගය ඇසුරු කෙරෙයි වඩයි පුනපුනා වඩයි, ඒ මාර්ගය ඇසුරු කරන වඩන පුනපුනා වඩන ඔහට සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විනත්‍යානත වෙත්.

ඇවැත්නි, යම් කිසි මහණෙක් හෝ මෙහෙණක් හෝ මා සමීපයෙහි තමා රහත්බවට පැමිණීම ප්‍රකාශ කෙරේ නම් මේ සතර ප්‍රතිපදාමාර්ගයෙන් හෝ මොවුනතුරෙහි එක්තරයෙකින් හෝ ප්‍රකාශ කෙරේ යයි.

**කිසෙයින් ශමථපූර්වඞ්ගම විදර්ශනා වඩා ද** යත්: නෛෂ්ක්‍රම්‍යවශයෙන් චිත්තයාගේ එකඟබව අවික්ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ, ඒ සමාධියෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් අනිත්‍යානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනස්වභාවයෙන් විදර්ශනා යි. මෙසෙයින් පළමු වැ ශමථය වෙයි. පසු වැ විදර්ශනා වේ. එහින් කියනු ලැබෙයි: 'සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති'

**භාවෙති** යනු භාවනා සතරෙකි: ඒ ශමථයෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදුපගවීර්‍යධුරස්වභාවයෙන් භාවනා යැ, ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

**මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිසඞ්ඛ්‍යාත මාර්ගය උපදී, අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සංකල්ප සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචන සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්ත සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීව සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාම සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘති සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. මෙසෙයින් මාර්ගය උපදී.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති" **ආසෙවති** යනු: කිසෙයින් ඇසුරු කෙරෙයි යත්: ආවර්ජනා කෙරෙමින් ඇසුරු කෙරෙයි, දනිමින් ඇසුරු කෙරෙයි, දක්මින් ඇසුරු කෙරෙයි, ප්‍රත්‍යවෙක්ෂා කෙරෙමින් ඇසුරු කෙරෙයි, සිත පිහිටුවමින් ඇසුරු කෙරෙයි, සැදැහැයෙන් නිශ්චය කෙරෙමින් ඇසුරු කෙරෙයි, වීර්‍යය දැඩි කොට ගනිමින් ඇසුරු කෙරෙයි, සිහි එළවා තබමින් ඇසුරු කෙරෙයි, සිත අරමුණෙහි සම වැ තබමින් ඇසුරු කෙරෙයි, ප්‍රඥායෙන් දැනගනිමින් ඇසුරු කෙරෙයි, ස්වභාවලක්ෂණාවබෝධයෙන් දතයුත්ත අභිජානනය කෙරෙමින් ඇසුරු කෙරෙයි, සාමාන්‍යලක්ෂණාවබෝධයෙන් දතයුත්ත පරිජානනය කෙරෙමින් ඇසුරු කෙරෙයි, දුරු කළයුත්ත දුරු කෙරෙමින් ඇසුරු කෙරෙයි, වැඩියයුත්ත වඩමින් ඇසුරු කෙරෙයි, ප්‍රත්‍යක්ෂකටයුත්ත ප්‍රත්‍යක්ෂ කෙරෙමින් ඇසුරු කෙරෙයි, මෙසෙයින් ඇසුරු කෙරේ.

**භාවෙතීති** කථං භාවෙති: ආවජ්ජන්තො භාවෙති, ජානන්තො භාවෙති, පස්සන්තො භාවෙති, පච්චවෙක්ඛන්තො භාවෙති, චිත්තං අධිට්ඨහන්තො භාවෙති, සද්ධාය අධිමුච්චන්තො භාවෙති, විරියං පග්ගණ්හන්තො භාවෙති, සතිං උපට්ඨපෙන්තො භාවෙති, චිත්තං සමාදහන්තො භාවෙති, පඤ්ඤාය පජානන්තො භාවෙති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො භාවෙති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො භාවෙති, පහාතබ්බං පජහන්තො භාවෙති, භාවෙතබ්බං භාවෙන්තො භාවෙති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො භාවෙති. එවං භාවෙති.

**බහුලීකරොතීති** කථං බහුලීකරොති: ආවජ්ජන්තො බහුලීකරොති, ජානන්තො බහුලීකරොති, පස්සන්තො බහුලීකරොති, පච්චවෙක්ඛන්තො බහුලීකරොති, චිත්තං අධිට්ඨහන්තො බහුලීකරොති, සද්ධාය අධිමුච්චන්තො බහුලීකරොති, විරියං, පග්ගණ්හන්තො බහුලීකරොති, සතිං උපට්ඨපෙන්තො බහුලීකරොති, චිත්තං සමාදහන්තො බහුලීකරොති, පඤ්ඤාය පජානන්තො බහුලීකරොති, අභිඤ්ඤෙය්‍යං අභිජානන්තො බහුලීකරොති, පරිඤ්ඤෙය්‍යං පරිජානන්තො බහුලීකරොති, පහාතබ්බං පජහන්තො බහුලීකරොති, භාවෙතබ්බං භාවෙන්තො බහුලීකරොති, සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො බහුලීකරොති, එවං බහුලීකරොති.

**තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා[1] පහීයන්ති අනුසයා බ්‍යන්තිහොන්තී'ති** කථං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තිහොන්ති: සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො ඉමානි තීණි සඤ්ඤොජනානි පහීයන්ති, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ඉමානි පඤ්ච සඤ්ඤොජනානි පහීයන්ති, මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො ඉමෙ තයො අනුසයා බ්‍යන්තීහොන්ති, එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

අබ්‍යාපාදවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- ආලොකසඤ්ඤාවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි, තත්ථ ජාතෙ ධම්මෙ අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, ඉති පඨමං සමථො, පච්ඡා විපස්සනා. තෙන වුච්චති: "සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති"[2]

1. සඤ්ඤොජනානි - මජසං, ස්‍යා PTS.
2. භාවෙතීති - මජසං.

**භාවේති** යනු: කිසෙයින් වඩා ද යත්: ආවර්ජනා කෙරෙමින් වඩයි, දනිමින් වඩයි, දකිමින් වඩයි, ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් වඩයි, සිත පිහිටුවමින් වඩයි, ශ්‍රද්ධායෙන් නිශ්චය කෙරෙමින් වඩයි, වීර්‍ය්‍යය දැඩි කොට ගන්මින් වඩයි, සිහි එළවා තබමින් වඩයි, සිත අරමුණෙහි සම වැ තබමින් වඩයි, ප්‍රඥායෙන් දැනගනිමින් වඩයි, අභිඥෙය්‍යය අභිජානනය කෙරෙමින් වඩයි, පරිඥෙය්‍යය පරිජානනය කෙරෙමින් වඩයි, ප්‍රහාතව්‍යය ප්‍රජහනය කෙරෙමින් වඩයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් වඩයි, සාක්‍ෂාත්කාතව්‍යය සාක්‍ෂාත් කෙරෙමින් වඩයි, මෙසෙයින් වඩා.

**බහුලීකරෝති** යනු: කිසෙයින් පුනපුනා වඩා ද යත්: ආවර්ජනා කෙරෙමින් පුනපුනා වඩයි, දනිමින් පුනපුනා වඩයි, දකිමින් පුනපුනා වඩයි, ප්‍රත්‍යවේක්‍ෂා කෙරෙමින් පුනපුනා වඩයි, සිත පිහිටුවමින් පුනපුනා වඩයි, සැදැහැයෙන් නිශ්චය කෙරෙමින් පුනපුනා වඩයි, වීර්‍ය්‍යය දැඩි කොට ගනිමින් පුනපුනා වඩයි, සිහි එළවා තබමින් පුනපුනා වඩයි, සිත අරමුණෙහි සම වැ තබමින් පුනපුනා වඩයි, ප්‍රඥායෙන් ප්‍රජානනය කෙරෙමින් පුනපුනා වඩයි, අභිඥෙය්‍යය අභිජානනය කෙරෙමින් පුනපුනා වඩයි, පරිඥෙය්‍යය පරිජානනය කෙරෙමින් පුනපුනා වඩයි, ප්‍රහාතව්‍යය ප්‍රජහනය කෙරෙමින් පුනපුනා වඩයි, භාවිතව්‍යය භාවනා කෙරෙමින් පුනපුනා වඩයි, සාක්‍ෂාත්කාතව්‍යය සාක්‍ෂාත් කෙරෙමින් පුනපුනා වඩයි, මෙසෙයින් පුනපුනා වඩා.

**තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති අනුසයා බ්‍යන්තීහොන්ති** යනු: කිසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙත් ද; අනුශයධර්මයෝ විගතාන්ත වෙත් ද යත්: සෝවත්මගින් සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ යන මේ තුන් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. සෙදගැමිමගින් ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අනාගැමිමගින් අණු සහගත වූ කාමරාගසංයෝජන යැ ප්‍රතිඝසංයෝජන යැ යන මේ සංයෝජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති. අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. රහත්මගින් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ යන මේ සංයෝජනයෝ පස්දෙන ප්‍රහීණ වෙති, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ යන මේ තුන් අනුශයධර්මයෝ විගතාන්ත වෙති, මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

අව්‍යාපාද වශයෙන් චිත්තයාගේ එකග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ ... ආලොකසංඥ වශයෙන් චිත්තයාගේ එකග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ ... පටිනිස්සග්ගානුපස්සී වැ ආශ්වාස කිරීම් වශයෙන්, පටිනිස්සග්ගානුපස්සී වැ ප්‍රශ්වාස කිරීම් වශයෙන් චිත්තයාගේ එකග්‍රබව අවික්‍ෂෙප සඞ්ඛ්‍යාත සමාධි යැ. ඒ ශමථයෙහි උපන් (චිත්තචෛතත) ධර්මයන් අනිත්‍යානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. මෙසෙයින් පළමු වැ ශමථය වෙයි, පසු වැ විදර්ශනා වේ. එයින් කියනු ලැබෙයි: 'සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති'

භාවෙතීති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති, අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මග්ගො සඤ්ජායති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මග්ගො සඤ්ජායති. එවං මග්ගො සඤ්ජායති.

"සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති." ආසෙවතීති කථං ආසෙවති: ආවජ්ජන්තො ආසෙවති, ජානන්තො ආසෙවති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො ආසෙවති, එවං ආසෙවති.

භාවෙතීති කථං භාවෙති: ආවජ්ජන්තො භාවෙති, ජානන්තො භාවෙති -පෙ- සච්ඡිකාතබ්බං සච්ඡිකරොන්තො භාවෙති, එවං භාවෙති.

බහුලීකරොතීති කථං බහුලීකරොති: ආවජ්ජන්තො බහුලීකරොති ජානන්තො බහුලීකරොති -පෙ- සච්ඡිකරොන්තො බහුලීකරොති. එවං බහුලීකරොති.

තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්තීති කථං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති: සොතාපත්තිමග්ගෙන සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො ඉමානි තීණි සඤ්ඤොජනානි පහීයන්ති, දිට්ඨානුසයො විචිකිච්ඡානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. සකදාගාමිමග්ගෙන ඔළාරිකං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, ඔළාරිකො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අනාගාමිමග්ගෙන අණුසහගතං කාමරාගසඤ්ඤොජනං පටිඝසඤ්ඤොජනං ඉමානි ද්වෙ සඤ්ඤොජනානි පහීයන්ති, අණුසහගතො කාමරාගානුසයො පටිඝානුසයො ඉමෙ ද්වෙ අනුසයා බ්‍යන්තීහොන්ති. අරහත්තමග්ගෙන රූපරාගො අරූපරාගො මානො උද්ධච්චං අවිජ්ජා ඉමානි පඤ්ච සඤ්ඤොජනානි පහීයන්ති, මානානුසයො භවරාගානුසයො අවිජ්ජානුසයො, ඉමෙ තයො අනුසයා බ්‍යන්තීහොන්ති. එවං සඤ්ඤොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති

එවං සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති.

කථං විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති: අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා, තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා[1] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති."[2]

---

1 වොසග්ගාරම්මණතා - මජසං, වවස්සග්ගාරම්මණතා - ස

2. භාවෙතීති - මජසං.

**භාවෙති** යනු: භාවනා සතරෙකි: ඒ ශමථයෙහි උපන් (චිත්ත-චෛතසික) ධර්මයන් නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ ඒකරසාර්ථයෙන් භාවනා යැ, තදුපගවීර්‍ය්‍යවාහනාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි.

**මග්ගො සඤ්ජායති** යනු· කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථ-යෙන් සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. අභිනිරෝපණාර්ථයෙන් සම්‍යක් සංකල්ප සඞ්ඛ්‍යාත මාර්ගය උපදී ... අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී. මෙසෙයින් මාර්ගය උපදී.

'සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති' **ආසෙවති** යනු: කිසෙයින් ආසෙවන කෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් ආසෙවන කෙරෙයි, දනිමින් ආසෙවන කෙරෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් ආසෙවන කෙරේ. මෙසෙයින් ආසෙවන කෙරේ.

**භාවෙති** යනු කිසෙයින් භාවනා කෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් භාවනා කෙරෙයි, දනිමින් භාවනා කෙරෙයි ... සාක්ෂාත්කර්තව්‍යය සාක්ෂාත් කෙරෙමින් භාවනා කෙරේ. මෙසෙයින් භාවනා කෙරේ.

**බහුලීකරොති** යනු: කිසෙයින් බහුලකෙරේ ද යත්: ආවර්ජනා කෙරෙමින් බහුල කෙරෙයි, දනිමින් බහුල කෙරෙයි ... සාක්ෂාත් කෙරෙමින් බහුල කෙරේ. මෙසෙයින් බහුල කෙරේ.

**"තස්ස තං මග්ගං ආසෙවතො භාවයතො බහුලීකරොතො සඤ්ඤොජනා පහීයන්ති අනුසයා බ්‍යන්තිහොන්ති** යනු: කිසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙත් ද, අනුශයධර්මයෝ විගතාන්ත වෙත් ද යත්: ස්‍රොතාපත්තිමාර්ගයෙන් සත්කායදෘෂ්ටි යැ විචිකිත්සා යැ ශීලව්‍රතපරාමර්ශ යැ යන මේ තුන් සංයොජනයෝ ප්‍රහීණ වෙති, දෘෂ්ට්‍යනුශය යැ විචිකිත්සානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. සකෘදාගාමිමාර්ග-යෙන් ඖදාරික වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයොජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, ඖදාරික වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අනාගාමිමාර්ගයෙන් අණුසහගත වූ කාමරාගසංයොජන යැ ප්‍රතිඝසංයො-ජන යැ යන මේ සංයොජනයෝ දෙදෙන ප්‍රහීණ වෙති, අණුසහගත වූ කාමරාගානුශය යැ ප්‍රතිඝානුශය යැ යන මේ අනුශයධර්මයෝ දෙදෙන විගතාන්ත වෙති. අර්හත්මාර්ගයෙන් රූපරාග යැ අරූපරාග යැ මාන යැ ඖද්ධත්‍ය යැ අවිද්‍යා යැ යන මේ සංයෝජනයෝ පස්දෙන ප්‍රහීණ වෙති, මානානුශය යැ භවරාගානුශය යැ අවිද්‍යානුශය යැ යන මේ තුන් අනුශය ධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් ශමථපූර්වඞ්ගම විදර්ශනා වඩා.

කිසෙයින් විදර්ශනාපූර්වඞ්ගම ශමථය වඩා ද යත්: අනිත්‍යානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, දුඃඛානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, අනාත්මානුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, ඒ විදර්ශනායෙහි උපන්(චිත්තචෛතසික) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත (උපචාරඅර්පණාභෙද) අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

භාවෙතීති චතස්සො භාවනා, -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. එවං සඤ්ඤොජනා පහීයන්ති. අනුසයා බ්‍යන්තීහොන්ති.

රූපං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, රූපං දුක්ඛතො අනුපස්සනට්ඨෙන විපස්සනා, රූපං අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා[1] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා, පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති."[2]

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. -පෙ- එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො අනුපස්සනට්ඨෙන විපස්සනා, ජරාමරණං දුක්ඛතො -පෙ- අනත්තතො අනුපස්සනට්ඨෙන විපස්සනා. තත්ථ ජාතානං ධම්මානඤ්ච වොස්සග්ගාරම්මණතා චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි. ඉති පඨමං විපස්සනා, පච්ඡා සමථො. තෙන වුච්චති: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති".

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

එවං විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති.

කථං සමථවිපස්සනං යුගනද්ධං[3] භාවෙති: සොළසහි ආකාරෙහි සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: ආරම්මණට්ඨෙන, ගොචරට්ඨෙන, පහානට්ඨෙන, පරිච්චාගට්ඨෙන, වුට්ඨානට්ඨෙන, විවට්ටනට්ඨෙන, සන්තට්ඨෙන, පණීතට්ඨෙන. විමුත්තට්ඨෙන, අනාසවට්ඨෙන, තරණට්ඨෙන, අනිමිත්තට්ඨෙන, අප්පණිහිතට්ඨෙන, සුඤ්ඤතට්ඨෙන, එකරසට්ඨෙන, අනතිවත්තනට්ඨෙන, යුගනද්ධට්ඨෙන.

කථං ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධාරම්මණො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධාරම්මණා. ඉති ආරම්මණට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති.[4] තෙන වුච්චති. 'ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං[3] භාවෙති'.

---

1 වොසග්ගාරම්මණතා-මජසං, වොස්සක්කාරම්මණතා-සී 1, චවස්සග්ගාරම්මණතා-ස
2 භාවෙතීති - මජසං 4 නාතිවත්තන්තීති - මජසං, සයා PTS
3. යුගනන්ධං - සයා PTS.

**භාවෙති** යනු: භාවනා සතරෙකි ... ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: ... මෙසෙයින් මාර්ගය උපදී. මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

රූපය අනිත්‍ය හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, රූපය දුඃඛ හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, රූපය අනාත්ම හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. ඒ විදර්ශනායෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

**භාවෙති** යනු: භාවනා සතරෙකි ... ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

වෙදනාව ... සංඥාව ... සංස්කාරයන් ... විඥානය ... චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යැ, ජරාමරණය දුඃඛ හෙයින් ... අනාත්ම හෙයින් අනුදර්ශනාර්ථයෙන් විදර්ශනා යි. ඒ විදර්ශනායෙහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් ද නිර්වාණාලම්බන බැවින් (උපදවනලද) චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය සමාධි යැ. මෙසෙයින් පළමු වැ විදර්ශනා වෙයි, පසු වැ ශමථය වේ. එයින් කියනු ලැබෙයි: "විපස්සනාපුබ්බඞ්ගමං සමථං භාවෙති" යනු.

**භාවෙති** යනු: භාවනා සතරෙකි: ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් විදර්ශනාපූර්වඞ්ගම ශමථය වඩා.

කිසෙයින් ශමථ විදර්ශනා යුගනද්ධ (යුගළ) කොට වඩා ද යත්: සොළොස් අයුරෙකින් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩයි. ආලම්බන වශයෙන්, ගොචර වශයෙන්, ප්‍රහාණ වශයෙන්, පරිත්‍යාග වශයෙන්, ව්‍යුත්ථාන වශයෙන, නිවර්තන වශයෙන්, ශාන්ත වශයෙන්, ප්‍රණීත වශයෙන, විමුක්ති වශයෙන්, අනාස්‍රව වශයෙන්, අතික්‍රමණ වශයෙන්, නිමිත්තරහිතාර්ථයෙන, ප්‍රණිධිරහිතාර්ථයෙන, ශූන්‍යතාර්ථයෙන, එකකෘත්‍යාර්ථයෙන, අනතික්‍රමණාර්ථයෙන, යුගනද්ධාර්ථයෙනි.

කිසෙයින් ආලම්බන වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධාලම්බන වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධාලම්බන වෙයි. මෙසෙයින් ආලම්බනාර්ථයෙන් ශමථවිදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු.

භාවෙතීති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති. එවං ආරම්මණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

කථං ගොචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා' ඉති ගොචරට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'ගොචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' (භාවෙතීති -පෙ-)

කථං පහානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති පහානට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'පහානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච පරිච්චජතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති පරිච්චාගට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං වුට්ඨානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච වුට්ඨහතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති වුට්ඨානට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: වුට්ඨානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං විවට්ටනට්ඨෙන.[1] සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච විවට්ටතො[2] චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙහි ච ඛන්ධෙහි ච විවට්ටතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති විවට්ටනට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති. අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'විවට්ටනට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

1 විවත්තනට්ඨෙන - සී 1, 3.
2. විවත්තතො - සී 1, 3.

**භාවෙති** යනු: භාවනා සතරෙකි .. ආසෙවනාර්ථයෙන් භාවනා යි. **මග්ගං සඤ්ජනෙති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් ආලම්බනාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා.

කිසෙයින් ගෝචර වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධගොචර වෙයි, මෙසෙයින් ගොචරාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'ගොචරට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු. (භාවෙති යනු ...)

කිසෙයින් ප්‍රහාණ වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත කෙලශයන් ද ස්කන්ධයන් ද දුරු කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධගොචර වෙයි, අවිද්‍යාසහගත කෙලශයන් ද ස්කන්ධයන් ද දුරු කරන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධගොචර වෙයි, මෙසෙයින් ප්‍රහාණාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි; 'පහානට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් පරිත්‍යාග වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත කෙල්ශයන් ද ස්කන්ධයන් ද පරිත්‍යාග කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධ-ගෝචර වෙයි, අවිද්‍යාසහගත කෙල්ශයන් ද ස්කන්ධයන් ද පරිත්‍යාග කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධගොචර වෙයි. මෙසෙයින් පරිත්‍යාගාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'පරිච්චාගට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් ව්‍යුත්ථාන වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්. ඖද්ධත්‍යසහගත කෙල්ශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙන යොගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධගොචර වෙයි, අවිද්‍යාසහගත කෙල්ශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද නැඟෙන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධ-ගොචර වෙයි, මෙසෙයින් ව්‍යුත්ථානාර්ථයෙන් ශමථ විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි. 'වුට්ඨානට්ඨෙන සමථ-විපස්සනං යුගනද්ධං භාවෙති' යනු ..

කිසෙයින් විවර්තන වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යසහගත කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විවර්තනය වන (වටාලා නො පෙරළෙන අයුරින් නවත්නා) යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය නිරොධගොචර වෙයි, අවිද්‍යාසහගත කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විවර්තනය වන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධගොචර වෙයි. මෙසෙයින් විවර්තනාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත් එයින් කියනු ලැබෙයි: 'විවට්ටනට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කථං සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සන්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සන්තා හොති නිරොධගොචරා. ඉති සන්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' -පෙ-

කථං පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි පණීතො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා පණීතා හොති නිරොධගොචරා. ඉති පණීතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං විමුත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි කාමාසවා විමුත්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා අවිජ්ජාසවා විමුත්තා හොති නිරොධගොචරා. ඉති රාගවිරාගා චෙතොවිමුත්ති, අවිජ්ජාවිරාගා පඤ්ඤාවිමුත්ති. ඉති විමුත්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'විමුත්තට්ඨෙන සමථවිස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං අනාසවට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි කාමාසවෙන අනාසවො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා අවිජ්ජාසවෙන අනාසවා හොති නිරොධගොචරා. ඉති අනාසවට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: අනාසවට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච තරතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි නිරොධගොචරො, අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච තරතො අනුපස්සනට්ඨෙන විපස්සනා නිරොධගොචරා. ඉති තරණට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්තීති. තෙන වුච්චති: 'තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' -පෙ-

කිසෙයින් ශාන්ත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙප සමාධිය ශාන්ත වූයේ නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ශාන්ත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් ශාන්ත වශයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි 'සන්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් ප්‍රණීත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපසමාධිය ප්‍රණීත වූයේ නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ප්‍රණීත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් ප්‍රණීත වශයෙන් ශමථ-විදර්ශනාවෝ එකරස වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'පණීතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් විමුක්තාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපසමාධිය කාමාස්‍රවය කෙරෙන් මිදුණේ නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවිද්‍යාස්‍රවය කෙරෙන් මිදුණී නිරොධගොචර වෙයි. මෙසෙයින් රාගවිරාගයෙන් චිත්තවිමුක්තිය වෙයි, අවිද්‍යාවිරාගයෙන් ප්‍රඥාවිමුක්තිය වෙයි. මෙසෙයින් විමුක්තාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි 'විමුත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු

කිසෙයින් අනාස්‍රවාර්ථයෙන් ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපසමාධිය කාමාස්‍රවයෙන් අනාස්‍රව වූයේ නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවිද්‍යාස්‍රවයෙන් අනාස්‍රව වූවා නිරොධගොචර වෙයි මෙසෙයින් අනාස්‍රවාර්ථයෙන් ශමථ-විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'අනාසවට්ඨෙන සමථවිපස්සනා යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් තරණාර්ථයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය සහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද තරණය කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්‍ෂෙපසමාධිය නිරොධ-ගොචර වෙයි, අවිද්‍යාසහගත ක්ලේශයන් ද ස්කන්ධයන් ද තරණය කරන යෝගීහට අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව නිරොධගොචර වෙයි. මෙසෙයින් තරණාර්ථයෙන් ශමථ විදර්ශනාවෝ ඒකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'තරණට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කථං අනිමිත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බනිමිත්තෙහි අනිමිත්තො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බනිමිත්තෙහි අනිමිත්තා හොති නිරොධගොචරා. ඉති අනිමිත්තට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති. 'අනිමිත්තට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බපණිධීහි අප්පණිහිතො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බපණිධීහි අප්පණිහිතා හොති නිරොධගොචරා. ඉති අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'අප්පණිහිතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.' -පෙ-

කථං සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති: උද්ධච්චං පජහතො චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමාධි සබ්බාභිනිවෙසෙහි සුඤ්ඤො හොති නිරොධගොචරො, අවිජ්ජං පජහතො අනුපස්සනට්ඨෙන විපස්සනා සබ්බාභිනිවෙසෙහි සුඤ්ඤා හොති නිරොධගොචරා. ඉති සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනා එකරසා හොන්ති, යුගනද්ධා හොන්ති, අඤ්ඤමඤ්ඤං නාතිවත්තන්ති. තෙන වුච්චති: 'සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.'

**භාවෙතීති** චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා

**මග්ගො සඤ්ජායතීති** කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති. එවං සුඤ්ඤතට්ඨෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

ඉමෙහි සොළසහි ආකාරෙහි සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

එවං සමථවිපස්සනං යුගනද්ධං භාවෙති.

කථං ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං[1] හොති: අනිච්චතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති, 'ඔභාසො ධම්මො'ති ඔභාසං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං. තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො.' හොති සො සමයො: යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

1 — විග්ගහිතමානසං - සී 3

කිසෙයින් අනිමිත්ත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම නිමිත්ත කෙරෙන් වෙන් වූ අනිමිත්ත වූයේ නිරොධගෝචර වෙයි, අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාඥානයෙන් විදර්ශනාව හැම නිමිත්ත කෙරෙන් වෙන් වූ අනිමිත්ත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් අනිමිත්ත වශයෙන් ශමථ විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'අනිමිත්තවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් අප්‍රණිහිත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යෝගීහට චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම ප්‍රණිධීන් කෙරෙන් වෙන් වූ අප්‍රණිහිත වූයේ නිරොධගොචර වෙයි, අවිද්‍යාව දුරු කරන යෝගීහට අනුදර්ශනාඥානයෙන් විදර්ශනාව හැම ප්‍රණිධීන් කෙරෙන් වෙන් වූ අප්‍රණිහිත වූවා නිරොධගොචර වෙයි. මෙසෙයින් අප්‍රණිහිත වශයෙන් ශමථ-විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි; 'අප්පණිහිතවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු ...

කිසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා ද යත්: ඖද්ධත්‍යය දුරු කරන යොගීහට චිත්තයාගේ එකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපසමාධිය හැම අභිනිවේශයන් කෙරෙන් ශූන්‍ය වූයේ නිරොධාලම්බන වෙයි. අවිද්‍යාව දුරු කරන යොගීහට අනුදර්ශනාඥානයෙන් විදර්ශනාව හැම අභිනිවේශයන් කෙරෙන් ශූන්‍ය වූවා නිරොධාලම්බන වෙයි. මෙසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනාවෝ එකකෘත්‍ය වෙති, යුගනද්ධ වෙති, ඔවුනොවුන් නො ඉක්ම පවතිත්. එයින් කියනු ලැබෙයි: 'සුඤ්ඤතවසෙන සමථවිපස්සනං යුගනද්ධං භාවෙති' යනු.

**භාවෙති** යනු භාවනා සතරෙකි: ඒ භාවනාවිශෙෂයෙහි උපන් ශමථ-විදර්ශනා සඞ්ඛ්‍යාත යුගනද්ධධර්මයන් නො ඉක්මී පවත්නා ස්වභාවයෙන් භාවනා යැ, ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන්ගේ ඒකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තද-නුරූපවීර්‍ය්‍යධුර ස්වභාවයෙන් භාවනා යැ, ආසෙවනස්වභාවයෙන් භාවනා යි.

**මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත් ... මෙසෙයින් මාර්ගය උපදී. මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්. මෙසෙයින් ශූන්‍යත වශයෙන් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩා.

මේ සොළොස් අයුරින් ශමථ-විදර්ශනා යුගනද්ධ කොට වඩයි.

මෙසෙයින් ශමථ විදර්ශනා යුගනද්ධ කොට වඩා.

කිසෙයින් ඔභාසාදි ධර්මයෙහි වික්ෂෙපයෙන් විරොධයට පමුණුවනලද සිත වෙයි යත්: අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට විදර්ශනාවභාසය උපදියි. අවභාසය මාර්ගඵලධර්ම යැ' යි අවභාසය ආවර්ජනා කෙරෙයි. ඒ අවභාසයෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍යය නම. ඒ ඖද්ධත්‍යයෙන් විරෝධයට පමුණුවනලද සිත් ඇත්තේ අනිත්‍ය හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනියි. දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනියි. අනාත්ම හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො' යි. යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ.

තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති. -පෙ- එවං සංයොජනානි පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

අනිච්චතො මනසිකරොතො ඤාණං උප්පජ්ජති පීති උප්පජ්ජති පස්සද්ධි උප්පජ්ජති සුඛං උප්පජ්ජති -පෙ- අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො[1]. උප්පජ්ජති -පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති. තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො.' හොති සො සමයො, යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති. තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

දුක්ඛතො මනසිකරොතො -පෙ- අනත්තතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති -පෙ- ඤාණං උප්පජ්ජති -පෙ- පීති උප්පජ්ජති-පෙ- පස්සද්ධි උප්පජ්ජති -පෙ- සුඛං උප්පජ්ජති -පෙ- අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො උප්පජ්ජති පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති. තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො අනත්තතො උපට්ඨානං -පෙ- අනිච්චතො උපට්ඨානං -පෙ- දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො, -පෙ- එවං සඤ්ඤොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

රූපං අනිච්චතො මනසිකරොතො -පෙ- රූපං දුක්ඛතො මනසිකරොතො -පෙ- රූපං අනත්තතො මනසිකරොතො -පෙ- වෙදනං -පෙ- සඤ්ඤං -පෙ- සඞ්ඛාරෙ -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අනිච්චතො මනසිකරොතො -පෙ- ජරාමරණං දුක්ඛතො මනසි කරොතො -පෙ- ජරාමරණං අනත්තතො මනසිකරොතො ඔභාසො උප්පජ්ජති -පෙ ඤාණං උප්පජ්ජති -පෙ- පීති උප්පජ්ජති -පෙ- පස්සද්ධි උප්පජ්ජති -පෙ- සුඛං උප්පජ්ජති -පෙ අධිමොක්ඛො උප්පජ්ජති -පෙ- පග්ගහො උප්පජ්ජති -පෙ- උපට්ඨානං උප්පජ්ජති -පෙ- උපෙක්ඛා උප්පජ්ජති -පෙ- නිකන්ති උප්පජ්ජති, 'නිකන්ති ධම්මො'ති නිකන්තිං ආවජ්ජති, තතො වික්ඛෙපො උද්ධච්චං, තෙන උද්ධච්චෙන විග්ගහිතමානසො ජරාමරණං අනත්තතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, ජරාමරණං අනිච්චතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, ජරාමරණං දුක්ඛතො උපට්ඨානං යථාභූතං නප්පජානාති, තෙන වුච්චති: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො, හොති සො සමයො යං තං චිත්තං අජ්ඣත්තමෙව සන්තිට්ඨති සන්නිසීදති එකොදි හොති සමාධියති.

1. පග්ගාහො - විසු.

**තස්ස මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටි සඞ්ඛ්‍යාත මාර්ගය උපදී ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට විදර්ශනාඥානය උපදියි ... විදර්ශනා ප්‍රීතිය උපදියි ... විදර්ශනා ප්‍රශ්‍රබ්ධිය උපදියි ... විදර්ශනා සුඛය උපදියි ... අධිමෝක්ෂය (ශ්‍රද්ධාව) උපදියි ... වීර්‍ය්‍යය උපදියි ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදියි ... උපෙක්ෂාව උපදියි ... විදර්ශනා නිකාන්තිය උපදියි ... නිකාන්තිය මාර්ගඵල ධර්ම යැ'යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම්. ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ අනිත්‍ය හෙයින් වැටහීම් ඇති සැටියෙන් නො දැයියි. දුඃඛ හෙයින් වැටහීම් ඇති සැටියෙන් නො දනියි. අනාත්ම හෙයින් වැටහීම් ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි. 'ධම්මුද්ධච්චවිග්ගහිත මානසො'යි. යම් කලෙක ඒ (විදර්ශනා වීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ **තස්ස මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: .. මෙසෙයින් මාර්ගය උපදියි. ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති, අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට ... අනාත්ම හෙයින් මෙනෙහි කරනුවාහට ඕභාසය උපදී, ... ඥානය උපදියි ... ප්‍රීතිය උපදියි ... ප්‍රශ්‍රබ්ධිය උපදියි ... සුඛය උපදියි ... අධිමොක්ෂය උපදියි ... වීර්‍ය්‍යය උපදියි ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදියි .. උපෙක්ෂාව උපදියි .. නිකාන්තිය උපදී. නිකාන්තිය මාර්ග . ඵල ධර්ම යැ'යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම්, ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ අනාත්ම හෙයින් වැටහීම ... අනිත්‍ය හෙයින් වැටහීම් ... දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: 'ධම්මුද්ධච්චවිග්ගහිත-මානසො'යි. ... මෙසෙයින් සංයොජනයෝ ප්‍රහීණ වෙති. අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

රූපය අනිත්‍ය හෙයින් මෙනෙහිකරනුවාහට ... රූපය දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට ... රූපය අනාත්ම හෙයින් මෙනෙහිකරනුවාහට ... වේදනාව .. සංඥාව ... සංස්කාරයන් .. විඥානය චක්ෂුස ... ජරාමරණය අනිත්‍ය හෙයින් මෙනෙහි කරනුවාහට ... ජරාමරණය දුඃඛ හෙයින් මෙනෙහි කරනුවාහට... ජරාමරණය අනාත්ම හෙයින් මෙනෙහි කරනුවාහට ඕභාසය උපදී. .. විදර්ශනාඥානය උපදී ... ප්‍රීතිය උපදී ... ප්‍රශ්‍රබ්ධිය උපදී ... සුඛය උපදී අධිමොක්ෂය උපදී ... වීර්‍ය්‍යය උපදී ... විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘතිය උපදී .. උපෙක්ෂාව උපදී ... නිකාන්තිය උපදී. නිකාන්තිය මාර්ග ඵල ධර්ම යැ'යි නිකාන්තිය ආවර්ජනා කෙරෙයි. ඒ නිකාන්තියෙන් උපදනා වික්ෂෙපය ඖද්ධත්‍ය නම, ඒ ඖද්ධත්‍යයෙන් විරොධයට පමුණුවන ලද සිත් ඇත්තේ ජරාමරණය අනාත්ම හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී, ජරාමරණය අනිත්‍ය හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී, ජරාමරණය දුඃඛ හෙයින් වැටහීම ඇති සැටියෙන් නො දනී. එයින් කියනු ලැබෙයි: 'ධම්මුද්ධච්චවිග්ගහිතමානසො'යි. යම් කලෙක ඒ (විදර්ශනාවීථියට බැස සිටි) සිත ගොචරාධ්‍යාත්ම සඞ්ඛ්‍යාත ආලම්බනයෙහි මැ පිහිටා නම් මොනොවට හිඳී නම් එකඟ වේ නම් මොනොවට සිටී නම් එබඳු සමයෙක් වේ.

තස්ස මග්ගො සඤ්ජායතීති කථං මග්ගො සඤ්ජායති: -පෙ- එවං මග්ගො සඤ්ජායති -පෙ- එවං සංයොජනා පහීයන්ති, අනුසයා බ්‍යන්තීහොන්ති.

එවං ධම්මුද්ධච්චවිග්ගහිතං මානසං හොති.

(1) "ඔභාසෙ චෙව ඤාණෙ ච පීතියා ච විකම්පති
පස්සද්ධියා සුඛෙ චෙව යෙහි චිත්තං පවෙධති,

(2) අධිමොක්ඛෙ ච පග්ගාහෙ උපට්ඨානෙ ච කම්පති
උපෙක්ඛාවජ්ජනාය චෙව[1] උපෙක්ඛාය ච නිකන්තියා,

(3) ඉමානි දස ඨානානි පඤ්ඤා යස්ස පරිචිතා[2]
ධම්මුද්ධච්චකුසලො හොති න ච සම්මොහං ගච්ඡති,[3]

(4) වික්ඛිපති[4] චෙව කිලිස්සති ච චවති චිත්තභාවනා
වික්ඛිපති න කිලිස්සති[5] භාවනා පරිහායති,

(5) වික්ඛිපති න කිලිස්සති භාවනා න පරිහායති
න ච වික්ඛිපතෙ චිත්තං න කිලිස්සති න චවති චිත්තභාවනා,

(6) ඉමෙහි චතූහි ඨානෙහි චිත්තස්ස සඞ්ඛෙපවික්ඛෙපවිග්ගහිතං
දසට්ඨානෙ (මානසං කුසලො) සම්පජානාතී"ති[6]

යුගනද්ධකථා සමත්තා.

## 2

## සච්චකථා

පරිපුණ්ණනිදානං,[7] "චත්තාරිමානි භික්ඛවෙ තථානි අවිතථානි අනඤ්ඤථානි. කතමානි චත්තාරි: 'ඉදං දුක්ඛ'න්ති භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, 'අයං දුක්ඛසමුදයො'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං 'අයං දුක්ඛනිරොධො'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, 'අයං දුක්ඛනිරොධගාමිනී පටිපදා'ති තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං, ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි තථානි අවිතථානි අනඤ්ඤථානී."[a]

1 උපෙක්ඛාවජ්ජනා චෙව - ස්‍යා
2. පරිචචිතා - මජසං, ස්‍යා, පරිචිතා - ස.
3 විකෙඛපං ගච්ඡති - විසු, සම්මොහනගච්ඡති - ස්‍යා
4. විකම්පති - ස්‍යා.
5. විකඛපති කිලිස්සති - ස්‍යා, PTS,
6 ඔභාසනගාථා පොත්ථකෙසු විසදිසා දිස්සන්ති, අට්ඨකථාය පන සංසන්දනවසෙන පටිසඞ්ඛතා,
7. පුරිමනිදානං - මජසං, පරිපුණ්ණකථානිදානං - ස්‍යා PTS
a සච්චසංයුත්ත - ධම්මචක්කප්පවත්තනවග්ග - 10.

**තස්ස මග්ගො සඤ්ජායති** යනු: කිසෙයින් මාර්ගය උපදී ද යත්: ... මෙසෙයින් මාර්ගය උපදී ... මෙසෙයින් සංයෝජනයෝ ප්‍රහීණ වෙති. අනුශයධර්මයෝ විගතාන්ත වෙත්.

මෙසෙයින් ඔභාසාදි ධර්මයෙහි වික්ෂෙපයෙන් විරෝධයට පමුණුවන ලද සිත වේ.

(1) විදර්ශනාවභාස නිමිත්තෙන් ද විදර්ශනාඥාන නිමිත්තෙන් ද විදර්ශනා ප්‍රීති නිමිත්තෙන් ද යෝගී තෙම විවිධ වැ කම්පා වෙයි, යම් ප්‍රශ්‍රබ්ධි ආදියෙකින් සිත සැලේ නම් ඒ විදර්ශනා ප්‍රශ්‍රබ්ධි නිමිත්තෙන් ද විදර්ශනා සුඛ නිමිත්තෙන් ද යෝගී තෙම කම්පා වෙයි.

(2) අධිමොක්ෂ නිමිත්තෙන් ද වීර්‍ය්‍ය නිමිත්තෙන් ද විදර්ශනා සම්ප්‍රයුක්ත ස්මෘති නිමිත්තෙන් ද අවර්ජනොපෙක්ෂා නිමිත්තෙන් ද විදර්ශනොපෙක්ෂා නිමිත්තෙන් ද විදර්ශනානිකාන්ති නිමිත්තෙන් ද යෝගී තෙම කම්පා වෙයි.

(3) මේ අවභාසාදි දශ උපක්ලේශ කාරණයෝ යමක්හු විසින් ප්‍රඥායෙන් පුරුදු කරන ලද්දෑහු ද හෙතෙම අවභාසාදි ධර්මයෙහි ඖද්ධත්‍ය සඞ්ඛ්‍යාත වික්ෂෙපයෙහි කුශල වූයෙ වෙයි, නො ද සම්මොහයට යෙයි.

(4) යොගාවචර තෙම ඔභාසාදියෙහි වික්ෂෙප වේ නම් තෘෂ්ණා-මානදෘෂ්ටීන් කිලිටි ද වේ නම් එකල්හි චිත්ත භාවනායෙන් ච්‍යුත වෙයි, වික්ෂෙප වේ නම් කිලිටි නො වේ නම් භාවනායෙන් පිරිහෙයි.

(5) වික්ෂෙප වේ නම් කිලිටි නො වේ නම් තියුණු නුවණැතියේ භාවනායෙන් නො පිරිහෙයි. නො ද වික්ෂෙප වේ නම් සිත කිලිටි නො වේ නම් චිත්තභාවනායෙන් ච්‍යුත නො වෙයි.

(6) මේ සතර කරුණින් අවභාසාදි දශ විධ උපක්ලේශකාරණයෙහි චිත්තයාගේ ලීනෞද්ධත්‍ය භාවයෙන් විරෝධයට පමුණුවන ලද සිත කුශල වූ යෝගී තෙම මොනොවට දැනගනී'යයි.

**යුගනද්ධකථා නිමි.**

## 2

## සත්‍ය කථා

පරිපූර්ණනිදාන යි. ''මහණෙනි, මොහු සතර දෙන (යථාස්වභාව හෙයින්) තථ නම් වෙති. (විපරීතාභාවයෙන්) අවිතථ නම් වෙති, (අන්‍යස්වභාව රහිත බැවින්) අනඤ්ඤථ නම් වෙත්. කවර සතර දෙනෙක යත්: මහණෙනි, 'මේ දුක යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යැ. මේ දුඃඛසමුදය යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යැ. 'මේ දුඃඛනිරොධ යැ' යන මෙය තථ යැ. අවිතථ යැ අනඤ්ඤථ යැ. 'මේ දුඃඛනිරොධගාමිනී පටිපදා යැ' යන මෙය තථ යැ අවිතථ යැ අනඤ්ඤථ යි. මහණෙනි, මොහු සතර දෙන තථ අවිතථ අනඤ්ඤථ නම් වෙත්.

කථං දුක්ඛං තථට්ඨෙන සච්චං: චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො, ඉමෙ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං දුක්ඛං තථට්ඨෙන සච්චං.

කථං සමුදයො තථට්ඨෙන සච්චං: චත්තාරො සමුදයස්ස සමුදයට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පළිබොධට්ඨො, ඉමෙ චත්තාරො සමුදයස්ස සමුදයට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං සමුදයො තථට්ඨෙන සච්චං.

කථං නිරොධො තථට්ඨෙන සච්චං: චත්තාරො නිරොධස්ස නිරොධට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො, ඉමෙ චත්තාරො නිරොධස්ස නිරොධට්ඨා තථා අවිතථා අනඤ්ඤථා, එවං නිරොධො තථට්ඨෙන සච්චං.

කථං මග්ගො තථට්ඨෙන සච්චං චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා: මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[1] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො, ඉමෙ චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා. එවං මග්ගො තථට්ඨෙන සච්චං..

කතිහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි[2] චතූහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි: තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන. ඉමෙහි චතූහාකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො තථට්ඨො, සමුදයස්ස සමදයට්ඨො තථට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො තථට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො තථට්ඨො, ඉමෙහි චතූහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො අනත්තට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො අනත්තට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො අනත්තට්ඨො මග්ගස්ස මග්ගට්ඨො අනත්තට්ඨො, ඉමෙහි චතූහාකාරෙහි අනත්තට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

1. හෙතට්ඨො - ස්‍යා
2. එකපටිවෙධානි - මජ්සං.

කිසෙයින් දුඃඛය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: දුඃඛයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ දුඃඛාර්ථයෝ සතර දෙනෙක: දුඃඛයාගේ පීඩනාර්ථ යැ ආයූහනාර්ථ යැ සන්තාපාර්ථ යැ විපරිණාමාර්ථ යි. මොහු සතර දෙන දුඃඛයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ දුඃඛාර්ථයෝ යි. මෙසෙයින් දුඃඛය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් සමුදය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: සමුදයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ සමුදයාර්ථයෝ සතර දෙනෙක: සමුදයාගේ ආයූහනාර්ථ යැ නිදානාර්ථ යැ සංයොගාර්ථ යැ පලිබොධාර්ථ යි. මොහු සතර දෙන සමුදයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ සමුදයාර්ථයෝ යි. මෙසෙයින් සමුදය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: නිරොධයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ නිරොධාර්ථයෝ සතර දෙනෙක: නිරොධයාගේ නිස්සරණාර්ථ යැ විවෙකාර්ථ යැ අසඞ්ඛතාර්ථ යැ අමෘතාර්ථ යි. මොහු සතර දෙන නිරොධයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ නිරොධාර්ථ යෝ යි. මෙසෙයින් නිරොධය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි.

කිසෙයින් මාර්ගය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වෙයි යත්: මාර්ගයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ මාර්ගාර්ථයෝ සතර දෙනෙක: මාර්ගයාගේ නිර්‍යාණාර්ථ යැ හෙත්වර්ථ යැ දර්ශනාර්ථ යැ අධිපතිභාවාර්ථ යි. මොහු සතර දෙන මාර්ගයාගේ තථ වූ අවිතථ වූ අනඤ්ඤථ වූ මාර්ගාර්ථයෝ යි. මෙසෙයින් මාර්ගය යථාස්වභාවාර්ථයෙන් සත්‍ය වේ.”

කිහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙයි යත්: සතර අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවෙධ කළයුතු අර්ථයෙනි. මේ සතර අයුරින් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ගෘහීත වෙති, යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු’ යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය තථාර්ථ යැ, සමුදයාගේ සමුදයස්වභාවය තථාර්ථ යැ, නිරොධයාගේ නිරොධස්වභාවය තථාර්ථ යැ, මාර්ගයාගේ මාර්ගස්වභාවය තථාර්ථ යි. මේ සතර අයුරින් තථාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද, එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු’ යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කිසෙයින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති යත්: සතර අයුරෙකින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවෙධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය අනාත්මාර්ථ යැ, සමුදයාගේ සමුදයස්වභාවය අනාත්මාර්ථ යැ, නිරොධයාගේ නිරොධස්වභාවය අනාත්මාර්ථ යැ, මාර්ගයාගේ මාර්ගස්වභාවය අනාත්මාර්ථ යි. මේ සතර අයුරින් අනාත්මාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ, යම් හෙයෙකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද, එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවෙධ කෙරේ නු’ යි සතර සත්‍යයෝ එකප්‍රතිවෙධ වෙති.

කථං සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො සච්චට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො සච්චට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො සච්චට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො සච්චට්ඨො. ඉමෙහි චතූහාකාරෙහි සච්චට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: චතූහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො පටිවෙධට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො පටිවෙධට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො පටිවෙධට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො පටිවෙධට්ඨො. ඉමෙහි චතූහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං චත්තාරි සච්චානි එකපටිවෙධානි: යං අනිච්චං තං දුක්ඛං, යං දුක්ඛං තං අනිච්චං[1] යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච තං අනත්තා. යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තං තථං, යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තථඤ්ච, තං සච්චං, යං අනිච්චඤ්ච දුක්ඛඤ්ච අනත්තා ච තථඤ්ච සච්චඤ්ච, තං එකසඞ්ගහිතං. යං එකසඞ්ගහිතං, තං එකත්තං. එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කතීහාකාරෙහි[2] චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි: තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිඤ්ඤට්ඨෙන පරිඤ්ඤට්ඨෙන පහානට්ඨෙන භාවනට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන. ඉමෙහි නවහාකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො තථට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො තථට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො තථට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො තථට්ඨො, අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො තථට්ඨො, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො තථට්ඨො, පහානස්ස පහානට්ඨො තථට්ඨො, භාවනාය භාවනට්ඨො තථට්ඨො, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො තථට්ඨො. ඉමෙහි නවහාකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

---

1. "යං දුක්ඛං තං අනිච්චං" ඉති සයා PTS, පොත්ථකෙසු න දිස්සති
2. කතිහාකාරෙහි - මජසං, සයා,

කිසෙයින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවේධ වෙති යත්: සතර අයුරෙකින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය සත්‍යාර්ථ යැ, සමුදයාගේ සමුදයස්වභාවය සත්‍යාර්ථ යැ, නිරෝධයාගේ නිරෝධස්වභාවය සත්‍යාර්ථ යැ, මාර්ගයාගේ මාර්ගස්වභාවය සත්‍යාර්ථ යැ. මේ සතර අයුරින් සත්‍යාර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරන ලද ද, එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති.

කිසෙයින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: සතර අයුරෙකින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය ප්‍රතිවේධාර්ථ යැ. සමුදයාගේ සමුදයස්වභාවය ප්‍රතිවේධාර්ථ යැ නිරෝධයාගේ නිරෝධස්වභාවය ප්‍රතිවේධාර්ථ යැ, මාර්ගයාගේ මාර්ගස්වභාවය ප්‍රතිවේධාර්ථ යි. මේ සතර අයුරින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලදහ. යම් හෙයකින් එකෙකි අර්ථයෙන් සඞ්ග්‍රහ කරනලද ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

කිසෙයින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: යමෙක් අනිත්‍ය වේ ද හේ දුඃඛ යැ, යමෙක් දුඃඛ වේ ද හේ අනිත්‍ය යැ, යමෙක් අනිත්‍යත් දුඃඛත් වේ ද හේ අනාත්ම යැ, යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් වේ ද හේ තථ යැ, යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් තථත් වේ ද හේ සත්‍ය යැ යමෙක් අනිත්‍යත් දුඃඛත් අනාත්මත් තථත් සත්‍යත් වේ ද හේ ඒකසඞ්ගෘහීත යැ, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් ඒකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එක ප්‍රතිවේධ වෙත්.

කිහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: නව අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවේධාර්ථයෙන අභිඥාර්ථයෙන පරිඥාර්ථයෙන ප්‍රහාණාර්ථයෙන භාවනාර්ථයෙන සාක්ෂාත්ක්‍රියාර්ථයෙනි. මේ නව අයුරින් සතර සත්‍යයෝ ඒකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් ඒකසඞ්ගෘහීත ද එහෙයින් ඒකත්ව වෙයි. ඒකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති.

කිසෙයින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: නව අයුරෙකින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ දුඃඛස්වභාවය තථාර්ථ යැ, සමුදයාගේ සමුදයස්වභාවය තථාර්ථ යැ, නිරෝධයාගේ නිරෝධස්වභාවය තථාර්ථ යැ, මාර්ගයාගේ මාර්ග ස්වභාවය තථාර්ථ යැ, අභිඥාවගේ අභිඥාර්ථය තථාර්ථ යැ, පරිඥාවගේ පරිඥාර්ථය තථාර්ථ යැ, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය තථාර්ථ යැ, භාවනාවගේ භාවනාර්ථය තථාර්ථ යැ, සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථය තථාර්ථ යි. මේ නව අයුරින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ ඒකසඞ්ගෘහීත වෙති. යම් හෙයෙකින් එකසඞ්ගෘහීත ද එහෙයින් ඒකත්ව වෙයි, ඒකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ ඒකප්‍රතිවේධ වෙති.

කථං අනත්තට්ඨෙන -පෙ- සච්චට්ඨෙන -පෙ- පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: නවහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස දුක්ඛට්ඨො පටිවෙධට්ඨො, සමුදයස්ස සමුදයට්ඨො පටිවෙධට්ඨො, නිරොධස්ස නිරොධට්ඨො පටිවෙධට්ඨො, මග්ගස්ස මග්ගට්ඨො පටිවෙධට්ඨො, අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො පටිවෙධට්ඨො, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො පටිවෙධට්ඨො, පහානස්ස පහානට්ඨො පටිවෙධට්ඨො, භාවනාය භාවනට්ඨො පටිවෙධට්ඨො, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො පටිවෙධට්ඨො. ඉමෙහි නවහාකාරෙහි පටිවෙධට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කතීහාකාරෙහි චත්තාරි සච්චානි එක පටිවෙධානි: ද්වාදසහි ආකාරෙහි චත්තාරි සච්චානි එකපටිවෙධානි; තථට්ඨෙන අනත්තට්ඨෙන සච්චට්ඨෙන පටිවෙධට්ඨෙන අභිජානනට්ඨෙන පරිජානනට්ඨෙන ධම්මට්ඨෙන ධාතුට්ඨෙන[1] ඤාතට්ඨෙන සච්ඡිකිරියට්ඨෙන ඵුසනට්ඨෙන[2] අභිසමයට්ඨෙන. ඉමෙහි ද්වාදසහි ආකාරෙහි චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: සොළසහි ආකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො තථට්ඨො, සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො තථට්ඨො, නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො තථට්ඨො, මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[3] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො තථට්ඨො, ඉමෙහි සොළසහි ආකාරෙහි තථට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි, යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

කථං අනත්තට්ඨෙන -පෙ- සච්චට්ඨෙන -පෙ- පටිවෙධට්ඨෙන -පෙ- අභිජානනට්ඨෙන -පෙ- පරිජානනට්ඨෙන -පෙ- ධම්මට්ඨෙන -පෙ- ධාතුට්ඨෙන -පෙ- ඤාතට්ඨෙන -පෙ- සච්ඡිකිරියට්ඨෙන -පෙ- ඵුසනට්ඨෙන[2] -පෙ- අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි; සොළසහි ආකාරෙහි අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකපටිවෙධානි: දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො අභිසමයට්ඨො, සමුදයස්ස ආයූහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො අභිසමයට්ඨො, නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසඞ්ඛතට්ඨො අමතට්ඨො අභිසමයට්ඨො, මග්ගස්ස නිය්‍යානට්ඨො හෙතුට්ඨො[3] දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො අභිසමයට්ඨො. ඉමෙහි සොළසහි ආකාරෙහි අභිසමයට්ඨෙන චත්තාරි සච්චානි එකසඞ්ගහිතානි. යං එකසඞ්ගහිතං තං එකත්තං, එකත්තං එකෙන ඤාණෙන පටිවිජ්ඣතීති චත්තාරි සච්චානි එකපටිවෙධානි.

1. තථට්ඨෙන - මජ්ඣසං, ස්‍යා, සී, PTS    2 ඵස්සනට්ඨෙන - මජ්ඣසං, ස්‍යා, සී
3. හෙතට්ඨො - ස්‍යා

කිසෙයින් අනාත්මාර්ථයෙන් ... සත්‍යාර්ථයෙන් ... ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්; නව අයුරෙකින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ දුඃඛාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, සමුදයාගේ සමුදයාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, නිරෝධයාගේ නිරෝධාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, මාර්ගයාගේ මාර්ගාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, අභිඥාවගේ අභිඥාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, පරිඥාවගේ පරිඥාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, භාවනාවගේ භාවනාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යැ, සාක්ෂාත්ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථය ප්‍රතිවේධ කළයුතු අර්ථ යි. මේ නව අයුරින් ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක් ඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

කිහි අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: දොළොස් අයුරෙකින් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: යථාස්වභාවාර්ථයෙන අනාත්මාර්ථයෙන සත්‍යාර්ථයෙන ප්‍රතිවේධ කළයුතු අර්ථයෙන අභිජානනාර්ථයෙන පරිජානනාර්ථයෙන ධර්මාර්ථයෙන ධාත්වර්ථයෙන ඥාතාර්ථයෙන සාක්ෂාත්ක්‍රියාර්ථයෙන ස්පර්ශාර්ථයෙන අභිසමයාර්ථයෙනි. මේ දොළොස් අයුරින් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

කිසෙයින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති යත්: සොළොස් අයුරෙකින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ පීඩනාර්ථය සඞ්ඛතාර්ථය සන්තාපාර්ථය විපරිණාමාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, සමුදයාගේ ආයූහනාර්ථය නිදානාර්ථය සංයෝගාර්ථය පලිබොධාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, නිරෝධයාගේ නිස්සරණාර්ථය විවෙකාර්ථය අසඞ්ඛතාර්ථය අමෘතාර්ථය යථාස්වභාවාර්ථ වෙයි, මාර්ගයාගේ නිර්යාණාර්ථය හෙත්වර්ථය දර්ශනාර්ථය අධිපතිභාවාර්ථය යථාස්වභාවාර්ථ වෙයි. මේ සොළොස් අයුරින් යථාස්වභාවාර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති, යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි. එකත්වය එක්මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති.

කිසෙයින් අනාත්මාර්ථයෙන් ... සත්‍යාර්ථයෙන් ... ප්‍රතිවේධාර්ථයෙන් ... අභිජානනාර්ථයෙන් ... පරිජානනාර්ථයෙන් ... ධර්මාර්ථයෙන් ... ධාත්වර්ථයෙන් ... ඥාතාර්ථයෙන් ... සාක්ෂාත්ක්‍රියාර්ථයෙන් ... ස්පර්ශාර්ථයෙන් ... අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත් ද යත්: සොළොස් අයුරෙකින් අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙති: දුඃඛයාගේ පීඩනාර්ථය සඞ්ඛතාර්ථය සන්තාපාර්ථය විපරිණාමාර්ථය අභිසමයාර්ථ (ප්‍රත්‍යවේක්ෂණඥානයෙන් අවබෝධ කටයුතු) අර්ථය වෙයි. සමුදයාගේ ආයූහනාර්ථය නිදානාර්ථය සංයෝගාර්ථය පලිබොධාර්ථය අභිසමයාර්ථ වෙයි, නිරෝධයාගේ නිස්සරණාර්ථය විවෙකාර්ථය අසඞ්ඛතාර්ථය අමෘතාර්ථය අභිසමයාර්ථ වෙයි, මාර්ගයාගේ නිර්යාණාර්ථය හෙත්වර්ථය දර්ශනාර්ථය අධිපතිභාවාර්ථය අභිසමයාර්ථ වෙයි. මේ සොළොස් අයුරින් අභිසමයාර්ථයෙන් සතර සත්‍යයෝ එකසඞ්ගෘහීත වෙති. යම් හෙයකින් එකසඞ්ගෘහීත වේ ද එහෙයින් එකත්ව වෙයි, එකත්වය එක් මාර්ගඥානයෙන් ප්‍රතිවේධ කෙරේ නු' යි සතර සත්‍යයෝ එකප්‍රතිවේධ වෙත්.

සච්චානං[1] කති ලක්ඛණානි: සච්චානං ද්වෙ ලක්ඛණානි: සඞ්ඛතලක්ඛණඤ්ච අසඞ්ඛතලක්ඛණඤ්ච. සච්චානං ඉමානි ද්වෙ ලක්ඛණානි.

සච්චානං කති ලක්ඛණානි: සච්චානං ඡ ලක්ඛණානි: සඞ්ඛතානං සච්චානං උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතානං අඤ්ඤථත්තං පඤ්ඤායති. අසඞ්ඛතස්ස සච්චස්ස න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සච්චානං ඉමානි ඡ ලක්ඛණානි.

සච්චානං කති ලක්ඛණානි: සච්චානං ද්වාදස ලක්ඛණානි: දුක්ඛසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සමුදයසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. මග්ගසච්චස්ස උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. නිරොධසච්චස්ස න උප්පාදො පඤ්ඤායති, න වයො පඤ්ඤායති, න ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. සච්චානං ඉමානි ද්වාදස ලක්ඛණානි.

චතුන්නං සච්චානං කති කුසලා, කති අකුසලා, කති අබ්‍යාකතා: සමුදයසච්චං අකුසලං, මග්ගසච්චං කුසලං, නිරොධසච්චං අබ්‍යාකතං, දුක්ඛසච්චං සියා කුසලං, සියා අකුසලං, සියා අබ්‍යාකතං.

සියා තීණි සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං තීහි සච්චෙහි සඞ්ගහිතං වත්ථුවසෙන පරියායෙන.

**සියාති** කථඤ්ච සියා: යං දුක්ඛසච්චං අකුසලං සමුදයසච්චං අකුසලං, එවං අකුසලට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං. යං දුක්ඛසච්චං කුසලං, මග්ගසච්චං කුසලං, එවං කුසලට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං. යං දුක්ඛසච්චං අබ්‍යාකතං, නිරොධසච්චං අබ්‍යාකතං, එවං අබ්‍යාකතට්ඨෙන ද්වෙ සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං ද්වීහි සච්චෙහි සඞ්ගහිතං එවං සියා තීණි සච්චානි එකසච්චෙන සඞ්ගහිතානි, එකසච්චං තීහි සච්චෙහි සඞ්ගහිතං වත්ථුවසෙන පරියායෙනාති.

1. සච්චානි - සී 1, 3

සත්‍යයන්ගේ ලක්ෂණයෝ කෙතෙකැ යත්: සත්‍යයන්ගේ ලක්ෂණ දෙකෙකි: සඞ්ඛතලක්ෂණ යැ අසඞ්ඛතලක්ෂණ යැ යි. මොහු සත්‍යයන්ගේ දෙ ලක්ෂණයෝ යි.

සත්‍යයන්ගේ ලක්ෂණයෝ කෙතෙකැ යත්: සත්‍යයන්ගේ ලක්ෂණයෝ සදෙනෙකි: සඞ්ඛත සත්‍යයන්ගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, ස්ථිතිප්‍රාප්තයන්ගේ අන්‍යථාභාව සඞ්ඛ්‍යාත ජරාව පැනෙයි. අසඞ්ඛතසත්‍ය-යාගේ උත්පාදය නො පැනෙයි, විනාශය නො පැනෙයි, නිත්‍යබවයෙන් සිටියහුගේ අන්‍යථාභාවය නො පැනේ. මොහු සත්‍යයන්ගේ ස ලක්ෂණ යෝ යි.

සත්‍යයන්ගේ ලක්ෂණයෝ කෙතෙකැ යත්: සත්‍යයන්ගේ ලක්ෂණ දොළොසෙකි: දුඃඛසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, සමුදයසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, මාර්ගසත්‍යයාගේ උත්පාදය පැනෙයි, විනාශය පැනෙයි, සිටියහුගේ අන්‍යථාභාවය පැනෙයි, නිරොධසත්‍යයාගේ උත්පාදය නො පැනෙයි, විනාශය නො පැනෙයි. නිත්‍යබ-යෙන් සිටියහුගේ අන්‍යථාභාවය නො පැනේ. මොහු සත්‍යයන්ගේ දොළොස් ලක්ෂණයෝ යි.

සතර සත්‍යයන් අතුරෙහි කුශලයෝ කෙතෙක් ද, අකුශලයෝ කෙතෙක් ද, අව්‍යාකෘතයෝ කෙතෙක් ද යත්: සමුදයසත්‍යය අකුශල යැ, මාර්ගසත්‍යය කුශල යැ, නිරොධසත්‍යය අව්‍යාකෘත යැ, දුඃඛසත්‍යය කුශල ද වන්නේ යැ, අකුශල ද වන්නේ යැ, අව්‍යාකෘත ද වන්නේ යි.

වස්තු වශයෙන් පර්‍යායයෙන් සත්‍යයෝ තිදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහු ද වන්නාහ, එක් සත්‍යයෙක් තුන් සත්‍යයෙකින් ගණනාලද ද වන්නේ යි.

සියා යනු; කිසෙයින් වන්නේ යැ යත්. යම් අකුශල වූ දුඃඛසත්‍යයෙක් වේ ද අකුශල වූ සමුදයසත්‍යයෙක් වේ ද, මෙසෙයින් අකුශලාර්ථයෙන් සත්‍යයෝ දෙදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ, එක් සත්‍යයෙක් සත්‍යදෙකෙකින් ගණනාලද යැ. යම් කුශල වූ දුඃඛසත්‍යයෙක් වේ ද කුශල වූ මාර්ගසත්‍යයෙක් වේ ද, මෙසෙයින් කුශලාර්ථයෙන් සත්‍යයෝ දෙදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ. එක් සත්‍යයෙක් සත්‍ය දෙකෙ-කින් ගණනාලද යැ. යම් අව්‍යාකෘත වූ දුඃඛසත්‍යයෙක් වේ ද අව්‍යාකෘත වූ නිරොධසත්‍යයෙක් වේ ද, මෙසෙයින් අව්‍යාකෘතාර්ථයෙන් සත්‍යයෝ දෙදෙ-නෙක් එක් සත්‍යයෙකින් ගණනාලදහ. එක් සත්‍යයෙක් සත්‍ය දෙකෙකින් ගණනා ලද යැ. මෙසෙයින් වස්තුවශයෙන් පර්‍යායයෙන් සත්‍යයෝ තිදෙනෙක් එක් සත්‍යයෙකින් ගණනා ලදහ. එක් සත්‍යයෙක් තුන් සත්‍ය-යෙකින් ගණනාලද යි.

[ සාවත්ථිනිදානං: ]

"පුබ්බෙව[1] මෙ භික්ඛවෙ සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො එතදහොසි: කො නු ඛො රූපස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං, කො වෙදනාය අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො සඤ්ඤාය අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො සඞ්ඛාරානං අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං. කො විඤ්ඤාණස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණන්ති. තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: 'යං ඛො රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං, අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං.[2] විපරිණාමධම්මං, අයං රූපස්ස ආදීනවො. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං රූපස්ස නිස්සරණං. යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං. අයං විඤ්ඤාණස්ස අස්සාදො, යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං[2]. විපරිණාමධම්මං, අයං විඤ්ඤාණස්ස ආදීනවො. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං, ඉදං විඤ්ඤාණස්ස නිස්සරණං.

යාවකීවඤ්චාහං භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං නාබ්භඤ්ඤාසිං, නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති[3]. පච්චඤ්ඤාසිං. යතො ච ඛ්වාහං භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං උපාදානක්ඛන්ධානං එවං අස්සාදඤ්ච අස්සාදතො ආදීනවඤ්ච ආදීනවතො නිස්සරණඤ්ච නිස්සරණතො යථාභූතං අබ්භඤ්ඤාසිං, අථාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අකුප්පා මෙ චෙතොවිමුත්ති.[4] අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො''ති [a].

යං රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං රූපස්ස අස්සාදොති පහානපටිවෙධො, සමුදයසච්චං. යං රූපං අනිච්චං දුක්ඛං[2] විපරිණාමධම්මං අයං රූපස්ස ආදීනවො'ති පරිඤ්ඤාපටිවෙධො දුක්ඛසච්චං. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං රූපස්ස නිස්සරණන්ති සච්ඡිකිරියාපටිවෙධො නිරොධසච්චං. යා ඉමෙසු තීසු ඨානෙසු දිට්ඨි සඞ්කප්පො වාචා කම්මන්තො ආජීවො වායාමො සති සමාධි භාවනාපටිවෙධො මග්ගසච්චං.

යං වෙදනං පටිච්ච -පෙ- යං සඤ්ඤං පටිච්ච -පෙ- යං සඞ්ඛාරෙ පටිච්ච -පෙ- යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං අයං විඤ්ඤාණස්ස අස්සාදො'ති පහානපටිවෙධො සමුදයසච්චං. යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං[2] විපරිණාමධම්මං අයං විඤ්ඤාණස්ස ආදීනවො'ති පරිඤ්ඤාපටිවෙධො දුක්ඛසච්චං. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං ඉදං විඤ්ඤාණස්ස නිස්සරණන්ති සච්ඡිකිරියා පටිවෙධො නිරොධසච්චං. යා ඉමෙසු තීසු ඨානෙසු දිට්ඨි සඞ්කප්පො වාචා කම්මන්තො ආජීවො වායාමො සති සමාධි භාවනාපටිවෙධො මග්ගසච්චං.

---

1. පුබ්බෙ - මජසං, ස්‍යා, සී, PTS, ස. 2. තං දුක්ඛං - මජසං.
3. අභිසම්බුද්ධො - ස්‍යා, PTS. 4. අකුප්පා මෙ විමුත්ති - මජසං.
a ඛන්ධසංයුත්ත - භාරවග්ග.

[සැවැත්නිදාන යි.]

"මහණෙනි, සම්බෝධියෙන් පෙර මා සර්වධර්මයන් ප්‍රතිවේධ නො කළ බෝධිසත්ත්ව වූ මා මට මෙ බඳු පරිවිතර්කයෙක් විය: රූපයාගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ, වේදනාවගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. සංඥාවගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. සංස්කාරයන්ගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ, නිස්සරණ කවරැ. විඥානයාගේ ආස්වාද කවරැ, ආදීනව කවරැ. නිස්සරණ කවරෙයැ'යි. මහණෙනි, ඒ මට මෙ බඳු සිතෙක් විය: රූපය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද වෙයි. යම් රූපයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාමස්වභාව ඇත්තේ වේ ද මේ රූපයාගේ ආදීනව වෙයි. රූපයෙහි යම් ඡන්දරාග සංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද මේ රූපයාගේ නිස්සරණය වෙයි. වේදනාව පිණිස යම් ... සංඥාව පිණිස යම් ... සංස්කාරයන් පිණිස යම් ... විඥානය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් වේ ද, මේ විඥානයාගේ ආස්වාද වෙයි, යම් විඥානයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද, මේ විඥානයාගේ ආදීනව වෙයි. විඥානයෙහි යම් ඡන්දරාගසංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද, මේ විඥානයාගේ නිස්සරණය වේ.

මහණෙනි, යම්තාක් මම මේ පඤ්චෝපාදානස්කන්ධයන් ගේ මෙසේයින් ආස්වාදය ද ආස්වාද හෙයින් ආදීනවය ද ආදීනව හෙයින් නිස්සරණය ද නිස්සරණ හෙයින් ඇති සැටියෙන් ප්‍රතිවේධ නො කෙළෙම් ද, මහණෙනි මම ඒ තාක් දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත අවකාශ ලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වලෝකයෙහි 'නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය ප්‍රතිවේධ කෙළෙම්' නො මැ පිළිත කෙළෙම්. වැළිත් මහණෙනි, යම් කලෙක මම මේ පඤ්චෝපාදානස්කන්ධයන් ගේ මෙසේයින් ආස්වාදය ද ආස්වාද හෙයින් ආදීනවය ද ආදීනව හෙයින් නිස්සරණය ද නිස්සරණ හෙයින් ඇති සැටියෙන් ප්‍රතිවේධ කෙළෙම් ද, මහණෙනි, එකල්හි මම දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත අවකාශලෝකයෙහි මහණ බමුණන් සහිත දෙව්මිනිසුන් සහිත සත්ත්වලෝකයෙහි 'නිරුත්තර වූ සම්‍යක් සම්බෝධිය (සර්වඥතාඥානය) ප්‍රතිවේධ කෙළෙමි' පිළිත කෙළෙම්. දර්ශන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යවේක්ෂණඥානය ද මට උපන. මාගේ අර්හත්ඵල විමුක්තිය අකෝප්‍ය වෙයි. මේ පශ්චිම වූ ස්කන්ධප්‍රවෘත්තිය වෙයි. දැන් පුනර්භවයෙක් නැතැ"යි.

රූපය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ රූපයාගේ ආස්වාද යැ'යි ප්‍රහාණ ප්‍රතිවේධය සමුදයසත්‍ය වෙයි. යම් රූපයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද මේ රූපයාගේ ආදීනව යැ'යි පරිඥාප්‍රතිවේධය දුඃඛසත්‍ය වෙයි. රූපයෙහි යම් ඡන්දරාගසංවරණයෙක් ඡන්දරාගයාගේ දුරු කිරීමෙක් වේ ද මේ රූපයාගේ නිස්සරණ යැ'යි සාක්ෂාත්ක්‍රියා ප්‍රතිවේධය නිරෝධසත්‍ය වේ. මේ තුන් තැන්හි යම් දෘෂ්ටියක් සඞ්කල්පයෙක් වචනයෙක් කර්මාන්තයෙක් ආජීවයෙක් ව්‍යායාමයෙක් ස්මෘතියක් සමාධියෙක් වේ ද (මේ මාර්ගභාවනා සඞ්ඛ්‍යාත) මාර්ගසත්‍යප්‍රතිවේධය මාර්ගසත්‍ය වේ.

වේදනාව පිණිස යම් (සුවයෙක්) ... සංඥාව පිණිස යම්... සංස්කාරයන් පිණිස යම් ... විඥානය පිණිස යම් සුවයෙක් සොම්නසෙක් උපදී ද මේ විඥානයාගේ ආස්වාදය'යි ප්‍රහාණප්‍රතිවේධය සමුදයසත්‍ය වෙයි. යම් විඥානයෙක් අනිත්‍ය දුඃඛ විපරිණාම ස්වභාව වේ ද මේ විඥානයාගේ ආදීනවය'යි පරිඥාප්‍රතිවේධය දුඃඛසත්‍ය වෙයි. විඥානයෙහි යම් ඡන්දරාගවිනයෙක් ඡන්දරාගප්‍රහාණයෙක් ඇද්ද මේ විඥානයාගේ නිස්සරණ යැ'යි සාක්ෂාත්ක්‍රියාප්‍රතිවේධය නිරෝධසත්‍යය වේ. මේ තුන්තැන්හි යම් දෘෂ්ටියක් සඞ්කල්පයෙක් වචනයෙක් කර්මාන්තයෙක් ආජීවයෙක් ව්‍යායාමයෙක් ස්මෘතියක් සමාධියෙක් වේ ද මේ භාවනාප්‍රතිවේධය මාර්ගසත්‍ය වේ.

සච්චන්ති.[1] කතිහාකාරෙහි සච්චං: එසනට්ඨෙන පරිග්ගහට්ඨෙන පටිවෙධට්ඨෙන.

කථං එසනට්ඨෙන සච්චං: ජරාමරණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං.

ජරාමරණං ජාතිනිදානං, ජාතිසමුදයං, ජාතිජාතිකං ජාතිප්පභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ජරාමරණඤ්ච පජානාති, ජරාමරණසමුදයඤ්ච පජානාති, ජරාමරණනිරොධඤ්ච පජානාති, ජරාමරණනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ජාති කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එසනට්ඨෙන සච්චං. ජාති භවනිදානා, භවසමුදයා, භවජාතිකා, භවප්පභවා'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ජාතිඤ්ච පජානාති, ජාතිසමුදයඤ්ච පජානාති, ජාතිනිරොධඤ්ච පජානාති, ජාතිනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

භවො කිංනිදානො. කිංසමුදයො, කිංජාතිකො කිංපභවො'ති එවං එසනට්ඨෙන සච්චං. භවො උපාදානනිදානො, උපාදානසමුදයො, උපාදාන-ජාතිකො, උපාදානප්පභවො'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං, භවඤ්ච පජානාති, භවසමුදයඤ්ච පජානාති, භවනිරොධඤ්ච පජානාති, භව-නිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති. එවං පටිවෙධට්ඨෙන සච්චං.

උපාදානං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං, උපාදානං තණ්හානිදානං තණ්හාසමුදයං තණ්හා-ජාතිකං, තණ්හාපභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. උපාදානඤ්ච පජානාති, උපාදානසමුදයඤ්ච පජානාති, උපාදානනිරොධඤ්ච පජානාති, උපාදානනිරොධගාමිනිං පටිපදඤ්ච පජානාති. එවං පටිවෙධට්ඨෙන සච්චං.

තණ්හා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවා'ති එවං එස-නට්ඨෙන සච්චං. තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා, වෙදනා ජාතිකා, වෙදනාපභවා'ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. තණ්හඤ්ච පජානාති, තණ්හා සමුදයඤ්ච පජානාති, තණ්හානිරොධඤ්ච පජානාති, තණ්හානිරොධගාමිනිං පටිපදඤ්ච[2] පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

1. 'සච්චන්ති' තාඩිපොත්ථකෙ න දිස්සති
2. ගාමිනිපටිපදඤ්ච - PTS.

කථං යනු: කිහි අයුරෙකින් සත්‍ය වෙයි යත්: එෂණාර්ථයෙන පරිග්‍රහාර්ථයෙන ප්‍රතිවෙධාර්ථයෙනි.

කිසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි යත්: ජරාමරණය කුමක් නිදාන කොට ඇත්තේ ද කුමක් සමුදය කොට ඇත්තේ ද කුමක් ජාති කොට ඇත්තේ ද කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ'යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි.

ජරාමරණය ජාතිය නිදාන කොට ඇත්තේ යැ, ජාතිය සමුදය කොට ඇත්තේ යැ, ජාතිය ජාති කොට ඇත්තේ යැ, ජාතිය ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ජරාමරණය ද දැනගනියි, ජරාමරණසමුදය ද දැනගනියි, ජරාමරණනිරොධය ද දැනගනියි, ජරාමරණනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවෙධාර්ථයෙන් සත්‍ය වේ.

ජාතිය කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. ජාතිය භවය නිදාන කොට ඇත්තී යැ, භවය සමුදය කොට ඇත්තී යැ, භවය ජාති කොට ඇත්තී යැ, භවය ප්‍රභව කොට ඇත්තී යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. ජාතිය ද දැනගනියි, ජාතිසමුදය ද දැනගනියි, ජාතිනිරොධය ද දැනගනියි, ජාතිනිරොධගාමිනී ප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවෙධාර්ථයෙන් සත්‍ය වේ.

භවය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි, භවය උපාදානය නිදාන කොට ඇත්තේ යැ, උපාදානය සමුදය කොට ඇත්තේ යැ, උපාදානය ජාති කොට ඇත්තේ යැ, උපාදානය ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි, භවය ද දැනගනියි, භවසමුදය ද දැනගනියි, භවනිරොධය ද දැනගනියි, භවනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවෙධාර්ථයෙන් සත්‍ය වේ.

උපාදානය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි, උපාදානය තෘෂ්ණාව නිදාන කොට ඇත්තේ යැ, තෘෂ්ණාව සමුදය කොට ඇත්තේ යැ, තෘෂ්ණාව ජාති කොට ඇත්තේ යැ, තෘෂ්ණාව ප්‍රභව කොට ඇත්තේ යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. උපාදානය ද දැනගනියි, උපාදානසමුදය ද දැනගනියි, උපාදාන නිරොධය ද දැනගනියි, උපාදානනිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවෙධාර්ථයෙන් සත්‍ය වේ.

තෘෂ්ණාව කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී දැ' යි මෙසෙයින් එෂණාර්ථයෙන් සත්‍ය වෙයි. තෘෂ්ණාව වෙදනාව නිදාන කොට ඇත්තී යැ, වෙදනාව සමුදය කොට ඇත්තී යැ, වෙදනාව ජාති කොට ඇත්තී යැ, වෙදනාව ප්‍රභව කොට ඇත්තී යැ' යි මෙසෙයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. තෘෂ්ණාව ද දැනගනියි, තෘෂ්ණාසමුදය ද දැනගනියි, තෘෂ්ණා නිරොධය ද දැනගනියි, තෘෂ්ණානිරොධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවෙධාර්ථයෙන් සත්‍ය වේ.

වෙදනා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එසනට්ඨෙන සච්චං, වෙදනා ඵස්සනිදානා ඵස්සසමුදයා, ඵස්සජාතිකා, ඵස්සපභවාති,[1] එවං පරිග්ගහට්ඨෙන සච්චං, වෙදනඤ්ච පජානාති, වෙදනාසමුදයඤ්ච පජානාති, වෙදනානිරොධඤ්ච පජානාති, වෙදනානිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ඵස්සො කිංනිදානො කිංසමුදයො, කිංජාතිකො, කිංපභවොති එවං එසනට්ඨෙන සච්චං. ඵස්සො සළායතනනිදානො, සළායතනසමුදයො, සළායතනජාතිකො, සළායතනපභවොති එවං පරිග්ගහට්ඨෙන සච්චං. ඵස්සඤ්ච පජානාති, ඵස්සසමුදයඤ්ච පජානාති, ඵස්සනිරොධඤ්ච පජානාති, ඵස්සනිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

සළායතනං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං. සළායතනං නාමරූපනිදානං’ නාමරූපසමුදයං, නාමරූපජාතිකං, නාමරූපපභවන්ති එවං පරිග්ගට්ඨෙන සච්චං. සළායතනඤ්ච පජානාති, සළායතනසමුදයඤ්ච පජානාති, සළායතනනිරොධඤ්ච පජානාති, සළායතනනිරෙධගාමිනීපටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

නාමරූපං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං. නාමරූපං විඤ්ඤාණනිදානං, විඤ්ඤාණසමුදයං, විඤ්ඤාණ ජාතිකං, විඤ්ඤාණපභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං. නාමරූපඤ්ච පජානාති, නාමරූපසමුදයඤ්ච පජානාති, නාමරූපනිරොධඤ්ච පජානාති, නාමරූපනිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

විඤ්ඤාණං කිංනිදානං, කිංසමුදයං, කිංජාතිකං, කිංපභවන්ති එවං එසනට්ඨෙන සච්චං. විඤ්ඤාණං සඞ්ඛාරනිදානං, සඞ්ඛාරසමුදයං, සඞ්ඛාරජාතිකං, සඞ්ඛාරපභවන්ති එවං පරිග්ගහට්ඨෙන සච්චං, විඤ්ඤාණඤ්ච පජානාති, විඤ්ඤාණසමුදයඤ්ච පජානාති, විඤ්ඤාණනිරොධඤ්ච පජානාති, විඤ්ඤාණනිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

1 .ඵස්සපපභවාති - මජසං.

වේදනාව කුමක් නිදාන කොට ඇත්තී ද, කුමක් සමුදය කොට ඇත්තී ද, කුමක් ජාති කොට ඇත්තී ද, කුමක් ප්‍රභව කොට ඇත්තී ද’ යි මෙසෙයින් එෂණාර්‍ථයෙන් සත්‍ය වෙයි. වේදනාව ස්පර්ශය නිදාන කොට ඇත්තී යැ, ස්පර්ශය සමුදය කොට ඇත්තී යැ, ස්පර්ශය ජාති කොට ඇත්තී යැ, ස්පර්ශය ප්‍රභව කොට ඇත්තී යැ’ යි මෙසෙයින් පරිග්‍රහාර්‍ථයෙන් සත්‍ය වෙයි. වේදනාව ද දැනගනියි, වේදනාසමුදය ද දැනගනියි, වේදනානිරෝධය ද දැනගනියි, වේදනානිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්‍ථයෙන් සත්‍ය වේ.

ස්පර්ශය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්‍ථයෙන් සත්‍ය වෙයි. ස්පර්ශය ෂඩායතනය නිදාන කොට ඇත්තේ යැ, ෂඩායතනය සමුදය කොට ඇත්තේ යැ, ෂඩායතනය ජාති කොට ඇත්තේ යැ, ෂඩායතනය ප්‍රභව කොට ඇත්තේ යැ’ යි මෙසෙයින් පරිග්‍රහාර්‍ථයෙන් සත්‍ය වෙයි. ස්පර්ශය ද දැනගනියි, ස්පර්ශසමුදය ද දැනගනියි, ස්පර්ශනිරෝධය ද දැනගනියි, ස්පර්ශනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්‍ථයෙන් සත්‍ය වේ.

ෂඩායතනය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්‍ථයෙන් සත්‍ය වෙයි. ෂඩායතනය නාමරූපය නිදාන කොට ඇත්තේ යැ, නාමරූපය සමුදය කොට ඇත්තේ යැ, නාමරූපය ජාති කොට ඇත්තේ යැ, නාමරූපය ප්‍රභව කොට ඇත්තේ යැ’ යි මෙසෙයින් පරිග්‍රහාර්‍ථයෙන් සත්‍ය වෙයි. ෂඩායතනය ද දැනගනියි, ෂඩායතනසමුදය ද දැනගනියි, ෂඩායතනනිරෝධය ද දැනගනියි, ෂඩායතන නිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්‍ථයෙන් සත්‍ය වේ.

නාමරූපය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්‍ථයෙන් සත්‍ය වෙයි. නාමරූපය විඥානය නිදාන කොට ඇත්තේ යැ, විඥානය සමුදය කොට ඇත්තේ යැ, විඥානය ජාති කොට ඇත්තේ යැ, විඥානය ප්‍රභව කොට ඇත්තේ යැ’ යි මෙසෙයින් පරිග්‍රහාර්‍ථයෙන් සත්‍ය වෙයි. නාමරූපය ද දැනගනියි, නාමරූපසමුදය ද දැනගනියි, නාමරූපනිරෝධය ද දැනගනියි, නාමරූපනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්‍ථයෙන් සත්‍ය වේ.

විඥානය කුමක් නිදාන කොට ඇත්තේ ද, කුමක් සමුදය කොට ඇත්තේ ද, කුමක් ජාති කොට ඇත්තේ ද, කුමක් ප්‍රභව කොට ඇත්තේ ද’ යි මෙසෙයින් එෂණාර්‍ථයෙන් සත්‍ය වෙයි. විඥානය සංස්කාරයන් නිදාන කොට ඇත්තේ යැ, සංස්කාරයන් සමුදය කොට ඇත්තේ යැ, සංස්කාරයන් ජාති කොට ඇත්තේ යැ, සංස්කාරයන් ප්‍රභව කොට ඇත්තේ යැ’ යි මෙසෙයින් පරිග්‍රහාර්‍ථයෙන් සත්‍ය වෙයි. විඥානය ද දැනගනියි, විඥානසමුදය ද දැනගනියි, විඥානනිරෝධය ද දැනගනියි, විඥානනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසෙයින් ප්‍රතිවේධාර්‍ථයෙන් සත්‍ය වේ.

සඞ්ඛාරා කිංනිදානා, කිංසමුදයා, කිංජාතිකා, කිංපභවාති එවං එසනට්ඨෙන සච්චං. සඞ්ඛාරා අවිජ්ජානිදානා, අවිජ්ජාසමුදයා, අවිජ්ජාජාතිකා, අවිජ්ජාපභවාති එවං පරිග්ගහට්ඨෙන සච්චං. සඞ්ඛාරෙ ච පජානාති, සඞ්ඛාරසමුදයඤ්ච පජානාති, සඞ්ඛාරනිරොධඤ්ච පජානාති, සඞ්ඛාරනිරොධගාමිනී පටිපදඤ්ච පජානාති, එවං පටිවෙධට්ඨෙන සච්චං.

ජරාමරණං දුක්ඛසච්චං, ජාතිසමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා[1] මග්ගසච්චං, ජාති දුක්ඛසච්චං, භවො සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. භවො දුක්ඛසච්චං, උපාදානං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. උපාදානං දුක්ඛසච්චං, තණ්හා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. තණ්හා දුක්ඛසච්චං වෙදනා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. වෙදනා දුක්ඛසච්චං, ඵස්සො සමුදයසච්චං උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. ඵස්සො දුක්ඛසච්චං, සළායතනං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. සළායතනං දුක්ඛසච්චං, නාමරූපං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. නාමරූපං දුක්ඛසච්චං, විඤ්ඤාණං සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. විඤ්ඤාණං දුක්ඛසච්චං, සඞ්ඛාරා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. සඞ්ඛාරා දුක්ඛසච්චං, අවිජ්ජා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං.

ජරාමරණං දුක්ඛසච්චං, ජාති සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං,[2] උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං. ජාති දුක්ඛසච්චං, භවො සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චං -පෙ- සඞ්ඛාරා දුක්ඛසච්චං, අවිජ්ජා සියා දුක්ඛසච්චං, සියා සමුදයසච්චං, උභින්නම්පි නිස්සරණං නිරොධසච්චං, නිරොධපජානනා මග්ගසච්චන්ති.[3]

සච්චකථා සමත්තා.

භාණවාරං.

1 නිරොධප්පජානනා - මජසං, ස්‍යා 2. ජරාමරණං සියා දුක්ඛසච්චං සියා සමුදයසච්චං - මජසං. ජරාමරණං දුක්ඛසච්චං සියා සමුදයසං - සී 3 'සඞ්ඛාරා දුක්ඛසච්චං' යාවපරියොසානා - මජසං - කත්ථචි සීහලපොත්ථකෙසු ච න දිස්සති

සංස්කාරයෝ කුමක් නිදාන කොට ඇත්තාහු ද, කුමක් සමුදය කොට ඇත්තාහු ද, කුමක් ජාති කොට ඇත්තාහු ද, කුමක් ප්‍රභව කොට ඇත්තාහු ද' යි මෙසේයින් එළඹීමාර්ථයෙන් සත්‍ය වෙයි. සංස්කාරයෝ අවිද්‍යාව නිදාන කොට ඇත්තාහු යෑ, අවිද්‍යාව සමුදය කොට ඇත්තාහු යෑ, අවිද්‍යාව ජාති කොට ඇත්තාහු යෑ, අවිද්‍යාව ප්‍රභව කොට ඇත්තාහු යෑ' යි මෙසේයින් පරිග්‍රහාර්ථයෙන් සත්‍ය වෙයි. සංස්කාරයන් ද දැනගනියි, සංස්කාරසමුදය ද දැනගනියි, සංස්කාරනිරෝධය ද දැනගනියි, සංස්කාරනිරෝධගාමිනීප්‍රතිපදාව ද දැනගනී. මෙසේයින් ප්‍රතිවේධාර්ථයෙන් සත්‍ය වේ.

ජරාමරණය දුඃඛසත්‍ය යෑ, ජාතිය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, (ආලම්බනකරණයෙන්) නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ජාතිය දුඃඛසත්‍ය යෑ, භවය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. භවය දුඃඛසත්‍ය යෑ, උපාදානය සමුදය සත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. උපාදානය දුඃඛ සත්‍ය යෑ, තෘෂ්ණාව සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධ සත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. තෘෂ්ණාව දුඃඛසත්‍ය යෑ, වේදනාව සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. වේදනාව දුඃඛසත්‍ය යෑ, ස්පර්ශය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ස්පර්ශය දුඃඛසත්‍ය යෑ, ෂඩායතනය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ෂඩායතනය දුඃඛසත්‍ය යෑ, නාමරූපය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. නාමරූපය දුඃඛසත්‍ය යෑ, විඥානය සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. විඥානය දුඃඛසත්‍ය යෑ, සංස්කාරයෝ සමුදයසත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. සංස්කාරයෝ දුඃඛසත්‍ය යෑ, අවිද්‍යාව සමුදය සත්‍ය යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි.

ජරාමරණය දුඃඛසත්‍ය යෑ, ජාතිය දුඃඛසත්‍ය ද වන්නේ යෑ, සමුදය සත්‍ය ද වන්නේ යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යි. ජාතිය දුඃඛසත්‍ය යෑ, භවය දුඃඛසත්‍ය ද වන්නේ යෑ, සමුදයසත්‍ය ද වන්නේ යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යෑ ... සංස්කාරයෝ දුඃඛසත්‍ය යෑ, අවිද්‍යාව දුඃඛසත්‍ය ද වන්නේ යෑ, සමුදයසත්‍ය ද වන්නේ යෑ, දෙදෙනාගේ මෑ නිස්සරණය නිරෝධසත්‍ය යෑ, නිරෝධය දැනගැනීම මාර්ගසත්‍ය යයි.

සත්‍යකථා නිමි.

බණවරෙකි.

## 2. 3

# බොජ්ඣඞ්ගකථා

[ සංවණ්ණනිදානං: ]

'සත්තිමෙ භික්ඛවෙ බොජ්ඣඞ්ගා. කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො විරියසම්බොජ්ඣඞ්ගො පීතිසම්බොජ්ඣඞ්ගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො සමාධිසම්බොජ්ඣඞ්ගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො භික්ඛවෙ සත්ත බොජ්ඣඞ්ගා.[a]

**බොජ්ඣඞ්ගාති** කෙනට්ඨෙන බොජ්ඣඞ්ගා, බොධාය[1] සංවත්තන්තීති බොජ්ඣඞ්ගා, බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනුබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිබුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සම්බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

බුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බුජ්ඣනට්ඨෙන බොජ්ඣඞ්ගා.

බොධෙන්තීති බොජ්ඣඞ්ගා, අනුබොධෙන්තීති බොජ්ඣඞ්ගා, පටිබොධෙන්තීති බොජ්ඣඞ්ගා, සම්බොධෙන්තීති බොජ්ඣඞ්ගා.

බොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබොධනට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බොධනට්ඨෙන බොජ්ඣඞ්ගා.

බොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනුබොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, පටිබොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා, සම්බොධිපක්ඛියට්ඨෙන බොජ්ඣඞ්ගා.

බුද්ධිලාභට්ඨෙන[2] බොජ්ඣඞ්ගා බුද්ධිපටිලාභට්ඨෙන[3] බොජ්ඣඞ්ගා, බුද්ධිරොපනට්ඨෙන බොජ්ඣඞ්ගා, බුද්ධිඅභිරොපනට්ඨෙන බොජ්ඣඞ්ගා, බුද්ධිපාපනට්ඨෙන[4] බොජ්ඣඞ්ගා, බුද්ධිසම්පාපනට්ඨෙන බොජ්ඣඞ්ගා.

මූලට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපරිපූරට්ඨෙන[5] බොජ්ඣඞ්ගා, මූලපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

හෙතුට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, හෙතුපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

---

a බොජ්ඣඞ්ගසංයුත්ත

1 බොධියා - සයා

2 බුද්ධිලාභනට්ඨෙන - මජසං, ස.

3 බුද්ධිපටිලාභනට්ඨෙන - මජසං,

4 පාපුණනට්ඨෙන - මජසං. ස. පාපනට්ඨෙන - සී

5 පරිපූරනට්ඨෙන - මජසං, ස.

# 2. 3

# බොධ්‍යඞ්ග කථා

[ සැවැත්නිදාන යි: ]

‘මහණෙනි, මේ බොධ්‍යඞ්ගයෝ සත් දෙනෙකි: කවර සත්දෙනෙකැ යත්: ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යැ වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යැ ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යැ ප්‍රශ්‍රබ්ධි සම්බොධ්‍යඞ්ග යැ සමාධිසම්බොධ්‍යඞ්ග යැ උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ග යි. මහණෙනි, මොහු සත්දෙන බොධ්‍යඞ්ගයෝ යි.

බොජ්ඣඞ්ගා යනු කවර අරුතින් බොධ්‍යඞ්ග වෙති යත්: අවබොධය පිණිස පවතිත් නු’යි බොධ්‍යඞ්ග යැ අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, අනුබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, මොනොවට අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

අවබොධ කිරීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධ කිරීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කිරීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධ කිරීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යි.

අවබොධ කරවත් නු’යි බොධ්‍යඞ්ග යැ, අනුබොධ කරවත් නු’යි බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කරවත් නු’ යි බොධ්‍යඞ්ග යැ සම්බොධය කරවත් නු’යි බොධ්‍යඞ්ග යි.

අවබොධ කරවීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධ කරවීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධ කරවීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධ කරවීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යි.

බොධිපාක්‍ෂිකාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, අනුබොධිපාක්‍ෂිකාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, ප්‍රතිබොධිපාක්‍ෂිකාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, සම්බොධිපාක්‍ෂි-කාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යි.

බුද්ධිලාභාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිප්‍රතිලාභාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිප්‍රතිෂ්ඨාපනාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිඅභිරොපණාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිපාපුණනාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, බුද්ධිසම්පාපුණ-නාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යි.

මූලාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මුල් වැ පවත්නා අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිග්‍රහාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිවාරාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලපරිපූරාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, (නිෂ්ඨාවට පැමිණීම් වශයෙන්) මූල-පරිපාකාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූල ප්‍රතිසංවිදර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූල ප්‍රතිසංවිදාවට පැමිණවීම් අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිද්ධි වශීභාවාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්-ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

(ජනක බැවින්) හේත්වර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු විසින් පවත්නා අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිග්‍රහාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිවාරාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිපූරාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු පරිපාකාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිදර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිදාවට පමුණුවන අර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිද්ධි වශීභාවාර්‍ථයෙන් බොධ්‍යඞ්ග යැ, හේතු ප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති,

පච්චයට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, පච්චයපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

විසුද්ධට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විසුද්ධිපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

අනවජ්ජට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජ පරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනවජ්ජපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

නෙක්ඛම්මට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

විමුත්තට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා විමුත්තිපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විමුත්තිපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

අනාසවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, අනාසවපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

(උපස්ථම්භක බැවින්) ප්‍රත්‍යයාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යය වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යය පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යයප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන් ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විශුද්ධ්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධ වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විශුද්ධිප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

අනවද්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍යපරිග්‍රහායෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය පරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍යපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍යප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනවද්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

නෛෂ්ක්‍රම්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍යපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍යපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය පරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය පරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍යප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, නෛෂ්ක්‍රම්‍ය ප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විමුක්ත්‍යාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්ති විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්ති පරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්තිපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ විමුක්තිපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්තිපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්ති ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්ති ප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්තිප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, විමුක්තිප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

අනාස්‍රවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රව වැ පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවපරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවප්‍රතිසංවිදවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ අනාස්‍රවප්‍රතිසංවිද්හි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවප්‍රතිසංවිද්හි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙති.

විවෙකට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, විවෙකපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

වොස්සග්ගට්ඨෙන[1], බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිග්ගහට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිවාරට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිපූරට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපරිපාකට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාපාපනට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාය වසීභාවට්ඨෙන බොජ්ඣඞ්ගා, වොස්සග්ගපටිසම්භිදාය වසීභාවප්පත්තානම්පි බොජ්ඣඞ්ගා.

මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පච්චයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසුද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනවජ්ජට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

මූලචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පච්චයචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසුද්ධිචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනවජ්ජචරියට්ඨං, බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නෙක්ඛම්මචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

මූලපරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිපූරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, -පෙ- වොස්සග්ගපරිපූරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපරිපාකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපරිපාකට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාපාපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදාපාපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මූලපටිසම්භිදාය වසීභාවට්ඨං[4] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වොස්සග්ගපටිසම්භිදාය වසීභාවට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

1. වොසග්ගට්ඨෙන - මජසං,
2. හෙතට්ඨං - සයා
3. වොසග්ගට්ඨං - මජසං.
4. වසීභාවතට්ඨං - PTS

විවෙකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක පරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක ප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකප්‍රතිසංවිදාවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙක ප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, විවෙකප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ග වෙති.

ව්‍යවසර්ග(හැරලීම්) අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග විසින් පවත්නා අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිග්‍රහාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග පරිවාරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිපූරාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගපරිපාකාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගප්‍රතිසංවිදර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග ප්‍රතිසංවිදාවට පමුණුවන අර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ග ප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථයෙන් බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගප්‍රතිසංවිද්ධි වශීභාවයට පැමිණියවුන්ගේ ද බොධ්‍යඞ්ගයෝ වෙත්.

මූලාර්ථය (මූලස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, හෙත්වර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විශුද්ධ්‍යර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනවද්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විමුක්ත්‍යර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විවෙකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

මූලචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, හෙතුචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රත්‍යයචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විශුද්ධිචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් න' යි බොධ්‍යඞ්ග යැ, අනවද්‍යචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, නෛෂ්ක්‍රම්‍යචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විමුක්තිචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනාස්‍රවචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විවෙකචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ව්‍යවසර්ගචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

මූලපරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලපරිපාකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගපරිපාකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මූලප්‍රතිසංවිදර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගප්‍රතිසංවිදර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. මූලප්‍රතිසංවිදාවට පමුණුවන අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ .. ව්‍යවසර්ගප්‍රතිසංවිදාවට පමුණුවන අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. මූලප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ව්‍යවසර්ගප්‍රතිසංවිද්ධි වශීභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

පරිග්ගහට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිවාරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිපූරට්ඨෙන[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකග්ගට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පග්ගහට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවිසාරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාවිලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනිඤ්ජනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තුපට්ඨානවසෙන චිත්තස්ස ඨිතට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආරම්මණට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ගොචරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පහානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිච්චාගට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වුට්ඨානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවට්ටනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සන්තට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පණීතට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනාසවට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, තරණට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනිමිත්තට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අප්පණිහිතට්ඨෙන බුජ්ඣන්තීති, බොජ්ඣඞ්ගා, සුඤ්ඤතට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකරසට්ඨෙන බුජ්ඣන්තීති, බොජ්ඣඞ්ගා, අනතිවත්තනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා යුගනද්ධට්ඨෙන[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිය්‍යානට්ඨෙන[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, හෙතුට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දස්සනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආධිපතෙය්‍යට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සමථස්ස අවික්ඛෙපට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විපස්සනාය අනුපස්සනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමථවිපස්සනානං එකරසට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, යුගනද්ධස්ස අනතිවත්තනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සික්ඛාය සමාදානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආරම්මණස්ස ගොචරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා ලීනස්ස චිත්තස්ස පග්ගහට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උද්ධතස්ස චිත්තස්ස නිග්ගහට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උභොවිසුද්ධානං අජ්ඣුපෙක්ඛනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විසෙසාධිගමට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උත්තරි පටිවෙධට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චාභිසමයට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන[4] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

1. පරිපූරණට්ඨෙන - මජසං,
2. යුගනන්ධට්ඨෙන - PTS.
3. නිය්‍යානිකට්ඨෙන - සී.
4. නිරොධපතිට්ඨාපනට්ඨෙන - PTS,

පරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, පරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, පරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, එකාග්‍රාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අවික්ෂෙපාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අවිසාරාර්ථය (නො විසිරෙන සවභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අනාවිලාර්ථය (නො කැලැඹුණු සවභාවය) අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, (අවිකම්පිත බැවින්) අනිඤ්ජනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි පිහිටීම් වශයෙන් චිත්තයාගේ ස්ථිතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ආලම්බනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ගොචරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රහාණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, පරිත්‍යාගාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ව්‍යුත්ථානාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, විවර්තන (නවත්නා) අර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ශාන්තාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ප්‍රණීතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, විමුක්තාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අනාස්‍රවාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ තරණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අනිමිත්තාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අප්‍රණිහිතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ශූන්‍යතාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, එකරසාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, අනතිවර්තනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, යුගනද්ධාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, නිර්යාණාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, හෙත්වර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, දර්ශනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ආධිපත්‍යාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ශමථයාගේ අවික්ෂෙපසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, විදර්ශනාවගේ අනුදර්ශනසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ශමථවිදර්ශනාවන්ගේ එකරසසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, යුගනද්ධයාගේ (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

ශික්ෂාවගේ සමාදානසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ආලම්බනයාගේ ගොචරසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, ලීන (හැකිළුණු) චිත්තයාගේ ප්‍රග්‍රහසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, උද්ධතචිත්තයාගේ නිග්‍රහසවභාවය අවබොධ කෙරෙත් නු, යි බොධ්‍යඞ්ග යෑ, ලීනොද්ධත දෙකින් විශුද්ධ වූ චිත්තයන්ගේ (ප්‍රග්‍රහනිග්‍රහ දෙක්හි සව්‍යාපාරභාව සඞ්ඛ්‍යාත) අධ්‍යුපෙක්ෂණසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, විශෙෂාධිගමසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, (ආර්‍ය්‍යමාර්ගය පහළවීම් වශයෙන්) මත්තෙහි ප්‍රතිවෙධසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, සත්‍යප්‍රතිවෙධසවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යෑ, නිරොධයෙහි පිහිටුවන සවභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යි.

සද්ධින්ද්‍රියස්ස අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සද්ධාබලස්ස අස්සද්ධියෙ අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පඤ්ඤාබලස්ස අවිජ්ජාය අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සතිසම්බොජ්ඣඞ්ගස්ස උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගස්ස පටිසඞ්ඛානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සම්මාදිට්ඨියා දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- සම්මාසමාධිස්ස අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ඉන්ද්‍රියානං ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, බලානං අකම්පියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, බොජ්ඣඞ්ගානං[1] නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මග්ගස්ස හෙතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සතිපට්ඨානානං උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සම්මප්පධානානං පදහනට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඉද්ධිපාදානං ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චානං තථට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මග්ගානං[3] පටිප්පස්සද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵලානං සච්ඡිකිරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා[4]

විතක්කස්ස අභිනිරොපනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විචාරස්ස උපවිචාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පීතියා ඵරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සුඛස්ස අභිසන්දනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස එකග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ආවජ්ජනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සඤ්ජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකොදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අභිඤ්ඤාය ඤාතට්ඨං[5] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිඤ්ඤාය තීරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පහානස්ස පරිච්චාගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, භාවනාය එකරසට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්ඡිකිරියාය ඵස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඛන්ධානං ඛන්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධාතූනං ධාතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආයතනානං ආයතනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සඞ්ඛතානං සඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

1 'බොජ්ඣඞ්ගානං' පාඨොයං - PTS කත්ථචි සීහලක්ඛර පොත්ථකෙසු ච න දිස්සති

2 පදහනට්ඨං - PTS සී 1. 3 පයොගානං - ස්‍යා PTS, පධානානං - සී

4 එත්ථ පඤ්ඤාය පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා'ති - PTS. කත්ථචි සීහල පොත්ථකෙසු දිස්සති. 5 අභිඤ්ඤෙය්‍යට්ඨං - ස්‍යා

ශ්‍රද්ධෙන්ද්‍රියයාගේ අධිමොක්ෂස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ප්‍රඥෙන්ද්‍රියයාගේ දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. ශ්‍රද්ධාබලයාගේ අශ්‍රද්ධායෙහි නො සැලෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... ප්‍රඥාබලයාගේ අවිද්‍යායෙහි නො සැලෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. ස්මෘති-සම්බොධ්‍යඞ්ගයාගේ උපස්ථානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගයාගේ පටිසඞ්ඛාන (සමවාහිතලක්ෂණ) ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. සම්‍යග්දෘෂ්ටිහුගේ දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ .. සම්‍යක්සමාධිහුගේ අවික්ෂෙප ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

ඉන්ද්‍රියයන්ගේ අධිපතිභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, බලයන්ගේ අකම්ප්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, බොධ්‍යඞ්ගයන්ගේ නිර්‍යාණාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මාර්ගයාගේ හෙත්වර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සතිපට්ඨාන-යන්ගේ උපස්ථානාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සම්‍යක්-ප්‍රධානයන්ගේ ප්‍රදහනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඍද්ධිපාදයන්ගේ සමෘද්ධ වන අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සත්‍යයන්ගේ යථාස්වභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, මාර්ගයන්ගේ ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඵලයන්ගේ සාක්ෂාත්ක්‍රියාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

විතර්කයාගේ අභිනිරොපණාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විචාරයාගේ අනුමාර්ජනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රීතියගේ පැතිරීම් අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සුඛයාගේ අභිසන්දන (තෙමීම) අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ එකාග්‍රාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

ආවර්ජනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විජානනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රජානනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සඤ්ජානනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, එකොදයාර්ථය (අග්‍ර වැ උපදනා ස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

අභිඥායෙහි ඥාතාර්ථය (ස්වභාවජානනාර්ථය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, පරිඥායෙහි තීරණාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රහාණයාගේ පරිත්‍යාගාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, භාවනායෙහි එකරසාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සාක්ෂාත්ක්‍රියායෙහි විඳනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ස්කන්ධයන්ගේ (පීඩාභාවාදි) ස්කන්ධාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ධාතූන්ගේ (ශූන්‍යතාදි) ධාත්වර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ආයතනයන්ගේ ආයතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සඞ්ඛතයන්ගේ සඞ්ඛතඅර්ථය (ප්‍රත්‍යයන් එක් වැ කරනලද ස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අසඞ්ඛත-යාගේ අසඞ්ඛත අර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

චිත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තානන්තරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස වුට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස විවට්ටනට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස හෙතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස පච්චයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස වත්ථුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස භුම්මට්ඨං[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ආරම්මණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ගොචරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස චරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස ගතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස අභිනීහාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, චිත්තස්ස නිස්සරණට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

එකත්තෙ ආවජ්ජනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ විජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සඤ්ජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ එකොදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ උපනිබන්ධනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පක්ඛන්දනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පසීදනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සන්තිට්ඨනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ විමුච්චනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ 'එතං සන්ත'න්ති පස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ යානීකතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ වත්ථුකතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ අනුට්ඨිතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිචිතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුසමාරද්ධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිවාරට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ පරිපූරට්ඨං[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සමොධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ අධිට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ ආසෙවනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ භාවනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ බහුලීකම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුසමුග්ගතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙ සුවිමුත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා,

1 විජානනට්ඨං - PTS
2 භුම්මට්ඨං - මජසං
3 පරිපූරණට්ඨං - මජසං

(අරමුණු සිතීම් ආදී) චිත්ත ස්වභාවය අවබොධ කෙරෙත්’නුයි බොධ්‍යඞ්ග යැ, චිත්තානන්තර්‍ය්‍ය ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ ව්‍යුත්ථාන ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ විවර්තන ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ හෙතු ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ ප්‍රත්‍යයස්වභාව ය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ වස්තුස්වභාවය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ (කාමාවචරාදී) භූම්‍යර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ ආලම්බනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ ගොචරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ චර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ (දූරසන්තිකාලම්බනග්‍රහණවශයෙන්) ගතාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ අභිනීහාරාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ චිත්තයාගේ නිර්‍ය්‍යාණාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, චිත්තයාගේ නිස්සරණාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යි.

එකාලම්බනයෙහි ආවර්ජන ස්වභාවය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි විජානනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි ප්‍රජානනාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි සඤ්ජානනාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි එකොදයාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි උපනිබන්ධනාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ එකාලම්බනයෙහි ප්‍රස්කන්දනාර්ථය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පැහැදීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි අව්‍යාපාරභාවයෙන් පිහිටීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි මිදීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි තෙල ශාන්තය’යි දක්නා ස්වභාවය අවබොධ කෙරෙත් නු’යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බයෙහි යුක්තයානයක් මෙන් කරනලද ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පිහිටීමට වස්තුවක් මෙන් කරන ලද ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි එලඹසිටි ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි හාත්පසින් රැස්කරනලද ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි සුසමාරබ්ධ ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පරිග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පරිවාරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පරිපූරාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි සමවධානාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි අධිෂ්ඨානාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි ආසෙවනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි භාවනාර්ථය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි පුනපුනා කිරීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි සුසමුත්පිතස්වභාවය අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ, එකාලම්බනයෙහි සුවිමුක්තස්වභාව අවබොධ කෙරෙත් නු’ යි බොධ්‍යඞ්ග යැ,

එකත්තෙන බුජ්ඣනට්ඨෙන[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබුජ්ඣනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබුජ්ඣනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බුජ්ඣනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන බොධනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබොධනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබොධනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බොධනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන බොධිපක්ඛියට්ඨෙන[2] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුබොධිපක්ඛියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිබොධිපක්ඛියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සම්බොධිපක්ඛියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන ජොතනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන උජ්ජොතනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන අනුජොතනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන පටිජොතනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකත්තෙන සඤ්ජොතනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

පකාසනට්ඨෙන[3] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරොචනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, කිලෙසානං සන්තාපනට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අමලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිම්මලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමයට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විවෙකචරියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරාගට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විරාගචරියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධචරියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වොස්සග්ගචරියට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිචරියට්ඨෙන බුජ්ඣන්තති බොජ්ඣඞ්ගා.

1 බුජ්ඣනට්ඨෙ - PTS 2 බොධිපක්ඛියට්ඨෙ - මජසං ස්‍යා PTS

3 පතාපනට්ඨෙ - මජසං ස්‍යා PTS වීමංසාය ඡන්දට්ඨෙ .... නිරොධට්ඨෙ ... ස්‍යා පභාසනට්ඨෙ — නිරොධට්ඨෙ ..., - PTS අධිකපදානි දිස්සන්ති

එකාලම්බනයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) බොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (සකෘදාගාමිමාර්ග බොධ්‍යඞ්ගයන්ගේ) අනුබොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අනාගාමිමාර්ගබොධ්‍යඞ්ගයන්ගේ) ප්‍රතිබොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අර්හත්මාර්ග-බොධ්‍යඞ්ගයන්ගේ) සම්බොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි බොධනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අනුබොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ප්‍රතිබොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි සම්බොධනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි බොධිපාක්ෂිකාර්ථය (බොධිපක්ෂයෙහි වූ ස්වභාවය) අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි අනුබොධි-පාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි ප්‍රතිබොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකා-ලම්බනයෙහි සම්බොධිපාක්ෂිකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (විදර්ශනාප්‍රඥා විසින්) ද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (ශ්‍රොතාපත්තිමාර්ගප්‍රඥා විසින්) උද්‍යොත-නාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (සකෘද-ගාමිමාර්ගප්‍රඥා විසින්) අනුද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අනාගාමිමාර්ගඥාන විසින්) ප්‍රතිද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, එකාලම්බනයෙහි (අර්හත්මාර්ගඥාන විසින්) සන්ද්‍යොතනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

(ආර්‍ය්‍යමාර්ගයාගේ) ප්‍රකාශනාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (ප්‍රභාස්වර බැවින්) බැබැලීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, කෙලශයන් තවන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, අමලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (සම්ප්‍රයුක්ත මලාභාවයෙන්) විමලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (අරමුණු කිරීම් මල නැති බැවින්) නිර්මලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, සමාර්ථය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යෑ, (කෙලශප්‍රහාණාර්ථයෙන්) සමයාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විවෙකාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විවෙකචර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විරාගස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, විරාගසඞ්ඛ්‍යාත නිර්වාණයෙහි හැසිරෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, නිරොධ ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, නිරොධසඞ්ඛ්‍යාතනිර්වාණ-යෙහි හැසිරෙනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ව්‍යොස්සග්ගස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, ව්‍යොස්සග්ගභාවයෙන් හැසිරෙන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (සමුච්ඡෙද විමුක්ති බැවින්) විමුක්තිස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යෑ, (නිස්සරණ) විමුක්තියෙහි හැසිරීම් ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

ඡන්දට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පාදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඡන්දස්ස දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

විරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- චිත්තට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- වීමංසට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය මූලට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය පාදට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. වීමංසාය පධානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය ඉජ්ඣනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය අධිමොක්ඛට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය පග්ගහට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය උපට්ඨානට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වීමංසාය අවික්ඛෙපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා වීමංසාය දස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

*දුක්ඛස්ස පීළනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස සඞ්ඛතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස සන්තාපට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දුක්ඛස්ස විපරිණාමට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. සමුදයස්ස ආයූහනට්ඨං -පෙ- නිදානට්ඨං -පෙ- සඤ්ඤොගට්ඨං -පෙ- පලිබොධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිරොධස්ස නිස්සරණට්ඨං -පෙ- විවෙකට්ඨං -පෙ- අසඞ්ඛතට්ඨං -පෙ- අමතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. මග්ගස්ස නිය්‍යානට්ඨං -පෙ- හෙතුට්ඨං -පෙ- දස්සනට්ඨං -පෙ- ආධිපතෙය්‍යට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

තථට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනත්තට්ඨං[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්චට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිවෙධට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අභිජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිජානනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධම්මට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධාතුට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඤාතට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සච්ඡිකිරියට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵස්සනට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අභිසමයට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

---

* සච්චානං තථලක්ඛණවසෙන නිද්දිට්ඨෙ සොළසකෙ 'දුක්ඛට්ඨං- සමුදයට්ඨං-නිරොධට්ඨං- මග්ගට්ඨං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා'ති - මජසං. පොත්ථකෙ පඤ්ඤත්තං පදචතුක්කං අඤ්ඤත්ථ න දිස්සති, අට්ඨකථායපි න සමෙති.

1. අනඤ්ඤථට්ඨං - PTS

(කර්තුකාම්‍යතා සඞ්ඛ්‍යාත) ඡන්දාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ; ඡන්දයාගේ මූලාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ ප්‍රතිෂ්ඨාස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ ප්‍රධානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ සමෘද්ධ වන ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ (ශ්‍රද්ධාසම්ප්‍රයොගයෙන්) අධිමොක්ෂස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ (වීර්‍ය්‍යසම්ප්‍රයොගයෙන්) ප්‍රග්‍රහාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ (ස්මෘතිසම්ප්‍රයොගයෙන්) උපස්ථානාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ (සමාධිසම්ප්‍රයොගයෙන්) අවික්ෂෙපාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඡන්දයාගේ (ප්‍රඥාසම්ප්‍රයොගයෙන්) දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

වීර්‍ය්‍යාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ... චිත්තාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ ... වීමංසාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි මූලස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි ප්‍රතිෂ්ඨාස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, විමංසායෙහි ප්‍රධානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි සමෘද්ධ වන ස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි අධිමොක්ෂස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි ප්‍රග්‍රහස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි උපස්ථානස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි අවික්ෂෙපස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, වීමංසායෙහි දර්ශනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

දුඃඛයාගේ පීඩනස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, දුඃඛයාගේ සඞ්ඛතස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, දුඃඛයාගේ සන්තාපස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, දුඃඛයාගේ විපරිණාමස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සමුදයාගේ ආයූහනස්වභාවය ... නිදානස්වභාවය ... සංයොගස්වභාවය ... පලිබොධස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. නිරොධයාගේ නිස්සරණස්වභාවය ... විවෙකස්වභාවය ... අසඞ්ඛතස්වභාවය ... අමෘත ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ. මාර්ගයාගේ නිර්‍ය්‍යාණ ස්වභාවය ... හෙතුස්වභාවය ... දර්ශනස්වභාවය ... ආධිපත්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

(හැම ධර්මයන්ගේ) යථාස්වභාවාර්ථය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, අනාත්මස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සත්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ප්‍රතිවෙධ කළයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ස්වභාව විසින් දතයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, පිරිසිඳ දතයුතු ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, (ස්වභාවධාරණාදි) ධර්මස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, (ශූන්‍යතාදි) ධාතුස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ඥාත (දතහැකි) ස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, සාක්ෂාත්කර්තව්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යැ, ස්පර්ශව්‍යස්වභාවය අවබොධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, අභිසමයස්වභාවය අවබොධ කෙරෙත් නු' යි බොධ්‍යඞ්ග යි.

නෙක්ඛම්මං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අබ්‍යාපාදං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ආලොකසඤ්ඤං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ධම්මවවත්ථානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පාමොජ්ජං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

පඨමං ඣානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. අනිච්චානුපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- සොතාපත්තිමග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අරහත්තමග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අරහත්තඵලසමාපත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අධිමොක්ඛට්ඨෙන සද්ධින්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- දස්සනට්ඨෙන පඤ්ඤින්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. උපට්ඨානට්ඨෙන සතිසම්බොජ්ඣඞ්ග බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- පටිසඞ්ඛානට්ඨෙන උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා. දස්සනට්ඨෙන සම්මාදිට්ඨිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අකම්පියට්ඨෙන බලං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා බුජ්ඣන්තීති[1] බොජ්ඣඞ්ගා, හෙතුට්ඨෙන මග්ගං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පදහනට්ඨෙන සම්මප්පධානං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, තථට්ඨෙන සච්චං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

අවික්ඛෙපට්ඨෙන සමථං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනුපස්සනට්ඨෙන විපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, එකරසට්ඨෙන සමථවිපස්සනං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

සංවරට්ඨෙන සීලවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මුත්තට්ඨෙන විමොක්ඛං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිවෙධට්ඨෙන විජ්ජං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පරිච්චාගට්ඨෙන විමුත්තිං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

1 නිය්‍යානට්ඨං බුජ්ඣන්තීති - සබ්බත්ථ

නෛෂ්ක්‍රම්‍යය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, අව්‍යාපාදය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, අලෝකසංඥාව අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, අවික්ෂේපය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, ධර්මනිශ්චය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, ඥානය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, ප්‍රාමෝද්‍යය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යි.

ප්‍රථමධ්‍යානය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... නෛවසංඥානාසංඥායතනසමාපත්තිය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ. අනිත්‍යතානුදර්ශනය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... ස්‍රෝතාපත්තිමාර්ගය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... අර්හත්මාර්ගය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, අර්හත්ඵලසමාපත්තිය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යි.

අධිමෝක්ෂාර්ථයෙන් ශ්‍රද්ධේන්ද්‍රියය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... දර්ශනාර්ථයෙන් ප්‍රඥේන්ද්‍රියය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ. අශ්‍රද්ධායෙහි අකම්ප්‍යාර්ථයෙන් ශ්‍රද්ධාබලය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... අවිද්‍යායෙහි අකම්ප්‍යාර්ථයෙන් ප්‍රඥාබලය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ. උපස්ථානාර්ථයෙන් ස්මෘතිසම්බෝධ්‍යඞ්ගය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... සමවාහිතස්වභාවයෙන් උපෙක්ෂාසම්බෝධ්‍යඞ්ගය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ. දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ ... අවික්ෂේපස්වභාවයෙන් සම්‍යක්සමාධිය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, අකම්ප්‍යාර්ථයෙන් බලධර්මය අවබෝධ කෙරෙත්නු’යි බෝධ්‍යඞ්ග යෑ, නිර්යාණ ස්වභාවයෙන් බෝධ්‍යඞ්ගය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, හෙතුස්වභාවයෙන් මාර්ගය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, උපස්ථාන ස්වභාවයෙන් සතිපට්ඨානය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, ප්‍රදහනස්වභාවයෙන් සම්‍යක්ප්‍රධානය අවබෝධ කෙරෙත් නු’ යි බෝධ්‍යඞ්ග යෑ, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, යථාස්වභාවයෙන් සත්‍යය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යි.

අවික්ෂේපාර්ථයෙන් ශමථය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, ඒකරසාර්ථයෙන් ශමථවිදර්ශනා අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය (ශමථවිදර්ශනා) අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යි.

සංවරාර්ථයෙන් ශීල විශුද්ධිය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, අවික්ෂේපාර්ථයෙන් චිත්ත විශුද්ධිය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, මුක්ත්‍යාර්ථයෙන් විමෝක්ෂය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග ය, ප්‍රතිවේධාර්ථයෙන් විද්‍යාව අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය අවබෝධ කෙරෙත් නු යි බෝධ්‍යඞ්ග යෑ; සමුච්ඡේද ස්වභාවයෙන් ක්ෂයඥානය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යෑ, ප්‍රතිප්‍රශ්‍රබ්ධි ස්වභාවයෙන් අනුත්පාද ඥානය අවබෝධ කෙරෙත් නු’යි බෝධ්‍යඞ්ග යි.

ඡන්දං මූලට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, මනසිකාරං සමුට්ඨානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, ඵස්සං සමොධානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, වෙදනං සමොසරණට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, සමාධිං පමුඛට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා සතිං ආධිපතෙය්‍යට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, පඤ්ඤං තදුත්තරට්ඨෙන[1] බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, විමුත්තිං සාරට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන බුජ්ඣන්තීති බොජ්ඣඞ්ගා.

[ සාවත්ථිනිදානං: ]

තත්‍ර ඛො ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි 'ආවුසො භික්ඛවො'ති[2] 'ආවුසො'ති ඛො තෙ භික්ඛූ ආයස්මතො සාරිපුත්තස්ස පච්චස්සොසුං, ආයස්මා සාරිපුත්තො එතදවොච:

''සත්තිමෙ ආවුසො බොජ්ඣඞ්ගා, කතමෙ සත්ත: සතිසම්බොජ්ඣඞ්ගො, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, ඉමෙ ඛො ආවුසො සත්ත බොජ්ඣඞ්ගා.

ඉමෙසං ඛ්වාහං ආවුසො සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බණ්හසමයං[3] විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බණ්හසමයං විහරාමි, යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣන්හසමයං[4] -පෙ- සායන්හසමයං විහරිතුං තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායන්හසමයං විහරාමි, සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං[5] තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, 'ඉදප්පච්චයා චවතීති පජානාමි, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං[5] 'තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි.

1. තතුත්තරට්ඨෙන - පු, මජසං, PTS.
2 ආවුසොති - සයා
3. පුබ්බණ්හං - මජසං, ස, සයා PTS,
4. මජ්ඣන්තික සමයං - මජසං, මජ්ඣන්තිකසමයං - සයා PTS
5 තිට්ඨන්තං චරං - සයා, තිට්ඨන්තං චවන්තං - PTS.

(කර්තුකාම්‍යතා) ඡන්දය මූලස්වභාවයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, මනසිකාරය සමුට්ඨාන ස්වභාවයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, ස්පර්ශය සමවධානාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ වේදනාව සමවසරණාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් අවබෝධ කෙරෙත් කෙරෙත් නු'යි බොධ්‍ය යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, විමුක්තිය සාරාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් අවබෝධ කෙරෙත් නු'යි බොධ්‍යඞ්ග යි.

[ සැවැත්නිදන යි: ]

එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ 'ඇවැත්නි මහණෙනි' යි භික්ෂූන් ඇමතූ සේක. 'ඇවැත්නි'යි ඒ භික්ෂූහු ආයුෂ්මත්, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙය වදාළහ.

''ඇවැත්නි, මේ බොධ්‍යඞ්ගයෝ සත් දෙනෙක් වෙති කවර සත් දෙනෙකැ යත්: ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ, ධර්මවිචය සම්බොධ්‍යඞ්ග යැ ... උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ යි. ඇවැත්නි, මොහු සප්තබොධ්‍යඞ්ගයෝ වෙත්.

ඇවැත්නි, මම මේ සප්තබොධ්‍යඞ්ගයන් අතුරින් යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ පෙරවරු කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ පෙරවරු කල්හි වාසය කෙරෙමි. යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ මද්දහන් කල්හි ... සවස් කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ සවස් කල්හි වාසය කෙරෙමි. ඇවැත්නි, 'ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ'යි මෙසේ ත් මට සිත් වෙයි, (හේ) 'අප්‍රමාණ යැ'යි මෙසේ ත් මට සිත් වෙයි, 'මොනොවට පරිපූර්ණ යැ'යි මෙසේ ත් මට සිත් වෙයි. තවද නිවත් අරමුණු කොට සිටුනා එය නිවත් අරමුණු කොට සිටී යැ'යි දනගනිමි. ඉදිනුදු මාගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය නිවන් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ' යයි දනගනිමි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ... ඇවැත්නි, උපේක්ෂාසම්බොධ්‍යඞ්ග යැ' යි මෙසේත් මට සිත් වෙයි, (එය) 'අප්‍රමාණ යැ'යි මෙසේ ත් මට සිත් වෙයි. 'මොනොවට පරිපූර්ණ යැ'යි මෙසේ ත්, මට සිත් වෙයි. තවද නිවත් අරමුණු කොට සිටුනා එය නිවත් අරමුණු කොට 'සිටී' යයි දනගනිමි. ඉදිනුදු මාගේ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය නිවත් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ යයි දනගනිමි.

සෙය්‍යථාපි ආවුසො රඤ්ඤො වා රාජමහාමත්තස්ස වා නානාරත්තානං දුස්සානං දුස්සකරණ්ඩකො පූරො අස්ස, සො යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය පුබ්බණ්හසමයං පාරුපිතුං, තං තදෙව දුස්සයුගං පුබ්බණ්හසමයං පාරුපෙය්‍ය. යඤ්ඤදෙව දුස්සයුගං ආකඞ්ඛෙය්‍ය මජ්ඣණ්හසමයං -පෙ- සායණ්හසමයං පාරුපිතුං, තං තදෙව දුස්සයුගං සායණ්හසමයං පාරුපෙය්‍ය. එවමෙව ඛ්වාහං ආවුසො ඉමෙසං සත්තන්නං බොජ්ඣඞ්ගානං යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි පුබ්බණ්හසමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන පුබ්බණ්හසමයං විහරාමි. යෙන යෙන බොජ්ඣඞ්ගෙන ආකඞ්ඛාමි මජ්ඣණ්හසමයං -පෙ- සායණ්හසමයං විහරිතුං, තෙන තෙන බොජ්ඣඞ්ගෙන සායණ්හසමයං විහරාමි, සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති 'ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි. ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ- උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ මෙ ආවුසො හොති, 'අප්පමාණො'ති මෙ හොති, 'සුසමාරද්ධො'ති මෙ හොති, තිට්ඨන්තං ච නං 'තිට්ඨතී'ති පජානාමි, සචෙපි මෙ චවති, 'ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි.''[a]

කථං 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො, යාවතා නිරොධුපට්ඨාති තාවතා 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යාවතා අච්චි. තාවතා වණ්ණො, යාවතා වණ්ණො තාවතා අච්චි, එවමෙව යාවතා නිරොධුපට්ඨාති, තාවතා සතිසම්බොජ්ඣඞ්ගො, 'ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

කථං 'අප්පමාණො ඉති චෙ[1] හොතී'ති බොජ්ඣඞ්ගො, පමාණබද්ධා[2] කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, අප්පමාණො නිරොධො අචලට්ඨෙන අසඞ්ඛතට්ඨෙන, යාවතා නිරොධුපට්ඨාති, තාවතා 'අප්පමාණො ඉති චෙ[3] හොතීති බොජ්ඣඞ්ගො,

කථං 'සුසමාරද්ධො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො, විසමා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, සමධම්මො නිරොධො සන්තට්ඨෙන, පණීතට්ඨෙන, යාවතා නිරොධුපට්ඨාති, තාවතා සුසමාරද්ධො ඉති චෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

---

1. ඉති චෙ මෙ - මජසං,
2. පමාණබන්ධා - PTS, සයා, පමාණවන්තා - සයා
3. ඉති මෙ - PTS.

a. බොජ්ඣඞ්ගසංයුත්ත - පබ්බතවග්ග - 4 වත්ථසුත්තං

යම් සේ ඇවැත්නි, රජකුහට වේවයි රජ මහ ඇමැත්තකුහට වේවයි නොයෙක් රඞ්ගජාතයෙන් රඳනා ලද පිළියෙන් පිරුණු පෙළායෙක් වී නම් හෙතෙම යම් යම් මැ පිළිසඟළක් පෙරවරු කල්හි පොරෝනට කැමැති වී නම් ඒ ඒ පිළිසඟළ මැ පෙරවරු කල්හි පොරෝනේ ද, යම් යම් මැ පිළිසඟළක් මද්දහත් කල්හි ... සවස් කල්හි පොරෝනට කැමැති වී නම් ඒ ඒ පිළිසඟළ මැ සවස් කල්හි පොරෝනේ ද, එපරිද්දෙන් මැ ඇවැත්නි මම මේ සප්තබොධ්‍යඞ්ගයන් අතුරින් යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ පෙරවරු කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ පෙරවරු කල්හි වාසය කෙරෙමි, යම් යම් බොධ්‍යඞ්ගයෙකින් යුතු වැ මද්දහත් කල්හි ... සවස් කල්හි වාසය කරන්නට කැමැති වීම් නම් ඒ ඒ බොධ්‍යඞ්ගයෙන් යුතු වැ සවස් කල්හි වාසය කෙරෙමි. ඇවැත්නි, ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ'යි මෙසේත් මට සිත් වෙයි, (හේ) 'අප්‍රමාණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. මොනොවට පරිපූර්ණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. තවද තිවත් අරමුණු කොට සිටුනා එය තිවත් අරමුණු කොට 'සිටී' යයි දැනගනිමි. ඉදිතුදු මාගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය තිවත් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ' යයි දැනගනිමි. ධර්මවිචය සම්බොධ්‍යඞ්ගය ... ඇවැත්නි, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ'යි මෙසේත් මට සිත් වෙයි, හේ, 'අප්‍රමාණ යැ'යි මෙසේත් මට සිත් වෙයි, 'මොනොවට පරිපූර්ණ යැ'යි මෙසේත් මට සිත් වෙයි. තවද තිවත් අරමුණු කොට සිටුනා එය තිවත් අරමුණු කොට 'සිටී' යයි දැනගනිමි, ඉදිතුදු මාගේ උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය තිවත් අරමුණින් පහ වැ යේ නම් 'මෙ කරුණින් පහ වැ යේ' යයි දැන ගනිමි.

කිසෙයිත් 'සතිසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොති' යි බොධ්‍යඞ්ග වේ ද යත්: යම්තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම. යම්සේ දැල්වෙන තෙල්පහනක්හු ගේ යම්තාක් සිළුව වී නම් ඒ තාක් පැහැය වේ ද, යම්තාක් පැහැය වී නම් ඒ තාක් සිළුව වේ ද, එපරිද්දෙන් මැ යම්තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්.

කිසෙයිත් 'අප්පමාණො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශයභූත) ක්ලේශයෝ ද හැම පර්‍යවස්ථාන (සමුදාචාරප්‍රාප්තක්ලේශ) යෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද ප්‍රමාණබද්ධ වෙති. නිරොධය තෙමේ අචලස්වභාවයෙන් අසංඛතස්වභාවයෙන් අප්‍රමාණ වෙයි. යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ අප්‍රමාණය ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්.

කිසෙයිත් 'සුසමාරද්ධො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශය භූත) ක්ලේශයෝ ද හැම පර්‍යවස්ථානයෝ ද පුනර්භවය කරන සුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද විෂම නම් වෙති. ශාන්ත ස්වභාවයෙන් ප්‍රණීත ස්වභාවයෙන් නිරොධය තෙමේ සමධර්ම ඇත්තේ වෙයි. යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ මොනොවට පරිපූර්ණ ද වේ නු'යි බොධ්‍යඞ්ග නම්,

කථං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි, කතිහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: කතිහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති:

අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති.

කතමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති; අනුප්පාදං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, උප්පාදං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අප්පවත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, පවත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අනිමිත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිමිත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිරොධං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, සඞ්ඛාරෙ අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති. ඉමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො තිට්ඨති.

කතමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති: උප්පාදං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අනුප්පාදං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, පවත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අප්පවත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, නිමිත්තං ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, අනිමිත්තං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, සඞ්ඛාරෙ ආවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති, නිරොධං අනාවජ්ජිතත්තා සතිසම්බොජ්ඣඞ්ගො චවති. ඉමෙහි අට්ඨහාකාරෙහි සතිසම්බොජ්ඣඞ්ගො චවති.

එවං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි. කථං ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො -පෙ-

කථං උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති මෙ හොතී'ති බොජ්ඣඞ්ගො: යාවතා නිරොධූපට්ඨාති. තාවතා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො. සෙය්‍යථාපි තෙලප්පදීපස්ස ඣායතො යාවතා අච්චි තාවතා වණ්ණො. යාවතා වණ්ණො තාවතා අච්චි. එවමෙව යාවතා නිරොධූපට්ඨාති, තාවතා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති වෙ හොතීති බොජ්ඣඞ්ගො.

කථං 'අප්පමාණො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො: පමාණබද්ධා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, අප්පමාණො නිරොධො අචලට්ඨෙන අසඞ්ඛතට්ඨෙන. යාවතා නිරොධූපට්ඨාති, තාවතා 'අප්පමාණො ඉති වෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

කිසෙයින් (නිර්වාණාලම්බනයෙහි ප්‍රවෘත්ති විසින්) සිටුනා ඒ බොධ්‍යඞ්ගය (නිවන් අරමුණු කොට) සිටී'යයි දැනගනිම් ද, ඉදින් (නිර්වාණාලම්බනයෙන්) පහ වැ යේ නම් 'මාගේ බොධ්‍යඞ්ගය මෙ කරුණින් පහ වැ යේ' යයි දැනගනිම් ද: කිහි අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය සිටුනේ ද කිහි අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පහ වැ යේ ද යත්:

අට අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය සිටී. අට අයුරෙකින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය පහ වැ යෙයි.

කවර අට අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද යත්: අනුත්පාදය ආවර්ජනා කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, උත්පාදය ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, අප්‍රවෘත්තිය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, ප්‍රවෘත්තිය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, අනිමිත්ත ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, නිමිත්ත ආවර්ජනා නොකරනලද බැවින් ස්මෘති සම්බොධ්‍යඞ්ගය පවතී, නිරොධය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී, සංස්කාරයන් ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවතී. මේ අට අයුරින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය පවති.

කවර අට අයුරෙකින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්: උත්පාදය ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනුත්පාදය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, ප්‍රවෘත්තිය අවර්ජනා කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අප්‍රවෘත්තිය ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිමිත්ත ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනිමිත්ත ආවර්ජනා නො කරනලද බැවින් ස්මෘති-සම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, සංස්කාරයන් ආවර්ජනා කරනලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිරොධය ආවර්ජනා නො කරන ලද බැවින් ස්මෘතිසම්බොධ්‍යඞ්ග අපගත වේ. මේ අට අයුරින් ස්මෘතිසම්බො-ධ්‍යඞ්ගය අපගත වේ.

මෙසෙයින් (නිර්වාණාලම්බනයෙහි) පවත්නා ඒ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය (නිර්වාණාලම්බනයෙහි) පවතී'යයි දැනගනිමි. ඉදින් (නිර්වාණාලම්බනයෙන්) අපගත වේ නම් 'මාගේ ස්මෘතිසම්බොධ්‍යඞ්ගය මෙ කරුණින් අපගත වේ'යයි දැනගනිමි. කිසෙයින් ධම්මවිචයසම්බොධ්‍යඞ්ගය ...

කිසෙයින් උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ උපෙක්ෂා-සම්බොධ්‍යඞ්ගය ද වේ නූ'යි බොධ්‍යඞ්ග නම්. යම්සේ දල් වෙන තෙල් පහනක්හු ගේ යම් තාක් සිළුව වේ නම් ඒ තාක් පැහැය වේ ද, යම් තාක් පැහැය වේ නම් ඒ තාක් සිළුව වේ ද, එසෙයින් මැ මෙසේ යම් තාක් නිරොධය වටහා නම් ඒ තාක් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ද වේ නූ' යි බොධ්‍යඞ්ග නම් වේ.

කිසෙයින් 'අප්පමාණො ඉති චෙ හොති'යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශය භූත) කෙලෙශයෝ ද හැම සමුදාචාර ප්‍රාප්තකෙලෙශයෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද ප්‍රමාණබද්ධ වෙති. නිරොධය තෙමේ අචල ස්වභාවයෙන් අසඞ්ඛත ස්වභාවයෙන් අප්‍රමාණ වෙයි. යම් තාක් නිරොධය වටහා ද ඒ තාක් 'මෙසේ අප්‍රමාණ ද වේ නූ'යි බොධ්‍යඞ්ග නම් වේ.

කථං 'සුසමාරද්ධො ඉති මෙ හොතී'ති බොජ්ඣඞ්ගො: විසමා කිලෙසා සබ්බෙ ච පරියුට්ඨානා යෙ ච සඞ්ඛාරා පොනොභවිකා, සමධම්මො නිරොධො සන්තට්ඨෙන පණීතට්ඨෙන. යාවතා නිරොධූපට්ඨාති, තාවතා 'සුසමාරද්ධො ඉති මෙ හොතී'ති බොජ්ඣඞ්ගො.

කථං 'තිට්ඨන්තං ච නං තිට්ඨතී'ති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතී'ති පජානාමි: කතිහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: කතිහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති:

අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති.

කතමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති: අනුප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, උප්පාදං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, අප්පවත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගො තිට්ඨති, පවත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බො-ජ්ඣඞ්ගො තිට්ඨති, අනිමිත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිමිත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, නිරොධං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති, සඞ්ඛාරෙ අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති. ඉමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො තිට්ඨති.

කතමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති: උප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, අනුප්පාදං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, පවත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගො චවති, අප්පවත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බො-ජ්ඣඞ්ගො චවති, නිමිත්තං ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, අනිමිත්තං අනාවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, සඞ්ඛාරෙ ආවජ්ජිතත්තා උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො චවති, නිරොධං අනාවජ්ජි-තත්තා උපෙක්ඛසම්බොජ්ඣඞ්ගො චවති. ඉමෙහි අට්ඨහාකාරෙහි උපෙක්ඛා-සම්බොජ්ඣඞ්ගො චවති.

එවං තිට්ඨන්තං ච නං තිට්ඨතීති පජානාමි, සචෙපි චවති, ඉදප්පච්චයා මෙ චවතීති පජානාමි.

බොජ්ඣඞ්ගකථා සමත්තා.

කිසෙසින් 'සුසමාරද්ධා ඉති ච හොති' යි බොධ්‍යඞ්ග වේ ද යත්: (අනුශයභූත) ක්ලේශයෝ ද හැම සමුදාචාරප්‍රාප්තක්ලේශයෝ ද පුනර්භවය කරනසුලු යම් සංස්කාර කෙනෙක් වෙත් නම් ඔහු ද විෂම නම් වෙති. නිරෝධය තෙමේ ශාන්තස්වභාවයෙන් ප්‍රණීත ස්වභාවයෙන් සමධර්ම නම් වෙයි. යම් තාක් නිරෝධය වටහා ද ඒ තාක් 'මෙසේ සුසමාරබ්ධ ද වේ නු'යි බොධ්‍යඞ්ග නම් වේ.

කිසෙසින් (නිර්වාණාලම්බනයෙහි) පවත්නා ඒ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය (නිර්වාණාලම්බනයෙහි) පවතී' යයි දැනගනිම් ද, ඉදින් (නිර්වාණාලම්බන-යෙන්) අපගත වේ නම් මෙකරුණින් අපගත වේ යයි දැනගනිම් ද, කිහි අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද, කිහි අයුරෙකින් උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්:

අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී. අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ.

කවර අට අයුරෙකින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවත්නේ ද යත්: අනුත්පාදය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, උත්පාදය ආවර්ජනා නො කරන ලද බැවින් උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය පවතී, අප්‍රවෘත්තිය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, ප්‍රවෘත්තිය ආවර්ජනා නො කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, අනිමිත්ත ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී, නිමිත්ත ආවර්ජනා නොකරන ලද බැවින් උපේක්ෂා සම්බොධ්‍යඞ්ගය පවතී. නිරෝධය ආවර්ජනා කරනලද බැවින් උපේක්ෂාසම්බොධඞ්ගය පවතී, සංස්කාරයන් ආවර්ජනා නො කරන ලද බැවින් උපේක්ෂා සම්බොධඞ්ගය පවතී. මේ අට අයුරින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී.

කවර අට අයුරෙකින් උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ ද යත්: උත්පාදය ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනුත්පාදය ආවර්ජනා නොකළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, ප්‍රවෘත්තිය ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අප්‍රවෘත්තිය ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිමිත්ත ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, අනිමිත්ත ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, සංස්කාරයන් ආවර්ජනා කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි, නිරෝධය ආවර්ජනා නො කළ බැවින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වෙයි. මේ අට අයුරින් උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය අපගත වේ.

මෙසෙසින් පවත්නා වූ ඒ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය පවතී යයි දැනගනිමි. ඉදින් අපගත වේ නම් මාගේ උපේක්ෂාසම්බොධ්‍යඞ්ගය මෙ කරුණින් අපගත වේ'යයි දැනගනිමි.

**බොධ්‍යඞ්ගකථා නිමි.**

## 2. 4

## මෙත්තාකථා

[ සාවත්ථිනිදානං: ]

“මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය එකාදසානිසංසා පාටිකඞ්ඛා. කතමෙ එකාදස: සුඛං සුපති, සුඛං පටිබුජ්ඣති, න පාපකං සුපිනං පස්සති, මනුස්සානං පියො හොති, අමනුස්සානං පියො හොති, දෙවතා රක්ඛන්ති, නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති, තුවටං චිත්තං සමාධියති, මුඛවණ්ණො විප්පසීදති, අසම්මූළ්හො කාලං කරොති, උත්තරිං.[1] අප්පටිවිජ්ඣන්තො බ්‍රහ්මලොකූපගො හොති. මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා ආසෙවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය. ඉමෙ එකාදසානිසංසා පාටිකඞ්ඛා.[a]

අත්ථි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, අත්ථි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, අත්ථි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතිහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති. කතිහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, කතිහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති:

පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති, දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතමෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බෙ සත්තා අවෙරා අබ්‍යාපජ්ජා[2] අනීඝා[3] සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පාණා -පෙ- සබ්බෙභූතා -පෙ- සබ්බෙ පුග්ගලා -පෙ- සබ්බෙ අත්තභාවපරියාපන්නා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති ඉමෙහි පඤ්චහාකාරෙහි අනොධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

කතමෙහි සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බා ඉත්ථියො අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පුරිසා -පෙ- සබ්බෙ අරියා -පෙ- සබ්බෙ අනරියා -පෙ- සබ්බෙ දෙවා -පෙ- සබ්බෙ මනුස්සා -පෙ- සබ්බෙ විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති. ඉමෙහි සත්තහාකාරෙහි ඔධිසො ඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

---

1 උත්තරි - මජ්සං. a එකාදසකඞ්ගුත්තර - දුතියවග්ග (11, 2, 5)

2 අබ්‍යාපජ්ඣා - සයා, PTS, ස 3 අනිග්ඝා - සයා

# 2. 4

# මෛත්‍රී කථා

[ සැවැත්නිදානයි ]

'මහණෙනි, මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනාලද කල්හි වඩනාලද කල්හි පුනපුනා කරනලද කල්හි යුක්තයානයක් මෙන් කරනලද කල්හි (ප්‍රතිෂ්ඨාවීයෙන්) වාස්තුවක් මෙන් කරනලද කල්හි එළඹසිටි කල්හි පරිචිත කල්හි මොනොවට කරනලද කල්හි එකොළොස් අනුසස් කෙනෙක් කැමැති වියයුත්තාහ. කවර එකොළොස් අනුසස් කෙනෙක යත්: සුවසේ නිදයි, සුවසේ පුබුදී, ලාමක සිහින නො දකී, මනුෂ්‍යයනට ප්‍රිය වෙයි, අමනුෂ්‍යයනට ප්‍රිය වෙයි, (මාපියන්ගේ පුතකු සෙයින්) දෙවියෝ රකිති, ඔහුගේ සිරුරෙහි අග්නිය හෝ විෂයෙක් හෝ ශස්ත්‍රයෙක් හෝ නො වැදගනී, වහා සිත සමාහිත වෙයි, මුඛවර්ණය ඉතා ප්‍රසන්න වෙයි, නො මුළා වී වැ කළුරිය කෙරෙයි, මත්තෙහි අර්හත්ඵලය ප්‍රතිවේධ නො කරනුයේ බඹලොව උපදනේ වෙයි මහණෙනි මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලද කල්හි වඩනාලද කල්හි පුනපුනා කරනලද කල්හි යුක්තයානයක් මෙන් කරන ලද කල්හි (ප්‍රතිෂ්ඨාවීයෙන්) වාස්තුවක් මෙන් කරනලද කල්හි එළඹසිටි කල්හි පරිචිත කල්හි මොනොවට කරනලද කල්හි මේ එකොළොස් අනුසස්හු කැමැති වියයුත්තාහ

මර්‍යාදා (හිම්) රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්තියක් ඇත. මර්‍යාදා වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තියක් ඇත, දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තියක් ඇත.

කිහි අයුරෙකින් මර්‍යාදාරහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වේ ද, කිහිඅයුරෙකින් මර්‍යාදා වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්තිය වේ ද, කිහි අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වේ ද යත්:

පස් අයුරෙකින් මර්‍යාදා රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වෙයි, සත් අයුරෙකින් මර්‍යාදා වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්තිය වෙයි. දස අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කවර පස් අයුරෙකින් මර්‍යාදා රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්: හැම සත්හු වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත් වා හැම ප්‍රාණයෝ ... හැම භූතයෝ .. හැම පුද්ගලයෝ ... හැම ආත්මභාවපර්‍යාපන්නයෝ වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා'යි මේ පස් අයුරින් මර්‍යාදා රහිත වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කවර සත් අයුරෙකින් මර්‍යාදා වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්: හැම ස්ත්‍රීහු වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත් වා; හැම පුරුෂයෝ ... හැම ආර්‍යයෝ ...හැම අනාර්‍යයෝ ... හැම දෙවියෝ ... හැම මනුෂ්‍යයෝ ... හැම විනිපාතිකයෝ වෛර රහිත වැ ව්‍යාපාද රහිත වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත් ව යි මේ සත් අයුරින් මර්‍යාදා වශයෙන් පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ.

කතමෙහි දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති: සබ්බෙ පුරත්ථිමාය දිසාය සත්තා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පච්ඡිමාය දිසාය සත්තා -පෙ- සබ්බෙ උත්තරාය දිසාය සත්තා -පෙ- සබ්බෙ දක්ඛිණාය දිසාය සත්තා -පෙ- සබ්බෙ පුරත්ථිමාය අනුදිසාය සත්තා පෙ- සබ්බෙ පච්ඡිමාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ උත්තරාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ දක්ඛිණාය අනුදිසාය සත්තා -පෙ- සබ්බෙ හෙට්ඨිමාය දිසාය සත්තා -පෙ- සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු සබ්බෙ පුරත්ථිමාය දිසාය පාණා -පෙ- භූතා -පෙ- පුග්ගලා -පෙ- අත්තභාවපරියාපන්නා -පෙ- සබ්බා ඉත්ථියො -පෙ- සබ්බෙ පුරිසා -පෙ- සබ්බෙ අරියා -පෙ- සබ්බෙ අනරියා -පෙ සබ්බෙ දෙවා -පෙ- සබ්බෙ මනුස්සා -පෙ- සබ්බෙ විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තු. සබ්බෙ පච්ඡිමාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උත්තරාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ දක්ඛිණාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ පුරත්ථිමාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ පච්ඡිමාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උත්තරාය අනුදිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ දක්ඛිණාය අනුදිසාය විනිපාතිකා -පෙ සබ්බෙ හෙට්ඨිමාය දිසාය විනිපාතිකා -පෙ- සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරා අබ්‍යාපජ්ජා අනීඝා සුඛී අත්තානං පරිහරන්තූති ඉමෙහි දසහාකාරෙහි දිසාඵරණා මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙසං සත්තානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු. මා වෙරිනො, සුඛිනො හොන්තු මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු මා දුක්ඛිතත්තා'ති. ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ සත්තෙ[1] මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති චිත්තං සමාදහති, සමාධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පඤ්ඤාය පජානාති, පඤ්ඤින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති

1 සබ්බෙ සත්තා - PTS

කවර දස අයුරෙකින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රීචිත්තවිමුක්ති වේ ද යත්: පැදුත් දිග හැම සත්හු වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පැළදිග හැම සත්හු... උතුරු දිග හැම සත්හු ... දකුණුදිග හැම සත්හු ... පැදුත් අනුදිග හැම සත්හු ... පැළඅනුදිග හැම සත්හු ... උතුරු අනුදිග හැම සත්හු ... දකුණුඅනුදිග හැම සත්හු ... යටදෙස හැම සත්හු ... උඩදෙස හැම සත්හු වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පෙරදිග හැම ප්‍රාණයෝ ... භූතයෝ ... පුද්ගලයෝ ආත්මභාවපර්‍යාපන්නයෝ ... හැම ස්ත්‍රීහු ... හැම පුරුෂයෝ ... හැම ආර්‍යයෝ ... හැම අනාර්‍යයෝ ... හැම දෙවියෝ ... හැම මිනිස්හු හැම විනිපාතිකයෝ වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා. පැළදිග හැම විනිපාතිකයෝ ... උතුර දිග හැම විනිපාතිකයෝ ... දකුණුදිග හැම විනිපාතිකයෝ ... පැදුත්අනුදිග හැම විනිපාතිකයෝ ... පැළඅනුදිග හැම විනිපාතිකයෝ ... උතුරුඅනුදිග හැම විනිපාතිකයෝ ... දකුණුදිග හැම විනිපාතිකයෝ .. යටදෙස හැම විනිපාතිකයෝ ... උඩදෙස හැම විනිපාතිකයෝ වෛර නැති වැ ව්‍යාපාද නැති වැ නිදුක් වැ සුවපත් වැ ආත්මභාවය පරිහරණය කෙරෙත්වා'යි මේ දස අයුරින් දිශාවන්හි පැතිරීම් ඇති මෛත්‍රී චිත්තවිමුක්ති වේ.

හැම සතුන් පිළිබඳ (අභ්‍යන්තර වශයෙන්) පෙළීම (තම සිතින්) හැරපියා නො පෙළෙන අයුරින්, (බාහිර වශයෙන්) ශරීරහිංසා හැරපියා අහිංසාකාරයෙන් සිත් තැවුලි හැරපියා නො තැවුලි අයුරින් ජීවිතාදී වස්තූන්ගේ ක්‍ෂයවීම හැරපියා අපරියාදානාකාරයෙන් (මෙරමා කෙරෙන්) දිවිවෙහෙස හැරපියා අවිහිංසාකාරයෙන් හැම සත්හු අවෛරීහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා, සුවපත් වෙත්වා නහමක් දුක්පත් වෙත්වා, සුඛිතාත්ම වෙත්වා නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් හැම සත්නට මෙත් වඩා නු'යි මෛත්‍රී නමු ඒ ධර්මය සිතා නු'යි චිත්ත නම. (මෛත්‍රියට ප්‍රතිපක්‍ෂ වූ) හැම ව්‍යාපාදසමුදාචාරයන් කෙරෙන් මිදේ නු'යි විමුක්ති නමු. මෛත්‍රිය ද චිත්තය ද විමුක්තිය ද'යි මෛත්‍රීචිත්තවිමුක්ති නමු.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි වීර්‍යය ප්‍රග්‍රහ කෙරේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍යෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිහි එළවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතීන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිත පිහිටුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධීන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ප්‍රඥායෙන් දැනගනී නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රියයෙන් පරිභාවිත වූවා වේ.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති. ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, සංසීදනා[1] හොන්ති, පතිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.[2]

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අස්සද්ධියෙ න කම්පති, සද්ධාබලපරිභාවිතා[3] හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති කොසජ්ජෙ න කම්පති, විරියබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පමාදෙ න කම්පති, සතිබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති උද්ධච්චෙ න කම්පති, සමාධිබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අවිජ්ජාය න කම්පති, පඤ්ඤාබලපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති

1 පසීදනා - මජසං., PTS
2 පතාපෙන්ති - මජසං, සයා. පභාසෙන්ති - PTS
3. සද්ධාබලං පරිභාවිතා - PTS,

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ ආසේවනයෝ වෙති. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ භාවනයෝ වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ බහුලීකෘතයෝ වෙති මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල (පුනපුනා) කරනු ලැබෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලංකාර වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලංකාර කරනලද වෙයි මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාර වෙති. මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි. මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියගේ ආසෙවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණිභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දන (ප්‍රවේශන) යෝ වෙති, සංසීදනයෝ වෙති, සන්තිට්ඨන (මධ්‍යස්ථකාරණ) යෝ වෙති. විමුක්තිකාරණයෝ වෙති, 'තෙල ශාන්ත යැ'යි ස්පර්ශකාරණයෝ වෙති. යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති. අනුෂ්ඨිතයෝ (එළඹසිටියාහු) වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුපිහිටියාහු වෙති, සුසමුද්ඝාතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, (මෛත්‍රිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබළුවත්.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි අශ්‍රද්ධායෙහි නො සැලේ නම් මෛත්‍රී චිත්තවිමුක්තිය ශ්‍රද්ධායෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි කුසීදභාවයෙහි නොසැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි ප්‍රමාදයෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තියස්මෘතිබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි උද්ධතභාවයෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිබලයෙන් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු අවෛරීහු වෙත්වා නිභීය වෙත්වා සුවපත් වෙත්වා'යි අවිද්‍යායෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥබලයෙන් පරිභාවිත වූවා වේ.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තා චෙතොවිමුත්ති ආසෙවීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තා-චෙතොවිමුත්ති බහුලීකරීයති, ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතො-විමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතො-විමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමානි පඤ්ච බලානි මෙත්තායචෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති. ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතිසම්බොජ්ඣඞ්ග[1] පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පඤ්ඤාය පවිචිනාති[2] ධම්මවිචයසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති පරිළාහං පටිප්පස්සම්භෙති, පීතිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති දුට්ඨුල්ලං පටිප්පස්සම්භෙති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති චිත්තං සමාදහති, සමාධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග-පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

---

1 සතිසම්බොජ්ඣඞ්ගං පරිභාවිතා - PTS,
2. පරිවිචිනාති - PTS

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට භාවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල කරනු ලැබෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලඞ්කාර කරනලද වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාර (සම්භාර) යෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි. මේ පඤ්චබලයෝ මෛත්‍රී චිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති. බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති. පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිට්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'මෙල මෛත්‍රිය ශාන්ත යැ යි සපශ්‍යකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුපිහිටියාහු වෙති' සුසමුත්ථිත වෙති, සුවිමුක්ත වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) තිපදවති, ප්‍රකට කෙරෙති, බමුළුවත්.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි සිහි එළවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි ප්‍රඥයෙන් විමසා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි වීර්‍ය්‍ය ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි (ක්ලේශ) පරිදාහය සන්හිඳුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා භය රහිතයෝ වෙත්වා සුවපත් වෙත්වා'යි අශාන්තභාවය සන්හිඳුවා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, භය රහිතයෝ වෙත්වා, සුවපත් වෙත්වා'යි නුවණින් කෙලෙසුන් ප්‍රත්‍යවේක්‍ෂා කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය උපෙක්‍ෂාසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වේ.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති භාවීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තා චෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, එතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පස්සති, සම්මාදිට්ඨිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා අභිනිරොපෙති, සම්මාසඞ්කප්පපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පරිග්ගණ්හාති, සම්මාවාචාපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා සමුට්ඨාපෙති, සම්මාකම්මන්තපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා වොදාපෙති, සම්මාආජීවපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති. මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට භාවනයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල කරනු ලැබෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලංකාර කරනලද වෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිෂ්කාරයෝ වෙති, මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය සුපරිෂ්කෘත වෙයි.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට පරිවාරයෝ වෙති මේ සතපබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පරිවරන ලද වේ.

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පිරිකර වෙති, පිරිවර වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගියෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රසකන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිට්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, තෙල (මෛත්‍රීචිත්තවිමුක්තිය) ශාන්ත යැ'යි සපශ්‍යකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාසතුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිතයෝ වෙති, සුසමා-රබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, සුපිහිටියාහු වෙති, සුසමුත්ථිත වෙති, සුවිමුක්ත වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්ව'යි මොනොවට දකි නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්දෘෂ්ටි විසින් හාත්පසින් වඩනලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්ව'යි මැනැවින් අරමුණට නඟා නම් මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්-සංකල්පය විසින් මොනොවට වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්ව'යි මොනොවට පරිග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්-වචන විසින් මොනොවට වඩනලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්ව'යි (ත්‍රිවිධකායසංවරය) මොනොවට නඟාතබා නම්, මෛත්‍රීචිත්ත-විමුක්තිය සම්‍යක් කර්මාන්ත විසින් හාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිඝීය වෙත්වා, සුවපත් වෙත්ව'යි මොනොවට පරිශුද්ධ කරවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍ය-ගාජීව විසින් හාත්පසින් වඩනාලද වෙයි.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පග්ගණ්හාති, සම්මාවායාමපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා උපට්ඨාපෙති, සම්මාසතිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ සත්තා අවෙරිනො හොන්තු ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා සමාදහති සම්මාසමාධිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති, ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා භාවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතො විමුත්ති භාවීයති ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා බහුලීකතා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති බහුලීකරීයති. ඉමෙ අට්ඨමග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා අලඞ්කාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ස්වාලඞ්කතා හොති. ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරික්ඛාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරික්ඛතා හොති. ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'එත සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති, නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පතාපෙන්ති.

සබ්බෙසං පාණානං -පෙ- සබ්බෙසං භූතානං -පෙ- සබ්බෙසං පුග්ගලානං -පෙ- සබ්බෙසං අත්තභාවපරියාපන්නානං -පෙ සබ්බෙසං ඉත්ථීනං -පෙ- සබ්බෙසං පුරිසානං -පෙ- සබ්බෙසං අරියානං -පෙ- සබ්බෙසං අනරියානං -පෙ- සබ්බෙසං දෙවානං -පෙ- සබ්බෙසං මනුස්සානං පෙ- සබ්බෙසං විනිපාතිකානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදනං වජ්ජෙත්වා අපරියාදනෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය, සබ්බෙ විනිපාතිකා අවෙරිනො හොන්තු, මා වෙරිනො, සුඛිනො හොන්තු, මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ විනිපාතිකෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්ව්‍යායාම විසින් හාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්ව,යි මොනොවට අරමුණෙහි සිත එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්ස්මෘති විසින් හාත්පසින් වඩනාලද වෙයි.

හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්සමාධි විසින් හාත්පසින් වඩනාලද වේ.

මේ මාර්ගාඞ්ගයෝ අට දෙන මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්ති ට භාවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය වඩනා ලැබෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට බහුලීකෘතයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය බහුල (පුනපුනා) කරනු ලැබෙයි මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට අලඞ්කාරයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට අලඞ්කාර කරනලද වෙයි, මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිකර වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය පරිෂ්කෘත වෙයි. මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පිරිවර වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙන විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ මාර්ගාඞ්ගයෝ අටදෙනා මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිෂ්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'තෙල මෛත්‍රීචිත්තවිමුක්තිය ශාන්ත යැ'යි ස්පර්ශීකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ (එළඹසිටියාහු) වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති. මොනොවට පිහිටියාහු වෙති, සුසමුපජිතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, (මෛත්‍රීචිත්තවිමුක්තිය) නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

හැම ප්‍රාණයන් පිළිබඳ .. හැම භූතයන් පිළිබඳ ... හැම පුද්ගලයන් පිළිබඳ ... හැම ආත්මභාවපර්යාපන්නයන් පිළිබඳ .. හැම මාගමුන් පිළිබඳ ... හැම පිරිමින් පිළිබඳ... හැම ආර්යයන් පිළිබඳ... හැම අනාර්යයන් පිළිබඳ... හැම දෙවියන් පිළිබඳ .. හැම මිනිසුන් පිළිබඳ ... හැම විනිපාතිකයන් පිළිබඳ (අභ්‍යන්තරශරීර) පීඩනය (තම සිතින්) හැරපියා අපීඩනාකාරයෙන් බාහිරශරීරහිංසාව හැරපියා අහිංසාකාරයෙන් (මනස්) සන්තාපය හැරපියා අසන්තාපාකාරයෙන්, ජීවිතාදිපරික්ෂය හැරපියා අපරියාදානාකාරයෙන්, මෙරමා කෙරෙත් ජීවිතාදිවිහිංසාව හැරපියා අවිහිංසාකාරයෙන්, හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා. සුවපත් වෙත්වා, නහමක් දුක්පත් වෙත්වා, සුඛිතාත්මයෝ වෙත්වා, නහමක් දුඃඛිතාත්මයෝ වෙත්වා'යි මේ අට අයුරින් හැම විනිපාතිකයන්ට මෙත් වඩා නු'යි 'මෙත්තා' නමි. ඒ ධර්මය සිතා නූ,යි 'චෙතො' නම, මෛත්‍රීප්‍රතිපක්ෂ) හැම ව්‍යාපාදපර්යුත්ථානයන් කෙරෙන් විමුක්ත වේ නූ'යි 'විමුත්ති' නමි. මෙත්තා ද චෙතො ද විමුත්ති දූ'යි 'මෙත්තාචෙතොවිමුක්ති' නමි.

සබ්බෙ විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රිය පරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙසං පුරත්ථිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං උත්තරාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං පුරත්ථිමාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං උත්තරාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය අනුදිසාය සත්තානං -පෙ- සබ්බෙසං හෙට්ඨිමාය දිසාය සත්තානං -පෙ- සබ්බෙසං උපරිමාය දිසාය සත්තානං පීළනං වජ්ජෙත්වා අපීළනාය උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා, අවිහෙසාය සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරිනො හොන්තු, මා වෙරිනො, සුඛිනො හොන්තු, මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ උපරිමාය දිසාය සත්තෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

සබ්බෙ උපරිමාය දිසාය සත්තා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙසං පුරත්ථිමාය දිසාය පාණානං -පෙ- භූතානං -පෙ- පුග්ගලානං -පෙ- අත්තභාවපරියාපන්නානං -පෙ- සබ්බාසං ඉත්ථීනං -පෙ- සබ්බෙසං පුරිසානං -පෙ- සබ්බෙසං අරියානං -පෙ- සබ්බෙසං අනරියානං -පෙ- සබ්බෙසං දෙවානං -පෙ- සබ්බෙසං මනුස්සානං -පෙ- සබ්බෙසං විනිපාතිකානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උත්තරාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං පුරත්ථිමාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං පච්ඡිමාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උත්තරාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං දක්ඛිණාය අනුදිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං හෙට්ඨිමාය දිසාය විනිපාතිකානං -පෙ- සබ්බෙසං උපරිමාය දිසාය විනිපාතිකානං පීළනං වජ්ජෙත්වා අපීළනාය, උපඝාතං වජ්ජෙත්වා අනුපඝාතෙන, සන්තාපං වජ්ජෙත්වා අසන්තාපෙන, පරියාදානං වජ්ජෙත්වා අපරියාදානෙන, විහෙසං වජ්ජෙත්වා අවිහෙසාය සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, මා වෙරිනො, සුඛිනො හොන්තු, මා දුක්ඛිනො, සුඛිතත්තා හොන්තු, මා දුක්ඛිතත්තාති ඉමෙහි අට්ඨහාකාරෙහි සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකෙ මෙත්තායතීති මෙත්තා, තං ධම්මං චෙතයතීති චෙතො, සබ්බබ්‍යාපාදපරියුට්ඨානෙහි විමුච්චතීති විමුත්ති, මෙත්තා ච චෙතො ච විමුත්ති චාති මෙත්තාචෙතොවිමුත්ති.

හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වෙයි ... නිපදවති, ප්‍රකට කෙරෙති, බබුළුවත්.

පැදුන්දෙස හැම සතුන් පිළිබඳ ... පැසිම්දෙස හැම සතුන් පිළිබඳ ... උතුරුදෙස හැම සතුන් පිළිබඳ ... දකුණුදෙස හැම සතුන් පිළිබඳ ... පැදුන්අනුදෙස හැම සතුන් පිළිබඳ ... පැසිම් අනුදෙස හැම සතුන් පිළිබඳ ... උතුරු අනුදෙස හැම සතුන් පිළිබඳ ... දකුණු අනුදෙස හැම සතුන් පිළිබඳ ... යටදෙස හැම සතුන් පිළිබඳ ... උඩදෙස හැම සතුන් පිළිබඳ .. (අභ්‍යන්තර ශරීර) පීඩනය (තම සිතින්) හැර පියා අපීඩනාකාරයෙන් බාහිරශරීරහිංසා හැරපියා අහිංසාකාරයෙන්, චිත්තසන්තාපය හැරපියා අසන්තාපාකාර-යෙන්, ජීවිතපරියාදානය හැරපියා අපරියාදානාකාරයෙන් ජීවිතවිහෙසාව හැරපියා අවිහෙසාකාරයෙන්, උඩදෙස හැම සත්හු වෛර නැත්තාහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා සුවපත් වෙත්වා, නහමක් දුක්පත් වෙත්වා සුඛිතාත්ම වෙත්වා, නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් උඩදෙස හැම සත්නට මෙත් වඩාතු'යි 'මෛත්‍රී නමු. ඒ ධර්මය සිතා තු'යි 'චිත්ත' නම. ('මෛත්‍රීප්‍රතිපක්ෂ) හැම ව්‍යාපාදපර්‍ය්‍යුත්ථානයන් කෙරෙන් මිදේ නු'යි විමුක්ති නමු. මෛත්‍රී ද චිත්ත ද විමුක්ති දැ'යි 'මෛත්‍රීචිත්තවිමුක්ති නමු.

උඩදෙස හැම සත්හු අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම් මෛත්‍රීචිත්තවිමුක්ති ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි නිපදවති, පාළ කෙරෙති, බබුළුවත්.

පැදුන්දෙස හැම ප්‍රාණයන් පිළිබඳ .. භූතයන් ... පුද්ගලයන් ආත්ම-භාවපර්‍ය්‍යාපන්නයන් පිළිබඳ ... හැම ස්ත්‍රීන් ... හැම පුරුෂයන් ... හැම ආර්‍ය්‍යයන් ... හැම අනාර්‍ය්‍යයන් ... හැම දෙවියන් ... හැම මිනිසුන් .. හැම විනිපාතිකයන් පිළිබඳ ... පැදුන්දෙස හැම විනිපාතිකයන් ... පැසිම් දෙස හැම විනිපාතිකයන් ... උතුරුදෙස හැම විනිපාතිකයන් ... දකුණුදෙස හැම විනිපාතිකයන් ... පැදුන් අනුදෙස හැම විනිපාතිකයන් ... පැසිම් අනුදෙස හැම විනිපාතිකයන් ... උතුරු අනුදෙස හැම විනිපාතිකයන් ... දකුණු අනුදෙස හැම විනිපාතිකයන් ... යටදෙස හැම විනිපාතිකයන් ... උඩදෙස හැම විනිපාතිකයන් පිළිබඳ පීඩනය හැරපියා අපීඩනාකාරයෙන්, උපඝාතය හැරපියා අනුපඝාතාකාරයෙන්, සන්තාපය හැරපියා අසන්තාපා-කාරයෙන්, පරියාදානය හැරපියා අපරියාදානාකාරයෙන්, විහෙසාව හැරපියා අවිහෙසාකාරයෙන්, උඩදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නහමක් වෛරීහු වෙත්වා. සුඛීහු වෙත්වා, නහමක් දුඃඛීහු වෙත්වා. සුඛිතාත්මයෝ වෙත්වා, නහමක් දුඃඛිතාත්ම වෙත්වා'යි මේ අට අයුරින් උඩදෙස හැම විනිපාතිකයනට මෙත් වඩාතු'යි 'මෛත්‍රී' නමු ඒ ධර්මය සිතාතු'යි 'චිත්ත' නමු. හැම ව්‍යාපාදපර්‍ය්‍යුත්ථානයන් කෙරෙන් මිදේ නු' යි විමුක්ති නමු. මෛත්‍රී ද චිත්ත ද විමුක්ති දැ'යි 'මෛත්‍රීචිත්තවිමුක්ති' නමු

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සද්ධාය අධිමුච්චති, සද්ධින්ද්‍රිය පරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති. සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති විරියං පග්ගණ්හාති, විරියින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති, -පෙ- සතිං උපට්ඨාපෙති, සතින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- චිත්තං සමාදහති, සමාධින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- පඤ්ඤාය පජානාති, පඤ්ඤින්ද්‍රියපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමානි පඤ්චින්ද්‍රියානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි ඉන්ද්‍රියෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති අස්සද්ධියෙ න කම්පති, සද්ධාබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- කොසජ්ජෙ න කම්පති, විරියබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- පමාදෙ න කම්පති, සති බලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- උද්ධච්චෙ න කම්පති, සමාධිබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- අවිජ්ජාය න කම්පති, පඤ්ඤාබලපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමානි පඤ්ච බලානි මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි පඤ්චහි බලෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සතිං උපට්ඨාපෙති, සතිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- පඤ්ඤාය පවිචිනාති, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- විරියං පග්ගණ්හාති, විරියසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තා චෙතොවිමුත්ති -පෙ- පරිළාහං පටිප්පස්සම්භෙති, පීතිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- දුට්ඨුල්ලං පටිප්පස්සම්භෙති, පස්සද්ධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- චිත්තං සමාදහති, සමාධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති, ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාති, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමෙ සත්ත බොජ්ඣඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි සත්තහි බොජ්ඣඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්ති.

හැම උඩදෙස විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි ශ්‍රද්ධායෙන් අධිමුක්ත වේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි. උඩදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි වීර්‍ය්‍ය ප්‍රග්‍රහ කෙරේ නම්, 'මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි සිහි එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතීන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි- සිත පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධීන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වෙයි, ප්‍රඥායෙන් දැනගනී නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රිය විසින් පරිභාවිත වූවා වේ.

මේ පඤ්චෙන්ද්‍රියයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චෙන්ද්‍රියයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි. ... නිෂ්ගීනය කෙරෙති, ද්‍යෝතනය කෙරෙති, ප්‍රකාශනය කෙරෙත්.

උඩදෙස හැම විනිපාතිකයෝ වෛර නැත්තාහු වෙත්වා, නිර්භය වෙත්වා සුවපත් වෙත්වා'යි අශ්‍රද්ධායෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ශ්‍රද්ධාබල විසින් පරිභාවිත වූවා වෙයි ... කෞසීද්‍යයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යබල විසින් පරිභාවිත වූවා වෙයි ප්‍රමාදයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිබල විසින් පරිභාවිත වූවා වෙයි ... ඖද්ධත්‍යයෙහි නො සැලේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිබල විසින් පරිභාවිත වූවා වෙයි අවිද්‍යායෙහි නො සැලේ නම් මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රඥාබල විසින් පරිභාවිත වූවා වේ.

මේ පඤ්චබලයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ පඤ්චබලයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි ... නිෂ්ගීනය කෙරෙති, ද්‍යෝතනය කෙරෙති, ප්‍රකාශනය කෙරෙත්

උඩදෙස හැම විනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි සිහි එළවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... ප්‍රඥායෙන් විමසා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... වීර්‍ය්‍ය ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි... ක්ලේශපරිදාහය සන්හිඳුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි ... අනාත්මභාවය සන්හිඳුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි, සිත සමාදහනය කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සමාධිසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වෙයි, ඥානයෙන් ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය උපේක්ෂාසම්බොධ්‍යඞ්ග විසින් පරිභාවිත වූවා වේ

මේ සප්තබොධ්‍යඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති. මේ සප්තබොධ්‍යඞ්ගයන් විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි උපදවති, බබුළුවා පාල කෙරෙති,ත්.

සබ්බෙ උපරිමාය දිසාය විනිපාතිකා අවෙරිනො හොන්තු, ඛෙමිනො හොන්තු, සුඛිනො හොන්තූති සම්මා පස්සති, සම්මාදිට්ඨිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා අභිනිරොපෙති, සම්මාසඞ්කප්පපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා පරිගණ්හාති, සම්මාවාචාපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා සමුට්ඨාපෙති, සම්මාකම්මන්තපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා වොදපෙති, සම්මාආජීවපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා පග්ගණ්හාති, සම්මාවායාමපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා උපට්ඨාති, සම්මාසතිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති -පෙ- සම්මා සමාදහති, සම්මාසමාධිපරිභාවිතා හොති මෙත්තාචෙතොවිමුත්ති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති ආසෙවීයති -පෙ- ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා පරිවාරා හොන්ති, ඉමෙහි අට්ඨහි මග්ගඞ්ගෙහි මෙත්තාචෙතොවිමුත්ති සුපරිවුතා හොති.

ඉමෙ අට්ඨ මග්ගඞ්ගා මෙත්තාය චෙතොවිමුත්තියා ආසෙවනා හොන්ති, භාවනා හොන්ති, බහුලීකතා හොන්ති, අලඞ්කාරා හොන්ති, පරික්ඛාරා හොන්ති, පරිවාරා හොන්ති, පාරිපූරී හොන්ති, සහගතා හොන්ති, සහජාතා හොන්ති, සංසට්ඨා හොන්ති, සම්පයුත්තා හොන්ති, පක්ඛන්දනා හොන්ති, පසීදනා හොන්ති, සන්තිට්ඨනා හොන්ති, විමුච්චනා හොන්ති, 'ඵතං සන්ත'න්ති ඵස්සනා හොන්ති, යානීකතා හොන්ති, වත්ථුකතා හොන්ති, අනුට්ඨිතා හොන්ති, පරිචිතා හොන්ති, සුසමාරද්ධා හොන්ති, සුභාවිතා හොන්ති, ස්වාධිට්ඨිතා හොන්ති, සුසමුග්ගතා හොන්ති, සුවිමුත්තා හොන්ති. නිබ්බත්තෙන්ති, ජොතෙන්ති, පකාසෙන්තීති.

**මෙත්තාකථා සමත්තා.**

## 2. 5

## විරාග කථා

විරාගො මග්ගො, විමුත්ති ඵලං.

කථං විරාගො මග්ගො සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි මිච්ඡාදිට්ඨියා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො[1] විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

---

1. විමොක්ඛො-ස්‍යා මොක්ඛො - ස.

උපරිමදිශායෙහි හැම වීනිපාතිකයෝ අවෛරීහු වෙත්වා, නිර්භය වෙත්වා, සුවපත් වෙත්වා'යි මොනොවට දකී නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්දෘෂ්ටි විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට සිත අරමුණට නංවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්සංකල්ප විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පරිග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්වචන විසින් පරිභාවිත වූවා වෙයි ... (ත්‍රිවිධකායසංවරය) මොනොවට ඔසොවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්කර්මාන්ත විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පරිශුද්ධකරවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යගාජීව විසින් පරිභාවිත වූවා වෙයි.. මොනොවට ප්‍රග්‍රහ කෙරේ නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යග්ව්‍යායාම විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට එළඹා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්ස්මෘති විසින් පරිභාවිත වූවා වෙයි ... මොනොවට පිහිටුවා නම්, මෛත්‍රීචිත්තවිමුක්තිය සම්‍යක්සමාධි විසින් පරිභාවිත වූවා වේ.

මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට ආසේවනයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය ආදරයෙන් සෙවුනා ලැබෙයි ... මේ මාර්ගාඞ්ගයෝ අටදෙන මෛත්‍රීචිත්තවිමුක්තියට පරිවාරයෝ වෙති, මේ මාර්ගාඞ්ගයන් අටදෙනා විසින් මෛත්‍රීචිත්තවිමුක්තිය මොනොවට පිරිවරනලද වේ.

මේ අෂ්ටමාර්ගාඞ්ගයෝ මෛත්‍රීචිත්තවිමුක්තියට ආසෙවනයෝ වෙති, භාවනයෝ වෙති, බහුලීකෘතයෝ වෙති, අලඞ්කාරයෝ වෙති, පරිෂ්කාරයෝ වෙති, පරිවාරයෝ වෙති, පරිපූර්ණීභාවයෝ වෙති, සහගතයෝ වෙති, සහජාතයෝ වෙති, සංසෘෂ්ටයෝ වෙති, සම්ප්‍රයුක්තයෝ වෙති, ප්‍රස්කන්දනයෝ වෙති, ප්‍රසීදනයෝ වෙති, සන්තිෂ්ඨනයෝ වෙති, විමුක්තිකාරණයෝ වෙති, 'තෙල (මෛත්‍රීචිත්තවිමුක්තිය) ශාන්ත යැ'යි ස්පර්ශකාරණයෝ වෙති, යානීකෘතයෝ වෙති, වාස්තුකෘතයෝ වෙති, අනුෂ්ඨිතයෝ වෙති, පරිචිතයෝ වෙති, සුසමාරබ්ධයෝ වෙති, සුභාවිතයෝ වෙති, මොනොවට පිහිටියාහු වෙති, සුසමුද්ඝාතිතයෝ වෙති, සුවිමුක්තයෝ වෙති, උපදවති, පෑල කෙරෙති, බබුළුවත්.

**මෛත්‍රීකථා නිමි.**

## 2. 5

## විරාග කථා

විරාගය මාර්ග වෙයි, විමුක්තිය ඵල වෙයි.

කිසෙයින් විරාගය මාර්ග වෙයි යත්: ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි දර්ශනස්වභාවයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් විරක්ත වෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි. බාහ්‍ය වූ හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි, විරාග තෙම නිවන අරමුණු කොට ඇත්තේ යැ, නිවණ ගොදුරු කොට ඇත්තේ යැ නිවන් අරමුණුහි උපන්නේ යැ නිවන්හි (ප්‍රවෘත්ති විසින්) සිටියේ යැ නිවන්හි (නො හවත්නා විසින්) පිහිටියේ යි.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො,[1] ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

අභිනිරොපනට්ඨෙන සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා විරජ්ජති -පෙ- පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය විරජ්ජති -පෙ- සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා විරජ්ජති -පෙ- වොදානට්ඨෙන සම්මා-ආජීවො මිච්ඡාආජීවා විරජ්ජති -පෙ- පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා විරජ්ජති -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා විරජ්ජති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො[1] ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

සකදාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

1 විමොක්ඛො - සං; මොක්ඛො - ස

**විරාගො** යනු: විරාග දෙකෙකි: නිර්වාණය ද (විරාග හෙතු බැවින්) විරාග නම් වෙයි, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම්, හැම විරාග වෙත් නු'යි විරාග නම් වෙති (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාග සඞ්ඛ්‍යාත නිර්වාණය අරමුණු කොට යෙත් නු'යි (විරාගාලම්බන බැවින්) විරාග නම් (මාර්ගණාර්ථයෙන්) මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දිශාව වූ නිවනට යෙත් නු'යි අෂ්ටාඞ්ගමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙයින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ගයෝ වෙත් නම්, (ඔවුනතුරෙහි) මේ මැ ආර්යඅෂ්ටාඞ්ගමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ නු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගමාර්ගය ඉතා ප්‍රශංසනීය වේ.

අභිනිරොපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පය කෙරෙන් විරක්ත වෙයි පරිග්‍රහ (චතුර්විධවාක්සංවර) ස්වභාවයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනය කෙරෙන් විරක්ත වෙයි .. සමුට්ඨාන (ත්‍රිවිධකායසංවර) ස්වභාවයෙන් සම්‍යක්කර්මාන්තය මිථ්‍යාකර්මාන්තය කෙරෙන් විරක්ත වෙයි ... ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීවය මිථ්‍යාජීවය කෙරෙන් විරක්ත වෙයි ... ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමය කෙරෙන් විරක්ත වෙයි ... උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතිය කෙරෙන් විරක්ත වෙයි... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධිහු කෙරෙන් විරක්ත වෙයි. එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි. විරාගය විරාග සඞ්ඛ්‍යාත නිවන අරමුණු කොට ඇත්තේ යැ නිවන ගොදුරු කොට ඇත්තේ යැ නිවන් අරමුණුහි උපන්නේ යැ නිවන්හි සිටියේ යැ නිවන්හි පිහිටියේ යි.

**විරාගෙ** යනු: විරාග දෙකෙකි: නිවන ද විරාග නම් වෙයි, නිවන් අරමුණුහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් හැම විරාග වෙත් නු'යි විරාග නම් වෙති, (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාගයට යෙත් නු'යි (විරාගාලම්බන බැවින්) විරාග නම් (ගමනාර්ථයෙන්) මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දෙස වූ නිවනට යෙත් නු,යි අෂ්ටාඞ්ගමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙයින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මේ මැ ආර්යඅෂ්ටාඞ්ගමාර්ග අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ නු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ග-මාර්ගය ශ්‍රෙෂ්ඨ යි

සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය .. අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය ඖදාරික වූ කාමරාග සංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විරක්ත වෙයි, තදනුවර්තක ක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි විරාගය නිර්වාණය අරමුණු කොට ඇත්තේ යැ, නිර්වාණය ගොදුරු කොට ඇත්තේ ය නිර්වාණාලම්බනයෙහි උපන්නේ යැ නිර්වාණයෙහි (ප්‍රවෘත්ති වසින්) සිටියේ යැ නිර්වාණයෙහි පිහිටියේ යි.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා, අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

අනාගාමිමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො -පෙ- මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

අරහත්තමග්ගක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා විරජ්ජති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විරජ්ජති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විරජ්ජති, විරාගො විරාගාරම්මණො විරාගගොචරො විරාගෙ සමුදාගතො විරාගෙ ඨිතො විරාගෙ පතිට්ඨිතො.

**විරාගොති** ද්වෙ විරාගා: නිබ්බානඤ්ච විරාගො, යෙ ච නිබ්බානාරම්මණතාජාතා ධම්මා සබ්බෙ විරාගා හොන්තීති විරාගා, සහජාතානි සත්තඞ්ගානි විරාගං ගච්ඡන්තීති විරාගො මග්ගො, එතෙන මග්ගෙන බුද්ධා ච සාවකා ච අගතං දිසං නිබ්බානං ගච්ඡන්තීති අට්ඨඞ්ගිකො මග්ගො, යාවතා පුථුසමණබ්‍රාහ්මණානං පරප්පවාදානං මග්ගා අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො අග්ගො ච සෙට්ඨො ච පාමොක්ඛො ච උත්තමො ච පවරො චාති මග්ගානං අට්ඨඞ්ගිකො සෙට්ඨො.

දස්සනවිරාගො සම්මාදිට්ඨි, අභිනිරොපනවිරාගො සම්මාසඞ්කප්පො පරිග්ගහවිරාගො සම්මාවාචා, සමුට්ඨානවිරාගො සම්මාකම්මන්තො, වොදානවිරාගො සම්මාආජීවො, පග්ගහවිරාගො සම්මාවායාමො, උපට්ඨානවිරාගො සම්මාසති, අවික්ඛෙපවිරාගො සම්මාසමාධි.

**විරාගො** යනු: විරාග දෙකෙකි නිර්වාණය ද විරාගයෙක, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙකුත් වෙත් නම් එ හැම විරාග නම් වෙත් නු'යි විරාගහ (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක්සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාගයට යෙත් නු'යි (විරාගාලම්බන බැවින්) විරාග නම්හු, (ගමනාර්ථයෙන්) මාර්ග නම්හු වෙයි. තෙල මාර්ගයෙන් බුද්ධවරු හා බුද්ධශ්‍රාවකයෝ හා නො ගියවිරූ දෙස වූ නිවනට යෙත් නු'යි අෂ්ටාඞ්ගිකමාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙයින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මෙ මැ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේනු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

අනාගාමිමාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය ඖදාරිකසහගත කාමරාගසංයොජනයෙන් ප්‍රතිඝසංයොජනයෙන් අනුසහගත කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විරක්ත වෙයි. තදනුවර්තීකක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි. බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි. විරාගය නිර්වාණය ආලම්බන කොට ඇත්තේ යැ ... මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

අර්හත්මාර්ගක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂෙපාර්ථයෙන් සම්‍යක්සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් විරක්ත වෙයි, තදනුවර්තීකක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විරක්ත වෙයි, බාහ්‍ය වූත් හැම නිමිත්ත කෙරෙන් විරක්ත වෙයි, විරාගය නිර්වාණය ආලම්බන කොට ඇත්තේ යැ නිර්වාණය ගොචර කොට ඇත්තේ යැ, නිර්වාණාලම්බනයෙහි උපන්නේ යැ නිර්වාණාලම්බනයෙහි සිටියේ යැ නිර්වාණාලම්බනයෙහි පිහිටියේ යි.

**විරාගො** යනු: විරාග දෙකෙකි: නිර්වාණය ද විරාග යැ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එහැම විරාග වෙත් නු යි විරාගහ, (සම්‍යග්දෘෂ්ටි) සහජාත වූ (සම්‍යක් සංකල්පාදි) සප්තාඞ්ගයෝ විරාගයට යෙත් නු'යි විරාග නම් මාර්ග නම් වෙයි. තෙල මාර්ගයෙන් බුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද නො ගියවිරූ දෙස වූ නිර්වාණයට යෙත් නු'යි අෂ්ටාඞ්ගික මාර්ග නම් වෙයි. යම්තාක් වෙත් වෙත් මහණබමුණන්ගේ ද මෙයින් අන්‍යලබ්ධි ඇතියන්ගේ ද මාර්ග කෙනෙක් වෙත් නම් (ඔවුනතුරින්) මෙ මැ ආර්‍ය්‍යාෂ්ටාඞ්ගිකමාර්ගය අග්‍ර ද ශ්‍රෙෂ්ඨ ද ප්‍රමුඛ ද උත්තම ද ප්‍රවර ද වේ නු'යි මාර්ගයන් අතුරින් අෂ්ටාඞ්ගිකමාර්ගය ශ්‍රෙෂ්ඨ යි.

දර්ශන සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්දෘෂ්ටි යැ, අභිනිරොපණ (අරමුණට සිත නැංවීම්) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක්සංකල්ප යැ, පරිග්‍රහ (චතුර්විධ වාක්සංවර) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්වචන යැ, සමුත්ථාන (ත්‍රිවිධ කායසංවර) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක්කර්මාන්ත යැ, ව්‍යවදාන සඞ්ඛ්‍යාත විරාගය සම්‍යගාජීව යැ, ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත විරාගය සම්‍යග්ව්‍යායාම යැ උපස්ථාන (එළවීම්) සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක් ස්මෘති යැ, අවික්ෂෙප සඞ්ඛ්‍යාත විරාගය සම්‍යක් සමාධි යි.

උපට්ඨානවිරාගො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයවිරාගො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහවිරාගො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණවිරාගො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමවිරාගො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපවිරාගො සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානවිරාගො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියවිරාගො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියවිරාගො විරියබලං, පමාදෙ අකම්පියවිරාගො සතිබලං, උද්ධච්චෙ අකම්පියවිරාගො සමාධිබලං, අවිජ්ජාය අකම්පිය විරාගො පඤ්ඤාබලං.

අධිමොක්ඛවිරාගො සද්ධින්ද්‍රියං, පග්ගහවිරාගො විරියින්ද්‍රියං, උපට්ඨානවිරාගො සතින්ද්‍රියං, අවික්ඛෙපවිරාගො සමාධින්ද්‍රියං, දස්සනවිරාගො පඤ්ඤින්ද්‍රියං,

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියානි විරාගො, අකම්පියට්ඨෙන බලං විරාගො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා විරාගො, හෙතුට්ඨෙන මග්ගො විරාගො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා විරාගො, පදහනට්ඨෙන සම්මප්පධානා විරාගො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා විරාගො,[1] තථට්ඨෙන සච්චා විරාගො, අවික්ඛෙපට්ඨෙන සමථො විරාගො, අනුපස්සනට්ඨෙන විපස්සනා විරාගො, එකරසට්ඨෙන සමථවිපස්සනා විරාගො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං,[2] විරාගො, සංවරට්ඨෙන සීලවිසුද්ධි විරාගො අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි විරාගො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි විරාගො, විමුත්තට්ඨෙන විමොක්ඛො විරාගො, පටිවෙධට්ඨෙන විජ්ජා විරාගො, පරිච්චාගට්ඨෙන විමුත්ති විරාගො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං විරාගො, ඡන්දො මූලට්ඨෙන විරාගො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන විරාගො, ඵස්සො සමොධානට්ඨෙන විරාගො, වෙදනා සමොසරණට්ඨෙන විරාගො, සමාධි පමුඛට්ඨෙන විරාගො, සති ආධිපතෙය්‍යට්ඨෙන විරාගො, පඤ්ඤා තදුත්තරට්ඨෙන[3] විරාගො, විමුත්ති සාරට්ඨෙන විරාගො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන විරාගො.[4]

දස්සනමග්ගො සම්මාදිට්ඨි, අභිනිරොපනමග්ගො සම්මාසඞ්කප්පො -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන මග්ගො. එවං විරාගො මග්ගො.

කථං විමුත්ති ඵලං 'සොතාපත්තිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මා දිට්ඨි මිච්ඡාදිට්ඨියා විමුත්තා හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තා හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තා හොති. විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

විමුත්තීති ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ[5] විමුත්තා හොන්තීති විමුත්තිඵලං.

---

1. විරාගා - සී,
2. යුගනන්ධං - PTS,
3. තතුත්තරට්ඨෙන - මජසං, 7 S.
4. පරියොසානට්ඨෙන මග්ගො - මජසං, පරියොසාන විරාගො - සී. 'අමතොගධං -පෙ- විරාගො''ති ස්‍යා PTS. පොත්ථකෙසු න දිස්සති.
5. සබ්බෙ ච - මජසං.

උපස්ථාන සංඛ්‍යාත විරාගය ස්මෘතිසම්බොධ්‍යඞ්ග යෑ, ප්‍රවිචය (විමසීම්) සංඛ්‍යාත විරාගය ධර්මවිචයසම්බොධ්‍යඞ්ග යෑ, ප්‍රග්‍රහ සංඛ්‍යාත විරාගය වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ග යෑ, ඵරණ (අරමුණු කිරීම්) සංඛ්‍යාත විරාගය ප්‍රීතිසම්බොධ්‍යඞ්ග යෑ, ව්‍යුපශම සංඛ්‍යාත විරාගය ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ග යෑ, අවික්ෂෙප සංඛ්‍යාත විරාගය සමාධිසම්බොධ්‍යඞ්ග යෑ, ප්‍රත්‍යවෙක්ෂා සංඛ්‍යාත විරාගය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යි.

අශ්‍රද්ධායෙහි නො සැලීම් සංඛ්‍යාත විරාගය ශ්‍රද්ධාබල යෑ, කෞසීද්‍යයෙහි නො සැලීම් සංඛ්‍යාත විරාගය වීර්‍ය්‍යබල යෑ, ප්‍රමාදයෙහි නො සැලීම් සංඛ්‍යාත විරාගය ස්මෘතිබල යෑ, ඖද්ධත්‍යයෙහි නො සැලීම් සංඛ්‍යාත විරාගය සමාධිබල යෑ, අවිද්‍යායෙහි නො සැලීම් සංඛ්‍යාත විරාගය ප්‍රඥාබල යි.

අධිමොක්ෂ සංඛ්‍යාත විරාගය ශ්‍රද්ධෙන්ද්‍රිය යෑ, ප්‍රග්‍රහ සංඛ්‍යාත විරාගය වීර්‍ය්‍යෙන්ද්‍රිය යෑ, උපස්ථාන සංඛ්‍යාත විරාගය ස්මෘතීන්ද්‍රිය යෑ, අවික්ෂෙප සංඛ්‍යාත විරාගය සමාධීන්ද්‍රිය යෑ, දර්ශන සංඛ්‍යාත විරාගය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ විරාග යෑ, අකම්ප්‍යාර්ථයෙන් බලධර්මය විරාග යෑ, නියර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ විරාග යෑ, හෙත්වර්ථයෙන් මාර්ගය විරාග යෑ, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානයෝ විරාග යෑ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ විරාග යෑ, සමෘද්ධ වන ස්වභාවයෙන් ඍද්ධිපාදයෝ විරාග යෑ, යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ විරාග යෑ, අවික්ෂෙපාර්ථයෙන් ශමථය විරාග යෑ, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව විරාග යෑ, නො ඉක්ම පවත්නා අර්ථයෙන් යුගනද්ධය විරාග යෑ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය විරාග යෑ, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය විරාග යෑ දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය විරාග යෑ, විමුක්ත්‍යර්ථයෙන් විමොක්ෂය විරාග යෑ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව විරාග යෑ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය විරාග යෑ, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය විරාග යෑ, ඡන්දය මූලාර්ථයෙන් විරාග යෑ, මනස්කාරය සමුත්ථානාර්ථයෙන් විරාග යෑ, ස්පර්ශය සමවධානාර්ථයෙන් විරාග යෑ, වෙදනාව සමවසරණාර්ථයෙන් විරාග යෑ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් විරාග යෑ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් විරාග යෑ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් විරාග යෑ, විමුක්තිය සාරාර්ථයෙන් විරාග යෑ, අමතොගධ සංඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් විරාග යි.

දර්ශන සංඛ්‍යාත මාර්ගය සම්‍යග්දෘෂ්ටි යෑ, අභිනිරොපණ සංඛ්‍යාත මාර්ගය සම්‍යක් සංකල්ප යෑ, .. අමතොගධ සංඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් මාර්ග යි. මෙසේයින් විරාගය මාර්ග නම් වේ.

කිසෙයින් විමුක්තිය ඵල වෙයි යත්: ශ්‍රොතාපත්තිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය මිථ්‍යාදෘෂ්ටියෙන් විමුක්ත (මිදුණේ) වෙයි. තදනුවර්ත්තකක්ලෙශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි. බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි විමුක්තිය නිවන අරමුණු කොට ඇත්තී යෑ, නිවණ ගොදුරු කොට ඇත්තී යෑ, නිවන් අරමුණෙහි උපන්නී යෑ, නිවන්හි සිටියා යෑ, නිවන්හි පිහිටියා වේ.

විමුක්ති යනු: විමුක්ති දෙකෙකි: නිර්වාණය ද විමුක්ති යෑ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු’යි විමුක්තිඵල නම් වේ.

අභිනිරොපනට්ඨෙන[1] සම්මාසඞ්කප්පො මිච්ඡාසඞ්කප්පා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති. විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං,

පරිග්ගහට්ඨෙන සම්මාවාචා මිච්ඡාවාචාය විමුත්තා හොති -පෙ- සමුට්ඨානට්ඨෙන සම්මාකම්මන්තො මිච්ඡාකම්මන්තා විමුත්තො හොති -පෙ- වොදානට්ඨෙන සම්මාආජීවො මිච්ඡාආජීවා විමුත්තො හොති -පෙ- පග්ගහට්ඨෙන සම්මාවායාමො මිච්ඡාවායාමා විමුත්තො හොති -පෙ- උපට්ඨානට්ඨෙන සම්මාසති මිච්ඡාසතියා විමුත්තා හොති -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි මිච්ඡාසමාධිතො විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති. විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්තිඵලං.

සකදාගාමිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි ඔළාරිකා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා ඔළාරිකා කාමරාගානුසයා පටිඝානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්ති ගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං.

අනාගාමිඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි අණුසහගතා කාමරාගසඤ්ඤොජනා පටිඝසඤ්ඤොජනා අණුසහගතා කාමරාගානුසයා පටිඝානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා සමුදාගතා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො -පෙ- විමුත්ති ඵලං.

අරහත්තඵලක්ඛණෙ දස්සනට්ඨෙන සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපට්ඨෙන සම්මාසමාධි රූපරාගා අරූපරාගා මානා උද්ධච්චා අවිජ්ජාය මානානුසයා භවරාගානුසයා අවිජ්ජානුසයා විමුත්තො හොති, තදනුවත්තකකිලෙසෙහි ච ඛන්ධෙහි ච විමුත්තො හොති, බහිද්ධා ච සබ්බනිමිත්තෙහි විමුත්තො හොති, විමුත්ති විමුත්තාරම්මණා විමුත්තිගොචරා විමුත්තියා ඨිතා විමුත්තියා පතිට්ඨිතා,

1. අභිරොපනට්ඨෙන - සයා PTS

අභිනිරෝපණාර්ථයෙන් සම්‍යක්සංකල්පය මිථ්‍යාසංකල්පයෙන් විමුක්ත වෙයි, තදනුවර්තිකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ, නිවන් අරමුණුහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා වේ.

**විමුත්ති** යනු විමුක්ති දෙකෙක: නිර්වාණය ද විමුක්ති නම, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (සපර්යාදි) ධර්ම කෙනෙකුන් වෙත් නම් ඒ හැම විමුක්ත වෙත් නු’යි විමුක්තිඵල නම් වේ.

පරිග්‍රහාර්ථයෙන් සම්‍යග්වචනය මිථ්‍යාවචනයෙන් මිදුණේ වෙයි ... සමුත්ථානාර්ථයෙන් සම්‍යක්කර්මාන්තය මිථ්‍යාකර්මාන්තයෙන් මිදුණේ වෙයි- ව්‍යවදානාර්ථයෙන් සම්‍යගාජීවය මිථ්‍යාආජීවයෙන් මිදුණේ වෙයි- ප්‍රග්‍රහාර්ථයෙන් සම්‍යග්ව්‍යායාමය මිථ්‍යාව්‍යායාමයෙන් මිදුණේ වෙයි- උපස්ථානාර්ථයෙන් සම්‍යක්ස්මෘතිය මිථ්‍යාස්මෘතියෙන් මිදුණා වෙයි.. අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධිය මිථ්‍යාසමාධියෙන් මිදුණේ වෙයි, එය අනුව පවත්නා කෙලෙසුන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද මිදුණේ වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් මිදුණේ වෙයි, විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ නිවන් අරමුණුහු උපන්නී යෑ, විමුක්තියෙහි සිටියා විමුක්තියෙහි පිහිටියා වේ

**විමුත්ති** යනු විමුක්ති දෙකෙක· නිවන ද විමුක්ති නම, නිවන්අරමුණුහි උපන් යම් (සපර්යාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු’යි විමුක්තිඵල නම් වේ.

සකෘදාගාමිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය අවික්ෂේපාර්ථයෙන් සම්‍යක් සමාධිය ඖදාරික වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් ඖදාරික වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විමුක්ත වෙයි, තදනුවර්තිකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි. බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිවන් අරමුණු කොට ඇත්තී යෑ, නිවන් ගොදුරු කොට ඇත්තී යෑ, නිවන් අරමුණුහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා යි.

**විමුත්ති** යනු: විමුක්ති දෙකෙකි නිර්වාණය ද විමුක්ති යෑ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (සපර්යාදි) ධර්ම කෙනෙක් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු’යි විමුක්තිඵල යි.

අනාගාමිඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය .. අවික්ෂේපාර්ථයෙන් සම්‍යක්සමාධිය අණුසහගත වූ කාමරාගසංයෝජනයෙන් ප්‍රතිඝසංයෝජනයෙන් අණුසහගත වූ කාමරාගානුශයෙන් ප්‍රතිඝානුශයෙන් විමුක්ත වෙයි, තදනුවර්තිකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිර්වාණය ආලම්බන කොට ඇත්තී යෑ, නිර්වාණය ගොචර කොට ඇත්තී යෑ, නිර්වාණාලම්බනයෙහි උපන්නී යෑ, නිවන්හි සිටියා නිවන්හි පිහිටියා වේ.

**විමුත්ති** යනු විමුක්ති දෙකෙකි විමුක්තිඵල යි.

අර්හත්ඵලක්ෂණයෙහි දර්ශනාර්ථයෙන් සම්‍යග්දෘෂ්ටිය ... අවික්ෂේපාර්ථයෙන් සම්‍යක් සමාධිය රූපරාගයෙන් අරූපරාගයෙන් මානයෙන් ඖද්ධත්‍යයෙන් අවිද්‍යායෙන් මානානුශයෙන් භවරාගානුශයෙන් අවිද්‍යානුශයෙන් විමුක්ත වෙයි තදනුවර්තිකක්ලේශයන් කෙරෙන් ද ස්කන්ධයන් කෙරෙන් ද විමුක්ත වෙයි, බාහ්‍ය වූ ත් හැම නිමිත්ත කෙරෙන් විමුක්ත වෙයි. විමුක්තිය නිර්වාණය ආලම්බන කොට ඇත්තී යෑ, නිර්වාණය ගොචර කොට ඇත්තී යෑ, නිර්වාණාලම්බනයෙහි උපන්නී යෑ, නිර්වාණාලම්බනයෙහි සිටියා නිර්වාණාලම්බනයෙහි පිහිටියා වේ.

**විමුත්තීති** ද්වෙ විමුත්තියො: නිබ්බානඤ්ච විමුත්ති, යෙ ච නිබ්බානාරම්මණතා ජාතා ධම්මා සබ්බෙ විමුත්තා හොන්තීති විමුත්ති ඵලං,

දස්සනවිමුත්ති සම්මාදිට්ඨි -පෙ- අවික්ඛෙපවිමුත්ති සම්මාසමාධි, උපට්ඨානවිමුත්ති සතිසම්බොජ්ඣඞ්ගො -පෙ- පටිසඞ්ඛානවිමුත්ති උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො, අස්සද්ධියෙ අකම්පිය විමුත්ති සද්ධාබලං -පෙ- අවිජ්ජාය අකම්පිය විමුත්ති පඤ්ඤාබලං, අධිමොක්ඛවිමුත්ති සද්ධින්ද්‍රියං -පෙ- දස්සනවිමුත්ති පඤ්ඤින්ද්‍රියං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියා විමුත්ති, අකම්පියට්ඨෙන බලා විමුත්ති, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගා විමුත්ති, හෙතුට්ඨෙන මග්ගො විමුත්ති, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා විමුත්ති, පදහනට්ඨෙන සම්මප්පධානා විමුත්ති, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා විමුත්ති, තථට්ඨෙන සච්චා විමුත්ති, අවික්ඛෙපට්ඨෙන සමථො විමුත්ති, අනුපස්සනට්ඨෙන විපස්සනා විමුත්ති, එකරසට්ඨෙන සමථවිපස්සනා විමුත්ති, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං විමුත්ති, සංවරට්ඨෙන සීලවිසුද්ධි විමුත්ති, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි විමුත්ති, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි විමුත්ති, විමුත්තට්ඨෙන විමොක්ඛො විමුත්ති, පටිවෙධට්ඨෙන විජ්ජා විමුත්ති, පරිච්චාගට්ඨෙන විමුත්ති විමුත්ති, පටිප්පස්සද්ධියට්ඨෙන අනුප්පාදෙ ඤාණං විමුත්ති, ඡන්දො මූලට්ඨෙන විමුත්ති, මනසිකාරො සමුට්ඨානට්ඨෙන විමුත්ති, ඵස්සො සමොධානට්ඨෙන විමුත්ති, වෙදනා සමොසරණට්ඨෙන විමුත්ති, සමාධි පමුඛට්ඨෙන විමුත්ති, සති ආධිපතෙය්‍යට්ඨෙන විමුත්ති, පඤ්ඤා තදුත්තරට්ඨෙන විමුත්ති, විමුත්ති සාරට්ඨෙන විමුත්ති, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන විමුත්ති, එවං විමුත්ති ඵලං.

එවං විරාගො මග්ගො, විමුත්ති ඵලන්ති.

**විරාගකථා සමත්තා**

## 2. 6

## පටිසම්භිදා කථා

එවං මෙ සුතං, එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ ආමන්තෙසි:

“ද්වෙමෙ භික්ඛවෙ, අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා: කතමෙ ද්වෙ යො චායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියො අනත්ථසංහිතො යො චා’යං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියො අනත්ථසංහිතො. එතෙ තෙ[1] භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

1 එතෙ ඛො - මජසං

විමුක්ති යනු විමුක්ති දෙකෙකි: නිර්වාණය ද විමුක්ති යැ, නිර්වාණාලම්බනයෙහි උපන් යම් (ස්පර්ශාදි) ධර්ම කෙනෙකුත් වෙත් නම් එ හැම විමුක්ත වෙත් නු'යි විමුක්තිඵල යැ.

දර්ශන සඞ්ඛ්‍යාත විමුක්තිය සම්‍යග්දෘෂ්ටි යැ ... අවික්ෂෙපවිමුක්තිය සම්‍යක් සමාධි යැ උපස්ථානවිමුක්තිය ස්මෘතිසම්බොධ්‍යඞ්ග යැ ... පටිසඞ්ඛාන විමුක්තිය උපෙක්ෂාසම්බොධ්‍යඞ්ග යැ අශ්‍රද්ධායෙහි නො සැලෙන විමුක්තිය ශ්‍රද්ධාබල යැ ... අවිද්‍යායෙහි නො සැලෙන විමුක්තිය ප්‍රඥාබල යැ. අධිමොක්ෂවිමුක්තිය ශ්‍රද්ධෙන්ද්‍රිය යැ ... දර්ශනවිමුක්තිය ප්‍රඥෙන්ද්‍රිය යි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියයෝ විමුක්ති යැ, අකම්ප්‍යාර්ථයෙන් බලධර්මයෝ විමුක්ති යැ, නියර්යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගයෝ විමුක්ති යැ හෙත්වර්ථයෙන් මාර්ගය විමුක්ති යැ, එළඹන අර්ථයෙන් සතිපට්ඨානයෝ විමුක්ති යැ, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රදහනයෝ විමුක්ති යැ, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදයෝ විමුක්ති යැ, යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ විමුක්ති යැ, අවික්ෂෙපාර්ථයෙන් ශමථය විමුක්ති යැ අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව විමුක්ති යැ, එකකෘත්‍යාර්ථයෙන් ශමථ-විදර්ශනා විමුක්ති යැ, (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා ස්වභාවයෙන් යුගනද්ධය විමුක්ති යැ, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය විමුක්ති යැ අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය විමුක්ති යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය විමුක්ති යැ, විමුක්තාර්ථයෙන් විමොක්ෂය විමුක්ති යැ, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව විමුක්ති යැ, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය විමුක්ති යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යර්ථයෙන් අනුත්පාදඥානය විමුක්ති යැ, ඡන්දය මූලාර්ථයෙන් විමුක්ති යැ, මනස්කාරය සමුත්ථානාර්ථයෙන් විමුක්ති යැ ස්පර්ශය සමවධානාර්ථයෙන් විමුක්ති යැ, වෙදනාව සමවසරණාර්ථයෙන් විමුක්ති යැ, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් විමුක්ති යැ, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් විමුක්ති යැ, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් විමුක්ති යැ, විමුක්තිය සාරාර්ථයෙන් විමුක්ති යැ, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් විමුක්ති යැ, මෙසෙයින් විමුක්තිය ඵල වේ.

මෙසෙයින් විරාගය මාර්ග වෙයි, විමුක්තිය ඵල වේ යයි.

**විරාගකථා නිමි.**

## 2. 6

## ප්‍රතිසංවිත් කථා

"මා විසින් මෙසේ අසන ලද එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස ඉසිපතන්හි මිගදාය නම් වූ අරම්හි වාසය කරණ සේක. එසමයෙහි භාග්‍යවතුන් වහන්සේ පස්වගමහණුන් ඇමතූ සේක:

මහණෙනි, මේ අන්තයෝ දෙදෙනෙක් පැවිද්දහු විසින් නො සෙවිය යුත්තාහ. කවර දෙදෙනෙක යත්: යම් හීන වූ ග්‍රාම්‍ය වූ පෘථග්ජනයන් විසින් ආචීර්ණ වූ අනාර්ය වූ අනර්ථසංහිත වූ වස්තුකාමයෙහි කෙල්ශකාමසුඛයාගේ අනුයෝගයෙකුත් වේ ද, යම් දුක් වූ අනාර්ය වූ අනර්ථසංහිත වූ ආත්මක්ලමථයාගේ අනුයෝගයෙකුත් වේ ද මොහු දෙදෙන වෙත් මහණෙනි, තෙල අන්තද්වයට නො පැමිණ තථාගත විසින් ප්‍රතිවෙධ කරන ලද පැනඇස් ඇති කරන්නී වූ නුවණ ඇති කරන්නී වූ මධ්‍යමප්‍රතිපදාව කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුස්සත්‍යයාගේ අභිජානනය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං· සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි, අයං ඛො සා භික්ඛවෙ, මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛං අරියසච්චං: ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛො, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගො දුක්ඛො, පියෙහි විප්පයොගො දුක්ඛො, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛසමුදයො[1] අරියසච්චං: යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං: කාම-තණ්හා භවතණ්හා විභවතණ්හා.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධො[2] අරියසච්චං: යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො.

ඉදං ඛො පන භික්ඛවෙ, දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං: අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථීදං: සම්මාදිට්ඨි -පෙ- සම්මාසමාධි.

ඉදං දුක්ඛං අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, 'තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති මෙ භික්ඛවෙ, -පෙ- පරිඤ්ඤාත'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණ උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උපාදි, ආලොකො උදපාදි.

'ඉදං දුක්ඛසමුදයො[2] අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බ'න්ති මෙ භික්ඛවෙ, පෙ 'පහීන'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි

'ඉදං දුක්ඛනිරොධො[3] අරියසච්ච'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බං'න්ති මෙ භික්ඛවෙ -පෙ- 'සච්ඡිකත'න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

---

1. දුක්ඛසමුදයං - සී, මජසං PTS සං.
2. දුක්ඛනිරොධං - සී මජසං PTS සං.

මහණෙනි, තථාගතයන් විසින් ප්‍රතිවෙධ කරනලද, පැනැස උපදවන නුවණ උපදවන ඒ කවර මධ්‍යමප්‍රතිපදාවක් කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුසසත්‍යයාගේ අභිජානනය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී ද යත්: මෙ මැ ආර්‍යාෂ්ටාඞ්ගිමාර්ගී යැ, හෙ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ, සම්‍යක් සංකල්ප යැ සම්‍යග්වචන යැ සම්‍යක්කර්මාන්ත යැ සම්‍යගාජීව යැ සම්‍යක් ව්‍යායාම යැ සම්‍යක් ස්මෘති යැ සම්‍යක් සමාධි යැ යි. මහණෙනි, තථාගතයන් විසින් ප්‍රතිවෙධ කරනලද පැනැස උපදවන නුවණ උපදවන මේ ඒ මධ්‍යමප්‍රතිපදාව කෙලෙසුන් සන්හිඳීම පිණිස චතුසසත්‍යයාගේ අභිජානනය පිණිස සම්බොධය පිණිස නිර්වාණය පිණිස පවතී.

මහණෙනි, මේ වනාහි දුඃඛ නම් වූ ආර්‍ය සත්‍යය වෙයි, ජාතිය ද දුක් යැ ජරාව ද දුක් යැ ව්‍යාධිය ද දුක් යැ මරණය ද දුක් යැ අප්‍රියයන් හා සමග එක්වීම ද දුක් යැ ප්‍රියයන් කෙරෙන් වෙන්වීම ද දුක් යැ ඉස්තේ යමක් නො ලබා නම් එ ද දුක් යැ සැකෙවින් පඤ්චොපාදානස්කන්ධයෝ දුඃඛයෝ යි.

මහණෙනි, මේ වනාහි දුඃඛසමුදය නම් වූ ආර්‍යසත්‍යය වෙයි: යම් තෘෂ්ණාවක් පුනර්භවය කරනසුලු ද නන්දිරාගය හා සමග එකත්වයට ගියා ද ඒ ඒ භවයෙහි සතුටුවනසුලු ද හෝ තෘෂ්ණා යැ. හේ මෙසේ යැ: කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභවතෘෂ්ණා යි.

මහණෙනි, මේ වනාහි දුඃඛනිරොධ නම් වූ ආර්‍යසත්‍යය වෙයි: ඒ මැ තෘෂ්ණායෙහි යම් අශෙෂවිරාග සඞ්ඛ්‍යාත නිරොධයෙක් ත්‍යාගයෙක් හැරපී-මෙක් මුක්තියක් ආලය රහිත බවෙක් වේ ද හේ යැ.

මහණෙනි, මේ වනාහි දුඃඛනිරොධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍යසත්‍යය වෙයි: මෙ මැ ආර්‍යාෂ්ටාඞ්ගිකමාර්ගී යැ,, හෙ මෙසේ යැ: සම්‍යග්දෘෂ්ටි යැ ... සම්‍යක් සමාධි යැ යි.

මහණෙනි, 'මේ දුඃඛ නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූ විරූ දහම්හි මට පැනැස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ග-විද්‍යාව පහළ වූ යැ ආලෝකය පහළ විය. තවද මහණෙනි, ඒ මේ දුඃඛ නම් වූ ආර්‍යසත්‍යය (සාමාන්‍යලක්ෂණාවබොධ විසින්) පිරිසිඳ දතයුතු යැ'යි මට ... මහණෙනි, ම විසින් 'පරිඥාත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ඥානය පහළ විය ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය. ආලෝකය පහළ වී.

මහණෙනි, 'මේ දුඃඛසමුදය නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය. ආලෝකය පහළ විය තවද මහණෙනි, 'ඒ මේ දුඃඛසමුදය නම් වූ ආර්‍යසත්‍යය ප්‍රහාතව්‍ය යැ'යි මට ... මහණෙනි, ම විසින් 'ප්‍රහීන යැ'යි පෙර නො ඇසූ විරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

මහණෙනි, 'මේ දුඃඛනිරොධ නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලොකය පහළ වී. තවද මහණෙනි, 'ඒ මේ දුඃඛනිරොධ නම් වූ ආර්‍යසත්‍යය සාක්ෂාත්කර්තව්‍ය යැ'යි මට ... මහණෙනි, මා විසින් 'සාක්ෂාත්කෘත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, මාර්ගවිද්‍යාව පහළ විය, ආලොකය පහළ වී.

'ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චන්'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. 'තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බන්'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතන්'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

යාවකීවඤ්ච මෙ භික්ඛවෙ, ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි. නෙව තාවාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධො'ති පච්චඤ්ඤාසිං. යතො ච ඛො මෙ භික්ඛවෙ, ඉමෙසු චතුසු අරියසච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි, අථාහං භික්ඛවෙ, සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ-බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය 'අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බු-ද්ධො'ති පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මෙ දස්සනං උදපාදි: 'අකුප්පා මෙ විමුත්ති,[1] අයමන්තිමා ජාති, නත්ථිදානි පුනබ්භවො'ති.

ඉදමවොච භගවා, අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්'ති.

ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩ-ඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි: 'යං කිඤ්චි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මන්'ති.

පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භුම්මා දෙවා සද්දමනුස්සා-වෙසුං: එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්ම-චක්කං පවත්තිතං, අප්පතිවත්තියං[2] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්'ති. භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා[3] දෙවා සද්දමනුස්සාවෙසුං: -පෙ- චාතුම්මහා-රාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා -පෙ- යාමා දෙවා -පෙ- තුසිතා දෙවා -පෙ- නිම්මානරතී දෙවා -පෙ- පරනිම්මිතවසවත්තී දෙවා -පෙ- බ්‍රහ්මකායිකා දෙවා සද්දමනුස්සාවෙසුං: 'එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්'ති.

ඉතිහ තෙන ඛණෙන* තෙන මුහුත්තෙන යාව බ්‍රහ්මලොකා සද්දො අබ්භුග්ගඤ්ඡි,[4] අයඤ්ච දසසහස්සිලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි, අප්පමාණො ච උළාරො ඔභාසො ලොකෙ පාතුරහොසි අතික්කම්ම[5] දෙවානං දෙවානුභාවන්ති.

1 චෙතොවිමුත්ති - සයා, PTS. 2. අප්පටිවත්තියං - මජසං සයා PTS
3. චාතුමහාරාජිකා - මජසං. 4. අබ්භුග්ගච්ඡි - මජසං සයා PTS
5. අතික්කම්මෙව - සයා PTS.
* තෙන ලයෙනාති - මජසං. පොත්ථකං අයිකං.

මහණෙනි, 'මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි මට පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, ආලොකය පහළ විය. තවද මහණෙනි, ඒ මේ දුඃඛනිරොධගාමිනීප්‍රතිපත් නම් වූ ආර්‍ය්‍යසත්‍යය භාවිතව්‍ය යැ'යි මට ... මහණෙනි, ම විසින් භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

මහණෙනි, යම්තාක් මට මේ සතර ආර්‍ය්‍යසත්‍යයන්හි මෙසේ තුන් පරිවෘත්තයක් ඇති දෙළොස් ආකාරයක් ඇති ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශනය ඇති සැටියෙන් සුවිශුද්ධ නො වී ද, මහණෙනි, ඒ තාක් මට මරුන් සහිත බඹුන් සහිත සදේවකලෝකයෙහි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි 'අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අභිසම්බුද්ධයෙමි' නො මැ පිළිත කෙළෙමි. මහණෙනි, වැළිත් යම් කලෙක මට මේ සතර ආර්‍ය්‍යසත්‍යයන්හි මෙසේ තුන් පරිවෘත්තයක් ඇති දෙළොස් ආකාරයක් ඇති ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශනය ඇති සැටියෙන් සුවිශුද්ධ වී ද, මහණෙනි, එකල්හි මම මරුන් සහිත බඹුන් සහිත සදේවකලෝකයෙහි මහණබමුණන් සහිත දෙව්මිනිසුන් සහිත ප්‍රජායෙහි 'අනුත්තර වූ සම්‍යක් සම්බොධිය අභිසම්බුද්ධයෙමි' පිළින කෙළෙමි. මට ඥාන සඞ්ඛ්‍යාත දර්‍ශන පහළ විය. මාගේ විමුක්තිය අකොප්‍ය වෙයි. මේ පශ්චිම සකන්ධප්‍රවෘත්තිය යැ, දැන් පුනර්භවයෙක් නැතැ'යි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ, සතුටුසිත් ඇති පස්වගමහණහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතයට සතුටු වූහ.

මේ වෙය්‍යාකරණය වදරනු ලබන කල්හි ආයුෂ්මත් කොණ්ඩඤ්ඤ ස්ථවිරයන්ට පහවූ රාගාදිරජස් ඇති පහවූ රාගාදිමල ඇති ප්‍රථමමාර්‍ගඥාන සඞ්ඛ්‍යාත ධර්මචක්ෂුස පහළ විය: 'යම්කිසි සමුදයසවභාව ඇති ධර්මයක් වේ නම් එ හැම නිරොධ සවභාව ඇත්තේ යැ'යි.

තවද භාග්‍යවතුන් විසින් දම්සක් පැවැත්වූ කල්හි 'තෙල භාග්‍යවතුන් විසින් බරණැස ඉසිපතනහි මිගදාය නම් අරම්හි දී මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ පිළිලොම් වැ නො පැවැත්විය හැකි අනුත්තර වූ දම්සක් පවත්වනලද'යි භූමාටු දෙවියෝ සාධුකාර දී හඬ ඇස්වූහ. භූමාටුදෙවියන්ගේ හඬ අසා සිව්මහරදවැසි දෙවියෝ හඬ ඇස්වූහ. ... සිව්මහරද වැසි දෙවියන්ගේ හඬ අසා තව්තිසාවැසි දෙවියෝ ... යාම-දෙවියෝ ... තුසිතදෙවියෝ ... නිර්මමාණරතිදෙවියෝ ... පරනිර්මිතවශ-වර්තිදෙවියෝ ... බ්‍රහ්මකායික දෙවියෝ 'තෙල භාග්‍යවතුන් විසින් බරණැස ඉසිපතනහි මිගදාය නම් අරම්හි දී මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ පිළිලොම් වැ නො පැවැත්වියහැකි අනුත්තර වූ දම්සක් පවත්වනලද'යි සාධුකාර දී හඬ ඇස්වූහ.

මෙසේ එකෙණෙහි ඒ මොහොතෙහි බඹලොව තෙක් සාධුකාරශබ්දය උස් වැ ගියේ යැ. මේ දශසහස්‍රලෝකධාතුව ද මොනොවට කම්පිත විය මොනොවට ප්‍රකම්පිත විය මොනොවට වෙවුලී යැ, දෙවියන්ගේ දේවානු-භාවය ඉක්ම අප්‍රමාණ වූ මහත් වූ අවභාසයෙක් ද ලෝකයෙහි ප්‍රාදුර්භූත වී.

අථ ඛො භගවා ඉමං උදානං උදානෙසි: 'අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤො'ති. ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස 'අඤ්ඤාකොණ්ඩඤ්ඤො' ත්වෙව[1] නාමං අහොසි ॥

'ඉදං දුක්ඛං අරියසච්ච'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී,ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'.

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටි-සම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා'.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා. ඉමා දස නිරුත්තියො නිරුත්ති-පටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා අරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා'.

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'

'තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති -පෙ- 'පරිඤ්ඤා-ත'න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

---

1 අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො - මජසං. අඤ්ඤාතකොණ්ඩඤ්ඤො - PTS

॥ සච්චසංයුත්ත - ධම්මචක්කප්පවත්තනවග්ග.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භවත් කොණ්ඩඤ්ඤ ඒකාන්තයෙන් චතුසත්‍යය දත්තේ යැ. භවත් කොණ්ඩඤ්ඤ ඒකාන්තයෙන් චතුසත්‍යය දත්තේ යැ’යි මේ උදානය පැවැත් වූ සේක. මෙ අයුරින් ආයුෂ්මත් කොණ්ඩඤ්ඤස්ථවිරයන්ට ‘අඤ්ඤාකොණ්ඩඤ්ඤ යැ’යි නම් වී’.

‘මේ දුඃඛ නම් වූ ආර්යසත්‍ය යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය නුවණ පහළ විය ප්‍රඥාව පහළ විය විද්‍යාව පහළ විය ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ඤාණං උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘විජ්ජා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ආලොකො උදපාදි’ යනු කවර අර්ථයෙන යත්: ‘චක්ඛුං උදපාදි’ යනු දර්ශනාර්ථයෙන, ‘ඤාණං උදපාදි’ යනු ඥානාර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු ප්‍රජානනාර්ථයෙන, ‘විජ්ජා උදපාදි’ යනු ප්‍රතිවේධාර්ථයෙන, ‘ආලොකො උදපාදි’ යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, ඥානය ධර්ම යැ, ප්‍රඥාව ධර්ම යැ, විද්‍යාව ධර්ම යැ, ආලෝකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති, යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්මප්‍රති-සංවිදාවට ගෝචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා’යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥානාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රති-වේධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච අර්ථයෝ අර්ථප්‍රතිසං-විදාවට ආලම්බන ද ගෝචර ද වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඈයට ගොචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථ-ප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඈයට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්ච අර්ථයන් දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති, යම් නිරුක්ති කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ති කෙනෙක් ඒ නිරුක්ති-ප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘නිරුත්තිසු ඤාණං නිරුත්තිපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ යැ පඤ්චඅර්ථයන්හි ඥානයෝ යැ දශ-නිරුක්තීන්හි ඥානයෝ යැ. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රති-සංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා’යි.

තවද, ඒ මේ දුඃඛ නම් වූ ආර්යසත්‍යය පිරිසිඳ දතයුතු යැ’යි ... ‘පිරිසිඳ දන්නාලද්දැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය, නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදී’ති ඤාණට්ඨෙන, ‘ඤාණං උදපාදී’ති ඤාණට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති ඤාණට්ඨෙන, ‘විජ්ජා උදපාදී’ති ඤාණට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති ඤාණට්ඨෙන: ‘චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන, ‘ඤාණං උදපාදී’ති ඤාතට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති පජානනට්ඨෙන, ‘විජ්ජා උදපාදී’ති පටිවෙධට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො, ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.’

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා, තෙන වුච්චති: ‘අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.’

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.’

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.’

දුක්ඛෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

‘ඉදං දුක්ඛසමුදයො අරියසච්ච’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- ‘තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං පහාතබ්බ’න්ති -පෙ- ‘පහීන’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- දුක්ඛසමුදයෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, ඥානය ධර්ම යැ, ප්‍රඥව ධර්ම යැ විද්‍යාව ධර්ම යැ, ආලෝකය ධර්ම යැ මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්මප්‍රති-සංවිදාවට ගොචර වෙති, යම් ධර්ම කෙනෙක්, ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥතාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යැ, මේ පඤ්චඅර්ථයෝ අර්ථප්‍රති-සංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසං-විදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා'යි

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්චඅර්ථයන් දක්වන්නට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් නිරුක්ති අභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'නිරුත්තිසු ඤාණං නිරුත්ති-පටිසම්භිදා'යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ යැ පඤ්චඅර්ථයන්හි ඥානයෝ යැ. දශ-නිරුක්තීන්හි ඥානයෝ යැ මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රති-සංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'යි.

දුඃඛාර්‍ය්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ දුඃඛසමුදය නම් වූ ආර්‍ය්‍යසත්‍යය ප්‍රහාතව්‍ය යැ'යි ... ප්‍රහීණ යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලොකය පහළ විය .. දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

‘ඉදං දුක්ඛනිරොධො අරියසච්ච’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- ‘තං ඛො පනිදං දුක්ඛනිරොධො අරියසච්චං සච්ඡිකාතබ්බ’න්ති -පෙ- සච්ඡිකත’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, -පෙ- දුක්ඛනිරොධෙ අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

‘ඉදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්ච’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- ‘තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං භාවෙතබ්බ’න්ති -පෙ- ‘භාවිත’න්ති පුබ්බෙ අනනස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- දුක්ඛනිරොධගාමිනියා පටිපදාය අරියසච්චෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු අරියසච්චෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං[1] නිරුත්තියො, චත්තාරීසඤ්ච[2] ද්වෙ ච ඤාණසතානි.

“අයං කායෙ කායානුපස්සනා’ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ‘සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා’ති මෙ භික්ඛවෙ, -පෙ- භාවිතා’ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

“අයං වෙදනාසු -පෙ- අයං චිත්තෙ -පෙ- අයං ධම්මෙසු ධම්මානුපස්සනා’ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා ‘භාවෙතබ්බා’ති -පෙ- භාවිත’න්ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි”[a].

‘අයං කායෙ කායානුපස්සනා’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සා ඛො පනායං කායෙ කායානුපස්සනා ‘භාවෙතබ්බා’ති -පෙ- ‘භාවිතා’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

‘චක්ඛුං උදපාදී’ති කෙනට්ඨෙන, ඤාණං උදපාදී’ති කෙනට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති කෙනට්ඨෙන, විජ්ජා උදපාදී’ති කෙනට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති කෙනට්ඨෙන: චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන, ‘ඤාණං උදපාදී’ති ඤාතට්ඨෙන, ‘පඤ්ඤා උදපාදී’ති පජානනට්ඨෙන, විජ්ජා උදපාදී’ති පටිවෙධට්ඨෙන, ‘ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච, යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.

1. විසංතිසත - මජසං., වීසසතං - සං., PTS 2. චත්තාලීසඤ්ච - මජසං.

a. සතිපට්ඨාන සංයුත්ත - අනනුස්සුතවග්ග 1

'මේ දුඃඛනිරෝධ නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ දුඃඛනිරෝධ නම් වූ ආර්‍යසත්‍යය සාක්‍ෂාත්කතව්‍ය යැ'යි ... සාක්‍ෂාත්කෘත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලෝකය පහළ විය ... දුඃඛනිරෝධ නම් වූ ආර්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක. අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපද නම් වූ ආර්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ දුඃඛනිරෝධගාමිනීප්‍රතිපද නම් වූ ආර්‍යසත්‍යය භාවිතව්‍ය යැයි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය ... දුඃඛනිරෝධගාමිනීප්‍රතිපද නම් වූ ආර්‍යසත්‍යයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර ආර්‍යසත්‍යයන්හි ධර්ම සැටෙක, අර්ථ සැටෙක, නිරුක්ති එක්සිය-විස්සෙක, ඥාන දෙසියසතලිසෙකි.

මහණෙනි, මට 'මේ කයෙහි කායානුපස්සනා භාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ආලෝකය පහළ විය. තවද මහණෙනි, මට 'ඒ මේ කයෙහි කායානුපස්සනාභාවනාව භාවිතව්‍යය යැ'යි ... මහණෙනි, මා විසින් භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. ... ආලෝකය පහළ වී.

මහණෙනි, මට 'මේ වෙදනාවන්හි ... මේ චිත්තයෙහි .. මහණෙනි, මට 'මේ ධර්මයන්හි ධම්මානුපස්සනා භාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ ධර්මයන්හි ධම්මානු-පස්සනා භාවනාව භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ වී.

'මේ කයෙහි කායානුපස්සනාභාවනා යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය ... ආලෝකය පහළ විය. ... තවද ඒ මේ කයෙහි කායානු-පස්සනාභාවනාව භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි පැනැස පහළ විය. නුවණ පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, 'ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥාතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථ-යෙන, 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ ඥානය ධර්ම යැ ප්‍රඥාව ධර්ම යැ විද්‍යාව ධර්ම යැ ආලෝකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදවට ආලම්බන ද ගොචර ද වෙති යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදවට ආලම්බන වෙත් ද ඔහු, ඒ ධර්ම-ප්‍රතිසංවිදවට ගෝචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදවට ආලම්බන වෙත්, එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා'යි.

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා, යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.'

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා, යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.'

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.'

කායෙ කායානුපස්සනාසතිපට්ඨානෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

'අයං වෙදනාසු -පෙ- අයං චිත්තෙ -පෙ- 'අයං ධම්මෙසු ධම්මානුපස්සනා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා භාවෙතබ්බා'ති -පෙ- 'භාවිතා'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. -පෙ- ධම්මෙසු ධම්මානුපස්සනාසතිපට්ඨානෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු සතිපට්ඨානෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං[1] නිරුත්තියො, චත්තාරීසඤ්ච[2] ද්වෙ ච ඤාණසතානි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ, -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- 'අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. 'සො ඛො පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ, -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ, පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

1 වීසතිසතං - මජසං. වීසංසතං - සයා PTS 2 චත්තාලීසඤ්ච - මජසං

දර්ශනාර්ථය අර්ථ යැ ඥාතාර්ථ යැ අර්ථ යැ ප්‍රජානනාර්ථය අර්ථ යැ ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ අවභාසාර්ථය අර්ථ යි. මේ පසළොස් අර්ථයෝ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙති, යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා' යි.

පසළොස් ධර්මයන් (මෙරමාහට) දක්වනුවට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති, පසළොස් අර්ථයන් දක්වනුවට ව්‍යඤ්ජනනිරුක්ත්‍යභිලාපයෝ වෙති. මේ දශනිරුක්තීහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිස විදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගොචර වෙති, යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්, එයින් කියනු ලැබෙයි: 'නිරුත්තිසු ඤාණං නිරුත්තිපටිසම්භිදා'යි.

පසළොස්ධර්මයන්හි ඥානයෝ යැ පසළොස්අර්ථයන්හි ඥානයෝ යැ දශනිරුක්තීන්හි ඥානයෝ යැ. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභාන ප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙති, යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙති, එයින් කියනු ලැබෙයි: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා'යි.

කයෙහි කායානුපස්සනාසතිපට්ඨානභාවනායෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'මේ වෙදනාවන්හි .. මේ චිත්තයෙහි ... මේ ධර්මයන්හි ධර්මානුදර්ශන යැ'යි පෙර නො ඇසූවිරූ ධර්මයන්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ විය ... තවද ඒ මේ ධර්මයන්හි ධර්මානුදර්ශනය භාවිතව්‍ය යැ'යි ... භාවිත යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළවිය ... ආලොකය පහළ විය ... ධර්මයන්හි ධම්මානුපස්සනා සතිපට්ඨානයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර සතිපට්ඨානයන්හි ධර්ම සැටෙක. අර්ථ සැටෙක, නිරුක්ති එක්සියවිස්සෙක, ඥාන දෙසිය සාළිසෙකි.

'මේ කර්තුකම්‍යතා කුශලච්ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාද යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය .. ආලොකය පහළ විය, 'තවද ඒ මේ ඡන්ද සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ'යි මහණෙනි, මට ... භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ වී.

'මේ වීර්‍ය්‍යාධිපතිසමාධියෙන් මේ චිත්තාධිපතිසමාධියෙන් ... මේ වීමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාද ය'යි මහණෙනි, මට පෙර නො ඇසූ විරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ වීමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ'යි මහණෙනි, මට 'භාවිත යැ'යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලොකය පහළ වී.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

'චක්ඛුං ධම්මො, ඤාණං ධම්මො, පඤ්ඤා ධම්මො, විජ්ජා ධම්මො, ආලොකො ධම්මො. ඉමෙ පඤ්ච ධම්මා ධම්මපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති 'ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා.'

දස්සනට්ඨො අත්ථො, ඤාතට්ඨො අත්ථො, පජානනට්ඨො අත්ථො, පටිවෙධට්ඨො අත්ථො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච අත්ථා අත්ථපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා.

පඤ්ච ධම්මෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, පඤ්ච අත්ථෙ සන්දස්සෙතුං බ්‍යඤ්ජනනිරුත්තාභිලාපා, ඉමා දස නිරුත්තියො නිරුත්තිපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා.'

පඤ්චසු ධම්මෙසු ඤාණානි, පඤ්චසු අත්ථෙසු ඤාණානි, දසසු නිරුත්තීසු ඤාණානි, ඉමානි වීසති ඤාණානි පටිභානපටිසම්භිදාය ආරම්මණා චෙව හොන්ති ගොචරා ච. යෙ තස්සා ආරම්මණා, තෙ තස්සා ගොචරා. යෙ තස්සා ගොචරා, තෙ තස්සා ආරම්මණා. තෙන වුච්චති: 'පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා.'

ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතෙ ඉද්ධිපාදෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

“මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත ඍද්ධිපාද යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය ... ‘තවද ඒ මේ ඡන්දාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ’යි ... ‘භාවිත යැ’යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ඤාණං උදපාදි’’ යනු කවර අර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘විජ්ජා උදපාදි’ යනු කවර අර්ථයෙන, ‘ආලෝකො උදපාදි’ යනු කවර අර්ථයෙන යත්: ‘චක්ඛුං උදපාදි’ යනු දර්ශනාර්ථයෙන, ‘ඤාණං උදපාදි’ යනු ඥාතාර්ථයෙන, ‘පඤ්ඤා උදපාදි’ යනු ප්‍රජානනාර්ථයෙන, ‘විජ්ජා උදපාදි’’ යනු ප්‍රතිවෙධාර්ථයෙන, ‘ආලොකො උදපාදි’ යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ ඥානය ධර්මය, ප්‍රඥාව ධර්ම යැ විද්‍යාව ධර්ම යැ ආලෝකය ධර්ම යි. මේ පඤ්චධර්මයෝ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ධර්ම ප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ධර්ම කෙනෙක් ඒ ධර්මප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ධර්මප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්, එයින් කියනු ලැබෙයි: ‘ධම්මෙසු ඤාණං ධම්මපටිසම්භිදා’යි.

දර්ශනාර්ථය අර්ථ යැ, ඥාතාර්ථය අර්ථ යැ, ප්‍රජානනාර්ථය අර්ථ යැ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ ප්‍රඤ්ච අර්ථයෝ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් අර්ථ කෙනෙක් ඒ අර්ථප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ අර්ථප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනුලැබෙයි: ‘අත්ථෙසු ඤාණං අත්ථපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන් (මෙරමාහට) දක්වනුවට ව්‍යඤ්ජන නිරුක්ත්‍යභිලාපයෝ වෙති, පඤ්ච අර්ථයන් දක්වනුවට ව්‍යඤ්ජන නිරුක්ත්‍යභිලාපයෝ වෙති, මේ දශනිරුක්තිහු නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන ද ගෝචර ද වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙති. යම් නිරුක්ත්‍යභිලාප කෙනෙක් ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ගෝචර වෙත් ද ඔහු ඒ නිරුක්තිප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනුලැබෙයි: ‘නිරුත්තීසු ඤාණං නිරුත්තිපටිසම්භිදා’යි.

පඤ්චධර්මයන්හි ඥානයෝ වෙති, පඤ්චඅර්ථයන්හි ඥානයෝ වෙති, දශනිරුක්තීන්හි ඥානයෝ වෙත්. මේ විංශද්ඥානයෝ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන ද ගොචර ද වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙති. යම් ඥාන කෙනෙක් ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ගොචර වෙත් ද ඔහු ඒ ප්‍රතිභානප්‍රතිසංවිදාවට ආලම්බන වෙත්. එයින් කියනු ලැබෙයි: ‘පටිභානෙසු ඤාණං පටිභානපටිසම්භිදා යි.

ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්වාගත වූ ඍද්ධිපාදයෙහි ධර්ම පසළොසෙක, අර්ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

'අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- 'අයං වීමංසාසමාධි-පධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- 'සො ඛො පනායං වීමංසා-සමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'තිපුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි පෙ- වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතෙ ඉද්ධිපාදෙ පන්නරස ධම්මා, පන්නරස අත්ථා, තිංස නිරුත්තියො, සට්ඨි ඤාණානි.

චතූසු ඉද්ධිපාදෙසු සට්ඨි ධම්මා, සට්ඨි අත්ථා, වීසංසතං නිරුත්තියො, චත්තාරීසඤ්ච ද්වෙ ච ඤාණසතානි.

'සමුදයො සමුදයො'ති ඛො භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි 'නිරොධො නිරොධො'ති ඛො, භික්ඛවෙ, විපස්සිස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. විපස්සිස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො චත්තාරීසං ඤාණානි.

සමුදයො සමුදයො'ති ඛො භික්ඛවෙ, සිඛිස්ස බොධිසත්තස්ස -පෙ- වෙස්සභුස්ස බොධිසත්තස්ස -පෙ- කකුසන්ධස්ස බොධිසත්තස්ස -පෙ- කොණාගමනස්ස බොධිසත්තස්ස -පෙ- කස්සපස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. 'නිරොධො නිරොධො'ති ඛො භික්ඛවෙ, කස්සපස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි පෙ- ආලොකො උදපාදි. කස්සපස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො, චත්තාරීසං ඤාණානි.

'සමුදයො සමුදයො'ති ඛො භික්ඛවෙ, ගොතමස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. 'නිරොධො නිරොධො'ති ඛො භික්ඛවෙ, ගොතමස්ස බොධිසත්තස්ස පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ගොතමස්ස බොධිසත්තස්ස වෙය්‍යාකරණෙ දස ධම්මා, දස අත්ථා, වීසති නිරුත්තියො, චත්තාරීසං[1] ඤාණානි.

සත්තන්නං බොධිසත්තානං සත්තසු වෙය්‍යාකරණෙසු සත්තති ධම්මා, සත්තති අත්ථා, චත්තාරීසංසතං[2] නිරුත්තියො, අසීති ච ද්වෙ ච ඤාණසතානි.

යාවතා අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය. අඵස්සිතො පඤ්ඤාය අභිඤ්ඤට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[3] නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨො -පෙ- යාවතා පහානස්ස පහානට්ඨො -පෙ- යාවතා භාවනාය භාවනට්ඨො -පෙ- යාවතා සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය. අඵස්සිතො පඤ්ඤාය සච්ඡිකිරියට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

---

1. චත්තාලීස - මජසං, 2. චත්තාලීසසතං - මජසං, චත්තාරීසසතා - සයා. PTS.
3 පඤ්ඤාස - මජසං, සයා, PTS.

'මේ වීර්‍ය්‍යාධිපතිසමාධියෙන් ... මේ චිත්තාධිපතිසමාධියෙන් ... මේ විමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්‍වාගත වූ ඍද්ධිපාද යැ'යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය .. ආලෝකය පහළ විය ... 'තවද ඒ මේ විමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්‍වාගත වූ ඍද්ධිපාදය භාවිතව්‍ය යැ' යි ... භාවිත යැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය .. ආලෝකය පහළ විය ... විමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් හා සමන්‍වාගත වූ ඍද්ධිපාදයෙහි ධර්‍ම පසළොසෙක, අර්‍ථ පසළොසෙක, නිරුක්ති තිසෙක, ඥාන සැටෙකි.

සතර ඍද්ධිපාදයන්හි ධර්‍ම සැටෙක, අර්‍ථ සැටෙක, නිරුක්ති එක්සිය විස්සෙක, ඥාන දෙසියසාලිසෙකි

මහණෙනි, 'සමුදය යැ සමුදය යැ'යි විපස්සී බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, 'නිරොධ යැ නිරොධ යැ'යි විපස්සී බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය විපස්සී බෝසත්හට සූත්‍රාන්තයෙහි ධර්‍ම දසයෙක, අර්‍ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

මහණෙනි, 'සමුදය යැ සමුදය යැ' යි සිඛී බොසත්හට ... වෙස්සභූ බෝසත්හට ... කකුසඳ බෝසත්හට .. කොණාගමන බෝසත්හට ... කාශ්‍යප බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, 'නිරොධ යැ නිරොධ යැ'යි කාශ්‍යප බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. කාශ්‍යප බෝසත්හට සූත්‍රාන්තයෙහි ධර්‍ම දසයෙක, අර්‍ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

මහණෙනි, 'සමුදය යැ සමුදය යැ'යි ගොයුම් බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. මහණෙනි, 'නිරොධ යැ නිරොධ යැ'යි ගොයුම් බෝසත්හට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. ගොයුම් බෝසත්හට සූත්‍රාන්ත-යෙහි ධර්‍ම දසයෙක, අර්‍ථ දසයෙක, නිරුක්ති විස්සෙක, ඥාන සතළිසෙකි.

සත් බෝසත්හට සප්තසූත්‍රාන්තයෙහි ධර්‍ම සැත්තෑවෙක, අර්‍ථ සැත්-තෑවෙක, නිරුක්ති එක්සියසාලිසෙක, ඥාන දෙසියඅසූවෙකි.

යම්තාක් අභිඥයෙහි අභිඥෙය්‍ය වේ ද් හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්‍ෂාත්කෘත යැ ප්‍රඥයෙන් (පුනපුනා සමුදාචාර විසින්) පහස්නා ලද යැ. ප්‍රඥයෙන් නො පහස්නාලද අභිඥෙය්‍යයෙක් නැතැ'යි චක්‍ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, අලෝකය පහළ වී අභිඥවගේ අභිඥෙය්‍යයෙහි ධර්‍ම පස්විස්සෙක, අර්‍ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් පරිඥවගේ පරිඥෙය්‍ය වේ ද ... යම්තාක් ප්‍රහාණයාගේ ප්‍රහාණාය්‍ය වේ ද ... යම්තාක් භාවනායෙහි භාවනාය්‍ය වේ ද ... යම්තාක් සාක්‍ෂාත්ක්‍රියාවගේ සාක්‍ෂාත්ක්‍රියාය්‍ය වේ ද හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්‍ෂාත්කෘත යැ ප්‍රඥයෙන් පහස්නාලද යැ ප්‍රඥයෙන් නො පහස්නාලද සාක්‍ෂාත්ක්‍රියාය්‍යයෙක් නැතැ'යි චක්‍ෂුස පහළ විය, ඥානය පහ විය, ප්‍රඥව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. සාක්‍ෂාත්ක්‍රියාවගේ සාක්‍ෂාත්ක්‍රියාය්‍යයෙහි ධර්‍ම පස්විස්සෙක, අර්‍ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

අභිඤ්ඤාය අභිඤ්ඤට්ඨෙ, පරිඤ්ඤාය පරිඤ්ඤට්ඨෙ, පහානාය පහානට්ඨෙ, භාවනාය භාවනට්ඨෙ, සච්ඡිකිරියාය සච්ඡිකිරියට්ඨෙ පඤ්චවීසංසතං ධම්මා, පඤ්චවීසංසතං අත්ථා, අඩ්ඪතෙය්‍යානි නිරුත්තිසතානි, පඤ්ච ඤාණසතානි.

යාවතා ඛන්ධානං ඛන්ධට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය ඛන්ධට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි ඛන්ධානං ඛන්ධට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[1] නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා ධාතූනං ධාතුට්ඨො -පෙ- යාවතා ආයතනානං ආයතනට්ඨො -පෙ- යාවතා සඞ්ඛතානං සඞ්ඛතට්ඨො -පෙ- යාවතා අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය අසඞ්ඛතට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං[1] නිරුත්තියො, සතං ඤාණානි.

ඛන්ධානං ඛන්ධට්ඨෙ, ධාතූනං ධාතුට්ඨෙ, ආයතනානං ආයතනට්ඨෙ සඞ්ඛතානං සඞ්ඛතට්ඨෙ, අසඞ්ඛතස්ස අසඞ්ඛතට්ඨෙ පඤ්චවීසංසතං ධම්මා, පඤ්චවීසංසතං[2] අත්ථා, අඩ්ඪතෙය්‍යානි නිරුත්තිසතානි,[3] පඤ්ච ඤාණසතානි.

යාවතා දුක්ඛස්ස දුක්ඛට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො, ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය දුක්ඛට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. දුක්ඛස්ස දුක්ඛට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

යාවතා සමුදයස්ස සමුදයට්ඨො -පෙ- යාවතා නිරොධස්ස නිරොධට්ඨො -පෙ- යාවතා මග්ගස්ස මග්ගට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය මග්ගට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි. මග්ගස්ස මග්ගට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

චතූසු අරියසච්චෙසු සතං ධම්මා, සතං අත්ථා, ද්වෙ නිරුත්තිසතානි, චත්තාරි ඤාණසතානි.

යාවතා අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය අත්ථපටිසම්භිදට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. අත්ථපටිසම්භිදාය අත්ථපටිසම්භිදට්ඨෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

---

1 පඤ්ඤාස - මජසං.

2. පඤ්චවීසසතං - මජසං., සතා, PTS. 3 අඩ්ඪතෙය්‍යනිරුත්තිසතානි - සතා, PTS

අභිඥාවගේ අභිඥාර්ථයෙහි, පරිඥාවගේ පරිඥාර්ථයෙහි, ප්‍රහාණයාගේ ප්‍රහාණාර්ථයෙහි, භාවනාවගේ භාවනාර්ථයෙහි, සාක්ෂාත් ක්‍රියාවගේ සාක්ෂාත්ක්‍රියාර්ථයෙහි ධර්ම එක්සියපස්විස්සෙක, අර්ථ එක්සියපස්විස්සෙක, නිරුක්ති දෙසියපනසෙක, ඥාන පන්සියයෙකි.

යම්තාක් ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථය වේ ද හේ දන්නාලද යෑ දක්නා ලද යෑ ප්‍රකට කරනලද යෑ සාක්ෂාත්කෘත යෑ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යෑ, ප්‍රඥායෙන් ස්පර්ශ නො කරනලද ස්කන්ධාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් ධාතූන්ගේ ධාත්වර්ථය වේ ද ... යම්තාක් ආයතනයන්ගේ ආයතනාර්ථය වේ ද ... යම්තාක් සඞ්ඛතයන්ගේ සඞ්ඛතාර්ථය වේ ද ... යම්තාක් අසඞ්ඛතයන්ගේ අසඞ්ඛතාර්ථය වේ ද හේ දන්නාලද යෑ දක්නා ලද යෑ ප්‍රකට කරනලද යෑ සාක්ෂාත්කෘත යෑ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යෑ. ප්‍රඥායෙන් ස්පර්ශ නො කරනලද අසඞ්ඛතාර්ථයෙක් නැතැ' යි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. අසඞ්ඛතයාගේ අසඞ්ඛතාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි

ස්කන්ධයන්ගේ ස්කන්ධාර්ථයෙහි, ධාතූන්ගේ ධාත්වර්ථයෙහි, ආයතනයන්ගේ ආයතනාර්ථයෙහි, සඞ්ඛතයන්ගේ සඞ්ඛතාර්ථයෙහි, අසඞ්ඛතයන්ගේ අසඞ්ඛතාර්ථයෙහි ධර්ම එක්සියපස්විස්සෙක, අර්ථ එක්සියපස්විස්සෙක, නිරුක්ති දෙසියපනසෙක, ඥාන පන්සියයෙකි.

යම්තාක් දුඃඛයාගේ දුඃඛාර්ථය වේ ද, හේ දන්නාලද යෑ දක්නාලද යෑ ප්‍රකට කරනලද යෑ සාක්ෂාත්කෘත යෑ ප්‍රඥායෙන් පහස්නාලද යෑ ප්‍රඥායෙන් නො පහස්නාලද දුඃඛාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. දුඃඛයාගේ දුඃඛාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් සමුදයාගේ සමුදයාර්ථය වේ ද ... යම්තාක් නිරොධයාගේ නිරොධාර්ථය වේ ද ... යම්තාක් මාර්ගයාගේ මාර්ගාර්ථය වේ ද, හේ දන්නා ලද යෑ දක්නාලද යෑ ප්‍රකට කරනලද යෑ සාක්ෂාත්කෘත යෑ ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද යෑ. ප්‍රඥායෙන් නො පහස්නාලද මාර්ගාර්ථයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ විය. මාර්ගයාගේ මාර්ගාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සතර ආර්‍ය්‍යසත්‍යයෙහි ධර්ම සියයෙක, අර්ථ සියයෙක, නිරුක්ති දෙසියයෙක, ඥාන සාරසියයෙකි.

යම්තාක් අර්ථප්‍රතිසංවිදායෙහි අර්ථප්‍රතිසංවිදාර්ථය වේ ද, හේ දන්නා ලද යෑ, දක්නා ලද යෑ ප්‍රකට කරන ලද යෑ, සාක්ෂාත්කෘත යෑ ප්‍රඥායෙන් පහස්නා ලද යෑ, ප්‍රඥායෙන් නො පහස්නා ලද අර්ථප්‍රතිසංවිදායෙක් නැතැ'යි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. අර්ථප්‍රතිසංවිදාවගේ අර්ථප්‍රතිසංවිදාර්ථයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යාවතා ධම්මපටිසම්භිදාය ධම්මපටිසම්භිදට්ඨො -පෙ- යාවතා නිරුත්තිපටිසම්භිදාය නිරුත්තිපටිසම්භිදට්ඨො -පෙ- යාවතා පටිභානපටිසම්භිදාය පටිභානපටිසම්භිදට්ඨො ඤාතො දිට්ඨො විදිතො සච්ඡිකතො ඵස්සිතො පඤ්ඤාය, අඵස්සිතො පඤ්ඤාය පටිභානපටිසම්භිදට්ඨො නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, පටිභානපටිසම්භිදට්ඨො පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

චතූසු පටිසම්භිදාසු සතං ධම්මා, සතං අත්ථා, ද්වෙ නිරුත්තිසතානි, චත්තාරි ඤාණසතානි.

යාවතා ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණං නත්ථීති චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි. ඉන්ද්‍රියපරොපරියත්තෙ ඤාණෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො සතං ඤාණානි.

යාවතා සත්තානං ආසයානුසයෙ ඤාණං -පෙ- යාවතා යමකපාටිහීරෙ ඤාණං -පෙ- යාවතා මහාකරුණාසමාපත්තියා ඤාණං -පෙ- යාවතා සබ්බඤ්ඤුතඤ්ඤාණං -පෙ- යාවතා අනාවරණං ඤාණං ඤාතං දිට්ඨං විදිතං සච්ඡිකතං ඵස්සිතං පඤ්ඤාය, අඵස්සිතං පඤ්ඤාය අනාවරණං ඤාණං නත්ථීති චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි, අනාවරණෙ ඤාණෙ පඤ්චවීසති ධම්මා, පඤ්චවීසති අත්ථා, පඤ්ඤාසං නිරුත්තියො, සතං ඤාණානි.

ඡසු බුද්ධධම්මෙසු දියඩ්ඪසතං ධම්මා, දියඩ්ඪසතං අත්ථා, තීණි නිරුත්තිසතානි, ඡ ඤාණසතානි.

පටිසම්භිදාධිකරණෙ[1] අඩ්ඪනවධම්මසතානි[2] අඩ්ඪනව අත්ථසතානි, නිරුත්තිසහස්සඤ්ච සත්ත ච නිරුත්තිසතානි, තීණි ච ඤාණසහස්සානි චත්තාරි ච ඤාණසතානීති.

**පටිසම්භිදාකථා සමත්තා.**

## 2. 7

## ධම්මචක්කකථා

"එකං සමයං භගවා බාරාණසියං විහරති -පෙ- ඉතිහිදං ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤො[3] ත්වෙව නාමං අහොසි.[a]

'ඉදං දුක්ඛං අරියසච්චන්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

1 පටිසම්භිදාපකරණෙ - සෑ.
2 අඩ්ඪනවමානි ධම්මසතානි සෑ., PTS.
3. අඤ්ඤාසිකොණ්ඩඤ්ඤො - මජ්සං., අඤ්ඤාතකොණ්ඩඤ්ඤො - සෑ., PTS
a. සච්චසංයුත්ත - ධම්මචක්කපවත්තනවග්ග

යම්තාක් ධර්මප්‍රතිසංවිදාව ගේ ධර්මප්‍රතිසංවිදාඥානය වේ ද ... යම්තාක් නිරුක්තිප්‍රතිසංවිදාවගේ නිරුක්තිප්‍රතිසංවිදාඥා ය වේ ද ... යම්තාක් ප්‍රති-භානප්‍රතිසංවිදාව ගේ ප්‍රතිභානප්‍රතිස විදාඥානය වේ ද, හේ දත්නා ලද යැ, දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්න ලද යැ, ප්‍රඥායෙන් නො පහස්නාලද ප්‍රතිභානප්‍රතිසංවිදාඥානයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. ප්‍රතිභාන ප්‍රතිසංවිදාඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සතර ප්‍රතිස විද්හි ධර්ම සියයෙක, අර්ථ සියයෙක, නිරුක්ති දෙසියයෙක. ඥාන සාරසියයෙකි.

යම්තාක් ඉන්ද්‍රියපරාවරතායෙහි ඥානය වේ ද, හේ දත්නාලද යැ දක්නාලද යැ ප්‍රකට කරනලද යැ සාක්ෂාත්කෘත යැ ප්‍රඥායෙන් පහස්නාලද යැ, ප්‍රඥායෙන් නො පහස්නාලද ඉන්ද්‍රියපරාවරතාඥානයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය .. ආලෝකය පහළ විය. ඉන්ද්‍රියපරාවරතාඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

යම්තාක් සත්ත්වයන්ගේ ආශයානුශය (ආශය අනුශය දත්නා) ඥානය වේ ද .. යම්තාක් යමකප්‍රාතිහාර්‍යඥානය වේ ද .. යම්තාක් මහා කරුණා සමාපත්තිඥානය වේ ද ... යම්තාක් සර්වඥතාඥානය වේ ද් යම්තාක් අනාවරණඥානය වේ ද. හේ දත්නාලද යැ දක්නා ලද යැ ප්‍රකට කරන ලද යැ සාක්ෂාත්කෘත යැ, ප්‍රඥායෙන් පහස්නාලද යැ. ප්‍රඥායෙන් නො පහස්නා ලද අනාවරණඥානයෙක් නැතැ'යි චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළවිය, ආලෝකය පහළ විය. අනා-වරණඥානයෙහි ධර්ම පස්විස්සෙක, අර්ථ පස්විස්සෙක, නිරුක්ති පනසෙක, ඥාන සියයෙකි.

සවැදෑරුම් බුද්ධධර්මයෙහි ධර්ම එක්සිය පනසෙක, අර්ථ එක්සියපනසෙක, නිරුක්ති තුන්සියයෙක, ඥාන සසියයෙකි.

පටිසම්භිදාධිකාරයෙහි ධර්ම අටසියපනසෙක, අර්ථ අටසියපනසෙක නිරුක්ති එක්දහස්සත්සියයෙක, ඥාන තුන්දහස්සාරසියයෙකි.

ප්‍රතිසංවිත්කථා නිමි.

## 2. 7

## දම්සක් කථා

''එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ බරණැස් නුවර වැඩ වාසය කරන සේක ... මෙසෙයින් ආයුෂ්මත් කෞණ්ඩින්‍ය ස්ථවිරයන්හට ''අඤ්ඤාකොණ්ඩඤ්ඤ' යයි මෙ නම් වී

'මේ දුඃඛ නම් වූ ආර්‍ය්‍යසත්‍ය යැ'යි පෙර නො ඇසූ විරූ දහම්හි ප්‍රඥා-චක්ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, අලෝකය පහළ විය

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති කෙනට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති කෙනට්ඨෙන, 'විජ්ජා උදපාදී'ති කෙනට්ඨෙන, 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන, 'ඤාණං උදපාදී'ති ඤාතට්ඨෙන, 'පඤ්ඤා උදපාදී'ති පජානනට්ඨෙන, විජ්ජා උදපාදී'ති පටිවෙධට්ඨෙන, 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො, ඤාණං ධම්මො, ඤාතට්ඨො අත්ථො, පඤ්ඤා ධම්මො, පජානනට්ඨො අත්ථො, විජ්ජා ධම්මො, පටිවෙධට්ඨො අත්ථො, ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා දුක්ඛවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති, චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වෙසාරජ්ජප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වෙසාරජ්ජං පාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං සක්කරොන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං ගරුං කරොන්තො[1] පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං මානෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං පූජෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මං අපචායමානො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මද්ධජො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මකෙතු පවත්තෙතීති ධම්මචක්කං, ධම්මාධිපතෙය්‍යො පවත්තෙතීති ධම්මචක්කං, තං ඛො පන ධම්මචක්කං අප්පතිවත්තියං[3] සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති ධම්මචක්කං.

සද්ධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සතින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

1 ගරුකරොන්තො - ස්‍යා, සී. PTS
3. අප්පටිවත්තියං - මජසං., ස්‍යා, PTS

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු කවර අර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු කවර අර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු කවර අර්ථයෙන, ආලොකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, 'ඤාණං උදපාදි' යනු ඥතාර්ථයෙන, 'පඤ්ඤා උදපාදි' යනු ප්‍රජානනාර්ථයෙන, 'විජ්ජා උදපාදි' යනු ප්‍රතිවෙධාර්ථයෙන, ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ. ඥනය ධර්ම යෑ, ඥතාර්ථය අර්ථ යෑ. ප්‍රඥව ධර්ම යෑ, ප්‍රජානනාර්ථය අර්ථ යෑ. විද්‍යාව ධර්ම යෑ, ප්‍රතිවෙධාර්ථය අර්ථ යෑ ආලොකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යෑ. මේ පඤ්චධර්මයෝ පඤ්ච අර්ථයෝ දුඃඛය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යෑ සත්‍යය විෂය කොට ඇත්තාහු යෑ මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහීතයහ, මාර්ග-සත්‍යයට අයත් වූවාහු යෑ, දුඃඛසත්‍යයෙහි උපන්නාහු යෑ, සත්‍යයෙහි සිටියාහු යෑ සත්‍යයෙහි පිහිටියාහු යි.

'ධම්මචක්කං' යනු කවර අරුතෙකින් ධම්මචක්ක නම් වී ද, යත්. ප්‍රතිවෙධ ධර්මය ද පවත්වයි. (කෙලෙස්සතුරන් නැසීමට වැවෙන බැවින් ප්‍රහරණචක්‍රයක් වැනි නු' යි) චක්‍රය ද. පවත්වා නු' යි 'ධම්මචක්ක' නම්: (ප්‍රතිවෙධධර්මචක්‍රය යි.) චක්‍රය ද පවත්වයි. දේශනාධර්මය ද පවත්වා නු'යි 'ධම්මචක්කනම් (දෙශනා ධර්මචක්‍රය යි ) (යථාසවභාව හෙයින්) ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක යෑ, (වෙනෙය සන්තානයෙහි) ධර්මචර්‍යා-පිණිස පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි (විෂයීභාවයෙන් සිටියේ පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි (අචලභාවයෙන්) පිහිටියේ පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි පිහිටුවමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි වශී (ඊශ්වර) භාවයට පැමිණියේ පවත්වා නු'යි ,ධම්මචක්ක' යෑ,. ධර්මයෙහි වශීභාවයට පමුණුවමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ ධර්මයෙහි කෙළවරට පැමිණියේ පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි කෙළවරට පමුණුවමින් පවත්වා නු' යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි විශාරද බවට පැමිණියේ පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි විශාරද බවට පමුණුවමින් පවත්වා නු'යි 'ධම්මචක්ක යෑ; ධර්මයට සත්කාර කෙරෙමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධම්මයට ගුරු කෙරෙමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මයට බුහුමන් කෙරෙමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මය පුදමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මය අපචායන කෙරෙමින් පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ ධර්මය ධ්වජයක් සෙයින් පෙරටු කොට ඇතියේ පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ ධර්මය කෙහෙලි කොට ඇතියේ පවත්වා නු'යි 'මමචක්ක' යෑ, ධර්මය අධිපති කොට ඇති වැ පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, තවද ඒ ධර්මචක්‍රය (අනන්‍යලබ්ධික) මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොව කිසිවකුහු විසින් හෝ නො පැවැත්විය හැකි නු'යි 'ධම්මචක්ක'යි.

ශ්‍රද්ධෙන්ද්‍රියය ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, වීර්‍යෙන්ද්‍රියය ධර්ම යෑ; ඒ ධර්මය පවත්වා නු'යි 'ධම්මචක්ක' නම, ස්මෘතීන්ද්‍රියය ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමාධීන්ද්‍රියය ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රඥෙන්ද්‍රියය ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම්.

සද්ධාබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සතිබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධිබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤාබලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

සතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විරියසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පීතිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධිසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං,

සම්මාදිට්ඨි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසඞ්කප්පො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාවාචා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාකම්මන්තො ධම්මො තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මා ආජීවො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං සම්මාවායාමො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසති ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සම්මාසමාධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අකම්පියට්ඨෙන බලං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, හෙතුට්ඨෙන මග්ගො ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පදහනට්ඨෙන සම්මප්පධානා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, තථට්ඨෙන සච්චා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අවික්ඛෙපට්ඨෙන සමථො ධම්මො තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අනුපස්සනට්ඨෙන විපස්සනා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, එකරසට්ඨෙන සමථවිපස්සනා ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අනතිවත්තනට්ඨෙන යුගනද්ධං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සංවරට්ඨෙන සීලවිසුද්ධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි ධම්මො තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමුච්ඡෙදට්ඨෙන ඛයෙ ඤාණං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඡන්දො මූලට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති

ශ්‍රද්ධාබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, වීර්යබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ස්මෘතිබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමාධිබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රඥාබලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නමි.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, වීර්යසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමාධිසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නමි.

සම්‍යග්දෘෂ්ටිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්සංකල්පය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යග්වචනය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්කර්මාන්තය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යගාජීවය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යග්ව්‍යායාමය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්ස්මෘතිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සම්‍යක්සමාධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නමි.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, අකම්ප්‍යාර්ථයෙන් බලය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, නිර්යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, හේත්වර්ථයෙන් මාර්ගය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, එටහන අර්ථයෙන් සතිපට්ඨානයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, යථාස්වභාවාර්ථයෙන් සත්‍යයෝ ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, අවික්ෂෙපාර්ථයෙන් ශමථය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාව ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ඔවුනොවුන් නොඉක්ම පවත්වා අර්ථයෙන් යුගනද්ධය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, මුක්තාර්ථයෙන් විමොක්ෂය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාව ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, පරිත්‍යාගාර්ථයෙන් විමුක්තිය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥානය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ප්‍රතිප්‍රශ්‍රබ්ධාර්ථයෙන් අනුත්පාදඥානය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ඡන්දය මූලාර්ථයෙන් ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම. මනසිකාරය

ධම්මචක්කං, මනසිකාරො සමුට්ඨානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, ඵස්සො සමොධානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, වෙදනා සමොසරණට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, සමාධි පමුඛට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං සති ආධිපතෙය්‍යට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, පඤ්ඤා තදුත්තරට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, විමුත්ති සාරට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය’න්ති -පෙ- පරිඤ්ඤාත’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

‘චක්ඛුං උදපාදී’ති කෙනට්ඨෙන -පෙ- ‘ආලොකො උදපාදී’ති කෙනට්ඨෙන චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන -පෙ- ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා දුක්ඛවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්ක , චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

‘ඉදං දුක්ඛසමුදයො අරියසච්ච’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- තං ඛො පනිදං දුක්ඛසමුදයො අරියසච්චං ‘පහාතබ්බ’න්ති -පෙ- ‘පහීන’න්ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි

‘චක්ඛුං උදපාදී’ති කෙනට්ඨෙන -පෙ- ‘ආලොකො උදපාදී’ති කෙනට්ඨෙන: ‘චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන -පෙ- ‘ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා සමුදයවත්ථුකා සච්චවත්ථුකා -පෙ- නිරොධවත්ථුකා සච්චවත්ථුකා -පෙ- මග්ගවත්ථුකා සච්චවත්ථුකා සච්චාරම්මණා සච්චගොචරා සච්චසඞ්ගහිතා සච්චපරියාපන්නා සච්චෙ සමුදාගතා සච්චෙ ඨිතා සච්චෙ පතිට්ඨිතා.

සමුත්ථානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම්, සඞ්ග්‍රහ සමවධානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, වේදනාව සමවසරණාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම්, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, විමුක්තිය සාරාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' නම්.

තවද ඒ මේ දුඃඛ නම් වූ ආර්යසත්‍යය 'පිරිසිඳ දතයුතු යෑ' යි ... 'පිරිසිඳ දන්නාලද්ද' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ දුඃඛය වස්තු කොට ඇත්තාහු යෑ, සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ, සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යෑ, සත්‍යය ගොචර කොට ඇත්තාහු යෑ, මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහීත යෑ, මාර්ගසත්‍යයට අයත් වූවාහු යෑ, දුඃඛසත්‍යයෙහි උපන්නාහු යෑ, සත්‍යයෙහි සිටියාහු යෑ, සත්‍යයෙහි පිහිටියාහු යි.

ධම්මචක්කං යනු කවර අර්ථයෙන් 'ධම්මචක්ක' නම් වී ද යත්: ප්‍රතිවේධ ධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ. (ප්‍රතිවේධධර්ම චක්‍රය යි.) චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු' යි 'ධම්මචක්ක'යෑ (දේශනාධර්මචක්‍රය යි), ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ. ධර්මචර්‍යා පිණිස පවත්වා නු' යි 'ධම්මචක්ක යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක යෑ...අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

'මේ දුඃඛසමුදය නම් වූ ආර්යසත්‍ය යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය .. තවද ඒ මේ දුඃඛ නම් වූ ආර්යසත්‍යය 'ප්‍රහාතව්‍ය යෑ' යි ... 'ප්‍රහීණ යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අර්ථයෙන ... 'ආලෝකො උදපාදි' යනු කවර අර්ථයෙන යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ සමුදය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ නිරෝධය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ ... මාර්ගය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය වස්තු කොට ඇත්තාහු යෑ සත්‍යය ආලම්බන කොට ඇත්තාහු යෑ සත්‍යය විෂය කොට ඇත්තාහු යෑ මාර්ගසත්‍යයෙන් සඞ්ගෘහීතයහ. (මාර්ග) සත්‍යයට අයත් වූවාහු යෑ (දුඃඛ) සත්‍යයෙහි උපන්නාහු යෑ සත්‍යයෙහි සිටියාහු යෑ සත්‍යයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො. තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

අයං කායෙ කායානුපස්සනා’ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා’ති මෙ භික්ඛවෙ -පෙ- ‘භාවිතා’ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

‘අයං වෙදනානු -පෙ- අයං චිත්තෙ -පෙ- ‘අයං ධම්මෙසු ධම්මානුපස්සනා’ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, ‘සා ඛො පනායං ධම්මෙසු ධම්මානුපස්සනා භාවෙතබ්බා’ති මෙ භික්ඛවෙ -පෙ- ‘භාවිතා’ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

‘අයං කායෙ කායානුපස්සනා’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, ‘සා ඛො පනායං කායෙ කායානුපස්සනා භාවෙතබ්බා’ති -පෙ- ‘භාවිතා’ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

‘චක්ඛුං උදපාදී’ති කෙනට්ඨෙන -පෙ- ආලොකො උදපාදී’ති කෙනට්ඨෙන: ‘චක්ඛුං උදපාදී’ති දස්සනට්ඨෙන -පෙ- ‘ආලොකො උදපාදී’ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා කායවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- වෙදනාවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- චිත්තවත්ථුකා සතිපට්ඨානවත්ථුකා -පෙ- ධම්මවත්ථුකා සතිපට්ඨානවත්ථුකා සතිපට්ඨානාරම්මණා සතිපට්ඨානගොචරා සතිපට්ඨානසඞ්ගහිතා සතිපට්ඨානපරියාපන්නා සතිපට්ඨානෙ සමුදාගතා සතිපට්ඨානෙ ඨිතා සතිපට්ඨානෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං, ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

ධම්මචක්කං යනු කවර අරුතෙකින් 'ධම්මචක්ක' නම් වී ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු'යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වානු' යි ධම්මචක්ක' යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

මහණෙනි, මට 'මේ කයෙහි කායානුපස්සනා යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද මහණෙනි, මට 'ඒ මේ කයෙහි කායානුපස්සනාව භාවිතව්‍ය යෑ' යි ... 'භාවිත යෑ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'මේ වේදනාවන්හි ... මේ චිත්තයෙහි මේ ධර්මයන්හි ධර්මානුදර්ශනා යෑ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ ධර්මයන්හි ධර්මානුදර්ශනාව භාවිතව්‍ය යෑ' යි මහණෙනි, මට .. 'භාවිත යෑ' යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'මේ කයෙහි කායානුපස්සනා යෑ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. 'තවද ඒ මේ කයෙහි කායානුපස්සනාව වැඩියයුතු යෑ' යි ... වඩනලද්දැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අරුතෙකින ... 'ආලොකො උදපාදි' යනු කවර අරුතෙකින යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන ... 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යෑ, දර්ශනාර්ථය අර්ථ යෑ ... ආලෝකය ධර්ම යෑ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ කායවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... වේදනාවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... චිත්තවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ ... ධර්මවස්තුක වූ සතිපට්ඨානය වස්තු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානය අරමුණු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානය ගොදුරු කොට ඇත්තාහු යෑ, සතිපට්ඨානයෙන් සඞ්ගෘහීතය හ, සතිපට්ඨානයට අයත් වූවාහු යෑ, සතිපට්ඨානයෙහි උපන්නාහු යෑ, සතිපට්ඨානයෙහි සිටියාහු යෑ, සතිපට්ඨානයෙහි පිහිටියාහු යි.

ධම්මචක්කං යනු කවර අරුතෙකින් 'ධම්මචක්ක' වේ ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මචර්‍ය්‍යා පිණිස පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යෑ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක, යෑ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් ධර්ම යෑ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි. -පෙ- ආලොකො උදපාදි, සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං විරියසමාධි -පෙ- අයං චිත්තසමාධි -පෙ- 'අයං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි, සො ඛො, පනායං වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති මෙ භික්ඛවෙ -පෙ- 'භාවිතො'ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'අයං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි සො ඛො පනායං ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි, විජ්ජා උදපාදි, ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන: 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො දස්සනට්ඨො අත්ථො, -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො, ඉමෙ පඤ්ච ධම්මා පඤ්ච අත්ථා ඡන්දවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා ඉද්ධිපාදාරම්මණා ඉද්ධිපාදගොචරා ඉද්ධිපාදසඞ්ගහිතා ඉද්ධිපාදපරියාපන්නා ඉද්ධිපාදෙ සමුදාගතා ඉද්ධිපාදෙ ඨිතා ඉද්ධිපාදෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙතීති චක්කඤ්චාති ධම්මචක්කං, චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං, ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්ක ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨාපෙන්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ වසිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං ධම්මෙ වසිං පාපෙන්තො පවත්තෙතීති ධම්ම-චක්කං, ධම්මෙ පාරමිප්පත්තො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පාරමිං පාපෙන්තො පවත්තෙතීති ධම්මධම්මචක්ක-පෙ- ධම්මං අපචායමානො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මද්ධජො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මකෙතු පවත්තෙතීති ධම්මචක්කං ධම්මාධිපතෙය්‍යො පවත්තෙතීති ධම්මචක්කං, තං ඛො පන ධම්මචක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති ධම්මචක්කං.

‘මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය .. ආලෝකය පහළ විය. තවද ඒ මේ ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි මහණෙනි, මට ... ‘භාවිත යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

‘මේ වීර්‍යය අධිපති කොට ඇති සමාධියෙන් හා ... මේ චිත්තය අධිපති කොට ඇති සමාධියෙන් හා ... මේ වීමංසාව අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද ඒ මේ වීමංසාධිපති සමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි මහණෙනි, මට ... ‘භාවිත යැ’ යි මහණෙනි, මට පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

‘මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාද යැ’ යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය ... ආලෝකය පහළ විය. තවද ඒ මේ ඡන්දාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍යයෙන් සමන්වාගත වූ ඍද්ධිපාදය ‘භාවිතව්‍ය යැ’ යි ... ‘භාවිත යැ’ යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්‍ෂුස පහළ විය, ඥානය පහළ විය, ප්‍රඥාව පහළ විය, විද්‍යාව පහළ විය, ආලෝකය පහළ වී.

‘චක්ඛුං උදපාදි’ යනු කවර අරුතෙකින ... ‘ආලෝකො උදපාදි’ යනු කවර අරුතෙකින යත්: ‘චක්ඛුං උදපාදි’ යනු දර්ශනාර්ථයෙන ... ‘ආලොකො උදපාදි’ යනු අවභාසාර්ථයෙනි.

චක්‍ෂුස ධර්ම යැ, දර්ශනාර්ථය අර්ථ යැ ... ආලෝකය ධර්ම යැ, අවභාසාර්ථය අර්ථ යි. මේ පඤ්ච ධර්මයෝ මේ පඤ්ච අර්ථයෝ ඡන්දවස්තුක වූ ඍද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදය ආලම්බන කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදය විෂය කොට ඇත්තාහු යැ, ඍද්ධිපාදයෙන් සඞ්ගෘහීතයහ. ඍද්ධිපාදයට අයත් වූවාහු යැ, ඍද්ධිපාදයෙහි උපන්නාහු යැ, ඍද්ධිපාදයෙහි සිටියාහු යැ, ඍද්ධිපාදයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කං** යනු කවර අරුතෙකින් ‘ධම්මචක්ක’ නම් වී ද යත්: ප්‍රතිවේධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙන් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මචර්‍යා පිණිස පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි සිටියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි පිහිටුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි වශීභාවයට පැමිණියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි වශීභාවයට පමුණුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මයෙහි කෙළවරට පැමිණියේ පවත්වා නු’ යි ධම්මචක්ක’ යැ, ධර්මයෙහි කෙළවරට පමුණුවමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ ... ධර්මය අපචායන කෙරෙමින් පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය ධ්වජයක් සෙයින් පෙරටු කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය කෙහෙලි කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යැ, ධර්මය අධිපති කොට ඇතියේ පවත්වා නු’ යි ‘ධම්මචක්ක’ යි. තවද ඒ ධර්මචක්‍රය මහණකු විසින් හෝ බමුණකු විසින් හෝ දෙවියකු විසින් හෝ මරකු විසින් හෝ බඹකු විසින් හෝ ලොවැ කිසිවක්හු විසින් හෝ නො පැවැත්විය හැකි නු’ යි ‘ධම්මචක්ක’ යි.

සද්ධින්ද්‍රියං ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කං.

'අයං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි -පෙ- සො ඛො පනායං විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතො ඉද්ධිපාදො 'භාවෙතබ්බො'ති -පෙ- 'භාවිතො'ති පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි -පෙ- ආලොකො උදපාදි.

'චක්ඛුං උදපාදී'ති කෙනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති කෙනට්ඨෙන, 'චක්ඛුං උදපාදී'ති දස්සනට්ඨෙන -පෙ- 'ආලොකො උදපාදී'ති ඔභාසට්ඨෙන.

චක්ඛුං ධම්මො, දස්සනට්ඨො අත්ථො -පෙ- ආලොකො ධම්මො, ඔභාසට්ඨො අත්ථො. ඉමෙ පඤ්ච ධම්මා, පඤ්ච අත්ථා විරියවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා -පෙ- චිත්තවත්ථුකා -පෙ- වීමංසාවත්ථුකා ඉද්ධිපාදවත්ථුකා ඉද්ධිපාදාරම්මණා ඉද්ධිපාදගොචරා ඉද්ධිපාදසඞ්ගහිතා ඉද්ධිපාදෙ ඨිතා ඉද්ධිපාදෙ පතිට්ඨිතා.

**ධම්මචක්කන්ති** කෙනට්ඨෙන ධම්මචක්කං: ධම්මඤ්ච පවත්තෙති චක්කඤ්චාති ධම්මචක්කං. චක්කඤ්ච පවත්තෙති ධම්මඤ්චාති ධම්මචක්කං. ධම්මෙන පවත්තෙතීති ධම්මචක්කං; ධම්මචරියාය පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ ඨිතො පවත්තෙතීති ධම්මචක්කං, ධම්මෙ පතිට්ඨිතො පවත්තෙතීති ධම්මචක්කං -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන ධම්මො, තං ධම්මං පවත්තෙතීති ධම්මචක්කන්ති.

**ධම්මචක්කකථා සමත්තා**

## 2. 8

## ලොකුත්තර කථා

කතමෙ ධම්මා ලොකුත්තරා: චත්තාරො සතිපට්ඨානා, චත්තාරො සම්මප්පධානා, චත්තාරො ඉද්ධිපාදා, පඤ්චින්ද්‍රියානි, පඤ්චබලානි, සත්ත බොජ්ඣඞ්ගා, අරියො අට්ඨඞ්ගිකො මග්ගො, චත්තාරො අරියමග්ගා, චත්තාරි ච සාමඤ්ඤඵලානි, නිබ්බානඤ්ච. ඉමෙ ධම්මා ලොකුත්තරා.

'ලොකුත්තරා'ති කෙනට්ඨෙන ලොකුත්තරා: ලොකං තරන්තීති ලොකුත්තරා, ලොකා උත්තරන්තීති ලොකුත්තරා, ලොකතො උත්තරන්තීති ලොකුත්තරා, ලොකම්හා උත්තරන්තීති ලොකුත්තරා, ලොකං අතික්කමන්තීති ලොකුත්තරා, ලොකං සමතික්කමන්තීති ලොකුත්තරා, ලොකෙන අතිරෙකාති ලොකුත්තරා, ලොකන්තං තරන්තීති ලොකුත්තරා.

ශ්‍රද්ධෙන්ද්‍රියය ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි ධම්මචක්ක යැ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

'මේ වීර්යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් සමන්නාගත වූ සෘද්ධි-පාද යැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ විය ... තවද ඒ මේ වීර්යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්යයෙන් සමන්නාගත වූ සෘද්ධිපාදය 'භාවිතව්‍ය යැ' යි ... 'භාවිත යැ' යි පෙර නො ඇසූවිරූ දහම්හි චක්ෂුස පහළ විය ... ආලෝකය පහළ වී.

'චක්ඛුං උදපාදි' යනු කවර අරුතෙකින ... 'ආලෝකො උදපාදි' යනු කවර අරුතෙකින යත්: 'චක්ඛුං උදපාදි' යනු දර්ශනාර්ථයෙන, ... 'ආලොකො උදපාදි' යනු අවභාසාර්ථයෙනි.

චක්ෂුස ධර්ම යැ, දර්ශනාර්ථය අර්ථ යැ ... ආලෝකය ධර්ම යැ, අවභාසා-ර්ථය අර්ථ යි මේ පඤ්චධර්මයෝ පඤ්චඅර්ථයෝ වීර්යවස්තුක වූ සෘද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යැ ... චිත්තවස්තුක වූ සෘද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යැ ... විමංසාවස්තුක වූ සෘද්ධිපාදය වස්තු කොට ඇත්තාහු යැ, සෘද්ධිපාදය ආලම්බන කොට ඇත්තාහු යැ, සෘද්ධිපාදය විෂය කොට ඇත්තාහු යැ, සෘද්ධිපාදයෙන් සඞ්ගෘහීතයහ. සෘද්ධිපාදයට අයත් වූවාහු යැ, සෘද්ධිපාදයෙහි උපන්නාහු යැ, සෘද්ධිපාදයෙහි සිටියාහු යැ, සෘද්ධිපාදයෙහි පිහිටියාහු යි.

**ධම්මචක්කං** යනු කවර අරුතෙකින් 'ධම්මචක්ක' නම් වි ද යත්: ප්‍රතිවෙධධර්මය ද පවත්වයි චක්‍රය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ, චක්‍රය ද පවත්වයි දේශනාධර්මය ද පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ, ධර්මයෙන් පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ, ධර්මචර්‍යා පිණිස පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ, ධර්මයෙහි සිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ, ධර්මයෙහි පිහිටියේ පවත්වා නු' යි 'ධම්මචක්ක' යැ ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්යවසානාර්ථයෙන් ධර්ම යැ, ඒ ධර්මය පවත්වා නු' යි 'ධම්මචක්ක' යි.

**ධර්මචක්‍ර කථා නිමි.**

## 2. 8

## ලොකොත්තර කථා

ලෝකෝත්තරධර්ම කවරහ යත්: සතර සතිපට්ඨානයෝ යැ සතර සම්‍යක්ප්‍රධානයෝ යැ සතර සෘද්ධිපාදයෝ යැ පඤ්චෙන්ද්‍රියයෝ යැ පඤ්ච-බලයෝ යැ සප්තබොධ්‍යඞ්ගයෝ යැ ආර්යාෂ්ටාඞ්ගිකමාර්ග යැ සතර ආර්යමාර්ගයෝ යැ සතර ශ්‍රාමණ්‍යඵලයෝ යැ නිර්වාණ යැ යන මොහු ලෝකෝත්තරධර්මයෝ යි.

'ලොකුත්තරා' යනු කවර අරුතෙකින් ලොකොත්තර නම් වූහ යත්: ලෝකය තරණය කෙරෙත් නු'යි ලෝකෝත්තරයහ, ලෝකයෙන් උත්තර-ණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලෝකය කෙරෙන් උත්තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොවින් උත්තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව ඉක්මයෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව මොනොවට ඉක්මයෙත් නු' යි ලෝකෝත්තරයහ, ලොව මොනොවට ඉක්ම ගියහ'යි ලෝකෝත්තරයහ, ලෝකය කෙරෙන් අධිකයහ'යි ලෝකෝත්තර-යහ, ලෝකාන්තයට තරණය කෙරෙත් නු' යි ලෝකෝත්තරයහ.

ලොකා නිස්සරන්තීති ලොකුත්තරා, ලොකතො නිස්සරන්තීති ලොකුත්තරා, ලොකම්හා නිස්සරන්තීති ලොකුත්තරා, ලොකා නිස්සටාති ලොකුත්තරා, ලොකෙන නිස්සටාති ලොකුත්තරා, ලොකම්හා නිස්සටාති ලොකුත්තරා.

ලොකෙ න තිට්ඨන්තීති ලොකුත්තරා, ලොකස්මිං න තිට්ඨන්තීති ලොකුත්තරා, ලොකෙ න ලිප්පන්තීති[1] ලොකුත්තරා, ලොකෙන න ලිප්පන්තීති ලොකුත්තරා, ලොකෙ අසංලිත්තාති ලොකුත්තරා, ලොකෙන අසංලිත්තාති ලොකුත්තරා, ලොකෙ අනුපලිත්තාති ලොකුත්තරා, ලොකෙන අනුපලිත්තාති ලොකුත්තරා.

ලොකෙ විප්පමුත්තාති ලොකුත්තරා, ලොකෙන විප්පමුත්තාති ලොකුත්තරා, ලොකා විප්පමුත්තාති ලොකුත්තරා, ලොකතො විප්පමුත්තාති ලොකුත්තරා, ලොකම්හා විප්පමුත්තාති ලොකුත්තරා.

ලොකෙ විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකෙන විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකා විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකස්මිං විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකතො විසඤ්ඤුත්තාති ලොකුත්තරා, ලොකම්හා විසඤ්ඤුත්තාති ලොකුත්තරා.

ලොකා සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකතො සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකම්හා සුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකා විසුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකතො විසුජ්ඣන්තීති ලොකුත්තරා, ලොකම්හා විසුජ්ඣන්තීති ලොකුත්තරා.

ලොකා වුට්ඨහන්තීති[2] ලොකුත්තරා, ලොකතො වුට්ඨහන්තීති ලොකුත්තරා ලොකම්හා වුට්ඨහන්තීති ලොකුත්තරා.

ලොකා විවට්ටන්තීති ලොකුත්තරා, ලොකතො විවට්ටන්තීති ලොකුත්තරා, ලොකම්හා විවට්ටන්තීති ලොකුත්තරා.

ලොකෙ න සජ්ජන්තීති ලොකුත්තරා, ලොකෙ න ගය්හන්තීති ලොකුත්තරා, ලොකෙ න බජ්ඣන්තීති ලොකුත්තරා.

ලොකං සමුච්ඡින්දන්තීති ලොකුත්තරා, ලොකං සමුච්ඡින්නත්තාති ලොකුත්තරා. ලොකං පටිප්පස්සම්භෙන්තීති ලොකුත්තරා, ලොකං පටිප්පස්සම්භිතත්තාති ලොකුත්තරා.

ලොකස්ස අපථාති ලොකුත්තරා, ලොකස්ස අගතීති ලොකුත්තරා, ලොකස්ස අවිසයාති ලොකුත්තරා, ලොකස්ස අසාධාරණාති ලොකුත්තරා.

---

1 ලිම්පන්තීති - මජසං, ස 2 උට්ඨහන්තීති - ස.

ලොවින් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් නික්මෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නික්මුණහ'යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නික්මුණහ'යි ලෝකොත්තරයහ, ලෝකයෙන් නික්මුණහ'යි ලෝකොත්තරයහ.

(අපර්‍යාපන්න බැවින්) ලෝකයෙහි නො සිටිත් නු'යි ලෝකොත්තරයහ, ලොවැ නො සිටිත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො තැවැරෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා නො තැවැරෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි අසංලිප්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග අසංලිප්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො තැවැරුණාහු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග නො තැවැරුණාහු'යි ලොකොත්තරයහ.

ලෝකයෙහි විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොකය හා සමග විප්‍රමුක්ත නු' යි ලොකොත්තරයහ, ලෝකයෙන් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොවින් විප්‍රමුක්ත නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙහි විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය හා සමග විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලොවිහි විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ, ලෝවින් විසංයුක්ත නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙන් (ලෝකමල සෝදා) ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් ශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙන් විශුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් විසුද්ධ වෙත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් විශුද්ධ වෙත් නු' යි ලොකොත්තරයහ.

ලෝකයෙන් නැගීසිටිත් නු' යි ලෝකොත්තරයහ, ලෝකය කෙරෙන් නැගීසිටිත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නැගීසිටිත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙන් නවතිත් නු' යි ලෙකොත්තරයහ, ලෝකය කෙරෙන් නවතිත් නු' යි ලෝකොත්තරයහ, ලොවින් නවතිත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකයෙහි නො ලැගෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි (කිසි සංස්කාර කෙනෙක්) නො ගත්තා ලැබෙත් නු' යි ලෝකොත්තරයහ, ලෝකයෙහි නො පෙලෙත් නු' යි ලෝකොත්තරයහ.

ලෝකය මුලුසුන් කෙරෙත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය මුලුසුන් කරනලද බැවිනැ'යි ලොකුත්තර නම් වෙති, ලෝකය සන්සිඳුවත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය සන්සිඳුවන ලද බැවිනැ' යි ලොකුත්තර නම් වෙත්.

ලෝකයට අභාගී නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අප්‍රතිභාග නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අයත් නො වෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකයට අසමාන නු' යි ලෝකුත්තර නම් වෙත්.

ලොකං වමන්තීති ලොකුත්තරා, ලොකං න පච්චාවමන්තීති[1] ලොකුත්තරා, ලොකං පජහන්තීති ලොකුත්තරා, ලොකං න උපාදියන්තීති ලොකුත්තරා, ලොකං විසිනෙන්තීති ලොකුත්තරා, ලොකං න උස්සිනෙන්තීති ලොකුත්තරා, ලොකං විධූපෙන්තීති ලොකුත්තරා, ලොකං න සන්ධූපෙන්තීති ලොකුත්තරා, ලොකං සමතික්කම්ම අභිභුය්‍ය තිට්ඨන්තීති ලොකුත්තරා.

ලොකුත්තරකථා සමත්තා.

## 2. 9

## බලකථා

[ සාවත්ථිනිදානං: ]

“පඤ්චිමානි භික්ඛවෙ බලානි: කතමානි පඤ්ච: සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං. ඉමානි ඛො භික්ඛවෙ, පඤ්චබලානී”[a]

අපි ච අට්ඨසට්ඨි බලානි: සද්ධාබලං විරියබලං සතිබලං සමාධිබලං පඤ්ඤාබලං ඔත්තප්පබලං පටිසඞ්ඛානබලං භාවනාබලං අනවජ්ජබලං සඞ්ගහබලං ඛන්තිබලං පඤ්ඤත්තිබලං නිජ්ඣත්තිබලං ඉස්සරියබලං අධිට්ඨානබලං සමථබලං විපස්සනාබලං දස සෙඛබලානි දස අසෙඛබලානි දස ඛීණාසවබලානි දස ඉද්ධිබලානි දස තථාගතබලානි.

කථමං සද්ධාබලං: අස්සද්ධියෙ න කම්පතීති සද්ධාබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සද්ධාබලං, කිලෙසානං පරියාදානට්ඨෙන සද්ධාබලං, පටිවෙධාදිවිසොධනට්ඨෙන සද්ධාබලං, චිත්තස්ස අධිට්ඨානට්ඨෙන සද්ධාබලං, චිත්තස්ස වොදානට්ඨෙන සද්ධාබලං, විසෙසාධිගමට්ඨෙන සද්ධාබලං, උත්තරිං පටිවෙධට්ඨෙන සද්ධාබලං, සච්චාභිසමයට්ඨෙන සද්ධාබලං, නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සද්ධාබලං, ඉදං සද්ධාබලං.

කතමං විරියබලං: කොසජ්ජෙ න කම්පතීති විරියබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන විරියබලං, කිලෙසානං පරියාදානට්ඨෙන විරියබලං, පටිවෙධාදිවිසොධනට්ඨෙන විරියබලං, චිත්තස්ස අධිට්ඨානට්ඨෙන විරියබලං, චිත්තස්ස වොදානට්ඨෙන විරියබලං, විසෙසාධිගමට්ඨෙන විරියබලං, උත්තරිං පටිවෙධට්ඨෙන විරියබලං, සච්චාභිසමයට්ඨෙන විරියබලං, නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන විරියබලං. ඉදං විරියබලං.

කතමං සතිබලං: පමාදෙ න කම්පතීති සතිබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සතිබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සතිබලං. ඉදං සතිබලං.

---

1 පච්චාගමන්තීති - PTS

a පඤ්චකඞ්ගුත්තර - බලවග්ග

ලෝකය තරත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය වටාලා නො තරත් නු' යි ලොකුත්තර නම් වෙති, ලෝකය දුරුකෙරෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය උපාදානය නො කෙරෙත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය විසුරුවත් නු' යි ලෝකුත්තර නම් වෙති, ලෝකය නො විසුරුවත් නු'යි ලොකුත්තර නම් වෙති, ලෝකය නිවත් නු'යි ලෝකුත්තර නම් වෙති, ලෝකය නො දල්වත් නු' යි ලොකුත්තර නම් වෙති, ලොකය ඉක්ම අභිභවනය කොට සිටිත් නු' යි ලොකුත්තර නම් වෙත්.

**ලොකොත්තර කථා නිමි.**

## 2. 9

## බල කථා

සැවැත්නිදාන යි. ''මහණෙනි, මේ බලයෝ පස්දෙනෙක් වෙති. කවර පස් දෙනෙක යත්: ශ්‍රද්ධාබල යැ වීර්‍ය්‍යබල යැ සමෘතිබල යැ සමාධිබල යැ ප්‍රඥාබල යි මහණෙනි, මොහු පඤ්චබලයෝ වෙත්.''

තවද අටසැට බල කෙනෙක් වෙති: ශ්‍රද්ධාබල යැ වීර්‍ය්‍යබල යැ සමෘති- බල යැ සමාධිබල යැ ප්‍රඥාබල යැ හිරිබල යැ ඔත්තප්පබල යැ පටිසඞ්ඛාන- බල යැ භාවනා බල යැ අනවද්‍යබල යැ සඞ්ග්‍රහබල යැ ක්‍ෂාන්තිබල යැ ප්‍රඥප්තිබල යැ නිදිධ්‍යාසන (අධිනාර්ථාගමන) බල යැ ඓශ්වර්‍ය්‍යබල යැ අධිෂ්ඨානබල යැ ශමථබල යැ විදර්ශනාබල යැ දශ ශෛක්‍ෂබලයෝ යැ දශ අශෛක්‍ෂ බලයෝ යැ දශක්‍ෂීණාශ්‍රවබලයෝ යැ දශ ඍද්ධිබලයෝ යැ දශ තථාගතබලයෝ යි.

ශ්‍රද්ධාබල කවරෙ යත්: අශ්‍රද්ධායෙහි නො සැලේ නු'යි ශ්‍රද්ධාබල යැ, සහජාත (අරූප) ධර්මයනට උපසථම්භනාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ' කෙලෙසුන් ක්‍ෂය කිරීම් අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, ප්‍රතිවෙධාදිවිශොධනාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, චිත්තයාගේ පරිශුද්ධාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, විශෙෂාධිගමාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, මත්තෙහි (මාර්ග) ප්‍රතිවෙධාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, සත්‍යාභිසමයාර්ථයෙන් ශ්‍රද්ධාබල යැ නිරොධයෙහි පිහිටුවනු අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, මේ ශ්‍රද්ධාබල යි.

වීර්‍ය්‍යබල කවරෙ යත්: කුසීදභාවයෙහි නො සැලේ නු'යි වීර්‍ය්‍යබල යැ, සහජාතධර්මයනට උපසථම්භනාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, කෙලෙසුන් ක්‍ෂය කිරීම් අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, ප්‍රතිවෙධාදිවිශොධනාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, චිත්තයාගේ අධිෂ්ඨානාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, චිත්තයාගේ පරිශුද්ධාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, විශෙෂාධිගමාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, මත්තෙහි (මාර්ග) ප්‍රති- වෙධාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, සත්‍යාභිසමයාර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, නිරොධයෙහි පිහිටුවන අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, මේ වීර්‍ය්‍යබල යි.

සමෘතිබල කවරෙ යත්: ප්‍රමාදයෙහි නො සැලේ නු'යි සමෘතිබල යැ, සහජාත (අරූප) ධර්මයනට උපසථම්භනාර්ථයෙන් සමෘතිබල යැ... නිරොධ- යෙහි පිහිටුවන අර්ථයෙන් සමෘතිබල යැ, මේ සමෘතිබල යි.

කතමං සමාධිබලං: උද්ධච්චෙ න කම්පතීති සමාධිබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන සමාධිබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන සමාධිබලං. ඉදං සමාධිබලං.

කතමං පඤ්ඤාබලං: අවිජ්ජාය න කම්පතීති පඤ්ඤාබලං, සහජාතානං ධම්මානං උපත්ථම්භනට්ඨෙන පඤ්ඤාබලං -පෙ- නිරොධෙ පතිට්ඨාපකට්ඨෙන පඤ්ඤාබලං. ඉදං පඤ්ඤාබලං.

කතමං හිරිබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං හිරීයතීති[1] හිරිබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං හිරීයතීති හිරිබලං, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං[2] හිරීයතීති හිරිබලං, අවික්ඛෙපෙන උද්ධච්චං හිරීයතීති හිරිබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං හිරීයතීති හිරිබලං, ඤාණෙන අවිජ්ජං හිරීයතීති හිරිබලං, පාමොජ්ජෙන අරතිං හිරීයතීති හිරිබලං, පඨමෙන ඣානෙන නීවරණෙ හිරීයතීති හිරිබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ හිරීයතීති හිරිබලං ඉදං හිරිබලං.

කතමං ඔත්තප්පබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං ඔත්තප්පතීති ඔත්තප්පබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං ඔත්තප්පතීති ඔත්තප්පබලං, අවික්ඛෙපෙන උද්ධච්චං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං ඔත්තප්පතීති ඔත්තප්පබලං, ඤාණෙන අවිජ්ජං ඔත්තප්පතීති ඔත්තප්පබලං, පාමොජ්ජෙන අරතිං ඔත්තප්පතීති ඔත්තප්පබලං, පඨමෙන ඣානෙන නීවරණෙ ඔත්තප්පතීති ඔත්තප්පබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ ඔත්තප්පතීති ඔත්තප්පබලං. ඉදං ඔත්තප්පබලං.

කතමං පටිසඞ්ඛානබලං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, අබ්‍යාපාදෙන බ්‍යාපාදං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ආලොකසඤ්ඤාය ථීනමිද්ධං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, අවික්ඛෙපෙන උද්ධච්චං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, ඤාණෙන අවිජ්ජං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, පාමොජ්ජෙන අරතිං පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, පඨමෙන ඣානෙන නීවරණෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං. ඉදං පටිසඞ්ඛානබලං.

කතමං භාවනාබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මං භාවෙතීති භාවනාබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං භාවෙතීති භාවනාබලං, ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤං භාවෙතීති භාවනාබලං, උද්ධච්චං පජහන්තො අවික්ඛෙපං භාවෙතීති භාවනාබලං, විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානං භාවෙතීති භාවනාබලං, අවිජ්ජං පජහන්තො ඤාණං භාවෙතීති භාවනාබලං, අරතිං පජහන්තො පාමොජ්ජං භාවෙතීති භාවනාබලං, නීවරණෙ පජහන්තො පඨමං ඣානං භාවෙතීති භාවනාබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං භාවෙතීති භාවනාබලං. ඉදං භාවනාබලං.

1 හිරියතීති - සභා, PTS    2 ථියමිද්ධං - මජසං

සමාධිබල කවරේ යත්: උද්ධතභාවයෙහි නො සැලේ නු’යි සමාධිබල යැ, සහජාතධර්මයනට උපසථම්භනාර්ථයෙන් සමාධිබල යැ ... නිරෝධයෙහි පිහිටුවන අර්ථයෙන් සමාධිබල යැ, මේ සමාධිබල යි.

ප්‍රඥාබල කවරේ යත්: අවිද්‍යායෙහි නො සැලේනු’යි ප්‍රඥාබල යැ, සහජාත ධර්මයනට උපසථම්භනාර්ථයෙන් ප්‍රඥාබල යැ, ... නිරෝධයෙහි පිහිටුවන අර්ථයෙන් ප්‍රඥාබල යැ, මේ ප්‍රඥාබල යි.

හිරිබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය කෙරෙන් ලජ්ජිත වේනු’යි හිරිබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය කෙරෙන් ලජ්ජිත වේනු’යි හිරිබල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ, ප්‍රාමෝද්‍ය හෙයින් අරතිය කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ, ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් කෙරෙන් ලජ්ජිත වේ නු’යි හිරිබල යැ, ... අර්හත්මාර්ග හෙයින් හැම කෙලෙසුන් කෙරෙන ලජ්ජිත වේ නු’යි හිරිබල යැ. මේ හිරිබල යි.

ඔත්තප්පබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ, ප්‍රාමෝද්‍ය හෙයින් අරතිය කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ; ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ ... අර්හත්මාර්ග හෙයින් හැම කෙලෙසුන් කෙරෙන් තැවේ නු’යි ඔත්තප්පබල යැ. මේ ඔත්තප්පබල යි.

පටිසඞ්ඛානබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍ය හෙයින් කාමච්ඡන්දය විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, අව්‍යාපාද හෙයින් ව්‍යාපාදය විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, ආලෝකසංඥා හෙයින් ථිනමිද්ධය විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, අවික්ෂෙප හෙයින් ඖද්ධත්‍යය විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, ධර්මනිශ්චය හෙයින් විචිකිත්සාව විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, ඥාන හෙයින් අවිද්‍යාව විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, ප්‍රාමෝද්‍ය හෙයින් අරතිය විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයන් විමසා නු’යි පටිසඞ්ඛානබල යැ ... අර්හත්මාර්ග හෙයින් හැම කෙලෙසුන් විමසා නු’යි පටිසඞ්ඛානබල යැ, මේ පටිසඞ්ඛාන බල යි.

භාවනාබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කෙරෙමින් නෛෂ්ක්‍රම්‍යය වඩා නුයි භාවනාබල යැ, ව්‍යාපාදය දුරු කෙරෙමින් අව්‍යාපාදය වඩා නු’යි භාවනාබල යැ, ථිනමිද්ධය දුරු කෙරෙමින් ආලෝකසංඥාව වඩා නු’යි භාවනාබල යැ, උද්ධතභාවය දුරු කෙරෙමින් අවික්ෂෙපය වඩානුයි භාවනාබල යැ, විචිකිත්සාව දුරු කෙරෙමින් ධර්මනිශ්චය වඩා නු’යි භාවනාබල යැ, අවිද්‍යාව දුරු කෙරෙමින් ඥානය වඩා නු’යි භාවනාබල යැ, අරතිය දුරු කෙරෙමින් ප්‍රාමෝද්‍යය වඩා නු’යි භාවනාබල යැ, නීවරණයන් දුරු කෙරෙමින් ප්‍රථමධ්‍යානය වඩා නු’යි භාවනාබල යැ ... හැම කෙලෙසුන් දුරු කෙරෙමින් අර්හත්මාර්ගය වඩා නු’යි භාවනා බල යැ. මේ භාවනා බල යි.

කතමං අනවජ්ජබලං: කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤාය නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, අවිජ්ජාය පහීනත්තා ඤාණෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, අරතියා පහීනත්තා පාමොජ්ජෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, නීවරණානං පහීනත්තා පඨමජ්ඣානෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගෙ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, ඉදං අනවජ්ජබලං.

කතමං සඞ්ගහබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, ඉදං සඞ්ගහබලං.

කතමං ඛන්තිබලං: කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං ඛමතීති ඛන්තිබලං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො ඛමතීති ඛන්තිබලං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා ඛමතීති ඛන්තිබලං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො ඛමතීති ඛන්තිබලං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං ඛමතීති ඛන්තිබලං, අවිජ්ජාය පහීනත්තා ඤාණං ඛමතීති ඛන්තිබලං, අරතියා පහීනත්තා පාමොජ්ජං ඛමතීති ඛන්තිබලං, නීවරණානං පහීනත්තා පඨමං ඣානං ඛමතීති ඛන්තිබලං, -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො ඛමතීති ඛන්තිබලං, ඉදං ඛන්තිබලං.

කතමං පඤ්ඤත්තිබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං පඤ්ඤපෙතීති පඤ්ඤත්තිබලං, ඉදං පඤ්ඤත්තිබලං.

කතමං නිජ්ඣත්තිබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, ඉදං නිජ්ඣත්තිබලං.

අනවද්‍යබල කවරේ යත්: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යයෙහි කිසි (රාගාදි) වද්‍යයෙක් (වරදෙක්) නැත් නු'යි අනවද්‍යබල යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, ථීනමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝකසංඥයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මව්‍යවස්ථානයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥනයෙහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යාන-යෙහි කිසි වද්‍යයෙක් නැත් නු' යි අනවද්‍යබල යැ ... හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගයෙහි කිසි වද්‍යයෙක් නැත්නු'යි අනවද්‍යබල යැ, මේ අනවද්‍යබල යි.

සඞ්ග්‍රහබල කවරේ යත් කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ (බඳී) නු'යි සඞ්ග්‍රහබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු' යි සඞ්ග්‍රහබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලොකසංඥවශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහබල යැ, .. හැම කෝලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහ බල යැ, මේ සඞ්ග්‍රහබල යි.

ක්ෂාන්තිබල කවරේ යත්: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් (යොගීහට) නෛෂ්ක්‍රම්‍යය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යා-පාදය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ථීනමිද්ධය ප්‍රහීණ බැවින් ආලෝක-සංඥව රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, ඖද්ධත්‍යය ප්‍රහීණ බැවින් අවික්ෂෙපය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, විචිකිත්සාව ප්‍රහීණ බැවින් ධර්මව්‍යවස්ථාය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, අවිද්‍යාව ප්‍රහීණ බැවින් ඥනය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, අරතිය ප්‍රහීණ බැවින් ප්‍රාමොද්‍යය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, නීවරණයන් ප්‍රහීණ බැවින් ප්‍රථමධ්‍යානය රිසි වේ නු' යි ක්ෂාන්තිබල යැ ... හැම කෙලෙසුන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගය රිසි වේ නු'යි ක්ෂාන්තිබල යැ, මේ ක්ෂාන්තිබල යි.

ප්‍රඥප්තිබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ, ව්‍යාපාදය දුර කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලොකසංඥවශයෙන් සිත පනවා නු'යි ප්‍රඥප්තිබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත පනවා නු' යි ප්‍රඥප්තිබල යැ, මේ ප්‍රඥප්තිබල යි.

නිදිධ්‍යාසනබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය වශයෙන් සිත නිදිධ්‍යාසන (ශ්‍රුතාර්ථවිමර්ශනය) කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාද වශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ, ථීනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥවශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු'යි නිදිධ්‍යාසනබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත නිදිධ්‍යාසන කරවා නු' යි නිදිධ්‍යාසනබල යැ. මේ නිදිධ්‍යාසනබල යි.

කතමං ඉස්සරියබලං: කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරියබලං, ඉදං ඉස්සරියබලං.

කතමං අධිට්ඨානබලං, කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, ථිනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤාවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, ඉදං අධිට්ඨානබලං.

කතමං සමථබලං නෙක්ඛම්මවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, අබ්‍යාපාදවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, ආලොකසඤ්ඤාවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං -පෙ- පටිනිස්සග්ගානුපස්සී අස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං, පටිනිස්සග්ගානුපස්සී පස්සාසවසෙන චිත්තස්ස එකග්ගතා අවික්ඛෙපො සමථබලං.

සමථබලන්ති කෙනට්ඨෙන සමථබලං: පඨමෙන ඣානෙන නීවරණෙ න කම්පතීති සමථබලං, දුතියෙන ඣානෙන විතක්කවිචාරෙ න කම්පතීති සමථබලං, තතියෙන ඣානෙන පීතියා න කම්පතීති සමථබලං, චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛෙ න කම්පතීති සමථබලං, ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය න කම්පතීති සමථබලං, විඤ්ඤාණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය න කම්පතීති සමථබලං, උද්ධච්චෙ ච උද්ධච්චසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති න චලති න වෙධතීති සමථබලං, ඉදං සමථබලං.

කතමං විපස්සනාබලං: අනිච්චානුපස්සනා විපස්සනාබලං -පෙ- පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, රූපෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං, රූපෙ දුක්ඛානුපස්සනා විපස්සනාබලං -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා විපස්සනාබලං, ජරාමරණෙ දුක්ඛානුපස්සනා විපස්සනාබලං -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා විපස්සනාබලං.

ඓශ්වර්යබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය-වශයෙන් සිත වශයෙහි පවත්වා නු’යි ඓශ්වර්යබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදවශයෙන් සිත වශයෙහි පවත්වා නු’යි ඓශ්වර්යබල යැ, ථිනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවශයෙන් සිත වශයෙහි පවත්වා නු’යි ඓශ්වර්යබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගයාගේ වශයෙන් සිත වශයෙහි පවත්වා නු’යි ඓශ්වර්යබල යැ, මේ ඓශ්වර්යබල යි.

අධිෂ්ඨානබල කවරේ යත්: කාමච්ඡන්දය දුරු කරනුයේ නෛෂ්ක්‍රම්‍ය-වශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු’යි අධිෂ්ඨානබල යැ, ව්‍යාපාදය දුරු කරනුයේ අව්‍යාපාදවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු’යි අධිෂ්ඨානබල යැ, ථිනමිද්ධය දුරු කරනුයේ ආලෝකසංඥාවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු’යි අධිෂ්ඨානබල යැ ... හැම කෙලෙසුන් දුරු කරනුයේ අර්හත්මාර්ගවශයෙන් සිත අධිෂ්ඨාන කෙරේ නු’යි අධිෂ්ඨාන බල යැ. මේ අධිෂ්ඨානබල යි

ශමථබල කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල යැ, අව්‍යාපාදයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල යැ, ආලෝකසංඥා-වගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල යැ ... ‘පටිනිස්සග්ගානුපස්සී’ යැයි කියනලද ආශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල යැ, පටිනිස්සග්ගානුපස්සී යැයි කියනලද ප්‍රශ්වාසයාගේ වශයෙන් චිත්තයාගේ ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත අවික්ෂෙපය ශමථබල යි.

**සමථබලං** යනු: කවර අරුතෙකින් ශමථබල නම් වී ද යත්: ප්‍රථමධ්‍යාන හෙයින් නීවරණයෙහි නො සැලේ නු’යි ශමථබල යැ, ද්විතීයධ්‍යාන හෙයින් විතර්කවිචාරයෙහි නො සැලේ නු’යි ශමථබල යැ, තෘතීයධ්‍යාන හෙයින් ප්‍රීතියෙහි නො සැලේ නු’යි ශමථබල යැ, චතුර්ථධ්‍යාන හෙයින් සුඛදුඃඛයෙහි නො සැලේ නු’ යි ශමථබල යැ, ආකාසානඤ්චායතනසමාපත්ති හෙයින් රූපසංඥායෙහි ප්‍රතිඝසංඥායෙහි නානාත්වසංඥායෙහි නො සැලේ නු’යි ශමථබල යැ, විඤ්ඤාණඤ්චායතනසමාපත්ති හෙයින් ආකාසානඤ්චායතන-සංඥායෙහි නො සැලේ නු’යි ශමථබල යැ, ආකිඤ්චඤ්ඤායතනසමාපත්ති හෙයින් විඤ්ඤාණඤ්චායතනසංඥායෙහි නො සැලේ නු’යි ශමථබල යැ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්ති හෙයින් ආකිඤ්චඤ්ඤායතනසංඥා-යෙහි නො සැලේ නු’යි ශමථබල යැ, ඖද්ධත්‍යයෙහි ද ඖද්ධත්‍යසහගත-ක්ලේශයෙහි ද ස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි වෙධනය නො වේ නු’ යි ශමථබල යැ, මේ ශමථබල යි.

විදර්ශනාබල කවරේ යත්: අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව විදර්ශනාබල යැ; වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුයෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව විදර්ශනාබල යැ, ජරාමරණයෙහි දුක්ඛානුපස්සනාව විදර්ශනාබල යැ ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානු-පස්සනාව විදර්ශනාබල යි.

**විපස්සනාබලන්ති** කෙනට්ඨෙන විපස්සනාබලං: අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය න කම්පතීති විපස්සනාබලං, නිබ්බිදානුපස්සනාය නන්දියා න කම්පතීති විපස්සනාබලං, විරාගානුපස්සනාය රාගෙ න කම්පතීති විපස්සනාබලං, නිරොධානුපස්සනාය සමුදයෙ න කම්පතීති විපස්සනාබලං, පටිනිස්සග්ගානුපස්සනාය ආදානෙ න කම්පතීති විපස්සනාබලං, අවිජ්ජාය ච අවිජ්ජාසහගතකිලෙසෙ ච ඛන්ධෙ ච න කම්පති න චලති න වෙධතීති විපස්සනාබලං, ඉදං විපස්සනාබලං.

කතමානි දස සෙඛබලානි: දස අසෙඛබලානි: සම්මාදිට්ඨිං, සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, සම්මාසඞ්කප්පං සික්ඛතීති සෙඛබලං තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, සම්මාවාචං -පෙ- සම්මාකම්මන්තං සම්මාආජීවං -පෙ- සම්මාවායාමං -පෙ- සම්මාසතිං -පෙ- සම්මාසමාධිං -පෙ- සම්මාඤාණං -පෙ- සම්මාවිමුත්තිං සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, ඉමානි දස සෙඛබලානි, දස අසෙඛබලානි.

කතමානි දස ඛීණාසවබලානි: ඉධ ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අනිච්චතො සබ්බෙ සඞ්ඛාරා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ඛීණාසවස්ස භික්ඛුනො 'අඞ්ගාරකාසූපමා කාමා' යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති. යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අඞ්ගාරකාසූපමා කාමා යථාභූතං සම්මප්පඤ්ඤාය සුදිට්ඨා හොන්ති, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති 'ඛීණා මෙ ආසවා'ති.

පුන ච පරං ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං බ්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො විවෙකනින්නං චිත්තං හොති විවෙකපොණං විවෙකපබ්භාරං විවෙකට්ඨං නෙක්ඛම්මාභිරතං බ්‍යන්තීභූතං සබ්බසො ආසවට්ඨානියෙහි ධම්මෙහි, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ අසවා'ති.

පුනච පරං ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා. යම්පි ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සතිපට්ඨානා භාවිතා හොන්ති සුභාවිතා, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති.

**විපස්සනාබලං** යනු: කවර අර්ථයෙකින් විදර්ශනාබල නම් වී ද යත්: අනිච්චානුපස්සනා හෙයින් නිත්‍යසංඥායෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, දුක්ඛානුපස්සනා හෙයින් සුඛසංඥායෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, අනත්තානුපස්සනා හෙයින් ආත්මසංඥායෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, නිබ්බිදානුපස්සනා හෙයින් නන්දියෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, විරාගානුපස්සනා හෙයින් රාගයෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ නිරෝධානුපස්සනා හෙයින් සමුදයෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, පටිනිස්සග්ගානුපස්සනා හෙයින් ග්‍රහණයෙහි නො සැලේ නු’යි විදර්ශනාබල යැ, අවිද්‍යායෙහි ද අවිද්‍යාසහගතක්ලේශයෙහි ද ස්කන්ධයෙහි ද කම්පා නො වෙයි නො සැලෙයි වේධනය නොවේ නු’යි විදර්ශනාබල යැ, මේ විදර්ශනාබල යි.

දශශෛක්ෂබල දශඅශෛක්ෂබල කවරහ යත්: සම්‍යග්දෘෂ්ටියෙහි හික්මේ නු’යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ. සම්‍යක්සංකල්පයෙහි හික්මේ නු’යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ. සම්‍යග්වචනයෙහි ... සම්‍යක්කර්මාන්තයෙහි .. සම්‍යගාජීවයෙහි ... සම්‍යග්ව්‍යායාමයෙහි ... සම්‍යක්ස්මෘතියෙහි . සම්‍යක්සමාධියෙහි ... සම්‍යග්ඥානයෙහි ... සම්‍යග්විමුක්තියෙහි හික්මේ නු’යි ශෛක්ෂබල යැ, එහි ශික්ෂිත බැවින් අශෛක්ෂබල යැ මොහු දශශෛක්ෂබලයෝ යැ, දශඅශෛක්ෂබලයෝ යි.

දශක්ෂීණාස්‍රවබල කවරහ යත්: මෙ සස්නෙහි ක්ෂීණාස්‍රව මහණහු විසින් අනිත්‍ය හෙයින් හැම සංස්කාරයෝ යථාභූතයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නා ලද වෙති, යම්සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහු විසින් අනිත්‍ය හෙයින් හැම සංස්කාරයෝ යථාභූතයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නා ලද වෙත් ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ’යි ආස්‍රවක්ෂය පිළිනා කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද අනෙකෙකි. ක්ෂීණාස්‍රව මහණහු විසින් අඞ්ගාරකර්ෂූවට (අඟුරු වළට) උපමා කරනලද කාමයෝ යථාස්වභාවයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නාලද වෙති. යම්සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහු විසින් අඞ්ගාරකර්ෂූපමකාමයෝ යථාස්වභාවයෙන් සම්‍යක්ප්‍රඥායෙන් මොනොවට දක්නාලද වෙත් ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ ‘මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ’යි ආස්‍රවක්ෂය පිළිනා කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද ක්ෂීණාස්‍රව මහණහට (උපධි) විවේකයට නැඹුරු වූ විවේකප්‍රවණ වූ, විවේකයට බැහැවුම් ඇති විවේකයෙහි සිටි නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු සර්වප්‍රකාරයෙන් (සම්ප්‍රයොග වශයෙන්) ආස්‍රවයනට කරුණු වූ ක්ලේශධර්මයන් කෙරෙන් විගතාන්ත වූ සිත වෙයි. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහට විවේකයට නැඹුරු වූ, විවේකප්‍රවණ වූ, විවේකයට බැහැවුම් ඇති, විවේකයෙහි සිටි නෛෂ්ක්‍රම්‍යයෙහි ඇලුණු සර්වප්‍රකාරයෙන් ආස්‍රවයනට කරුණු වූ ක්ලේශධර්මයන් කෙරෙන් විගතාන්ත වූ සිත වේ ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ ‘මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ’යි ආස්‍රවක්ෂය පිළිනා කෙරේ ද මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

තවද ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සතිපට්ඨානයෝ භාවිත සුභාවිත වෙති. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සතිපට්ඨානයෝ භාවිත සුභාවිත වෙත් ද යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ ‘මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ’යි ආස්‍රවක්ෂය පිළිනා කෙරේ ද මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

පුනච පරං ඛීණාසවස්ස භික්ඛුනො චත්තාරො සම්මප්පධානා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- චත්තාරො ඉද්ධිපාදා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- පඤ්චින්ද්‍රියානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- පඤ්ච බලානි භාවිතානි හොන්ති සුභාවිතානි -පෙ- සත්ත බොජ්ඣඞ්ගා භාවිතා හොන්ති සුභාවිතා -පෙ- අරියො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, යම්පි ඛීණාසවස්ස භික්ඛුනො අට්ඨඞ්ගිකො මග්ගො භාවිතො හොති සුභාවිතො, ඉදම්පි ඛීණාසවස්ස භික්ඛුනො බලං හොති, යං බලං ආගම්ම ඛීණාසවො භික්ඛු ආසවානං ඛයං පටිජානාති ඛීණා මෙ ආසවා'ති' ඉමානි දස ඛීණාසවබලානි.

කතමානි දස ඉද්ධිබලානි: අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාරා ඉද්ධි, සමාධිවිප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි, තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි, ඉමානි දස ඉද්ධිබලානි.

කතමානි දස තථාගතබලානි: ඉධ තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, යම්පි තථාගතො ඨානඤ්ච ඨානතො අට්ඨානඤ්ච අට්ඨානතො යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අතීතානාගතපච්චුප්පන්නානං කම්මසමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති

පුනච පරං තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං යථාභූතං පජානාති, යම්පි තථාගතො සබ්බත්ථගාමිනිං පටිපදං[1] යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති, යම්පි තථාගතො අනෙකධාතුනානාධාතුලොකං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, යම්පි තථාගතො සත්තානං නානාධිමුත්තිකතං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

1 සබ්බත්ථගාමිනිපටිපදං - ස්‍යා, PTS

තවද ක්ෂීණාස්‍රව මහණහු විසින් සතර සම්‍යක්ප්‍රධානයෝ භාවිත සුභාවිත වෙති ... සතර ඍද්ධිපාදයෝ භාවිත සුභාවිත වෙති ... පඤ්චෙන්ද්‍රියයෝ භාවිත සුභාවිත වෙති ... පඤ්චබලයෝ භාවිත සුභාවිත වෙති ... සප්තබොධ්‍යඞ්ගයෝ භාවිත සුභාවිත වෙති ... ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය භාවිත සුභාවිත වෙයි. යම් සෙයෙකින් ක්ෂීණාස්‍රව මහණහු විසින් අෂ්ටාඞ්ගිකමාර්ගය භාවිත සුභාවිත වේ ද, යම් බලයක් පිණිස ක්ෂීණාස්‍රව මහණ 'මාගේ ආස්‍රවයෝ ක්ෂීණයහ'යි ආස්‍රවක්ෂය පිළිත කෙරේ ද, මෙ ද ක්ෂීණාස්‍රව මහණහට බල වෙයි.

ද්ශර්ධිබල කවරහ යත්; අධිෂ්ඨාන ඍද්ධි යැ, විකුර්‍වණ ඍද්ධි යැ, මනොමය ඍද්ධි යැ, ඥානවිස්ඵාර ඍද්ධි යැ, සමාධිවිස්ඵාර ඍද්ධි යැ, ආර්‍ය්‍ය ඍද්ධි යැ, කර්මවිපාකජ ඍද්ධි යැ, පුණ්‍යවත්හුගේ ඍද්ධි යැ, විද්‍යාමය ඍද්ධි යැ. ඒ ඒ කරුණෙහි සම්‍යක්ප්‍රයෝග හෙයින් සමෘද්ධ වන අර්‍ථයෙන් ඍද්ධි යි. මොහු ද්ශර්ධිබලයෝ යි.

දශ තථාගතබල කවරහ යත්: මෙහි තථාගතයෝ කාරණය ද කාරණ හෙයින් අකාරණය ද අකාරණ හෙයින් යථාස්වභාවයෙන් දැනගනිති යම් සෙයෙකින් තථාගතයෝ කාරණය ද කාරණ හෙයින් අකාරණය ද අකාරණ හෙයින් යථාස්වභාවයෙන් දැනගනිත් ද. යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද, පිරිස් මැද අභීතනාද කෙරෙත් ද බ්‍රහ්මසඞ්ඛ්‍යාත ශ්‍රෙෂ්ඨ ධර්මචක්‍රය පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගත බල වෙයි.

තවද තථාගතයෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්න කර්මසමාදානයන්ගේ ප්‍රත්‍යය විසින් හේතු විසින් විපාකය යථාස්වභාවයෙන් දැනගනිති, යම් සෙයෙකින් තථාගතයෝ අතීතානාගතප්‍රත්‍යුත්පන්නකර්මසමාදානයන්ගේ ප්‍රත්‍යය විසින් හේතු විසින් විපාකය යථාස්වභාවයෙන් දැනගනිත් ද යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද පර්ෂද්හි සිංහනාද කෙරෙත් ද බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ සර්‍වත්‍රගාමී (හැම ගතියට අගතියට යනසුලු) මාර්ගය යථාස්වභාවයෙන් දැනගනිති යම්සෙයෙකින් තථාගතයෝ සර්‍වත්‍රගාමිමාර්ගය යථාස්වභාවයෙන් දැනගනිත් ද, යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රෙෂ්ඨස්ථානය පිළිත කෙරෙත් ද, පර්ෂද්හි සිංහනාද කෙරෙත් ද, බ්‍රහ්මචක්‍රය පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි

තවද තථාගතයෝ අනේකධාතු නානාධාතු ලෝකය යථාස්වභාවයෙන් දැනගනිති. යම් සෙයෙකින් තථාගතයෝ අනෙකධාතුනානාධාතුලොකය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ සත්ත්වයන් නානාධිමුක්ති ඇති බව යථාස්වභාවයෙන් දැනගනිති. යම් සෙයෙකින් තථාගතයෝ සත්ත්වයන් නානාධිමුක්ති ඇති බව යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

පුනච පරං තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රිය-පරොපරියත්තං යථාභූතං පජානාති, යම්පි තථාගතො පරසත්තානං පරපුග්ගලානං ඉන්ද්‍රියපරොපරියත්තං යථාභූතං පජානාති, ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං සංකිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති, යම්පි තථාගතො ඣානවිමොක්ඛ-සමාධිසමාපත්තීනං සඞ්කිලෙසං වොදානං වුට්ඨානං යථාභූතං පජානාති ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථිදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, යම්පි තථාගතො අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති, සෙය්‍යථිදං: එකම්පි ජාතිං ද්වෙපි ජාතියො -පෙ- ඉදම්පි තථාගතස්ස -පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත-මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ -පෙ- යම්පි තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ -පෙ- ඉදම්පි තථාගතස්ස-පෙ- බ්‍රහ්මචක්කං පවත්තෙති.

පුනච පරං තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, යම්පි තථාගතො ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති, ඉදම්පි තථාගතස්ස තථාගතබලං හොති, යං බලං ආගම්ම තථාගතො ආසභං ඨානං පටිජානාති, පරිසාසු සීහනාදං නදති, බ්‍රහ්ම-චක්කං පවත්තෙති, ඉමානි දස තථාගතබලානි.

කෙනට්ඨෙන සද්ධාබලං, කෙනට්ඨෙන විරියබලං, කෙනට්ඨෙන සතිබලං, කෙනට්ඨෙන, සමාධිබලං, කෙනට්ඨෙන පඤ්ඤාබලං, කෙනට්ඨෙන හිරිබලං, කෙනට්ඨෙන ඔත්තප්පබලං, කෙනට්ඨෙන පටිසඞ්ඛානබලං, -පෙ- කෙනට්ඨෙන තථාගතබලං:

තවද තථාගතයෝ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාපරභාවය (වෘද්ධි - හානි) යථාස්වභාවයෙන් දැනගනිති. යම් සේයෙකින් තථාගතයෝ පරසත්ත්වයන්ගේ පරපුද්ගලයන්ගේ ඉන්ද්‍රියපරාපරභාවය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ ධ්‍යානවිමොක්ෂසමාධිසමාපත්තීන්ගේ සංක්ලේශ (හානභාගියධර්ම) ය ව්‍යවදාන (විශේෂභාගියධර්ම) ය ව්‍යුත්ථානය යථාස්වභාවයෙන් දැනගනිති. යම්සෙයෙකින් තථාගතයෝ ධ්‍යානවිමොක්ෂසමාධි-සමාපත්තීන්ගේ සංක්ලේශය ව්‍යවදානය ව්‍යුත්ථානය යථාස්වභාවයෙන් දැනගනිත් ද ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ අනේකප්‍රකාර වූ පූර්වනිවාස (පෙරවිසූකඳපිළිවෙළ) සිහි කෙරෙති. හේ කෙසේ යැ යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු .. මෙසෙයින් (වර්ණාදි) ආකාර සහිත වූ (නාමගොත්‍රාදි) උද්දේශ සහිත වූ අනේකප්‍රකාර පූර්වනිවාස සිහි කෙරෙති යම් සෙයෙකින් තථාගතයෝ අනේකප්‍රකාර වූ පූර්වනිවාස සිහි කෙරෙත් ද, හේ කෙසේ යැ යත්: එක් ජාතියකුදු ජාති දෙකකුදු ... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ විශුද්ධ වූ මිනිසත්බව ඉක්මගිය දිවඇසින් සැවයන උපදනා සත්ත්වයන් බලති. යම් සෙයෙකින් තථාගතයෝ විශුද්ධ වූ මිනිසත්බව ඉක්මගිය දිව ඇසින් සැවයන උපදනා ... සත්ත්වයන් බලත් ද... බ්‍රහ්මචක්‍ර පවත්වත් ද, මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි.

තවද තථාගතයෝ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව විරහිත වූ චිත්ත-විමුක්තිය (අර්හත්ඵලසමාධිය) ප්‍රඥාවිමුක්තිය (අර්හත්ඵලප්‍රඥාව) මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙරෙති යම් සෙයෙකින් තථාගතයෝ ආස්‍රවයන් ක්ෂය කිරීමෙන් ආස්‍රව විරහිත වූ චිත්තවිමුක්තිය ප්‍රඥාවිමුක්තිය මෙ අත්බැව්හි මැ තුමූ අභිඥායෙන් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඊට පැමිණ වාසය කෙරෙත් ද යම් බලයක් පිණිස තථාගතයෝ ශ්‍රේෂ්ඨස්ථානය පිළින කෙරෙත් ද පර්ෂද්හි අභීතනාද කෙරෙත් ද බ්‍රහ්ම සඞ්ඛ්‍යාත ශ්‍රේෂ්ඨධර්මචක්‍රය පවත්වත් ද මෙ ද තථාගතයන්ගේ තථාගතබල වෙයි. මොහු දශ තථාගතබලයෝ යි.

කවර අරුතෙකින් ශ්‍රද්ධාබල වේ ද, කවර අරුතෙකින් වීර්‍ය්‍යබල වේ ද, කවර අරුතෙකින් ස්මෘතිබල වේ ද, කවර අරුතෙකින් සමාධිබල වේ ද, කවර අරුතෙකින් ප්‍රඥාබල වේ ද, කවර අරුතෙකින් හිරිබල වේ ද, කවර අරුතෙකින් ඔත්තප්පබල වේ ද, කවර අරුතෙකින් පටිසඞ්ඛානබල වේ ද ... කවර අරුතෙකින් තථාගතබල වේ ද යත්:

අස්සද්ධියෙ අකම්පියට්ඨෙන සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියට්ඨෙන විරියබලං, පමාදෙ අකම්පියට්ඨෙන සතිබලං, උද්ධච්චෙ අකම්පියට්ඨෙන සමාධිබලං, අවිජ්ජාය අකම්පියට්ඨෙන පඤ්ඤාබලං, හිරීයති පාපකෙ අකුසලෙ ධම්මෙති හිරිබලං, ඔත්තප්පති පාපකෙ අකුසලෙ ධම්මෙති ඔත්තප්පබලං, ඤාණෙන කිලෙසෙ පටිසඞ්ඛාතීති පටිසඞ්ඛානබලං, තත්ථ ජාතා ධම්මා එකරසා හොන්තීති භාවනා බලං, තත්ථ නත්ථි කිඤ්චි වජ්ජන්ති අනවජ්ජබලං, තෙන චිත්තං සඞ්ගණ්හාතීති සඞ්ගහබලං, තං ඛමතීති¹ ඛන්තිබලං, තෙන චිත්තං පඤ්ඤාපෙතීති පඤ්ඤත්තිබලං තෙන චිත්තං නිජ්ඣාපෙතීති නිජ්ඣත්තිබලං, තෙන චිත්තං වසං වත්තෙතීති ඉස්සරිය බලං, තෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානබලං, තෙන චිත්තං එකග්ගං හොති සමථබලං, තත්ථ ජාතෙ ධම්මෙ අනුපස්සතීති විපස්සනාබලං, තත්ථ සික්ඛතීති සෙඛබලං, තත්ථ සික්ඛිතත්තා අසෙඛබලං, තෙන ආසවා ඛීණාති ඛීණාසවබලං, තස්ස ඉජ්ඣතීති ඉද්ධිබලං, අප්පමෙය්‍යට්ඨෙන තථාගතබලන්ති.

බලකථා සමත්තා

## 2. 10

## සුඤ්ඤතා කථා

"එවං මෙ සුතං, එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ අථ ඛො ආයස්මා ආනන්දො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො ආයස්මා ආනන්දො භගවන්තං එතදවොච:

"සුඤ්ඤො ලොකො, සුඤ්ඤො ලොකො'ති භන්තෙ වුච්චති, කිත්තාවතා නු ඛො භන්තෙ 'සුඤ්ඤො ලොකො'ති වුච්චතී"ති "යස්මා ඛො ආනන්ද සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චති, කිඤ්චානන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා; චක්ඛුං ඛො² ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, රූපා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුවිඤ්ඤාණං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, චක්ඛුසම්ඵස්සො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, යම්පිදං චක්ඛු-සම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා.

---

1 තං තස්ස ඛමතීති - තාසි PTS, තස්ස ඛමතීති - සී.
2 චක්ඛු ඛො - මජසං.

අශ්‍රද්ධායෙහි නො සැලෙන අර්ථයෙන් ශ්‍රද්ධාබල යැ, කෞසීද්‍යයෙහි නො සැලෙන අර්ථයෙන් වීර්‍ය්‍යබල යැ, ප්‍රමාදයෙහි නො සැලෙන අර්ථයෙන් ස්මෘතිබල යැ, ඖද්ධත්‍යයෙහි නො සැලෙන අර්ථයෙන් සමාධිබල යැ, අවිද්‍යායෙහි නො සැලෙන අර්ථයෙන් ප්‍රඥාබල යැ ලාමක වූ අකුසල් දහම්හි ලජ්ජිත වේ නු'යි හිරිබල යැ, ලාමක වූ අකුසල්දහම්හි තැවේ නු'යි ඔත්තප්පබල යැ, නුවණින් කෙලෙසුන් විමසා නු'යි පටිසඞ්ඛානබල යැ. ඒ භාවනා විශේෂයෙහි උපන් චිත්තචෛතසිකධර්මයෝ එකරස වෙත් නු'යි භාවනා බල යැ, එහි කිසි වද්‍යයෙක් නැත් නු'යි අනවද්‍යබල යැ, එයින් සිත සඞ්ග්‍රහ කෙරේ නු'යි සඞ්ග්‍රහබල යැ, එය සහනය කෙරේ නු'යි ක්‍ෂාන්තිබල යැ, එයින් සිත ප්‍රකාරයෙන් ඥපනය කෙරේ නු'යි ප්‍රඥප්තිබල යැ, එයින් සිත නිදිධ්‍යාසන (ශ්‍රැතාර්ථවිචාරය) කෙරේ නු' යි නිදිධ්‍යාසනබල යැ. එයින් සිත වශයෙහි පවත්වා නු'යි ඓශ්වර්‍ය්‍යබල යැ, එයින් සිත අධිෂ්ඨාන කෙරේ නු'යි අධිෂ්ඨානබල යැ, එයින් (සමාධියෙන්) සිත එකඟ නු'යි ශමථබල යැ, එහි උපන් (චිත්තචෛතසික) ධර්මයන් අනුපස්සනා කෙරේ නු'යි විදර්ශනාබල යැ, ඒ ශෛක්‍ෂබලයෙහි හික්මේ නු'යි ශෛක්‍ෂබල යැ, එහි (අශෛක්‍ෂබලයෙහි) ශික්ෂිත බැවින් අශෛක්‍ෂබල යැ, එයින් (ලෞකිකලෝකෝත්තරඥානයෙන්) ආස්‍රවයෝ ක්‍ෂය කරනලදහ'යි ක්‍ෂීණාස්‍රවබල යැ, ඔහට (ඍද්ධිමත්හට) සමෘද්ධ වේ නු'යි ඍද්ධිබල යැ, ප්‍රමාණ නො කට හැකි අර්ථයෙන් තථාගත බල වේ යයි.

**බලකථා නිමි.**

## 2. 10

## ශූන්‍යතා කථා

මා විසින් මෙසේ අසනලද. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩවසනසේක. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ කරා එළැඹ වැඳ එකත්පස් වැ භාග්‍යවතුන් වහන්සේට මෙ කරුණ සැලකළහ.

වහන්ස, 'ලෝකය ශූන්‍ය යැ ලෝකය ශූන්‍ය යැ' යි කියනු ලැබෙයි. වහන්ස, කිපමණෙකින් 'ලෝකය ශූන්‍ය යැ'යි කියනු ලැබේ ද යි. යම් හෙයකින් ආනන්දයෙනි, ආත්ම භාවයෙන් ද ආත්මනීය භාවයෙන් ද ශූන්‍ය වේ නම් එහෙයින් 'ලෝකය ශූන්‍ය යැ'යි කියනු ලැබෙයි. තවද ආනන්දයෙනි, කුමක් ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වේ ද යත් ආනන්දයෙනි, චක්‍ෂුස ආත්ම භාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙයි, රූපයෝ ආත්ම භාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙති, චක්‍ෂුර් විඥානය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වෙයි. චක්ඛුසම්ඵස්සය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වෙයි. චක්ඛුසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් හෙ ද ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය වෙයි.

සොතං සුඤ්ඤං -පෙ- සද්දා සුඤ්ඤා -පෙ- ඝානං සුඤ්ඤං -පෙ- ගන්ධා සුඤ්ඤා -පෙ- ජිව්හා සුඤ්ඤා -පෙ- රසා සුඤ්ඤා -පෙ- කායො සුඤ්ඤො -පෙ- ඵොට්ඨබ්බා සුඤ්ඤා -පෙ- මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, ධම්මා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා, මනොවිඤ්ඤාණං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, මනොසම්ඵස්සො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා, යම්පිදං මනොසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, තම්පි සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, යස්මා ඛො ආනන්ද, සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, තස්මා සුඤ්ඤො ලොකො'ති වුච්චතී'ති.

සුඤ්ඤසුඤ්ඤං[1] සඞ්ඛාරසුඤ්ඤං, විපරිනාමසුඤ්ඤං අග්ගසුඤ්ඤං, ලක්ඛණසුඤ්ඤං, වික්ඛම්භනසුඤ්ඤං, තදඞ්ගසුඤ්ඤං, සමුච්ඡෙදසුඤ්ඤං, පටිප්පස්සද්ධිසුඤ්ඤං, නිස්සරණසුඤ්ඤං, අජ්ඣත්තසුඤ්ඤං, බහිද්ධාසුඤ්ඤං දුභතොසුඤ්ඤං, සභාගසුඤ්ඤං, විසභාගසුඤ්ඤං, එසනාසුඤ්ඤං, පරිග්ගහසුඤ්ඤං, පටිලාභසුඤ්ඤං, පටිවෙධසුඤ්ඤං, එකත්තසුඤ්ඤං, නානත්තසුඤ්ඤං, ඛන්තිසුඤ්ඤං, අධිට්ඨානසුඤ්ඤං, පරියොගාහනසුඤ්ඤං[2] සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤං.

කතමං සුඤ්ඤසුඤ්ඤං· චක්ඛුං[3] සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා, නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිනාමධම්මෙන වා, සොතං සුඤ්ඤං -පෙ- ඝානං සුඤ්ඤං -පෙ- ජිව්හා සුඤ්ඤා -පෙ- කායො සුඤ්ඤො -පෙ- මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා ඉදං සුඤ්ඤසුඤ්ඤං.

කතමං සඞ්ඛාරසුඤ්ඤං; තයො සඞ්ඛාරා: පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරො ආනෙඤ්ජාභිසඞ්ඛාරො, පුඤ්ඤාභිසඞ්ඛාරො අපුඤ්ඤාභිසඞ්ඛාරෙන ච ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, අපුඤ්ඤාභිසඞ්ඛාරො පුඤ්ඤාභිසඞ්ඛාරෙන ච ආනෙඤ්ජාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, ආනෙඤ්ජාභිසඞ්ඛාරො පුඤ්ඤාභිසඞ්ඛාරෙන ච අපුඤ්ඤාභිසඞ්ඛාරෙන ච සුඤ්ඤො, ඉමෙ තයො සඞ්ඛාරා.

අපරෙපි තයො සඞ්ඛාරා: කායසඞ්ඛාරො වචීසඞ්ඛාරො චිත්තසඞ්ඛාරො. කායසඞ්ඛාරො වචීසඞ්ඛාරෙන ච චිත්තසඞ්ඛාරෙන ච සුඤ්ඤො, වචීසඞ්ඛාරො කායසඞ්ඛාරෙන ච චිත්තසඞ්ඛාරෙන ච සුඤ්ඤො, චිත්තසඞ්ඛාරො කායසඞ්ඛාරෙන ච වචීසඞ්ඛාරෙන සුඤ්ඤො, ඉමෙ තයො සඞ්ඛාරා.

අපරෙපි තයො සඞ්ඛාරා: අතීතා සඞ්ඛාරා අනාගතා සඞ්ඛාරා පච්චුප්පන්නා සඞ්ඛාරා, අතීතා සඞ්ඛාරා අනාගතෙහි ච පච්චුප්පන්නෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, අනාගතා සඞ්ඛාරා අතීතෙහි ච පච්චුප්පන්නෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, පච්චුප්පන්නා සඞ්ඛාරා අතීතෙහි ච අනාගතෙහි ච සඞ්ඛාරෙහි සුඤ්ඤා, ඉමෙ තයො සඞ්ඛාරා. ඉදං සඞ්ඛාරසුඤ්ඤං.

---

1 සුඤ්ඤ. සුඤ්ඤං - සං
2 පරියොගාහනසුඤ්ඤං - සු.
3 චක්ඛු සුඤ්ඤං - මජසං.

ශ්‍රොත්‍රය ශූන්‍ය යැ ... ශබ්දයෝ ශූන්‍යහ ... ඝ්‍රාණය ශූන්‍ය යැ ... ගන්ධයෝ ශූන්‍ය හ ... ජිහ්වාව ශූන්‍ය යැ ... රසයෝ ශූන්‍යහ ... කාය ශූන්‍ය යැ ... ස්ප්‍රෂ්ටව්‍යයෝ ශූන්‍ය හ ... මනස ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, ධර්මයෝ ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍යයෝ යැ, මනොවිඥානය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, මනොසම්ඵස්සය ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය යැ, මනොසම්ඵස්ස ප්‍රත්‍යයෙන් සුව වූ හෝ දුක් වූ හෝ නො දුක් නො සුව වූ හෝ යම් වෙදයිතයෙක් උපදී නම් හෙ ද ආත්මභාවයෙන් හා ආත්මනීය භාවයෙන් හා ශූන්‍ය යැ. යම් හෙයකින් ආනන්දයෙනි, ආත්මභාවයෙන් හා ආත්මනීයභාවයෙන් හා ශූන්‍ය වේ නම් එහෙයින් 'ලොකය ශූන්‍ය යැ'යි කියනුලැබේ' යයි.

ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍ය යැ, සංස්කාරශූන්‍ය යැ, විපරිණාම ශූන්‍ය යැ, අග්‍රශූන්‍ය යැ, ලක්ෂණශූන්‍ය යැ, විෂ්කම්භණශූන්‍ය යැ, තදඞ්ගශූන්‍ය යැ, සමුච්ඡෙදශූන්‍ය යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය යැ, නිස්සරණශූන්‍ය යැ, අධ්‍යාත්මශූන්‍ය යැ, බාහ්‍යශූන්‍ය යැ, උභයතඃශූන්‍ය යැ, සභාගශූන්‍ය යැ, විසභාගශූන්‍ය යැ, ඒෂණාශූන්‍ය යැ, පරිග්‍රහශූන්‍ය යැ, ප්‍රතිලාභශූන්‍ය යැ, ප්‍රතිවෙධශූන්‍ය යැ, ඒකත්වශූන්‍ය යැ, නානාත්වශූන්‍ය යැ, ක්ෂාන්තිශූන්‍ය යැ, අධිෂ්ඨානශූන්‍ය යැ, පර්‍යවගාහණශූන්‍ය යැ, සම්‍යක්ප්‍රඥ ඇත්තහු (රහත්හු) ගේ ප්‍රවෘත්ත (ස්කන්ධ) යන් ක්ෂය කිරිම හැම ශූන්‍යතාවන් අතුරින් පරමාර්ථශූන්‍ය යි

ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍යය කවරැ යත්: චක්ෂුස ආත්මයෙන් හා ආත්මනීයෙන් හා නිත්‍යයෙන් හා ධ්‍රැවයෙන් හා ශාශ්වතයෙන් හා අවිපරිණාමස්වභාවයෙන් හා ශූන්‍ය යැ. ශ්‍රොත්‍රය ශූන්‍ය යැ .. ඝ්‍රාණය ශූන්‍ය යැ ... ජිහ්වාව ශූන්‍ය යැ ... කාය ශූන්‍ය යැ ... මනස ආත්මයෙන් හා ආත්මනියෙන් හා නිත්‍යයෙන් හා ධ්‍රැවයෙන් හා ශාශ්වතයෙන් හා අවිපරිණාමස්වභාවයෙන් හා ශූන්‍ය යැ. මේ ශූන්‍ය සඞ්ඛ්‍යාත ශූන්‍ය යි.

සංස්කාරශූන්‍යය කවරැ යත්: සංස්කාරයෝ තිදෙනෙක් වෙති: පුණ්‍යාභි සංස්කාර යැ අපුණ්‍යාභිසංස්කාර යැ ආනෙඤ්ජාභිසංස්කාර යැ යි. පුණ්‍යාභිසංස්කාරය අපුණ්‍යාභිසංස්කාරයෙනුදු ආනෙඤ්ජාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. අපුණ්‍යාභිසංස්කාරය පුණ්‍යාභිසංස්කාරයෙනුදු ආනෙඤ්ජාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. ආනෙඤ්ජාභිසංස්කාරය පුණ්‍යාභිසංස්කාරයෙනුදු අපුණ්‍යාභිසංස්කාරයෙනුදු ශූන්‍ය යි මොහු තුන් සංස්කාරයෝ යි.

අන්‍ය වූ ද තුන් සංස්කාර කෙනෙක් වෙති: කායසංස්කාර යැ වාක්සංස්කාර යැ චිත්තසංස්කාර යැ යි. කායසංස්කාරය වාක්සංස්කාරයෙනුදු චිත්තසංස්කාරයෙනුදු ශූන්‍ය යැ. වාක්සංස්කාරය කායසංස්කාරයෙනුදු චිත්තසංස්කාරයෙනුදු ශූන්‍ය යැ, චිත්තසංස්කාරය කායසංස්කාරයෙනුදු වාක්සංස්කාරයෙනුදු ශූන්‍ය යි. මොහු තුන් සංස්කාරයෝ යි.

අන්‍ය වූ ද තුන් සංස්කාර කෙනෙක් වෙති: අතීතසංස්කාර යැ අනාගතසංස්කකාර යැ ප්‍රත්‍යුත්පන්නසංස්කාර යැයි අතීතසංස්කාරයෝ අනාගත වූ ද ප්‍රත්‍යුත්පන්න වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ. අනාගතසංස්කාරයෝ අතීත වූ ද ප්‍රත්‍යුත්පන්න වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ ප්‍රත්‍යුත්පන්නසංස්කාරයෝ අතීත වූ ද අනාගත වූ ද සංස්කාරයන්ගෙන් ශූන්‍යහ. මොහු තුන් සංස්කාරයෝ යි. මේ සංස්කාරශූන්‍ය නම් වෙයි.

කතමං විපරිනාමසුඤ්ඤං; ජාතං රූපං සභාවෙන සුඤ්ඤං, විගතං රූපං විපරිනතඤ්චෙව සුඤ්ඤඤ්ච, ජාතා වෙදනා සභාවෙන සුඤ්ඤා, විගතා වෙදනා විපරිනතා චෙව සුඤ්ඤා ච -පෙ- ජාතා සඤ්ඤා -පෙ- ජාතා සඞ්ඛාරා -පෙ- ජාතං විඤ්ඤාණං -පෙ- ජාතං චක්ඛුං -පෙ- ජාතො භවො සභාවෙන සුඤ්ඤො, විගතො භවො විපරිනතො චෙව සුඤ්ඤො ච, ඉදං විපරිනාමසුඤ්ඤං.

කතමං අග්ගසුඤ්ඤං: අග්ගමෙතං පදං, සෙට්ඨමෙතං පදං, විසිට්ඨමෙතං[1] පදං, යදිදං සබ්බසඞ්ඛාරසමථො සබ්බූපධිපටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං, ඉදං අග්ගසුඤ්ඤං.

කතමං ලක්ඛණසුඤ්ඤං, ද්වෙ ලක්ඛණානි බාලලක්ඛණඤ්ච පණ්ඩිතලක්ඛණඤ්ච, බාලලක්ඛණං පණ්ඩිතලක්ඛණෙන සුඤ්ඤං, පණ්ඩිතලක්ඛණං බාලලක්ඛණෙන සුඤ්ඤං.

තීණි ලක්ඛණානි: උප්පාදලක්ඛණං වයලක්ඛණං ඨිතඤ්ඤථත්තලක්ඛණං. උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං.

රූපස්ස උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, රූපස්ස වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, රූපස්ස ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං, වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරානං -පෙ- විඤ්ඤාණස්ස -පෙ- චක්ඛුස්ස -පෙ- ජරාමරණස්ස උප්පාදලක්ඛණං වයලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ජරාමරණස්ස වයලක්ඛණං උප්පාදලක්ඛණෙන ච ඨිතඤ්ඤථත්තලක්ඛණෙන ච සුඤ්ඤං, ජරාමරණස්ස ඨිතඤ්ඤථත්තලක්ඛණං උප්පාදලක්ඛණෙන ච වයලක්ඛණෙන ච සුඤ්ඤං, ඉදං ලක්ඛණසුඤ්ඤං.

කතමං වික්ඛම්භනසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො වික්ඛම්භිතො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො වික්ඛම්භිතො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං වික්ඛම්භිතඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං වික්ඛම්භිතඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා, වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා වික්ඛම්භිතා චෙව සුඤ්ඤා ච, ඉදං වික්ඛම්භනසුඤ්ඤං.

විපරිණාමශූන්‍ය නම් කවරැ යත්: ජාත (ප්‍රත්‍යුත්පන්න) රූපය ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගත (ඉපැද නිරුද්ධ වූ) රූපය විපරිණාමයට පැමිණියේ ද ශූන්‍ය ද වෙයි. ජාතවේදනාව ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගතවේදනාව විපරිණත ද ශූන්‍ය ද වෙයි ... ජාතසංඥව ... ජාතසංස්කාරයෝ ... ජාතවිඥානය ... ජාතචක්ෂුස ... ජාතභවය ස්වභාව හෙයින් ශූන්‍ය වෙයි. විගතභවය විපරිණත ද ශූන්‍ය ද වෙයි. මේ විපරිණාමශූන්‍ය නම් වෙයි.

අග්‍රශූන්‍ය නම් කවරැ යත්: යම් මේ හැම සංස්කාරයන්ගේ ශමථයෙක් හැම උපධීන්ගේ දුරැලීමෙක් තෘෂ්ණාවගේ ක්ෂය කිරීමෙක් විරාගයෙක් නිරෝධයෙක් නිර්වාණයෙක් වේ ද තෙල අග්‍රපද යැ තෙල ශූන්‍ය මැ ප්‍රශංසනීයපද යැ තෙල විශිෂ්ටපද යි. මේ අග්‍රශූන්‍ය නම් වේ.

ලක්ෂණශූන්‍ය නම් කවරැ යත්: ලක්ෂණ දෙකෙකි බාලලක්ෂණ යැ පණ්ඩිතලක්ෂණ යැ යි. බාලලක්ෂණය පණ්ඩිතලක්ෂණයෙන් ශූන්‍ය යැ පණ්ඩිතලක්ෂණය බාලලක්ෂණයෙන් ශූන්‍ය යි.

ලක්ෂණ තුනෙකි: උත්පාදලක්ෂණ යැ ව්‍යයලක්ෂණ යැ සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණ යැ යි. උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ, ව්‍යයලක්ෂණය උත්පාද ලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ, සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි.

රූපයාගේ උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. රූපයාගේ ව්‍යයලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු සිටියහුගේ අන්‍යථාත්වලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. රූපයාගේ ස්ථිතාන්‍යලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි. වේදනාවගේ ... සංඥවගේ ... සංස්කාරයන්ගේ ... විඥානයාගේ ... චක්ෂුස්හුගේ ... ජරාමරණයාගේ උත්පාදලක්ෂණය ව්‍යයලක්ෂණයෙනුදු ස්ථිතාන්‍යලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. ජරාමරණයාගේ ව්‍යයලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ස්ථිතාන්‍යලක්ෂණයෙනුදු ශූන්‍ය යැ. ජරාමරණයාගේ ස්ථිතාන්‍යලක්ෂණය උත්පාදලක්ෂණයෙනුදු ව්‍යයලක්ෂණයෙනුදු ශූන්‍ය යි. මේ ලක්ෂණශූන්‍ය නම් වේ.

විෂ්කම්භණ ශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය විෂ්කම්භණය කරනලද ද ශූන්‍යද වෙයි. අව්‍යාපාදයෙන් ව්‍යාපාදය විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥයෙන් ථීනමිද්ධය විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය විෂ්කම්භණය කරන ලදද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් විචිකිත්සාව විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් අවිද්‍යාව විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් අරතිය විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් නීවරණයෝ විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙති ... අර්හත්මාර්ගයෙන් හැම කෙලෙස්හු විෂ්කම්භණය කරනලදද ශූන්‍ය ද වෙත්. මේ විෂ්කම්භණ ශූන්‍ය නම් වේ.

කතමං තදඞ්ගසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො තදඞ්ගසුඤ්ඤො, අබ්‍යාපාදෙන බ්‍යාපාදො තදඞ්ගසුඤ්ඤො, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං තදඞ්ගසුඤ්ඤං, අවික්ඛෙපෙන උද්ධච්චං තදඞ්ගසුඤ්ඤං, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා තදඞ්ගසුඤ්ඤා, ඤාණෙන අවිජ්ජා තදඞ්ගසුඤ්ඤා, පාමොජ්ජෙන අරති තදඞ්ගසුඤ්ඤා, පඨමෙන ඣානෙන නීවරණා තදඞ්ගසුඤ්ඤා -පෙ- විවට්ටනානුපස්සනාය සඤ්ඤොගාභිනිවෙසො තදඞ්ගසුඤ්ඤො, ඉදං තදඞ්ගසුඤ්ඤං.

කතමං සමුච්ඡෙදසුඤ්ඤං; නෙක්ඛම්මෙන කාමච්ඡන්දො සමුච්ඡින්නො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො සමුච්ඡින්නො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං සමුච්ඡින්නඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං සමුච්ඡින්නඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා සමුච්ඡින්නා චෙව සුඤ්ඤා ච, ඉදං සමුච්ඡෙදසුඤ්ඤං.

කතමං පටිප්පස්සද්ධිසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො පටිප්පස්සද්ධො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො පටිප්පස්සද්ධො චෙව සුඤ්ඤො ච, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං පටිප්පස්සද්ධං චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං පටිප්පස්සද්ධඤ්චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා පටිප්පස්සද්ධා චෙව සුඤ්ඤා ච, ඉදං පටිප්පස්සද්ධිසුඤ්ඤං.

කතමං නිස්සරණසුඤ්ඤං: නෙක්ඛම්මෙන කාමච්ඡන්දො නිස්සටො චෙව සුඤ්ඤො ච, අබ්‍යාපාදෙන බ්‍යාපාදො නිස්සටො චෙව සුඤ්ඤො ච ආලොකසඤ්ඤාය ථිනමිද්ධං නිස්සටඤ්චෙව සුඤ්ඤඤ්ච, අවික්ඛෙපෙන උද්ධච්චං නිස්සටං චෙව සුඤ්ඤඤ්ච, ධම්මවවත්ථානෙන විචිකිච්ඡා නිස්සටා චෙව සුඤ්ඤා ච, ඤාණෙන අවිජ්ජා නිස්සටා චෙව සුඤ්ඤා ච, පාමොජ්ජෙන අරති නිස්සටා චෙව සුඤ්ඤා ච, පඨමෙන ඣානෙන නීවරණා නිස්සටා චෙව සුඤ්ඤා ච -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසා නිස්සටා චෙව සුඤ්ඤා ච, ඉදං නිස්සරණසුඤ්ඤං.

කතමං අජ්ඣත්තසුඤ්ඤං: අජ්ඣත්තං චක්ඛුං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා. අජ්ඣත්තං සොතං සුඤ්ඤං -පෙ- අජ්ඣත්තං ඝානං සුඤ්ඤං -පෙ- අජ්ඣත්තා ජිව්හා සුඤ්ඤා -පෙ- අජ්ඣත්තො කායො සුඤ්ඤො -පෙ- අජ්ඣත්තං මනො සුඤ්ඤො අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, ඉදං අජ්ඣත්තසුඤ්ඤං.

තදඞ්ගශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය නෛෂ්ක්‍රම්‍යභාව හෙයින් ඒ (නෛෂ්ක්‍රම්‍ය) අඞ්ගයෙන් ශූන්‍ය යැ. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ආලෝකසංඥායෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යැ. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ ඒ අඞ්ගයෙන් ශූන්‍යහ ... විවර්තානුදර්ශනායෙන් ප්‍රහීණ වූ සංයොගාභිනිවේශය ඒ අඞ්ගයෙන් ශූන්‍ය යි. මේ තදඞ්ගශූන්‍ය නම් වේ.

සමුච්ඡේදශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥායෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු මොනොවට සිඳුනාලද ද ශූන්‍ය ද වේ. මේ සමුච්ඡේද ශූන්‍ය නම් වේ.

ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය සන්හිඳුනාලද ද (තදඞ්ග හෙයින්) ශූන්‍ය ද වෙයි. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥායෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය සන්හිඳුනා ලද ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව සන්හිඳුනාලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය සන්හිඳුනා ලද ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ සන්හිඳුනාලදහු ද ශූන්‍ය ද වෙති... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු සන්හිඳුනාලදහු ද ශූන්‍ය ද වෙත්. මේ ප්‍රතිප්‍රශ්‍රබ්ධිශූන්‍ය නම් වේ.

නිස්සරණ ශූන්‍ය නම් කවරැ යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් ප්‍රහීණ වූ කාමච්ඡන්දය නිස්සෘත (හැරපියන ලද) ද ශූන්‍ය ද වෙයි. අව්‍යාපාදයෙන් ප්‍රහීණ වූ ව්‍යාපාදය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ආලෝකසංඥායෙන් ප්‍රහීණ වූ ථීනමිද්ධය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. අවික්ෂෙපයෙන් ප්‍රහීණ වූ ඖද්ධත්‍යය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ධර්මනිශ්චයෙන් ප්‍රහීණ වූ විචිකිත්සාව නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ඥානයෙන් ප්‍රහීණ වූ අවිද්‍යාව නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ප්‍රාමොද්‍යයෙන් ප්‍රහීණ වූ අරතිය නිස්සෘත ද ශූන්‍ය ද වෙයි. ප්‍රථමධ්‍යානයෙන් ප්‍රහීණ වූ නීවරණයෝ නිස්සෘත ද ශූන්‍ය ද වෙත් ... අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ වූ හැම කෙලෙස්හු නිස්සෘත ද ශූන්‍ය ද වෙත්. මේ නිස්සරණශූන්‍ය නම් වේ.

අධ්‍යාත්මශූන්‍ය නම් කවරැ යත්: අධ්‍යාත්ම වූ චක්ෂුස ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමසවභාව හෙයිනුදු ශූන්‍ය යැ: අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රය ... අධ්‍යාත්ම වූ ඝ්‍රාණය .. අධ්‍යාත්ම වූ ජිහ්වාව ... අධ්‍යාත්ම වූ කය ... අධ්‍යාත්ම වූ මනස ... ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාම සවභාව හෙයිනුදු ශූන්‍ය යි. මේ අධ්‍යාත්ම ශූන්‍ය නම් වේ.

කතමං බහිද්ධාසුඤ්ඤං, බහිද්ධා රූපා සුඤ්ඤා -පෙ- බහිද්ධා ධම්මා සුඤ්ඤා අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාම ධම්මෙන වා. ඉදං බහිද්ධා සුඤ්ඤං.

කතමං දුභතොසුඤ්ඤං, යඤ්ච අජ්ඣත්තං චක්ඛු යෙ ච බහිද්ධා රූපා උභයමෙතං[1] සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාමධම්මෙන වා, යඤ්ච අජ්ඣත්තං සොතං යෙ ච බහිද්ධා සද්දා -පෙ- යඤ්ච අජ්ඣත්තං ඝානං යෙ ච බහිද්ධා ගන්ධා -පෙ- යා ච අජ්ඣත්තා ජිව්හා යෙ ච බහිද්ධා රසා -පෙ- යො ච අජ්ඣත්තං කායො යෙ ච බහිද්ධා ඵොට්ඨබ්බා -පෙ- යො ච අජ්ඣත්තං මනො යෙ ච බහිද්ධා ධම්මා උභයමෙතං සුඤ්ඤං අත්තෙන වා අත්තනියෙන වා නිච්චෙන වා ධුවෙන වා සස්සතෙන වා අවිපරිණාම ධම්මෙන වා, ඉදං දුභතො සුඤ්ඤං.

කතමං සභාගසුඤ්ඤං; ඡ අජ්ඣත්තිකානි ආයතනානි සභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ බාහිරානි ආයතනානි සභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ විඤ්ඤාණකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ ඵස්සකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ වෙදනාකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ සඤ්ඤාකායා සභාගා චෙව සුඤ්ඤා ච, ඡ චෙතනා කායා සභාගා චෙව සුඤ්ඤා ච, ඉදං සභාගසුඤ්ඤං.

කතමං විසභාගසුඤ්ඤං; ඡ අජ්ඣත්තිකානි ආයතනානි ඡහි බාහිරෙහි ආයතනෙහි විසභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ බාහිරානි ආයතනානි ඡහි විඤ්ඤාණකායෙහි විසභාගානි චෙව සුඤ්ඤානි ච, ඡ විඤ්ඤාණකායා ඡහි ඵස්සායතනෙහි විසභාගා චෙව සුඤ්ඤා ච ඡ ඵස්සකායා ඡහි වෙදනාකා-යෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඡ වෙදනාකායා ඡහි සඤ්ඤාකායෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඡ සඤ්ඤාකායා ඡහි චෙතනාකායෙහි විසභාගා චෙව සුඤ්ඤා ච, ඉදං විසභාගසුඤ්ඤං.

කතමං එසනාසුඤ්ඤං: නෙක්ඛම්මෙසනා කාමච්ඡන්දෙන සුඤ්ඤා, අබ්‍යාපාදෙසනා බ්‍යාපාදෙන සුඤ්ඤා, ආලොකසඤ්ඤෙසනා ථිනමිද්ධෙන සුඤ්ඤා, අවික්ඛෙපෙසනා උද්ධච්චෙන සුඤ්ඤා, ධම්මවවත්ථානෙසනා විචිකිච්ඡාය සුඤ්ඤා, ඤාණෙසනා අවිජ්ජාය සුඤ්ඤා, පාමොජ්ජෙසනා අරතියා සුඤ්ඤා, පඨමජ්ඣානෙසනා නීවරණෙහි සුඤ්ඤා -පෙ- අරහත්ත-මග්ගෙසනා සබ්බකිලෙසෙහි සුඤ්ඤා, ඉදං එසනාසුඤ්ඤං.

කතමං පරිග්ගහසුඤ්ඤං: නෙක්ඛම්මපරිග්ගහො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපරිග්ගහො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපරිග්ගහො ථිනමිද්ධෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපරිග්ගහො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපරිග්ගහො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපරිග්ගහො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපරිග්ගහො නීවරණෙහි සුඤ්ඤො -පෙ- අරහත්තමග්ගපරිග්ගහො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පරිග්ගහසුඤ්ඤං.

---

1. උභයතො තං - සයා,

බාහ්‍ය ශූන්‍ය නම් කවරු යත්: බාහ්‍ය වූ රූපයෝ ... බාහ්‍ය වූ ධර්මයෝ ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍යහ. මේ බාහ්‍ය ශූන්‍ය නම් වේ.

ද්වහතො ශූන්‍ය නම් කවරු යත්: යම් අධ්‍යාත්ම වූ චක්ෂුසෙකුත් යම් බාහ්‍යවූ රූප කෙනෙකුත් වෙත් ද මෙ දෙක ආත්මහෙයිනුදු ආත්මීයහෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍ය යැ. යම් අධ්‍යාත්ම වූ ශ්‍රොත්‍රයෙකුත් යම් බාහ්‍ය වූ ශබ්ද කෙනෙකුත් වෙත් ද .. යම් අධ්‍යාත්ම වූ ඝ්‍රාණයෙකුත් යම් බාහ්‍ය වූ ගන්ධ කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ ජිහ්වාවකුත් යම් බාහ්‍ය වූ රස කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ කයෙකුත් යම් බාහ්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍ය කෙනෙකුත් වෙත් ද ... යම් අධ්‍යාත්ම වූ මනසෙකුත් යම් බාහ්‍ය වූ ධර්ම කෙනෙකුත් වෙත් ද මේ දෙක ආත්ම හෙයිනුදු ආත්මීය හෙයිනුදු නිත්‍ය හෙයිනුදු ධ්‍රැව හෙයිනුදු ශාශ්වත හෙයිනුදු අවිපරිණාමස්වභාව හෙයිනුදු ශූන්‍ය යි. මේ ද්වහතොශූන්‍ය නම් වේ.

සභාගශූන්‍ය නම් කවරු යත්: ආධ්‍යාත්මික වූ ෂඩායතනයෝ සභාග ද ශූන්‍ය ද වෙති, බාහ්‍ය වූ ෂඩායතනයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්විඥානකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්ස්පර්ශකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්වෙදනාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්සංඥාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙති, ෂට්චෙතනාකායයෝ සභාග ද ශූන්‍ය ද වෙත්. මේ සභාගශූන්‍ය නම් වේ.

විසභාගශූන්‍ය නම් කවරු යත්. ආධ්‍යාත්මික වූ ෂඩායතනයෝ බාහ්‍ය වූ ෂඩායතනයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, බාහ්‍ය වූ ෂඩායතනයෝ ෂඩ්විඥානකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්විඥානකායයෝ ෂට්ස්පර්ශකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂට්ස්පර්ශකායයෝ ෂඩ්වෙදනාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂඩ්වෙදනාකායයෝ ෂට්සංඥාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙති, ෂට්සංඥාකායයෝ ෂට්චේතනාකායයන් හා සමග විසභාග ද ශූන්‍ය ද වෙත්. මේ විසභාග ශූන්‍ය නම් වේ.

එෂණාශූන්‍ය නම් කවරු යත්: නෛෂ්ක්‍රම්‍යෛෂණාව කාමච්ඡන්දයෙන් ශූන්‍යයැ, අව්‍යාපාදෛෂණාව ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලොකසංඥෛෂණාව ථීනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂෙපෛෂණාව ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයෛෂණාව විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානෛෂණාව අවිද්‍යයෙන් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යෛෂණාව අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානෛෂණාව නීවරණ හෙයින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගෛෂණාව හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි මේ එෂණාශූන්‍ය නම් වේ.

පරිග්‍රහශූන්‍ය නම් කවරු යත්. නෛෂ්ක්‍රම්‍යපරිග්‍රහය කාමච්ඡන්ද හෙයින් ශූන්‍ය යැ, අව්‍යාපාදපරිග්‍රහය ව්‍යාපාද හෙයින් ශූන්‍ය යැ, ආලොකසංඥාපරිග්‍රහය ථීනමිද්ධ හෙයින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයපරිග්‍රහය විචිකිත්සා හෙයින් ශූන්‍ය යැ, ඥානපරිග්‍රහය අවිද්‍යා හෙයින් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යපරිග්‍රහය අරති හෙයින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානපරිග්‍රහය නීවරණ හෙයින් ශූන්‍ය යැ .. අර්හත්මාර්ගපරිග්‍රහය හැම කෙලෙස් හෙයින් ශූන්‍ය යි. මේ පරිග්‍රහ ශූන්‍ය නම් වේ.

කතමං පටිලාභසුඤ්ඤං, නෙක්ඛම්මපටිලාභො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපටිලාභො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපටිලාභො ථිනමිද්ධෙන සුඤ්ඤො, අවික්ඛෙපපටිලාභො උද්ධච්චෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපටිලාභො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපටිලාභො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපටිලාභො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපටිලාභො නීවරණෙහි සුඤ්ඤො -පෙ- අරහත්තමග්ගපටිලාභො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පටිලාභසුඤ්ඤං.

කතමං පටිවෙධසුඤ්ඤං: නෙක්ඛම්මපටිවෙධො කාමච්ඡන්දෙන සුඤ්ඤො, අබ්‍යාපාදපටිවෙධො බ්‍යාපාදෙන සුඤ්ඤො, ආලොකසඤ්ඤාපටිවෙධො ථිනමිද්ධෙන සුඤ්ඤො, අවික්ඛෙපපටිවෙධො උද්ධච්චෙන සුඤ්ඤො, ධම්මවවත්ථානපටිවෙධො විචිකිච්ඡාය සුඤ්ඤො, ඤාණපටිවෙධො අවිජ්ජාය සුඤ්ඤො, පාමොජ්ජපටිවෙධො අරතියා සුඤ්ඤො, පඨමජ්ඣානපටිවෙධො නීවරණෙහි සුඤ්ඤො -පෙ- අරහත්තමග්ගපටිවෙධො සබ්බකිලෙසෙහි සුඤ්ඤො, ඉදං පටිවෙධසුඤ්ඤං.

කතමං එකත්තසුඤ්ඤං නානත්තසුඤ්ඤං: කාමච්ඡන්දො නානත්තං, නෙක්ඛම්මං එකත්තං, නෙක්ඛම්මෙකත්තං චෙතයතො කාමච්ඡන්දෙන සුඤ්ඤං, බ්‍යාපාදො නානත්තං අබ්‍යාපාදො එකත්තං, අබ්‍යාපාදෙකත්තං චෙතයතො බ්‍යාපාදෙන සුඤ්ඤං, ථිනමිද්ධං නානත්තං, ආලොකසඤ්ඤා එකත්තං, ආලොකසඤ්ඤෙකත්තං චෙතයතො ථිනමිද්ධෙන සුඤ්ඤං, උද්ධච්චං නානත්තං, අවික්ඛෙපො එකත්තං, අවික්ඛෙපෙකත්තං චෙතයතො උද්ධච්චෙන සුඤ්ඤං, විචිකිච්ඡා නානත්තං, ධම්මවවත්ථානං එකත්තං, ධම්මවවත්ථානෙකත්තං චෙතයතො විචිකිච්ඡාය සුඤ්ඤං, අවිජ්ජා නානත්තං ඤාණං එකත්තං, ඤාණෙකත්තං චෙතයතො අවිජ්ජාය සුඤ්ඤං, අරති නානත්තං, පාමොජ්ජං එකත්තං, පාමොජ්ජෙකත්තං චෙතයතො අරතියා සුඤ්ඤං, නීවරණං නානත්තං, පඨමජ්ඣානං එකත්තං, පඨමජ්ඣානෙකත්තං චෙතයතො නීවරණෙහි සුඤ්ඤං -පෙ- සබ්බකිලෙසා නානත්තං, අරහත්තමග්ගො එකත්තං, අරහත්තමග්ගෙකත්තං චෙතයතො සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං එකත්තසුඤ්ඤං, නානත්තසුඤ්ඤං.

කතමං ඛන්තිසුඤ්ඤං: නෙක්ඛම්මඛන්ති කාමච්ඡන්දෙන සුඤ්ඤා, අබ්‍යාපාදඛන්ති බ්‍යාපාදෙන සුඤ්ඤා, ආලොකසඤ්ඤාඛන්ති ථිනමිද්ධෙන සුඤ්ඤා, අවික්ඛෙපඛන්ති උද්ධච්චෙන සුඤ්ඤා, ධම්මවවත්ථානඛන්ති විචිකිච්ඡාය සුඤ්ඤා, ඤාණඛන්ති අවිජ්ජාය සුඤ්ඤා, පාමොජ්ජඛන්ති අරතියා සුඤ්ඤා, පඨමජ්ඣානඛන්ති නීවරණෙහි සුඤ්ඤා, -පෙ- අරහත්තමග්ගඛන්ති සබ්බකිලෙසෙහි සුඤ්ඤා, ඉදං ඛන්තිසුඤ්ඤං.

කතමං අධිට්ඨානසුඤ්ඤං, නෙක්ඛම්මාධිට්ඨානං කාමච්ඡන්දෙන සුඤ්ඤං, අබ්‍යාපාදාධිට්ඨානං බ්‍යාපාදෙන සුඤ්ඤං, ආලොකසඤ්ඤාධිට්ඨානං ථිනමිද්ධෙන සුඤ්ඤං, අවික්ඛෙපාධිට්ඨානං උද්ධච්චෙන සුඤ්ඤං, ධම්මවවත්ථානාධිට්ඨානං විචිකිච්ඡාය සුඤ්ඤං ඤාණාධිට්ඨානං අවිජ්ජාය සුඤ්ඤං, පාමොජ්ජාධිට්ඨානං අරතියා සුඤ්ඤං, පඨමජ්ඣානාධිට්ඨානං නීවරණෙහි සුඤ්ඤං -පෙ- අරහත්තමග්ගාධිට්ඨානං සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං අධිට්ඨානසුඤ්ඤං.

ප්‍රතිලාභශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යප්‍රතිලාභය කාමච්ඡන්දයෙන් ශූන්‍ය යැ, අව්‍යාපාදප්‍රතිලාභය ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලොකසංඥප්‍රතිලාභය ථිනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂෙපප්‍රතිලාභය ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයප්‍රතිලාභය විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානප්‍රතිලාභය අවිද්‍යායෙන් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යප්‍රතිලාභය අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානප්‍රතිලාභය නීවරණයන්ගෙන් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගප්‍රතිලාභය හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි. මේ ප්‍රතිලාභශූන්‍ය නම් වේ.

ප්‍රතිවෙධශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යප්‍රතිවෙධය කාමච්ඡන්දයෙන් ශූන්‍ය යැ, අව්‍යාපාදප්‍රතිවෙධය ව්‍යාපාදයෙන් ශූන්‍ය යැ, ආලොකසංඥප්‍රතිවෙධය ථිනමිද්ධයෙන් ශූන්‍ය යැ, අවික්ෂෙපප්‍රතිවෙධය ඖද්ධත්‍යයෙන් ශූන්‍ය යැ, ධර්මනිශ්චයප්‍රතිවෙධය විචිකිත්සායෙන් ශූන්‍ය යැ, ඥානප්‍රතිවෙධය අවිද්‍යායෙන්ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යප්‍රතිවෙධය අරතියෙන් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානප්‍රතිවෙධය නීවරණයන්ගෙන් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගප්‍රතිවෙධය හැම කෙලෙසුන්ගෙන් ශූන්‍ය යි. මේ ප්‍රතිවෙධශූන්‍ය නම් වේ.

එකත්වශූන්‍ය නම්, නානාත්වශූන්‍ය නම් කවරේ යත්. කාමච්ඡන්දය (ශාන්තවෘත්ති නැති බැවින්) නානාත්ව යැ, නෛෂ්ක්‍රම්‍යය (ශාන්තවෘත්ති බැවින්) ඒකත්ව යි. නෛෂ්ක්‍රම්‍යසඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, ව්‍යාපාදය නානාත්ව යැ, අව්‍යාපාදය ඒකත්ව යි. අව්‍යාපාද සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ව්‍යාපාද විසින් ශූන්‍ය යැ. ථිනමිද්ධය නානාත්ව යැ, ආලොකසංඥව ඒකත්ව යි. ආලොකසංඥ සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ. ඖද්ධත්‍යය නානාත්ව යැ, අවික්ෂෙපය එකත්ව යි. අවික්ෂෙප සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ. විචිකිත්සාව නානාත්ව යැ, ධර්මනිශ්චය ඒකත්ව යි. ධර්මනිශ්චය සඞ්ඛ්‍යාත එකත්වය සිතනුවහට විචිකිත්සා විසින් ශූන්‍ය යැ. අවිද්‍යාව නානාත්ව යැ, ඥානය ඒකත්ව යි. ඥාන සඞ්ඛ්‍යාත එකත්වය සිතනුවහට අවිද්‍යා විසින් ශූන්‍ය යැ. අරතිය නානාත්ව යැ, ප්‍රාමොද්‍යය එකත්ව යි. ප්‍රාමොද්‍ය සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට අරති විසින් ශූන්‍ය යැ. නීවරණයෝ නානාත්ව යැ, ප්‍රථමධ්‍යානය ඒකත්ව යි. ප්‍රථමධ්‍යාන සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට නීවරණ විසින් ශූන්‍ය යැ ... හැම කෙලෙස්හු නානාත්ව යැ. අර්හත්මාර්ගය එකත්ව යි. අර්හත්මාර්ග සඞ්ඛ්‍යාත ඒකත්වය සිතනුවහට හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ එකත්වශූන්‍ය නම් නානාත්වශූන්‍ය නම් වේ.

ක්‍ෂාන්තිශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යක්‍ෂාන්තිය කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, අව්‍යාපාදක්‍ෂාන්තිය ව්‍යාපාද විසින් ශූන්‍ය යැ, ආලොකසංඥක්‍ෂාන්තිය ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ, අවික්ෂෙපක්‍ෂාන්තිය ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයක්‍ෂාන්තිය විචිකිත්සා විසින් ශූන්‍ය යැ, ඥානක්‍ෂාන්තිය අවිද්‍යා විසින් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යක්‍ෂාන්තිය අරති විසින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යාන ක්‍ෂාන්තිය නීවරණ විසින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගක්‍ෂාන්තිය හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ ක්‍ෂාන්තිශූන්‍ය නම් වේ.

අධිෂ්ඨානශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යාධිෂ්ඨානය කාමච්ඡන්ද විසින් ශූන්‍ය යැ, අව්‍යාපාදාධිෂ්ඨානය ව්‍යාපාද විසින් ශූන්‍ය යැ, ආලොකසංඥාධිෂ්ඨානය ථිනමිද්ධ විසින් ශූන්‍ය යැ, අවික්ෂෙපාධිෂ්ඨානය ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යැ, ධර්මනිශ්චයාධිෂ්ඨානය විචිකිත්සා විසින් ශූන්‍ය යැ, ඥානාධිෂ්ඨානය අවිද්‍යා විසින් ශූන්‍ය යැ, ප්‍රාමොද්‍යාධිෂ්ඨානය අරති විසින් ශූන්‍ය යැ, ප්‍රථමධ්‍යානාධිෂ්ඨානය නීවරණ විසින් ශූන්‍ය යැ ... අර්හත්මාර්ගාධිෂ්ඨානය හැම කෙලෙසුන් විසින් ශූන්‍ය යි. මේ අධිෂ්ඨානශූන්‍ය නම් වේ.

කතමං පරියොගාහනසුඤ්ඤං, නෙක්ඛම්මපරියොගාහනං කාමච්ඡන්දෙන සුඤ්ඤං, අබ්‍යාපාදපරියොගාහනං බ්‍යාපාදෙන සුඤ්ඤං, ආලොකසඤ්ඤාපරියොගාහනං ථීනමිද්ධෙන සුඤ්ඤං, අවික්ඛෙපපරියොගාහනං උද්ධච්චෙන සුඤ්ඤං, ධම්මවවත්ථානපරියොගාහනං විචිකිච්ඡාය සුඤ්ඤං, ඤාණපරියොගාහනං අවිජ්ජාය සුඤ්ඤං, පාමොජ්ජපරියොගාහනං අරතියා සුඤ්ඤං, පඨමජ්ඣානපරියොගාහනං නීවරණෙහි සුඤ්ඤං, -පෙ- අරහත්තමග්ගපරියොගාහනං සබ්බකිලෙසෙහි සුඤ්ඤං, ඉදං පරියොගාහනසුඤ්ඤං

කතමං සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤං: ඉධ සම්පජානො නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පවත්තං පරියාදියති, අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පවත්තං පරියාදියති, ආලොකසඤ්ඤාය ථීනමිද්ධස්ස පවත්තං පරියාදියති, අවික්ඛෙපෙන උද්ධච්චස්ස පවත්තං පරියාදියති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡාය පවත්තං පරියාදියති, ඤාණෙන අවිජ්ජාය පවත්තං පරියාදියති, පාමොජ්ජෙන අරතියා පවත්තං පරියාදියති, පඨමෙන ඣානෙන නීවරණානං පවත්තං පරියාදියති, -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පවත්තං පරියාදියති.

අථ වා පන සම්පජානස්ස අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායන්තස්ස ඉදං චෙව චක්ඛුපවත්තං පරියාදියති, අඤ්ඤං ච චක්ඛුපවත්තං න උප්පජ්ජති, ඉදං චෙව සොතපවත්තං -පෙ- ඝානපවත්තං -පෙ- ජිව්හාපවත්තං -පෙ- කායපවත්තං -පෙ- මනොපවත්තං පරියාදියති, අඤ්ඤං ච මනොපවත්තං න උප්පජ්ජති, ඉදං සම්පජානස්ස පවත්තපරියාදානං සබ්බසුඤ්ඤතානං පරමත්ථසුඤ්ඤන්ති.

සුඤ්ඤකථා සමත්තා.

යුගනද්ධවග්ගො දුතියො.

තස්සුද්දානං:

යුගනද්ධා සච්ච බොජ්ඣඞ්ගා
මෙත්තාවිරාගපඤ්චමා,
පටිසම්භිදා ධම්මචක්කං
ලොකුත්තරබලසුඤ්ඤා'ති

එස නිකායධරෙහි ඨපිතො
අසමො දුතියො පවරො වරවග්ගො'ති.

පර්‍යායවගාහණශූන්‍ය නම් කවරේ යත්: නෛෂ්ක්‍රම්‍යයෙහි බැසගැනීම කාමච්ඡන්ද විසින් ශූන්‍ය යෑ, අව්‍යාපාදයෙහි බැසගැනීම ව්‍යාපාද විසින් ශූන්‍ය යෑ, ආලෝකසංඥයෙහි බැසගැනීම ථීනමිද්ධ විසින් ශූන්‍ය යෑ, අවික්ෂෙපයෙහි බැසගැනීම ඖද්ධත්‍ය විසින් ශූන්‍ය යෑ, ධර්මනිශ්‍රවයෙහි බැසගැනීම විචිකිත්සා විසින් ශූන්‍ය යෑ, ඥානයෙහි බැසගැනීම අවිද්‍යා විසින් ශූන්‍ය යෑ, ප්‍රාමොද්‍යයෙහි බැසගැනීම් අරති විසින් ශූන්‍ය යෑ, ප්‍රථමධ්‍යානයෙහි බැසගැනීම නීවරණ විසින් ශූන්‍ය යෑ ... අර්හත්මාර්ගයෙහි බැසගැනීම හැම කෙලෙසුන් විසින් ශූන්‍ය සි. මේ පර්‍යායවගාහණශූන්‍ය සි.

සම්‍යග්ඥාන සමන්වාගතයා (රහත්හු) ගේ හැම ශූන්‍යතයන් අතුරින් පරමාර්ථශූන්‍ය වූ ප්‍රවෘත්තික්ෂය (අනුපාදපරිනිර්වාණය) කවරේ යත්: මෙ සසුන්හි සම්‍යග්ඥානසමන්වාගත වූයේ නෛෂ්ක්‍රම්‍ය හේතුකොටගෙන කාමච්ඡන්දයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, අව්‍යාපාදය හේතුකොටගෙන ව්‍යාපාදයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ආලෝකසංඥව හේතුකොටගෙන ථීනමිද්ධයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, අවික්ෂෙපය හේතුකොටගෙන ඖද්ධත්‍යයාගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ධර්මනිශ්‍රවය හේතුකොටගෙන විචිකිත්සාවගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ඥානය හේතුකොටගෙන අවිද්‍යාවගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ප්‍රාමොද්‍යය හේතුකොටගෙන අරතියගේ පැවැත්ම ක්ෂය කෙරෙයි, ප්‍රථමධ්‍යානය හේතුකොටගෙන නීවරණයන්ගේ පැවැත්ම ක්ෂය කෙරෙයි ... අර්හත්මාර්ගය හේතුකොටගෙන හැම කෙලෙසුන්ගේ පැවැත්ම ක්ෂය කෙරේ.

තවද සම්‍යග්ඥාන ඇත්තහු අනුපාදිශෙෂපරිනිර්වාණධාතුයෙන් පිරිනිවෙන්නහුට මේ චක්ෂුඃප්‍රවෘත්තිය ද ක්ෂය වෙයි. අන්‍ය චක්ෂුඃප්‍රවෘත්තියෙකුදු නූපදී. මේ ශ්‍රොත්‍රප්‍රවෘත්තිය ද ... ඝ්‍රාණප්‍රවෘත්තිය ද ... ජිහ්වාප්‍රවෘත්තිය ද ... කායප්‍රවෘත්තිය ද ... මනඃප්‍රවෘත්තිය ද ක්ෂය වෙයි, අන්‍ය වූ මනඃප්‍රවෘත්තියෙකුදු නූපදී. මේ සම්‍යග්ඥානසමන්වාගතයාගේ හැම ශූන්‍යතයන් අතුරින් පරමාර්ථශූන්‍ය වූ ප්‍රවෘත්තික්ෂය නම් වේ යයි.

**ශූන්‍යතාකථා නිමි.**

**දෙ වැනි යුගනද්ධවර්ග සි.**

**එහි උද්දානය:**

යුගනද්ධ කථා යෑ, සත්‍ය කථා යෑ, බොධ්‍යඞ්ග කථා යෑ, මෛත්‍රී කථා යෑ, පස් වැනි වූ විරාග කථා යෑ, ප්‍රතිසංවිත් කථා යෑ, ධර්මචක්‍ර කථා යෑ, ලොකොත්තර කථා යෑ, බල කථා යෑ, ශූන්‍ය කථා යෑ' යි.

# 3. පඤ්ඤාවග්ගො

## 3. 1.

## පඤ්ඤාකථා

අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති. -පෙ- පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤං පරිපූරෙති, අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා මහාපඤ්ඤං පරිපූරෙති, නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤං පරිපූරෙති, විරාගානුපස්සනා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤං පරිපූරෙති, නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤං පරිපූරෙති, පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති. ඉමා සත්තපඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති. ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති. ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස.[1] අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය. පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති. ඉමා, සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති, ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති

# 3. ප්‍රඥා වර්ගය

## 3. 1.

## ප්‍රඥා කථා

අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, දුක්ඛානුපස්සනාව වඩනා ලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී නිබ්බෙධිකප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී මහාප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, නිබ්බිදානුපස්සනාව වඩනා ලද්දී පුනපුනා කරනලද්දී තීක්ෂණප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි. විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා වඩනාලද්දී විපුලප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, නිරොධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ගම්භීරප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පාණ්ඩිත්‍යය පරිපූර්ණ කෙරෙති, මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්:

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද යැ. ඒ ආර්‍ය්‍යපුද්ගල විසින් (යථොක්ත) අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරන ලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙයි. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු ලබනලද සාක්ෂාත් කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරනලද වෙත්.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී බහුල කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු පාණ්ඩිත්‍යය පරිපූර්ණ කෙරෙති, මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති, මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු බහුල කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා තස්ස[1] අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති, ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨ පඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති. ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා භාවිතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා පස්සිතා පඤ්ඤාය.

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති: රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

---

1 තස්සා - මජසං, සං PTS

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද යෑ, ඒ ආර්‍ය්‍යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභාන ප්‍රතිසංවිද්ඥානය ලබනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු ලබනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්‍ෂුසෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්: ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්‍යප්‍රඥාව පරිපූර්ණ කෙරේ. මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පණ්ඩිත බව පරිපූර්ණ කෙරෙති. මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද යෑ. ඒ ආර්‍ය්‍යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය වඩනාලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි. ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වේ. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත ප්‍රත්‍යුත්පන්නරූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා නිබ්බෙධිකපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ දුක්ඛානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති. රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා මහාපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ අනත්තානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති. රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා තික්ඛපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිබ්බිදානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා විපුලපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ විරාගානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ගම්භීරපඤ්ඤං පරිපූරෙති. අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ නිරොධානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා අසාමන්තපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ රූපෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, ඉමා සත්ත පඤ්ඤා භාවිතා බහුලීකතා පණ්ඩිච්චං පරිපූරෙන්ති, ඉමා අට්ඨපඤ්ඤා භාවිතා බහුලීකතා පුථුපඤ්ඤං පරිපූරෙන්ති, ඉමා නව පඤ්ඤා භාවිතා බහුලීකතා හාසපඤ්ඤං පරිපූරෙන්ති.

හාසපඤ්ඤා පටිභානපටිසම්භිදා, තස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

වෙදනාය -පෙ- සඤ්ඤාය -පෙ- සඞ්ඛාරෙසු -පෙ- විඤ්ඤාණෙ -පෙ- චක්ඛුස්මිං -පෙ- ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, -පෙ- ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ පටිනිස්සග්ගානුපස්සනා භාවිතා බහුලීකතා කතමං පඤ්ඤං පරිපූරෙති:

ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකතා ජවනපඤ්ඤං පරිපූරෙති, අතීතානාගතපච්චුප්පන්නෙ ජරාමරණෙ අනිච්චානුපස්සනා භාවිතා බහුලීකා ජවනපඤ්ඤං පරිපූරෙති -පෙ- තස්සිමා චතස්සො පටිසම්භිදායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය.

රූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නරූපයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී නිබ්බේධික (ප්‍රණිධිවිදාරණ) ප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි දුක්ඛානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරන ලද්දී මහාප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි අනත්තානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී තීක්ෂණප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිබ්බිදානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී විපුලප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි විරාගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ගම්භීරප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි නිරෝධානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී අසාමන්තප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න රූපයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරේ මේ සප්තප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු පණ්ඩිත බව පරිපූර්ණ කෙරෙති. මේ අෂ්ටප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු පෘථුප්‍රඥාව පරිපූර්ණ කෙරෙති. මේ නවප්‍රඥාවෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු හාසප්‍රඥාව පරිපූර්ණ කෙරෙත්.

හාසප්‍රඥාව ප්‍රතිභානප්‍රතිසංවිද යැ. ඒ ආර්යපුද්ගල විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, නිරුක්තිනිශ්චය කිරීම් වශයෙන් නිරුක්තිප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙයි, ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභානප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වේ. ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

වේදනායෙහි ... සංඥායෙහි ... සංස්කාරයන්හි ... විඥානයෙහි ... චක්ෂුයෙහි ... ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද; අතීත-අනාගත-වර්තමාන වූ ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද ... ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද, අතීත - අනාගත - වර්තමාන වූ ජරාමරණයෙහි පටිනිස්සග්ගානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී කවර ප්‍රඥාවක් පරිපූර්ණ කෙරේ ද යත්:

ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි, අතීත-අනාගත-වර්තමාන වූ ජරාමරණයෙහි අනිච්චානුපස්සනාව වඩනාලද්දී පුනපුනා කරනලද්දී ජවනප්‍රඥාව පරිපූර්ණ කෙරෙයි ... ඔහු විසින් මේ සතර ප්‍රතිසංවිද්හු අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥායෙන් පහස්නාලද වෙත්.

“චත්තාරො’මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං[1] යොනිසොමනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා සොතාපත්තිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති.

චත්තාරො මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා සකදාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති -පෙ- අනාගාමිඵලසච්ඡිකිරියාය සංවත්තන්ති -පෙ- අරහත්තඵලසච්ඡිකිරියාය සංවත්තන්ති, කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං,[1] යොනිසොමනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා අරහත්තඵල[2] සච්ඡිකිරියාය සංවත්තන්ති.

චත්තාරො’මෙ භික්ඛවෙ, ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති -පෙ- පඤ්ඤාවුද්ධියා[3] සංවත්තන්ති -පෙ- පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති -පෙ- මහාපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- පුථුපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- විපුලපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- ගම්භීරපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- අසාමන්තපඤ්ඤතාය[4] සංවත්තන්ති -පෙ-භූරිපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති -පෙ- සීඝපඤ්ඤතාය ලහුපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- හාසපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- සංවත්තන්ති -පෙ ජවනපඤ්ඤතාය සංවත්තන්ති -පෙ- තික්ඛපඤ්ඤතාය සංවත්තන්ති-පෙ-නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්ති. කතමෙ චත්තාරො: සප්පුරිසසංසෙවො, සද්ධම්මසවනං,[1] යොනිසොමනසිකාරො, ධම්මානුධම්මපටිපත්ති, ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති, පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති -පෙ- නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්ති”.ඝ

**පඤ්ඤාපටිලාභාය සංවත්තන්තීති** කතමො පඤ්ඤාපටිලාභො: චතුන්නං මග්ගඤාණානං චතුන්නං ඵලඤාණානං චතුන්නං පටිසම්භිදාඤාණානං ඡන්නං අභිඤ්ඤාඤාණානං තෙසත්තතීනං ඤාණානං සත්තසත්තතීනං ඤාණානං ලාභො පටිලාභො පත්ති සම්පත්ති ඵස්සනා සච්ඡිකිරියා උපසම්පදා. පඤ්ඤාපටිලාභාය සංවත්තන්තීති අයං පඤ්ඤාපටිලාභො.

**පඤ්ඤාවුද්ධියා[3] සංවත්තන්තීති** කතමා පඤ්ඤාවුද්ධි: සත්තන්නඤ්ච සෙඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වඩ්ඪති, අරහතො පඤ්ඤා වඩ්ඪිතවඩ්ඪනා, පඤ්ඤාවුද්ධියා[3] සංවත්තන්තීති අයං පඤ්ඤාවුද්ධි[5]

**පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්තීති** කතමං පඤ්ඤාවෙපුල්ලං: සත්තන්නං සෙඛානං පුථුජ්ජනකල්‍යාණකස්ස ච පඤ්ඤා වෙපුල්ලං ගච්ඡති, අරහතො පඤ්ඤා වෙපුල්ලං ගතා,[6] පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්තීති ඉදං පඤ්ඤාවෙපුල්ලං,

---

1 සද්ධම්මස්සවනං - මජ්ඣං,
2. අරහත්තමග්ගඵල - මජ්ඣං,
3. පඤ්ඤාබුද්ධියා-මජ්ඣං, PTS පඤ්ඤාවුඩ්ඪියා - සයා,
4. අසාමන්තපඤ්ඤතාය - සයා, PTS.
5. පඤ්ඤාබුද්ධි මජ්ඣං, PTS, පඤ්ඤාවුඩ්ඪි - සයා,
6. වෙපුල්ලගතා - මජ්ඣං, වෙපුල්ලතා සයා, වෙපුල්ලගතා වෙපුල්ලං PTS,
ඝ. සොතාපත්ති සංයුත්ත

මහණෙනි, මේ ධර්මයෝ සතර දෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්. කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසෙවන යැ සද්ධර්මශ්‍රවණ යැ යොනිසොමනසිකාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු සෝවාන්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත් අනාගාමි ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත් ... අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්. කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසෙවන යැ සද්ධර්ම-ශ්‍රවණ යැ යොනිසොමනසිකාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු අර්හත්ඵලය ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස පවතිත්.

මහණෙනි, මේ සතර ධර්ම කෙනෙක් වඩනාලද්දාහු පුනපුනා කරන ලද්දාහු ප්‍රඥාප්‍රතිලාභය පිණිස පවතිත් ... ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත් ... ප්‍රඥාවගේ විපුලභාවය පිණිස පවතිත් (මහදර්ථප්‍රතිවෙධක බැවින්) මහා ප්‍රඥා බව පිණිස පවතිත් (නානාර්ථප්‍රතිවෙධක බැවින්) පෘථු ප්‍රඥා බව පිණිස පවතිත් ... විපුලප්‍රඥා බව පිණිස පවතිත් .. ගම්භීරප්‍රඥා බව පිණිස පවතිත් .. (යට යට ප්‍රඥා මතු මතු ප්‍රඥාවනට අනාසන්න බැවින්) අනාමන්තප්‍රඥා බව පිණිස පවතිත් .. භූරිප්‍රඥා බව පිණිස පවතිත් ... ප්‍රඥාවගේ බහුල බව පිණිස පවතිත් .. (ශීඝ්‍ර වැ අර්ථ ප්‍රතිවෙධ කරන) ශීඝ්‍රප්‍රඥා බව පිණිස පවතිත් ... (ලඝු වැ අර්ථප්‍රතිවෙධ කරන) ලඝුප්‍රඥා බව පිණිස පවතිත් ... (තුෂ්ටි බහුල බැවින්) හාසප්‍රඥා බව පිණිස පවතිත් ... ජවනප්‍රඥා බව පිණිස පවතිත් ... තීක්ෂණප්‍රඥා බව පිණිස පවතිත් ... නිර්වේධිකප්‍රඥා බව පිණිස පවතිත් ... කවර සතර ධර්ම කෙනෙකැ යත්: සත්පුරුෂසංසේවන යැ සද්ධර්මශ්‍රවණ යැ යෝනිසොමනසිකාර යැ ධර්මානුධර්මප්‍රතිපත්ති යැ යි. මහණෙනි, මේ සතර ධර්මයෝ වඩනාලද්දාහු පුනපුනා කරනලද්දාහු ප්‍රඥා-ප්‍රතිලාභය පිණිස පවතිත් ... ප්‍රඥාවෘද්ධිය පිණිස පවතිත් ... නිර්වේධිකප්‍රඥා බව පිණිස පවතිත්.

**පඤ්ඤාපටිලාභාය සංවත්තන්ති** යනු: ප්‍රඥාප්‍රතිලාභ නම් කවරෙ යත්: සතර මාර්ගඥානය සතර ඵලඥානය සතර ප්‍රතිසංවිද්ඥානය ෂඩ් අභිඥාඥානය තෙසැත්තෑනුවණ සත්සැත්තෑනුවණ යන මොවුන්ගේ ලාභය ප්‍රතිලාභය ප්‍රාප්තිය සම්ප්‍රාප්තිය ස්පර්ශනය සාක්‍ෂාත්කරණය උපසම්ප්‍රාප්තිය ප්‍රඥාව ලැබීම පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාප්‍රතිලාභ නම්.

**පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති** යනු: ප්‍රඥාවෘද්ධි නම් කවරැ යත්: සප්ත ශෛක්‍ෂයන්ගේ ද කල්‍යාණපෘථග්ජනයාගේ ද ප්‍රඥාව වැඩෙයි, රහත්හුගේ ප්‍රඥාව වැඩුණු වැඩීම් ඇත්තී යා, ප්‍රඥාවගේ වැඩීම පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාවෘද්ධි නමු.

**පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති** යනු: ප්‍රඥාවෛපුල්‍ය නම් කවරැ යත්: සප්තශෛක්‍ෂයන්ගේ ද කල්‍යාණ පෘථග්ජනයාගේ ද ප්‍රඥාව විපුල බවට යෙයි, රහත්හුගේ ප්‍රඥාව විපුල බවට ගියා වෙයි. ප්‍රඥාවගේ විපුල බව පිණිස පවතිත් නු' යි මේ ප්‍රඥාවෛපුල්‍ය නම.

මහාපඤ්ඤතාය සංවත්තන්තීති කතමා මහාපඤ්ඤා, මහන්තෙ අත්ථෙ පරිගණ්හාතීති[1] මහාපඤ්ඤා, මහන්තෙ ධම්මෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තී[2] නිරුත්තියො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි පටිභානානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සීලක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සමාධික්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ පඤ්ඤාක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ විමුත්තික්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි ඨානාට්ඨානානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තී[2] විහාරසමාපත්තියො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි අරියසච්චානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සතිපට්ඨානෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ සම්මප්පධානෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ ඉද්ධිපාදෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි ඉන්ද්‍රියානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි බලානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තෙ බොජ්ඣඞ්ගෙ පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තං අරියමග්ගං පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තානි සාමඤ්ඤඵලානි පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තී[2] අභිඤ්ඤායො පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහන්තං පරමත්ථං නිබ්බානං පරිගණ්හාතීති මහාපඤ්ඤා, මහාපඤ්ඤතාය සංවත්තන්තීති අයං මහාපඤ්ඤා.

පුථුපඤ්ඤතාය සංවත්තන්තී'ති කතමා පුථුපඤ්ඤා: පුථු නානාඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාධාතුසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාආයතනෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපටිච්චසමුප්පාදෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසුඤ්ඤතමනුපලබ්භෙසු[3] ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅත්ථෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාධම්මෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානානිරුත්තිසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපටිභානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසීලක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසමාධික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාපඤ්ඤාක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාවිමුත්තික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාවිමුත්තිඤාණදස්සනක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඨානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාවිහාරසමාපත්තීසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅරියසච්චෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසතිපට්ඨානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසම්මප්පධානෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඉද්ධිපාදෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඉන්ද්‍රියෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාබලෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාබොජ්ඣඞ්ගෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅරියමග්ගෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාසාමඤ්ඤඵලෙසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාඅභිඤ්ඤාසු ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුනානාජනසාධාරණෙ[4] ධම්මෙ අතික්කම්ම[5] පරමත්ථෙ නිබ්බානෙ ඤාණං පවත්තතීති පුථුපඤ්ඤා, පුථුපඤ්ඤතාය සංවත්තන්තීති අයං පුථුපඤ්ඤා.

1. පරිග්ගණ්හාතීති මජසං, සයා, PTS,
2. මහන්තා - මජසං, සයා - PTS.
3. සුඤ්ඤතමනුපලබ්භෙසු - සයා.
4. පුථුජ්ජනසාධාරණෙ - මජසං, සයා PTS,
5. සමතික්කම්ම - තායි, PTS

**මහාපඤ්ඤතාය සංවත්තන්ති** යනු මහාප්‍රඥා නම් කවර යත් (පිළිසැඹියාපත් ආර්‍යශ්‍රාවක තෙම) මහත් වූ අර්ථයන් (ආලම්බනකරණයෙන්) පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ධර්මයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ නිරුක්තීන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ප්‍රතිභානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ශීලස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ සමාධිස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ප්‍රඥාස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විමුක්තිස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ස්ථානාස්ථානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ විහාරසමාපත්තීන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ආර්‍යසත්‍යයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ සතිපට්ඨානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ සම්‍යක්ප්‍රධානයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ඍද්ධිපාදයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ඉන්ද්‍රියයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ බලයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ බොධ්‍යඞ්ගයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ආර්‍යමාර්ගය පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ ශ්‍රාමණ්‍යඵලයන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ අභිඥාවන් පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යැ, මහත් වූ පරමාර්ථ නිර්වාණය පිරිසිඳගනී නු'යි මහාප්‍රඥා යි. මහාප්‍රඥා බව පිණිස පවතිත් නු'යි මේ මහාප්‍රඥා නම.

**පුථුපඤ්ඤතාය සංවත්තන්ති** යනු: පෘථුප්‍රඥා නම් කවර යත් පෘථුනානාස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාධාතූන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාආයතනයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රතීත්‍යසමුත්පාදයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාශූන්‍යතානුපලබ්ධීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා අර්ථයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා ධර්මයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා නිරුක්තීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රතිභානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාශීලස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ, පෘථුනානාසමාධිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාප්‍රඥාස්කන්ධයන්හි ඥානය පවතී නු,යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිමුක්තිස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිමුක්තිඥානදර්ශනස්කන්ධයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාස්ථානාස්ථානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාවිහාරසමාපත්තීන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා-ආර්‍යසත්‍යයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාසතිපට්ඨානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා සම්‍යක්ප්‍රධානයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාඍද්ධිපාදයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාඉන්ද්‍රියයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාබලයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාබොධ්‍යඞ්ගයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාආර්‍යමාර්ගයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාශ්‍රාමණ්‍යඵලයන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානා-අභිඥාවන්හි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ පෘථුනානාජනසාධාරණ ධර්මයන් ඉක්ම පරමාර්ථ සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි ඥානය පවතී නු'යි පෘථුප්‍රඥා යැ 'පුථුපඤ්ඤතාය සංවත්තන්ති'යි මේ පෘථුප්‍රඥා නමු

**විපුලපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා විපුලපඤ්ඤා: විපුලෙ අත්ථෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ ධම්මෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා නිරුත්තියො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි පටිභානානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සීලක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සමාධික්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ පඤ්ඤාක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ විමුත්තික්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි ඨානාඨානානි[1] පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා විහාරසමාපත්තියො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි අරියසච්චානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සතිපට්ඨානෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ සම්මප්පධානෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ ඉද්ධිපාදෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි ඉන්ද්‍රියානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි බලානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ බොජ්ඣඞ්ගෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලෙ අරියමග්ගෙ පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලානි සාමඤ්ඤඵලානි පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලා අභිඤ්ඤායො පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලං පරමත්ථං නිබ්බානං පරිග්ගණ්හාතීති විපුලපඤ්ඤා, විපුලපඤ්ඤතාය සංවත්තන්තීති අයං විපුලපඤ්ඤා.

**ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තීති**: කතමා ගම්භීරපඤ්ඤා: ගම්භීරෙසු ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු ධාතූසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ආයතනෙසු ඤාණං පවත්තතීති ගරම්භීපඤ්ඤා, ගම්භීරෙසු පටිච්චසමුප්පාදෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සුඤ්ඤතමනුපලබ්භෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අත්ථෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ධම්මෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු නිරුත්තීසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු පටිභානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සීලක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සමාධික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු පඤ්ඤාක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු විමුත්තික්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු විමුත්තිඤාණදස්සනක්ඛන්ධෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඨානාඨානෙසු[2] ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු විහාරසමාපත්තීසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අරියසච්චෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සතිපට්ඨානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සම්මප්පධානෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඉද්ධිපාදෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු ඉන්ද්‍රියෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු බලෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු බොජ්ඣඞ්ගෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු අරියමග්ගෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙසු සාමඤ්ඤඵලෙසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරාසු අභිඤ්ඤාසු ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරෙ පරමත්ථෙ නිබ්බානෙ ඤාණං පවත්තතීති ගම්භීරපඤ්ඤා, ගම්භීරපඤ්ඤතාය සංවත්තන්තීති අයං ගම්භීරපඤ්ඤා.

---

1 ඨානට්ඨානානි - මජසං, සයා, PTS

2 ඨානට්ඨානෙසු - මජසං, සයා, PTS

**විපුලපඤ්ඤතාය සංවත්තන්ති** යනු: විපුලප්‍රඥා කවර යත්: විපුල වූ අර්ථයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ධර්මයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ නිරුක්තීන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුල ප්‍රඥා යැ විපුල වූ ප්‍රතිභානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ශීලස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ සමාධිස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ප්‍රඥාස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ විමුක්තිස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුල ප්‍රඥා යැ විපුල වූ විමුක්තිඥානදර්ශනස්කන්ධයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුල ප්‍රඥා යැ විපුල වූ ස්ථානාස්ථානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ විහාරසමාපත්තීන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ආර්යසත්‍යයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ සතිපට්ඨානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ සම්‍යක් ප්‍රධානයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ඍද්ධිපාදයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ඉන්ද්‍රියයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ බලයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ බොධ්‍යඞ්ගයන් ප්‍රති-වේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ආර්යමාර්ගයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල වූ ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුල ප්‍රඥා යැ විපුල වූ අභිඥාවන් ප්‍රතිවේධ කෙරේ නු'යි විපුලප්‍රඥා යැ විපුල පරමාර්ථ වූ නිර්වාණය ප්‍රතිවේධ කෙරේ නු,යි විපුලප්‍රඥා යැ 'විපුලපඤ්ඤතාය සං-වත්තන්ති'යි මෙසේ විපුලප්‍රඥා නමු.

**ගම්භීරපඤ්ඤතාය සංවත්තන්ති** යනු: ගම්භීරප්‍රඥා නම් කවර යත්: ගැඹුරු වූ ස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ ගැඹුරු වූ ධාතූන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආයතනයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රතීත්‍යසමුත්පාදයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ශූන්‍යතානුපලබ්ධීන්හි ඥානය පවතී නු'යි ගම්භීර-ප්‍රඥා යැ, ගැඹුරු වූ අර්ථයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ධර්මයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ නිරුක්තීන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රතිභානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ශීලස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සමාධිස්කන්ධයන්හි ඥානය පවතී නු යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ප්‍රඥාස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විමුක්ති-ස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විමුක්තිඥානදර්ශන ස්කන්ධයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ස්ථානාස්ථාන-යන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ විහාරසමාපත්තීන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආර්යසත්‍යයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සතිපට්ඨානයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ සම්‍යක්ප්‍රධානයන්හි ඥානය පවතී නු'යි ගම්භීර-ප්‍රඥා යැ, ගැඹුරු වූ ඍද්ධිපාදයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ඉන්ද්‍රියයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ බලයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ බොධ්‍යඞ්ගයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ ආර්යමාර්ගයන්හි ඥානය පවතී නු'යි ගම්භීර-ප්‍රඥා යැ, ගැඹුරු වූ ශ්‍රාමණ්‍යඵලයන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ අභිඤ්ඤාවන්හි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යැ, ගැඹුරු වූ පරමාර්ථනිර්වාණයෙහි ඥානය පවතී නු'යි ගම්භීරප්‍රඥා යි. 'ගම්භීරපඤ්ඤතාය සංවත්තන්ති'යි මෙසේ ගම්භීරප්‍රඥා නමු.

අසාමන්තපඤ්ඤතාය[1] සංවත්තන්තීති: කතමා අසාමන්තපඤ්ඤා: යස්ස පුග්ගලස්ස අත්ථවවත්ථානතො අත්ථපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, ධම්මවවත්ථානතො ධම්මපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, නිරුත්තිවවත්ථානතො නිරුත්තිපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, පටිභානවවත්ථානතො පටිභානපටිසම්භිදා අධිගතා හොති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤාය, තස්ස අත්ථෙ ච ධම්මෙ ච නිරුත්තියා ච පටිභානෙ ච න අඤ්ඤො කොචි සක්කොති අභිසම්භවිතු, අනභිසම්භවනීයො ච සො අඤ්ඤෙහීති අසාමන්තපඤ්ඤො.

පුථුජ්ජනකල්‍යාණකස්ස පඤ්ඤා අට්ඨමකස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ න සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, පුථුජ්ජනකල්‍යාණකං උපාදාය අට්ඨමකො අසාමන්තපඤ්ඤො. අට්ඨමකස්ස පඤ්ඤා සොතාපන්නස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අට්ඨමකං උපාදාය සොතාපන්නො අසාමන්තපඤ්ඤො. සොතාපන්නස්ස පඤ්ඤා සකදාගාමිස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, සොතාපන්නං උපාදාය සකදාගාමී අසාමන්තපඤ්ඤො. සකදාගාමිස්ස පඤ්ඤා අනාගාමිස්ස පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, සකදාගාමිං උපාදාය අනාගාමී අසාමන්තපඤ්ඤො. අනාගාමිස්ස පඤ්ඤා අරහතො පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අනාගාමිං උපාදාය අරහා අසාමන්තපඤ්ඤො. අරහතො පඤ්ඤා පච්චෙකබුද්ධස්ස[2] පඤ්ඤාය දූරෙ විදූරෙ සුවිදූරෙ න සන්තිකෙ න සාමන්තා, අරහන්තං උපාදාය පච්චෙකබුද්ධො[3] අසාමන්තපඤ්ඤො. පච්චෙකබුද්ධං ච සදෙවකං ච ලොකං උපාදාය තථාගතො අරහං සම්මාසම්බුද්ධො අග්ගො අසාමන්තපඤ්ඤො. පඤ්ඤාපභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො[4] චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪො මහද්ධනො[5] ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා නිජ්ඣාපෙතා පෙක්ඛතා පසාදෙතා.

සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා[6] අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදො මග්ගානුගා[7] ච පනස්ස එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා.

---

3 අසාමන්තපඤ්ඤතාය - සයා, PTS

1 'න' ඉති මජසං පොත්ථකෙ නත්ථි    2 පච්චෙකසම්බුද්ධස්ස - මජසං

3 පච්චෙකබුද්ධො - මජසං, සයා, PTS    4 අධිගතප්පටිසම්භිදො - මජසං

5 මහද්ධනො - පු    6 සඤ්ජානෙතා - සයා    7 මග්ගානුගාමී - මජසං, PTS, ස

**අසාමන්තපඤ්ඤතාය සංවත්තන්ති** යනු අසාමන්තප්‍රඥ කවරැ යත්: යම් පුද්ගලයක්හු විසින් අර්ථනිශ්චය කිරීම් වශයෙන් අර්ථප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ඥානයෙන් පහස්නාලද වේ ද, ධර්මනිශ්චය කිරීම් වශයෙන් ධර්මප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වේ ද, නිරුක්ති නිශ්චය කිරීම් වශයෙන් නිරුක්ති ප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වූ ද, ප්‍රතිභානනිශ්චය කිරීම් වශයෙන් ප්‍රතිභාන ප්‍රතිසංවිද්ඥානය අධිගම කරනලද ප්‍රත්‍යක්ෂ කරනලද ප්‍රඥයෙන් පහස්නාලද වේ ද, ඔහුගේ අර්ථයෙහි ද ධර්මයෙහි ද නිරුක්තියෙහි ද ප්‍රතිභානයෙහි ද අන් කිසිවෙක් (ඥානගතියෙන්) පැමිණෙන්නට නො හැකි වෙයි. හෙතෙම අන්‍යයන් විසින් නො පැමිණිය හැක්කේ ද වේ නු' යි 'අසාමන්තප්‍රාඥ' නම් වේ.

පෘථග්ජනකල්‍යාණකයාගේ ප්‍රඥාව අෂ්ටමකයා (ශ්‍රොතාපත්තිමාර්ගස්ථයා)ගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. පෘථග්ජනකල්‍යාණකයා පිණිස අෂ්ටමක තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. අෂ්ටමකයාගේ ප්‍රඥාව ශ්‍රොතාපන්නයාගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. අෂ්ටමකයා පිණිස ශ්‍රෝතාපන්න තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. ශ්‍රෝතාපන්නයාගේ ප්‍රඥාව සකෘදාගාමීහුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. ශ්‍රොතාපන්නයා පිණිස සකෘදාගාමී තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. සකෘදාගාමීහුගේ ප්‍රඥාව අනාගාමීහුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි. සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි සකෘදාගාමීහු පිණිස අනාගාමී තෙම අසාමන්තප්‍රාඥ නම් වෙයි. අනාගාමීහුගේ ප්‍රඥාව රහත්හුගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි. සමීපයෙහි නො වෙයි. සමීපභාගයෙහි නො වෙයි. අනාගාමීහු පිණිස රහත්හු අසාමන්තප්‍රාඥ නම් වෙති. රහතුන්ගේ ප්‍රඥාව පසේබුදුන්ගේ ප්‍රඥාව කෙරෙන් දූරයෙහි විදූරයෙහි සුවිදූරයෙහි වෙයි, සමීපයෙහි නො වෙයි, සමීපභාගයෙහි නො වෙයි. රහතුන් පිණිස පසේබුදුහු අසාමන්තප්‍රාඥ නම් වෙති. පසේබුදුන් ද සදෙවකලෝකයා ද පිණිස තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයෝ අග්‍ර වූ අසාමන්තප්‍රාඥයහ ප්‍රඥාප්‍රභේදයෙහි ඡේකයහ ප්‍රභේදප්‍රාප්තඥාන ඇතියහ ලබනලද ප්‍රතිසංවිද්ඥාන ඇතියහ චතුර්වෛශාරද්‍යප්‍රාප්තයහ දශබලධාරීහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ පුරුෂාජානීයහ පුරුෂධෞරෙයහ අනන්තඥාන ඇතියහ අනන්තතේජස් ඇතියහ අනන්තයශස් ඇතියහ ආඪ්‍යයහ මහද්ධන ඇතියහ ධනවත්හ නෙතෘහ විනෙතෘහ අනුනෙතෘහ පනවනුවහ නිශ්චය කරවනුවහ (පිළිවෙත්) දක්වනුවහ පහදවනුවහ.

තවද ඒ බුදුහු නූපන් මාර්ගය (ස්වසන්තානයෙහි) උපදවනුවහ, අසඤ්ජාත-මාර්ගය (වෛනෙයසන්තානයෙහි) දනවනුවහ, ප්‍රකාශ නො කළ මාර්ගය ප්‍රකාශ කරනුවහ, (ප්‍රත්‍යවේක්ෂාවශයෙන්) මාර්ගය දතුවහ, (වෛනෙය සන්තානයෙහි දැනැවියයුතු) මාර්ගය දන්නාසුල්ලහ, මාර්ගයෙහි විචක්ෂණයහ ඒ බුදුන් විසින් හෙළි කළ මාර්ගය හෙතු කොට මෙකල්හි මාර්ගය අනුව යන ශ්‍රාවකයෝ (ශීලාදිගුණයෙන්) පසුපස යෙමින් වෙසෙත්.

සො හි භගවා ජානං ජානාති, පස්සං පස්සති, චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො, වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතො. නත්ථි තස්ස භගවතො අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය. අතීතං අනාගතං පච්චුප්පන්නං[1] උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති. යං කිඤ්චි ඤෙය්‍යං[2] නාම අත්ථි ධම්මං[3] ජානිතබ්බං, අත්තත්ථො වා පරත්ථො වා උභයත්ථො වා දිට්ඨධම්මිකො වා අත්ථො සම්පරායිකො වා අත්ථො උත්තානො වා අත්ථො ගම්භීරො වා අත්ථො ගූළ්හො වා අත්ථො පටිච්ඡන්නො වා අත්ථො නෙය්‍යො වා අත්ථො නීතො වා අත්ථො අනවජ්ජො වා අත්ථො නික්කිලෙසො වා අත්ථො වොදානො වා අත්ථො පරමත්ථො වා අත්ථො, සබ්බං තං අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති, සබ්බං වචීකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති, සබ්බං මනොකම්මං බුද්ධස්ස භගවතො ඤාණානුපරිවත්ති

අතීතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, අනාගතෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං, යාවතක ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණ නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො[4] නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵුසිතානං[5] හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමං නාතිවත්තති, උපරිමං සමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො. එවමෙව බුද්ධස්ස භගවතො ඤෙය්‍යං ච ඤාණං ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො, යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං, යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං, ඤෙය්‍යපරියන්තිකං ඤාණං, ඤාණපරියන්තිකං ඤෙය්‍යං, ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති, ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි, අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා. සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති.

සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛනපටිබද්ධා[6] මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා, සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති. සබ්බෙසං[7] සත්තානං බුද්ධො ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං[8] ජානාති, අධිමුත්තිං ජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති. සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො තිමිතිමිඞ්ගලං උපාදාය අන්තොමහාසමුද්දෙ පරිවත්තන්ති එවමෙව සදෙවකො ලොකො සමාරකො සබ්‍රහ්මකො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙවමනුස්සා අන්තොබුද්ධඤාණෙ පරිවත්තති. යථා යෙ කෙචි පක්ඛී[9] අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති, එවමෙව යෙපි තෙ සාරිපුත්තසමා පඤ්ඤාය,[10] තෙපි බුද්ධඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති. බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං ඵරිත්වා අතිඝංසිත්වා තිට්ඨති. යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ[11] චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගූළ්හානි ච පටිච්ඡන්නානි ච, කථිතා විස්සජ්ජිතාව[12] තෙ පඤ්හා භගවතා

---

1 අතීතානාගතපච්චුප්පන්නං - ස්‍යා  2 නෙය්‍යං - මජ්සං, ස්‍යා, PTS
3 තං සබ්බං - මජ්සං, සී 1, අභිධම්මං - ස්‍යා, PTS  4 නෙය්‍යපථො - මජ්සං, ස්‍යා, PTS
5 ඵුසිතානං - ස්‍යා  6 ආකඞ්ඛපටිබද්ධා - මජ්සං  7 සබ්බසං - මජ්සං
8 චරියං - ස්‍යා  9 පක්ඛිනො - මජ්සං  10 සාරිපුත්තසමා පඤ්ඤවන්තා - ස්‍යා, PTS
11 තෙ භින්දන්තා පඤ්ඤෙ - PTS, පඤ්ඤා - ස්‍යා  12 විසජ්ජිතා ච - මජ්සං

තවද ඒ බුදුහු දතයුතු (ඥෙයධර්මය) දනිති, දක්ක යුත්ත (නුවණැසින්) දකිති, ඇසක් මෙන් වූවහ, ඥානමය වූවහ, ධර්මය වූවහ, ශ්‍රෙෂ්ඨ වූවහ, වක්තෘහ, ප්‍රවක්තෘහ, අර්ථය එළවා දක්වනුවහ, අමෘතය දෙනුවහ, ධර්මස්වාමීහ, තථාගතයහ, ඒ බුදුන් විසින් (මහනුවණින්) නො දන්නාලද්දෙක් (සචිතේ දත් නැණින්) නො දක්නාලද්දෙක් අවිදිත වූයෙක් ප්‍රත්‍යක්ෂ නො කරනලද්දෙක් ප්‍රඥයෙන් නො පහස්නාලද්දෙක් නැති. ඥෙය නම් වූ දතයුතු යම් කිසි ධර්මයෙක් වේ ද, අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්නය ඇතුළු කොට සියලු ධර්මයෝ සර්වාකාරයෙන් භාග්‍යවත් බුදුන්ගේ ඥානමුඛයෙහි ආපාථයට පැමිණෙති. ආත්මාර්ථය ද පරාර්ථය ද උභයාර්ථය ද දෘෂ්ටධාර්මිකාර්ථය ද, සාම්පරායිකාර්ථය ද උත්තානාර්ථය ද ගම්භීරාර්ථය ද ගූඪාර්ථය ද ප්‍රතිච්ඡන්නාර්ථය ද නෙය්‍යාර්ථය ද නීතාර්ථය ද අනවද්‍යාර්ථය ද නිෂ්ක්ලේශාර්ථය ද පරිශුද්ධාර්ථය ද පරමාර්ථය (නිර්වාණාර්ථය) ද යන ඒ සියල්ල බුද්ධඥානය තුළ පවතී. භාග්‍යවත් බුදුන්ගේ සියලු කායකර්මය ඥානය අනුව පවතී සියලු වාක්කර්මය ඥානය අනුව පවතී සියලු මනඃකර්මය ඥානය අනුව පවතී.

අතීතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත (නිරාවරණ) යැ, අනාගතයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත යැ, ප්‍රත්‍යුත්පන්නයෙහි භාග්‍යවත් බුදුන්ගේ ඥානය අප්‍රතිහත යැ, දතයුත්ත යම් පමණ ද ඥානය එපමණ යැ, ඥානය යම් පමණ ද ඥෙයය එපමණ යැ, ඥානය ඥෙය පර්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍යන්තික යැ, ඥෙයය ඉක්මැ ඥානය නො පවතී. ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ ධර්මයෝ අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි පවත්නා සුල්ලහ, යම්සේ මනාකොට පැහැසු සුමුගුපටල දෙකෙකින් යට සුමුගුපටල උපරිමය නො ඉක්මවා ද, උඩ සුමුගුපටල හෙට්ඨිමය නො ඉක්මැ සිටී ද, ඔහු ඔවුනොවුන්ගේ කෙළවර සිටුනාසුලු වෙත් ද, එසෙයින් මැ භාග්‍යවත් බුදුන්ගේ ඥෙයයත් ඥානයත් අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි පවත්නාසුල්ලහ. යම්තාක් ඥෙයය ද ඒ තාක් ඥානය යැ, යම්තාක් ඥානය ද ඒ තාක් ඥෙය යැ, ඥානය ඥෙයපර්‍යන්තික යැ, ඥෙයය ඥානපර්‍යන්තික යැ, ඥෙය ඉක්මැ ඥානය නො පවතී, ඥානය ඉක්මැ ඥෙයපථයෙක් නැති. ඒ දහම්හු අන්‍යෝන්‍යපර්‍යන්තයෙහි සිටුනා සුල්ලහ. හැම දහම්හි භාග්‍යවත් බුදුන්ගේ ඥානය පවතී.

හැම දහම්හු භාග්‍යවත් බුදුන්ගේ මනොද්වාරාවර්ජනයට අයත්හු වෙති, රුචිප්‍රතිබද්ධයහ, මනසිකාරප්‍රතිබද්ධයහ, චිත්තොත්පාදප්‍රතිබද්ධයහ, හැම සතුන් පිෂයෙහි භාග්‍යවත් බුදුන් ගේ ඥානය පවතී, බුදුහු හැම සතුන්ගේ ආශය දනිති, අනුශය දනිති, චරිතය දනිති, අධිමුක්තිය දනිති, අල්ප වූ කෙලෙස්රජස් ඇති මහත් වූ කෙලෙස්රජස් ඇති තියුණු වූ (ශ්‍රද්ධාදි) ඉඳුරන් ඇති මෘදු වූ ඉඳුරන් ඇති සුන්දර ආකාර ඇති ගර්හිත ආකාර ඇති සුවසේ හැඟැවිය හැකි දුකසේ හැඟැවිය හැකි භව්‍යාභව්‍යසත්ත්වයන් දනිති, මරුන් බඹුන් සහිත වූ දෙවියන් සහිත වූ ලෝවැසි තෙම මහණබමුණන් සහිත වූ දෙව්මිනිසුන් සහිත වූ ප්‍රජාව බුද්ධඥානය තුළ පවතී, යම්සේ තිමි තිමිඞගල පටන් කොට යම් මස්කැසුබු කෙනෙක් වෙත් නම් ඔහු මහමුහුද තුළ පවතිත් ද එසෙයින් මරුන් බඹුන් සහිත වූ සදෙවක ලොක තෙමේ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිත සදෙවමනුෂ්‍යප්‍රජාව බුද්ධඥානය තුළ පවතී. යම්සේ විනතාපුත්‍ර ගුරුළුරජ්හු පටන් කොට යම් කිසි පක්ෂි කෙනෙක් වෙත් නම් ඔහු අහසැ පෙදෙසෙක හැසිරෙත් ද, එසෙයින් මැ යම් කෙනෙක් නැණින් සැරියුත් තෙරුන් සම වූවාහු නම් ඔහු ද බුද්ධඥානයා ගේ පෙදෙසෙක පවත්නාහු යැ, බුද්ධඥානය දෙව්මිනිසුන් ගේ ප්‍රඥාව පැතිරැ මැඩගෙන සිටී මැ යැ. නිපුණ වූ කළ පරවාද ඇති වල්විදිනා දුනුවායන් සෙයින් ප්‍රසිද්ධ වූ යම් ක්ෂත්‍රිය ... බ්‍රාහ්මණ ... ගෘහපති ... ශ්‍රමණපණ්ඩිත කෙනෙක් ප්‍රඥායෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද ප්‍රතිච්ඡන්න වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොටගෙන බුදුන් කරා පැමිණ

හොන්ති නිද්දිට්ඨකාරණා, උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා[1] තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති අග්ගො අසාමන්තපඤ්ඤො අසාමන්තපඤ්ඤතාය සංවත්තන්තීති අයං අසාමන්තපඤ්ඤා.

**භූරිපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා භූරිපඤ්ඤා: රාගං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, දොසං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, මොහං අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා, කොධං -පෙ- උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ පෙ- සබ්බෙ භවගාමිකම්මෙ අභිභුය්‍යතීති භූරිපඤ්ඤා, අභිභවිතාති භූරිපඤ්ඤා.

රාගො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති[2] භූරිපඤ්ඤා, දොසො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, මොහො අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, කොධො -පෙ- උපනාහො -පෙ- මක්ඛො -පෙ- පළාසො -පෙ- ඉස්සා -පෙ- මච්ඡරියං -පෙ- මායා -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භො -පෙ- සාරම්භො -පෙ- මානො -පෙ- අතිමානො -පෙ- මදො -පෙ- පමාදො -පෙ- සබ්බෙ කිලෙසා -පෙ- සබ්බෙ දුච්චරිතා -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරා -පෙ- සබ්බෙ භවගාමිකම්මා අරි, තං අරිං මද්දනී පඤ්ඤාති භූරිපඤ්ඤා, භූරි වුච්චති පථවී,[3] තාය පථවීසමාය විත්ථතාය විපුලාය පඤ්ඤාය සමන්නාගතොති භූරිපඤ්ඤා, අපි ච පඤ්ඤාය මෙතං අධිවචනං: භූරි මෙධා පරිනායිකාති භූරිපඤ්ඤා, භූරිපඤ්ඤතාය සංවත්තන්තීති අයං භූරිපඤ්ඤා.

**පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්තීති** කතමං පඤ්ඤාබාහුල්ලං ඉධෙකච්චො පඤ්ඤාගරුකො හොති, පඤ්ඤාචරිතො පඤ්ඤාසයො පඤ්ඤාධිමුත්තො පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො, විචයබහුලො පවිචයබහුලො ඔක්ඛායනබහුලො සමොක්ඛායනබහුලො[4] සම්පෙක්ඛායනධම්මො විභූතවිහාරී තච්චරිතො තග්ගරුකො තබ්බහුලො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො[5] තදධිමුත්තො තදධිපතෙය්‍යො, යථා ගණගරුකො වුච්චති ගණබාහුලිකො'ති චීවරගරුකො වුච්චති චීවරබාහුලිකො'ති පත්තගරුකො වුච්චති පත්තබාහුලිකො'ති. සෙනාසනගරුකො වුච්චති සෙනාසනබාහුලිකො'ති, එවමෙව ඉධෙකච්චො පඤ්ඤාගරුකො හොති පඤ්ඤාචරිතො පඤ්ඤාසයො පඤ්ඤාවිමුත්තො පඤ්ඤාධජො පඤ්ඤාකෙතු පඤ්ඤාධිපතෙය්‍යො විචයබහුලො පවිචයබහුලො ඔක්ඛායනබහුලො සමොක්ඛායනබහුලො සම්පෙක්ඛායනබහුලො විභූතවිහාරී තච්චරිතො තග්ගරුකො තබ්බහුලො තන්නින්නො තප්පොණො තප්පබ්භාරො තදධිමුත්තො තදධිපතෙය්‍යො. පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්තීති ඉදං පඤ්ඤාබාහුල්ලං,

---

1 භගවා ච - PTS
2. මද්දනීපඤ්ඤාති - මජ්ඣං,
3. පථවී - මජ්ඣං,
4 සමොක්ඛායනබහුලො-සයා,
5. තංපොණො තංපබ්භාරො - සයා, PTS

විචාරති. ඒ ප්‍රශ්නයෝ බුදුන් විසින් සකාරණ වැ කියන ලද්දාහු විසඳන ලද්දාහු ද වෙති. තවද ඔහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යළි බුදුහු එහි ප්‍රඥායෙන් අතිශයින් බබලත්. මේ කරුණින් අග්‍ර අසාමන්‍ය-ප්‍රාඥ නම් වෙත්. ‘අසාමන්තපඤ්ඤතාය සංවත්තන්ති’ යි. මේ අසාමන්‍ය ප්‍රඥා නමි.

**භූරිපඤ්ඤතාය සංවත්තන්ති** යනු: භූරිප්‍රඥා නම් කවර යත්: රාගය අභිභවනය කෙරේ නු’ යි ‘භූරිපඤ්ඤා නමි, අභිභවනය කළා නු’ යි භූරිපඤ්ඤා නමි, ද්වේෂය අභිභවනය කෙරේ නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි, අභිභවනය කළා නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි, මෝහය අභිභවනය කෙරේ නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි, අභිභවනය කළා නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි, ක්‍රෝධය ... උපනාහය ... මක්ඛය ... පළාසය ... ඊර්ෂ්‍යාව .. මාත්සර්‍ය්‍යය ... මායාව ... සාඨෙය්‍යය ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... සියලු ක්ලේශයන් ... සියලු දුශ්චරිතයන් ... සියලු අභිසංස්කාර-යන් ... සියලු භවගාමිකර්මයන් අභිභවනය කෙරේ නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි. අභිභවනය කළා නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි.

රාගය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි ද්වේෂය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි මෝහය සතුරු යැ ඒ සතුරා මඩනා ප්‍රඥාව නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි ක්‍රෝධය ... උපනාහය ... මක්ඛය ... පළාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්‍ය්‍යය ... මායාව ... සඨ බව ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... සියලු ක්ලේශයෝ ... සියලු දුශ්චරිතයෝ ... සියලු අභිසංස්කාරයෝ ... සියලු භවගාමිකර්මයෝ සතුරු යැ. ඒ සතුරා මඩනා ප්‍රඥාව නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි. පෘථිවිය ‘භූරි’ යි කියනු ලැබේ. ඒ පෘථිවිය සම වූ විස්තෘත වූ විපුල වූ ප්‍රඥායෙන් යුක්ත වූයේ නු’ යි ‘භූරිපඤ්ඤා’ නමි තවද ප්‍රඥාවට තෙල නාමෙකි: ‘භූරි මෙධා පරිණායිකා’ යි ‘භූරිපඤ්ඤා’ නමි. ‘භූරිපඤ්ඤතාය සංවත්තන්ති’ යි මේ ‘භූරිපඤ්ඤා’ නමි.

**පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති** යනු: ප්‍රඥාබාහුල්‍ය නම් කවර යත්: මේ ශාසනයෙහි කිසිවෙක් ප්‍රඥාගරුක වූයේ ප්‍රඥාචරිත ඇත්තේ ප්‍රඥාශය වූයේ ප්‍රඥාධිමුක්ත වූයේ ප්‍රඥාව ධ්වජ කොට ඇත්තේ ප්‍රඥාව කෙතු කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ දහම් විමසීම බහුල කොට ඇත්තේ නානාප්‍රකාරයෙන් දහම් විමසීම බහුල කොට ඇත්තේ ප්‍රඥායෙන් බැසගෙන දහම් ප්‍රකට කිරීම බහුල කොට ඇත්තේ මොනොවට ප්‍රකට කිරීම බහුල කොට ඇත්තේ ධර්මයන් මනාකොට දක්නා සවභාව ඇත්තේ විභූතවිහරණ ඇත්තේ ඒ ප්‍රඥාචරිත ඇත්තේ ඒ ප්‍රඥාව ගුරු කොට ඇත්තේ ඒ ප්‍රඥාව බහුල කොට ඇත්තේ ඒ ප්‍රඥාවට නිම්නප්‍රවණ-ප්‍රාග්භාර වූයේ ඒ ප්‍රඥායෙහි අධිමුක්ත වූයේ ඒ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ වෙයි. යම්සේ ගණගරුක වූයේ ‘ගණබාහුලික’ යි කියනු ලැබේ ද, චීවරගරුක වූයේ ‘චීවරබාහුලික, යි කියනු ලැබේ ද, පාත්‍රගරුක වූයේ ‘පාත්‍රබාහුලික’ යි කියනු ලැබේ ද, සෙනාසනගරුක වූයේ ‘සෙනාසනබාහුලික’ යි කියනු ලැබේ ද එපරිද්දෙන්මැ මේ ශාසනයෙහි කිසිවෙක් ප්‍රඥාගරුක ප්‍රඥාචරිත ප්‍රඥාශය වූයේ ප්‍රඥා විමුක්ත වූයේ ප්‍රඥාව ධ්වජ කොට ඇත්තේ ප්‍රඥාව කෙතු කොට ඇත්තේ ප්‍රඥාව අධිපති කොට ඇත්තේ දහම් විමසීම් බහුල කොට ඇත්තේ නානාප්‍රකාරයෙන් දහම් විමසීම් බහුල කොට ඇත්තේ ඔක්ඛායන බහුල කොට ඇත්තේ සමොක්ඛායන බහුල කොට ඇත්තේ සමෙපක්ඛායන බහුල කොට ඇත්තේ විභූතවිහරණ ඇත්තේ තච්චරිත ... තද්ගරුක ... තද්බහුල ... තන්නින්න ... තත්ප්‍රවණ ... තත්ප්‍රාග්භාර ... තදධිමුක්ත වූයේ තදධිපති වූයේ වෙයි. ‘පඤ්ඤාබාහුල්ලාය සංවත්තන්ති’ යි මේ ප්‍රඥාබාහුල්‍ය නමි.

සීඝපඤ්ඤතාය සංවත්තන්තීති කතමා සීඝපඤ්ඤා, සීඝං සීඝං සීලානි පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ජාගරියානුයොගං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝසීඝං සීලක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සමාධික්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං පඤ්ඤාක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං විමුත්තික්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝසීඝං විහාරසමාපත්තියො පරිපූරෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අරියසච්චානි පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සතිපට්ඨානෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සම්මප්පධානෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඉද්ධිපාදෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං ඉන්ද්‍රියානි භාවෙතීති සීඝපඤ්ඤා, සීඝ සීඝං බලානි භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං බොජ්ඣඞ්ගෙ භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අරියමග්ගං භාවෙතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං අභිඤ්ඤායො පටිවිජ්ඣතීති සීඝපඤ්ඤා, සීඝං සීඝං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති සීඝපඤ්ඤා, සීඝපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං සීඝපඤ්ඤා.

ලහුපඤ්ඤතාය සංවත්තන්තීති කතමා ලහුපඤ්ඤා: ලහුං ලහුං සීලානි පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ජාගරියානුයොගං පරිපූරෙතීති ලහුපඤ්ඤා ලහුං ලහු සීලක්ඛන්ධං -පෙ- සමාධික්ඛන්ධං -පෙ- පඤ්ඤාක්ඛන්ධං -පෙ-විමුත්තික්ඛන්ධං-පෙ- විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං විහාරසමාපත්තියො පරිපූරෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අරියසච්චානි පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං සතිපට්ඨානෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුංලහුං සම්මප්පධානෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉද්ධිපාදෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං ඉන්ද්‍රියානි භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං බලානි භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං බොජ්ඣඞ්ගෙ භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අරියමග්ගං භාවෙතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං අභිඤ්ඤායො පටිවිජ්ඣතීති ලහුපඤ්ඤා, ලහුං ලහුං පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති ලහුපඤ්ඤා, ලහුපඤ්ඤතාය සංවත්තන්තීති අයං ලහුපඤ්ඤා.

**සීඝපඤ්ඤතාය සංවත්තන්තී** යනු: ශීඝ්‍රප්‍රඥා නම් කවර යත්: ශීඝ්‍ර ශීඝ්‍ර වැ ශීලයන් පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ කෙරේ නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ භොජනයෙහි මාත්‍රඥතාව පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ශීලස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ සමාධිස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ප්‍රඥාස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ විමුක්තිස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ විමුක්ති-ඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ සතිපට්ඨාන-යන් වඩා නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ සම්‍යක්ප්‍රධානයන් වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ඍද්ධිපාදයන් වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ඉන්ද්‍රියයන් වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ බලයන් වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ බොධ්‍යඞ්ගයන් වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ආර්‍ය්‍යමාර්ගය වඩා නු’ යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ ශ්‍රාමණ්‍යඵල-යන් සාක්ෂාත් කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යැ, ශීඝ්‍රශීඝ්‍ර වැ පරමාර්ථ වූ නිර්වාණය සාක්ෂාත් කෙරේ නු’යි ශීඝ්‍රප්‍රඥා යි. ‘සීඝපඤ්ඤතාය සංවත්තන්තී’ යි මේ ශීඝ්‍රප්‍රඥා නමි.

**ලහුපඤ්ඤතාය සංවත්තන්තී** යනු: ලහුප්‍රඥා නම් කවර යත්: පුහුපුහු වැ ශීලයන් පරිපූර්ණ කෙරේ නු’යි ‘ලහුපඤ්ඤා’ නමි. පුහුපුහු වැ ඉන්ද්‍රිය සංවරය පරිපූර්ණ කෙරේ නු’යි ‘ලහුපඤ්ඤා’ නමි. පුහුපුහු වැ බොජුන්හි පමණ දන්නා බව පරිපූර්ණ කෙරේ නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ශීලස්කන්ධය ... සමාධිස්කන්ධය ... ප්‍රඥාස්කන්ධය ... විමුක්තිස්කන්ධය ... විමුක්තිඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු’ යි ලහුපඤ්ඤා නමි පුහුපුහු වැ විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ සති-පට්ඨානයන් වඩා නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ සම්‍යක්ප්‍රධානයන් වඩා නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ඍද්ධිපාදයන් වඩා නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ඉන්ද්‍රියයන් වඩා නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ බලයන් වඩා නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ බොධ්‍යඞ්ගයන් වඩා නු’යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ආර්‍ය්‍යමාර්ගය වඩා නු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කෙරේනු’ යි ලහුපඤ්ඤා නමි. පුහුපුහු වැ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ලහුපඤ්ඤා නමි: පුහුපුහු වැ පරමාර්ථ වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේ නු’යි ලහුපඤ්ඤා නමි. ‘ලහුපඤ්ඤතාය සං-වත්තන්තී’ යි මේ ලහුපඤ්ඤා නමි.

**හාසපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා හාසපඤ්ඤා: ඉධෙකච්චො හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො සීලානි පරිපූරෙති හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො ඉන්ද්‍රියසංවරං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො භොජනෙ මත්තඤ්ඤුතං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො ජාගරියානුයොගං පරිපූරෙතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො සීලක්ඛන්ධං -ප- සමාධික්ඛන්ධං -පෙ- පඤ්ඤාක්ඛන්ධං -පෙ- විමුත්තික්ඛන්ධං -පෙ- විමුත්තිඤාණදස්සනක්ඛන්ධං පරිපූරෙතීති -පෙ- ඨානාට්ඨානානි පටිවිජ්ඣතීති -පෙ- විහාරසමාපත්තියො පරිපූරෙතීති -පෙ- අරියසච්චානි පටිවිජ්ඣතීති -පෙ- සතිපට්ඨානෙ භාවෙතීති -පෙ- සම්මප්පධානෙ භාවෙතීති -පෙ- ඉද්ධිපාදෙ භාවෙතීති -පෙ- ඉන්ද්‍රියානි භාවෙතීති -පෙ- බොජ්ඣඞ්ගෙ භාවෙතීති -පෙ- අරියමග්ගං භාවෙතීති -පෙ- සාමඤ්ඤඵලානි සච්ඡිකරොතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො අභිඤ්ඤායො පටිවිජ්ඣතීති හාසපඤ්ඤා, හාසබහුලො වෙදබහුලො තුට්ඨිබහුලො පාමොජ්ජබහුලො පරමත්ථං නිබ්බානං සච්ඡිකරොතීති හාසපඤ්ඤා, හාසපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං හාසපඤ්ඤා.

**ජවනපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා ජවනපඤ්ඤා· යං කිඤ්චි රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං රූපං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, අනත්තතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, යා කාචි වෙදනා -පෙ- යා කාචි සඤ්ඤා -පෙ- යෙ කෙචි සඞ්ඛාරා -පෙ- යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා සබ්බං විඤ්ඤාණං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, දුක්ඛතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, අනත්තතො ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තා අසාරකට්ඨෙනාති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා රූපනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං ඛයට්ඨෙන දුක්ඛං භයට්ඨෙන අනත්තා අසාරකට්ඨෙනාති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ජරාමරණනිරොධෙ[1] නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා.

---

1 ජරාමරණං රූපනිරොධෙ - සං

**හාසපඤ්ඤතාය සංවත්තන්ති** යනු: හාසප්‍රඥා නම් කවර යත්: මෙ සසුන්හි කිසිවෙක් ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ශීලයන් පරිපූර්ණ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ඉන්ද්‍රියසංවරය පරිපූර්ණ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ භොජනයෙහි මාත්‍රඥතාව පරිපූර්ණ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ජාගර්‍ය්‍යානුයොගය පරිපූර්ණ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ ශීලස්කන්ධය ... සමාධිස්කන්ධය ... ප්‍රඥාස්කන්ධය ... විමුක්තිස්කන්ධය .. විමුක්තිඥානදර්ශනස්කන්ධය පරිපූර්ණ කෙරේ නු’යි ... ස්ථානාස්ථානයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ... විහාරසමාපත්තීන් පරිපූර්ණ කෙරේ නු’යි ... ආර්‍ය්‍යසත්‍යයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ... සතිපට්ඨානයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ... සම්‍යක්ප්‍රධානයන් ප්‍රතිවෙධ කෙරේ නු’යි ඍද්ධිපාදයන් වඩා නු’යි ... ඉන්ද්‍රියයන් වඩා නු’යි ... බලයන් වඩා නු’යි ... බොධ්‍යඞ්ගයන් වඩා නු’යි ... ආර්‍ය්‍යමාර්ගය වඩා නු’යි ... ශ්‍රාමණ්‍යඵලයන් ප්‍රත්‍යක්ෂ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ අභිඥාවන් ප්‍රතිවෙධ කෙරේ නු’යි හාසප්‍රඥා යෑ, ප්‍රීතිබහුල වූයේ ඥානබහුල වූයේ තුෂ්ටිබහුල වූයේ ප්‍රාමොද්‍යබහුල වූයේ පරමාර්ථ වූ නිර්වාණය ප්‍රත්‍යක්ෂ කෙරේ නු’යි හාසප්‍රඥා යි. ‘හාසපඤ්ඤතාය සංවත්තන්ති’යි මේ හාසප්‍රඥා නමි.

**ජවනපඤ්ඤතාය සංවත්තන්ති** යනු: ජවනප්‍රඥා කවර යත්: අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි ඖදාරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීත-අනාගත-ප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි රූපයෙක් වේ ද දුරු වූ හෝ ළඟ වූ හෝ යම් කිසි රූපයෙක් වේ ද ඒ සියලු රූපය අනිත්‍ය හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ, දුඃඛ හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ, අනාත්ම හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යි. යම් කිසි වෙදනාවක් .. යම් කිසි සංඥාවක් ... යම් කිසි සංස්කාර කෙනෙක් ... අධ්‍යාත්ම වේවයි බාහ්‍ය වේවයි ඖදාරික වේවයි සූක්ෂ්ම වේවයි හීන වේවයි ප්‍රණීත වේවයි අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ යම් කිසි විඥානයෙක් දුරු වූ හෝ ළඟ වූ හෝ යම් කිසි විඥානයෙක් වේ ද, එ හැම විඥානය අනිත්‍ය හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ දුඃඛ හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ අනාත්ම හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යි. චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ දුඃඛ හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ අනාත්ම හෙයින් වහා දිවේ නු’යි ජවනප්‍රඥා යි.

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය ක්ෂයාර්ථයෙන් අනිත්‍ය යෑ භයාර්ථයෙන් දුඃඛ යෑ අසාරකාර්ථයෙන් අනාත්ම යෑ යි තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට රූපනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු’යි ජවනප්‍රඥා යෑ, වෙදනාව ... සංඥාව ... සංස්කාරයෝ විඥානය ... චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය ක්ෂයාර්ථයෙන් අනිත්‍ය යෑ, භයාර්ථයෙන් දුඃඛ යෑ අසාරකාර්ථයෙන් අනාත්ම යෑ’යි තුලනය කොට තීරණය කොට විභාවනය කොට විභූත කොට ජරාමරණනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු’යි ජවනප්‍රඥා යි.

රූපං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා රූපනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, වෙදනා -පෙ- සඤ්ඤා -පෙ- සඞ්ඛාරා -පෙ- විඤ්ඤාණං -පෙ- චක්ඛුං -පෙ- ජරාමරණං අතීතානාගතපච්චුප්පන්නං අනිච්චං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වයධම්මං විරාගධම්මං නිරොධධම්මන්ති තුලයිත්වා තීරයිත්වා විභාවයිත්වා විභූතං කත්වා ජරාමරණනිරොධෙ නිබ්බානෙ ඛිප්පං ජවතීති ජවනපඤ්ඤා, ජවනපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං ජවනපඤ්ඤා.

**තික්ඛපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා තික්ඛපඤ්ඤා: ඛිප්පං කිලෙසෙ ඡින්දතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා උප්පන්නං බ්‍යාපාදවිතක්කං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං විහිංසාවිතක්කං නාධිවාසෙති -පෙ- උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං රාගං නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, උප්පන්නං දොසං -පෙ- උප්පන්නං මොහං -පෙ- උප්පන්නං කොධං -පෙ- උප්පන්නං උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ -පෙ- සබ්බෙ භවගාමිකම්මෙ නාධිවාසෙති පජහති විනොදෙති බ්‍යන්තීකරොති අනභාවං ගමෙතීති තික්ඛපඤ්ඤා, එකස්මිං ආසනෙ චත්තාරො ච අරියමග්ගා චත්තාරි ච සාමඤ්ඤඵලානි චතස්සො පටිසම්භිදායො ඡ අභිඤ්ඤායො අධිගතා හොන්ති සච්ඡිකතා ඵස්සිතා පඤ්ඤායාති තික්ඛපඤ්ඤා, තික්ඛපඤ්ඤතාය සංවත්තන්තී'ති අයං තික්ඛපඤ්ඤා.

**නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තීති** කතමා නිබ්බෙධිකපඤ්ඤා: ඉධෙකච්චො සබ්බසඞ්ඛාරෙසු උබ්බෙගබහුලො[1] හොති උත්තාසබහුලො උක්කණ්ඨනබහුලො[2] හොති. අරතිබහුලො අනභිරතිබහුලො, බහිමුඛො න රමති සබ්බසඞ්ඛාරෙසු, අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං ලොභක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං දොසක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං මොහක්ඛන්ධං නිබ්බිජ්ඣති පදලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, අනිබ්බිද්ධපුබ්බං අප්පදලිතපුබ්බං කොධං -පෙ- උපනාහං -පෙ- මක්ඛං -පෙ- පළාසං -පෙ- ඉස්සං -පෙ- මච්ඡරියං -පෙ- මායං -පෙ- සාඨෙය්‍යං -පෙ- ථම්භං -පෙ- සාරම්භං -පෙ- මානං -පෙ- අතිමානං -පෙ- මදං -පෙ- පමාදං -පෙ- සබ්බෙ කිලෙසෙ -පෙ- සබ්බෙ දුච්චරිතෙ -පෙ- සබ්බෙ අභිසඞ්ඛාරෙ -පෙ- සබ්බෙ භවගාමිකම්මෙ නිබ්බිජ්ඣති පදලෙතීති නිබ්බෙධිකපඤ්ඤා, නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තීති අයං නිබ්බෙධිකපඤ්ඤා ඉමා සොළස පඤ්ඤායො, ඉමාහි සොළසහි පඤ්ඤාහි සමන්නාගතො පුග්ගලො පටිසම්භිදප්පත්තො.

---

1 උබ්බෙගබහුලො - සී

2 උක්කණ්ඨනබහුලො - සී, හොතී'ති මජ්ඣං පොත්ථකෙ නත්ථි

අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ රූපය අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍ය-සමුත්පන්න යැ ක්‍ෂයධර්ම යැ ව්‍යයධර්ම යැ විරාගධර්ම යැ නිරොධධර්ම යැ'යි තුලනය කොට තීරණය කොට ප්‍රකට කොට ස්ඵුට කොට රූපනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යැ. වෙදනාව ... සංඥාව ... සංස්කාරයෝ ... විඥානය ... චක්ෂුස ... අතීතානාගතප්‍රත්‍යුත්පන්න වූ ජරාමරණය අනිත්‍ය යැ සඞ්ඛත යැ ප්‍රතීත්‍යසමුත්පන්න යැ ක්‍ෂයධර්ම යැ ව්‍යයධර්ම යැ විරාගධර්ම යැ නිරොධධර්ම යැ'යි තුලනය කොට තීරණය කොට ප්‍රකට කොට ස්ඵුට කොට ජරාමරණනිරොධය වූ නිර්වාණයෙහි වහා දිවේ නු'යි ජවනප්‍රඥා යි. 'ජවනපඤ්ඤතාය සංවත්තන්තී'යි මේ ජවනප්‍රඥා නම් වේ.

**තික්ඛපඤ්ඤතාය සංවත්තන්තී** යනු: තීක්‍ෂණප්‍රඥා නම් කවර යත්: වහා කෙලෙසුන් සිඳී නු'යි තීක්‍ෂණ ප්‍රඥා යැ, උපන් කාමවිතර්කය සන්තානයට නභා වාසය නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්‍ෂණප්‍රඥා යැ, උපන් ව්‍යාපාදවිතර්කය අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්‍ෂණප්‍රඥා යැ, උපන් විහිංසා විතර්කය අධිවාස නො කරවයි ... උපනුපන් ලාමක අකුශල ධර්මයන් අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්‍ෂණ-ප්‍රඥා යැ, උපන් රාගය අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්‍ෂණ ප්‍රඥා යැ. උපන් ද්වෙෂය ... උපන් මොහය ... උපන් ක්‍රොධය ... උපන් උපනාහය ... මක්‍ෂය ... පලාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්ය්‍යය ... මායාව ... සාඨෙය්‍යය ... ස්තම්භය ... සාරම්භය .. මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... හැම කෙලෙසුන් ... හැම දුශ්චරිතයන් ... හැම අභිසංස්කාරයන් ... හැම භවගාමී කර්මයන් අධිවාස නො කරවයි දුරු කෙරෙයි බැහැර කෙරෙයි විගතාන්ත කෙරෙයි අනභාවයට පමුණුවා නු'යි තීක්‍ෂණප්‍රඥා යැ, එක් අසුන්හි සිද සතර ආර්යමාර්ගයෝ ද සතර ශ්‍රාමණ්‍යඵලයෝ ද සතර ප්‍රතිසංවිද්හු ද ෂඩ්-අභිඥාවෝ ද අධිගම කරනලද ප්‍රත්‍යක්‍ෂ කරනලද ප්‍රඥායෙන් ස්පර්ශ කරන-ලද වෙත් නු'යි තීක්‍ෂණප්‍රඥා යි. 'තික්ඛපඤ්ඤතාය සංවත්තන්තී'යි මේ තීක්‍ෂණප්‍රඥා නමි.

**නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තී** යනු: නිර්වේධිකප්‍රඥා නම් කවර යත්: මෙ සසුන්හි කිසිවෙක් හැම සංස්කාරයන්හි උද්වෙග බහුල වූයේ උත්‍රාසබහුල වූයේ උත්කණ්ඨා බහුල වූයේ අරතිබහුල වූයේ අනභිරතිබහුල වූයේ බහිර්මුඛ වූයේ වෙයි. හැම සංස්කාරයන්හි නො ඇලෙයි. නො විදනා-ලද විරූ ප්‍රදාරණය නො කල විරූ ලොභස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ. නො විදනාලද විරූ නො පලනලද විරූ ද්වෙෂස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ, නො විදනාලද විරූ නො පලනලද විරූ මොහස්කන්ධය බිඳී නු'යි පලා නු'යි නිර්වේධිකප්‍රඥා යැ, නො විදනාලද විරූ නො පලනලද විරූ ක්‍රොධය ... උපනාහය ... මක්‍ෂය ... පලාසය ... ඊර්ෂ්‍යාව ... මාත්සර්ය්‍යය ... මායාව ... සඨ බව ... ස්තම්භය ... සාරම්භය ... මානය ... අතිමානය ... මදය ... ප්‍රමාදය ... හැම කෙලෙසුන් ... හැම දුශ්චරිතයන් ... හැම අභිසංස්කාරයන් ... හැම භවගාමීකර්මයන් බිඳී නු'යි පලා නු'යි නිර්වේ-ධිකප්‍රඥා යි. නිබ්බෙධිකපඤ්ඤතාය සංවත්තන්තී යි මේ නිර්වේධිකප්‍රඥා නමි. මොහු ෂොඩශප්‍රඥා වෙති. මේ සොළොස් ප්‍රඥායෙන් සමන්නාගත වූ පුද්ගල තෙම ප්‍රතිසංවිත් ප්‍රාප්ත වේ.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: එකො පුබ්බයොගසම්පන්නො එකො න පුබ්බයොගසම්පන්නො, යො පුබ්බයොගසම්පන්නො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.[1]

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා. එකො බහුස්සුතො, එකො න බහුස්සුතො. යො බහුස්සුතො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, එකො දෙසනාබහුලො, එකො න දෙසනාබහුලො. යො දෙසනාබහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා. එකො ගරූපනිස්සිතො, එකො න ගරූපනිස්සිතො. යො ගරූපනිස්සිතො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා. එකො විහාරබහුලො, එකො න විහාරබහුලො. යො විහාරබහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, එකො පච්චවෙක්ඛණාබහුලො, එකො න පච්චවෙක්ඛණාබහුලො. යො පච්චවෙක්ඛණාබහුලො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති, තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා. එකො සෙඛපටිසම්භිදප්පත්තො, එකො අසෙඛපටිසම්භිදප්පත්තො. යො අසෙඛපටිසම්භිදප්පත්තො, සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

1 පභිජ්ජිත - PTS

ප්‍රතිසංවිත්ප්‍රාප්ත පුද්ගලයෝ දෙදෙනෙක් වෙති: එක් පුද්ගලයෙක් පූර්ව (පූර්වය) යෝගසම්පන්න වෙයි. එක් පුද්ගලයෙක් පූර්වයෝගසම්පන්න නො වෙයි. යමෙක් පූර්වයොගසම්පන්න වේ ද හෙතෙම එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, එක් පුද්ගලයෙක් බහුශ්‍රැත වෙයි, එක් පුද්ගලයෙක් බහුශ්‍රැත නො වෙයි. යමෙක් බහුශ්‍රැත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, එක් පුද්ගලයෙක් (ධර්ම) දේශනාබහුල වෙයි, එක්පුද්ගලයෙක් දේශනාබහුල නො වෙයි. යමෙක් දේශනාබහුල වේ ද, හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දෙශනාබහුල වෙති, එක් පුග්ලෙක් (නුවණින් වැඩිසිටි) ගුරුන් ඇසුරු කෙළේ වෙයි, එක් පුග්ලෙක් ගුරුන් ඇසුරුකෙළේ නො වෙයි. යමෙක් ගුරුන් ඇසුරු කෙළේ වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥාන ප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරුකළාහු වෙති, එක් පුග්ලෙක් විදර්ශනාවිහාරබහුල වෙයි, එක් පුග්ලෙක් විදර්ශනාවිහාරබහුල නො වෙයි, යමෙක් විදර්ශනාවිහාරබහුල වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති; දෙදෙන මැ දෙශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, එක් පුග්ලෙක් ප්‍රත්‍යවෙක්ෂා බහුල වෙයි. එක් පුග්ලෙක් ප්‍රත්‍යවෙක්ෂාබහුල නො වෙයි, යමෙක් ප්‍රත්‍යවෙක්ෂාබහුල වේ ද හේ එයින් අතිරික්ත වෙයි. අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දෙශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවෙක්ෂාබහුල වෙති, එක් පුග්ලෙක් ශෛක්ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙයි, එක් පුග්ලෙක් අශෛක්ෂප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙයි. යමෙක් අශෛක්ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අධික වෙයි, විශිෂ්ට වෙයි. ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා, ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා, ද්වෙපි අසෙඛපටිසම්භිදප්පත්තා, එකො සාවකපාරමිප්පත්තො, එකො න සාවකපාරමිප්පත්තො. යො සාවකපාරමිප්පත්තො සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

ද්වෙ පුග්ගලා පටිසම්භිදප්පත්තා: ද්වෙපි පුබ්බයොගසම්පන්නා, ද්වෙපි බහුස්සුතා, ද්වෙපි දෙසනාබහුලා, ද්වෙපි ගරූපනිස්සිතා, ද්වෙපි විහාරබහුලා ද්වෙපි පච්චවෙක්ඛණාබහුලා, ද්වෙපි අසෙඛපටිසම්භිදප්පත්තා, එකො සාවකපාරමිප්පත්තො, එකො පච්චෙකසම්බුද්ධො, යො පච්චෙකසම්බුද්ධො, සො තෙන අතිරෙකො හොති, අධිකො හොති, විසෙසො හොති. තස්ස ඤාණං පභිජ්ජති.

පච්චෙකබුද්ධස්ස සදෙවකස්ස ලොකං උපාදය තථාගතො අරහං සම්මාසම්බුද්ධො අග්ගො පටිසම්භිදප්පත්තො පඤ්ඤප්පභෙදකුසලො පභින්නඤාණො අධිගතපටිසම්භිදො චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො -පෙ- යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපතිපණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධිරූපා වොභින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි, තෙ පඤ්හං අභිසඞ්ඛරිත්වා අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්කමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච. කථිතා විස්සජ්ජිතා ච තෙ පඤ්හා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා. උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති. අථ ඛො භගවා තත්ථ අතිරොචති යදිදං පඤ්ඤායාති අග්ගො පටිසම්භිදප්පත්තො'ති.

පඤ්ඤාකථා සමත්තා.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති, දෙදෙන මැ ගුරුන් ඇසුරු කළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවෙක්‍ෂාබහුල වෙති, දෙදෙන ම අශෛක්‍ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වෙයි, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත නො වෙයි. යමෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වේ ද හේ එයින් අතිරික්ත වෙයි, අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි, ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පුද්ගලයෝ දෙදෙනෙක් ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති: දෙදෙන මැ පූර්වයොගසම්පන්න වෙති, දෙදෙන මැ බහුශ්‍රැත වෙති, දෙදෙන මැ දේශනාබහුල වෙති. දෙදෙන මැ ගුරුන් ඇසුරුකළාහු වෙති, දෙදෙන මැ විදර්ශනාවිහාරබහුල වෙති, දෙදෙන මැ ප්‍රත්‍යවෙක්‍ෂාබහුල වෙති, දෙදෙන මැ අශෛක්‍ෂ වැ ප්‍රතිසංවිත්ප්‍රාප්ත වෙති, එක් පුහුලෙක් ශ්‍රාවකපාරමීප්‍රාප්ත වෙයි, එක්පුහුලෙක් ප්‍රත්‍යෙක සම්බුද්ධ වෙයි. යමෙක් ප්‍රත්‍යෙකසම්බුද්ධ වේ ද හේ එයින් අතිරික්ත වෙයි. අග්‍ර වෙයි, විශිෂ්ට වෙයි. ඔහුගේ ඥානය ප්‍රතිසංවිද්ඥානප්‍රභෙදයට පැමිණෙයි.

පසේබුදුන් ද සදේවකලෝකයා ද පිණිස තථාගත අර්හත්සම්‍යක්සම්බුද්ධයෝ අග්‍රයහ ප්‍රතිසංවිත්ප්‍රාප්තයහ ප්‍රඥාප්‍රභෙදයෙහි ඡේකයහ ප්‍රභෙදප්‍රාප්තඥාන ඇතියහ ලබනලද ප්‍රතිසංවිද්ඥාන ඇතියහ චතුර්වෛශාරද්‍යප්‍රාප්තයහ දශබලධාරීහ පුරුෂශ්‍රෙෂ්ඨයහ පුරුෂසිංහයහ ... යම් ඒ ක්‍ෂත්‍රියපණ්ඩිත කෙනෙක් බ්‍රාහ්මණපණ්ඩිත කෙනෙක් ගෘහපතිපණ්ඩිත කෙනෙක් ශ්‍රමණපණ්ඩිත කෙනෙක් නිපුණ වූවාහු කළ පරවාද ඇතියාහු වල්විදුනා දුනුවායන් බඳු වූවාහු ප්‍රඥායෙන් දෘෂ්ටිගතයන් බිඳිමින් මෙන් හැසිරෙත් නම් ඔහු ගූඪ වූ ද බොහෝ ප්‍රශ්න සකස් කොට ගෙන බුදුන් කරා පැමිණ විචාරති. ඒ ප්‍රශ්නයෝ භාග්‍යවතුන් විසින් සකාරණ වැ කියනලද්දාහු විසඳනලද්දාහු ද වෙති. තවද ඔහු භාග්‍යවතුන්ගේ ශ්‍රාවක වූවාහු මැ වෙත්. යළි බුදුහු එහි ප්‍රඥායෙන් අතිශයින් බබලත් නු’යි අග්‍ර වූ ප්‍රතිසංවිත්ප්‍රාප්ත නම් වෙත් යයි.

ප්‍රඥාකථා නිමි.

## 3. 2.

## ඉද්ධිකථා

කා ඉද්ධි, කති ඉද්ධියො, ඉද්ධියා කති භූමියො, කති පාදා, කති පදානි, කති මූලානි:

**කා ඉද්ධී'ති** ඉජ්ඣනට්ඨෙන ඉද්ධි.

**කති ඉද්ධියො'ති** දස ඉද්ධියො.

**ඉද්ධියා කති භූමියො'ති** ඉද්ධියා චතස්සො භූමියො චත්තාරො පාදා අට්ඨ පදානි, සොළස මූලානි.

කතමා දස ඉද්ධියො: අධිට්ඨානා ඉද්ධි, විකුබ්බනා ඉද්ධි, මනොමයා ඉද්ධි, ඤාණවිප්ඵාරා ඉද්ධි, සමාධිවිප්ඵාරා ඉද්ධි, අරියා ඉද්ධි, කම්මවිපාකජා ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධි, විජ්ජාමයා ඉද්ධි තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා[1] ඉජ්ඣනට්ඨෙන ඉද්ධි.

ඉද්ධියා කතමා චතස්සො භූමියො: විවෙකජා භූමි පඨමං ඣානං, පීතිසුඛභූමි දුතියං ඣානං, උපෙක්ඛාසුඛභූමි තතියං ඣානං, අදුක්ඛමසුඛා භූමි චතුත්ථං ඣානං, ඉද්ධියා ඉමා චතස්සො භූමියො ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

ඉද්ධියා කතමෙ[2] චත්තාරො පාදා: ඉධ භික්ඛු ඡන්දසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, චිත්තසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, විරියසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති, වීමංසාසමාධිපධානසඞ්ඛාරසමන්නාගතං ඉද්ධිපාදං භාවෙති. ඉද්ධියා ඉමෙ චත්තාරො පාදා ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

ඉද්ධියා කතමානි අට්ඨ පදානි: ඡන්දං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, ඡන්දො න සමාධි, සමාධි න ඡන්දො. අඤ්ඤො ඡන්දො, අඤ්ඤො සමාධි. විරියං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, විරියං න සමාධි, සමාධි න විරියං. අඤ්ඤං විරියං අඤ්ඤො සමාධි. චිත්තං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං, චිත්තං න සමාධි, සමාධි න චිත්තං. අඤ්ඤං චිත්තං, අඤ්ඤො සමාධි. වීමංසං චෙ භික්ඛු නිස්සාය ලභති සමාධිං, ලභති චිත්තස්ස එකග්ගතං. වීමංසා න සමාධි, සමාධි න වීමංසා. අඤ්ඤා වීමංසා, අඤ්ඤො සමාධි. ඉද්ධියා ඉමානි අට්ඨ පදානි, ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

---

1 සම්මප්පයොගපච්චයා - සයා    2 කතමා - PTS

## 3. 2.

## ඍද්ධි කථා

ඍද්ධි කවර යෑ, ඍද්ධීහු කෙතෙක් ද, ඍද්ධියට භූමීහු කෙතෙක් ද, පාදයෝ කෙතෙක් ද, පදයෝ කෙතෙක් ද, මූලයෝ කෙතෙක් ද යත්:

**කා ඉද්ධි** යනු: සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධි යෑ.

**කති ඉද්ධියො** යනු: ඍද්ධිහු දශ දෙනෙක.

**ඉද්ධියා කති භූමියො** යනු: ඍද්ධියට භූමි සතරෙක. පාද සතරෙක. පද අටෙක මූල සොළොසෙකි.

දශඍද්ධිහු නම් කවරහ යත්: අධිෂ්ඨාන ඍද්ධි යෑ විකුර්වණඍද්ධි යෑ මනොමය ඍද්ධි යෑ ඥානවිස්ඵාර ඍද්ධි යෑ සමාධිවිස්ඵාරඍද්ධි යෑ ආර්‍ය්‍යඍද්ධි යෑ කර්මවිපාකජඍද්ධි යෑ පුණ්‍යවත්හුගේ ඍද්ධි යෑ විද්‍යාමයඍද්ධි යෑ ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයොගප්‍රත්‍යයෙන් සමෘද්ධ වන අර්ථයෙන් ඍද්ධි යි.

ඍද්ධියට සතරභූමිහු කවරහ යත්: ප්‍රථමධ්‍යානය විවෙකජභූමි ය ද්විතීයධ්‍යානය ප්‍රීතිසුඛභූමි යෑ, තෘතීයධ්‍යානය උපෙක්‍ෂාසුඛභූමි යෑ, චතුර්ථධ්‍යානය අදුක්ඛමසුඛභූමි යෑ, මේ සතරභූමිහු ඍද්ධිලාභ පිණිස ඍද්ධිප්‍රතිලාභ පිණිස ඍද්ධිවිකුර්වණතා පිණිස ඍද්ධිවිශෙෂ පවත්වන බවට ඍද්ධිවශීභාවය පිණිස ඍද්ධිවෛශාරද්‍ය පිණිස පවතිත් යයි.

ඍද්ධියට සතර පාදයෝ කවරහ යත්: මෙ සස්නෙහි මහණ තෙම ඡන්දය අධිපති කොට ඇති සමාධියෙන් හා ප්‍රධානසංස්කාරයෙන් (සම්‍යක්ප්‍රධානවීර්‍ය්‍යයෙන්) සමන්‍වාගත වූ ඍද්ධිපාදය වඩයි, චිත්තාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූ ඍද්ධිපාදය වඩයි, වීර්‍ය්‍යාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූ ඍද්ධිපාදය වඩයි, වීමංසාධිපතිසමාධියෙන් හා ප්‍රධන්වීර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූ ඍද්ධිපාදය වඩයි. ඍද්ධිය පිළිබඳ මේ සතර පාදයෝ ඍද්ධිලාභ පිණිස ඍද්ධිප්‍රතිලාභ පිණිස ඍද්ධිවිකුර්වණතා පිණිස ඍද්ධිවිශෙෂ පවත්වන පිණිස ඍද්ධිවශීභාව පිණිස ඍද්ධිවිශාරද බව පිණිස පවතිත් යයි.

ඍද්ධියට අටපද කවරහ යත්: ඉදින් මහණ තෙම ඡන්දය නිසා සමාධිය ලබා නම් චිත්තෙකාග්‍රතාව ලබා නම් ඒ ඡන්දය සමාධි නො වෙයි, සමාධිය ඡන්ද නො වෙයි. ඡන්දය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම චිත්තය නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතාව ලබා නම්, ඒ චිත්තය සමාධි නො වෙයි, සමාධිය චිත්ත නො වෙයි, චිත්තය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම වීර්‍ය්‍යය නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතා ලබා නම් ඒ වීර්‍ය්‍යය සමාධි නො වෙයි, සමාධිය වීර්‍ය්‍ය නො වෙයි, වීර්‍ය්‍යය අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඉදින් මහණ තෙම වීමංසාව නිසා සමාධිය ලබා නම්, චිත්තෙකාග්‍රතා ලබා නම්, ඒ වීමංසාව සමාධි නො වෙයි, සමාධිය වීමංසා නො වෙයි, වීමංසාව අනෙකෙක, සමාධිය අනෙකෙකි. ඍද්ධිය පිළිබඳ මේ අටපදයෝ ඍද්ධිලාභ පිණිස ඍද්ධිප්‍රතිලාභ පිණිස ඍද්ධිවිකුර්වණ පිණිස ඍද්ධිවිශෙෂ පවත්වන පිණිස ඍද්ධිවශීභාව පිණිස ඍද්ධිවිශාරද බව පිණිස පවතිත් යයි.

ඉද්ධියා කතමානි සොළස මූලානි: අනොණතං[1] චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති[2] ආනෙඤ්ජං, අනුන්නතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනභිනතං චිත්තං රාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනපනතං චිත්තං බ්‍යාපාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අනිස්සිතං චිත්තං දිට්ඨියා න ඉඤ්ජතීති ආනෙඤ්ජං, අප්පටිබද්ධං චිත්තං ඡන්දරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විප්පමුත්තං චිත්තං කාමරාගෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විසඤ්ඤුත්තං චිත්තං කිලෙසෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විමරියාදීකතං[3] චිත්තං කිලෙසමරියාදෙ[4] න ඉඤ්ජතීති ආනෙඤ්ජං, එකත්තගතං[5] චිත්තං නානත්තකිලෙසෙ[6] න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සද්ධාය පරිග්ගහිතං චිත්තං අස්සද්ධියෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, විරියෙන පරිග්ගහිතං චිත්තං කොසජ්ජෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සතියා පරිග්ගහිතං චිත්තං පමාදෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, සමාධිනා පරිග්ගහිතං චිත්තං උද්ධච්චෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං, පඤ්ඤාය පරිග්ගහිතං චිත්තං අවිජ්ජාය න ඉඤ්ජතීති ආනෙඤ්ජං, ඔභාසගතං චිත්තං අවිජ්ජන්ධකාරෙ න ඉඤ්ජතීති ආනෙඤ්ජං ඉද්ධියා ඉමානි සොළස මූලානි ඉද්ධිලාභාය ඉද්ධිපටිලාභාය ඉද්ධිවිකුබ්බනතාය ඉද්ධිවිසවිතාය ඉද්ධිවසීභාවාය ඉද්ධිවෙසාරජ්ජාය සංවත්තන්තීති.

කතමා අධිට්ඨානා ඉද්ධි: ඉධ භික්ඛු අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති, එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවීභාවං[7] තිරොභාවං තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පථවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පථවියං, ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො, ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති.

**ඉධාති** ඉමිස්සා දිට්ඨියා ඉමිස්සා ඛන්තියා ඉමිස්සා රුචියා ඉමස්මිං ආදායෙ ඉමස්මිං ධම්මෙ ඉමස්මිං විනයෙ ඉමස්මිං ධම්මවිනයෙ ඉමස්මිං පාවචනෙ ඉමස්මිං බ්‍රහ්මචරියෙ ඉමස්මිං සත්ථුසාසනෙ. තෙන වුච්චති 'ඉධා'ති.

**භික්ඛූති** පුථුජ්ජකල්‍යාණකො වා හොති භික්ඛු සෙඛො වා අරහා වා අකුප්පධම්මො.

**අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොතීති** නානප්පකාරං ඉද්ධිවිධං පච්චනුභොති.

**එකොපි හුත්වා බහුධා හොතීති** පකතියා එකො බහුකං[8] ආවජ්ජති, සතං වා සහස්සං වා සතසහස්සං වා ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'බහුකො[9] හොමී'ති බහුකො හොති. යථායස්මා චූළපන්ථකො[10] එකොපි හුත්වා බහුධා හොති, එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො එකොපි හුත්වා බහුධා හොති

1 අනොණතං - PTS, සයා 2 ඉජ්ඣතීති - PTS 3 විපරියාදිකතං - PTS
4 කිලෙසපරියාදෙ - PTS 5 එකග්ගතං - සයා, PTS
6 නානත්තකිලෙසෙහි - මජසං 7 ආවිභාවං - මජසං, සයා, PTS
8 බහුලං - PTS 9 බහුලො - PTS 10 චූළපන්ථකො - PTS

ඍද්ධියට සොළොස් මූලයෝ කවරහ යත්: (කෞසීද්‍ය වශයෙන්) නො නැමුණු සිත කෞසීද්‍ය නිමිතින් නො සැලේ (කම්පා නො වේ) නු'යි ආනෙඤ්ජ නම්. ඖද්ධත්‍යයෙන් නො හුවනලද සිත ඖද්ධත්‍ය නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, රාගවශයෙන් නො නැමුණු (අනභිනත) සිත රාග නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ක්‍රොධවශයෙන් ප්‍රතිමුඛ (අදූෂ්‍ය) වූ සිත ව්‍යාපාද නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, දෘෂ්ටි වශයෙන් අනිඃශ්‍රිත වූ සිත දෘෂ්ටි නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ඡන්දරාගප්‍රතිබද්ධ නො වූ සිත ඡන්දරාග නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, විප්‍රමුක්ත සිත කාමරාග නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, කෙලෙසුන් කෙරෙන් වෙන් වූ සිත කෙලෙස් නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, කෙලෙස්හිම් නො කරනලද සිත කෙලෙස්හිම් නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, එකාග්‍රභාවයට ගිය සිත නානාස්වභාව කෙලෙස් නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ශ්‍රද්ධාපරිගෘහීත සිත අශ්‍රද්ධා නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, වීර්‍ය්‍යයෙන් පරිගෘහීත සිත කෞසීද්‍ය නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ස්මෘතියෙන් පරිගෘහීත සිත ප්‍රසාද නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, සමාධියෙන් පරිගෘහීත සිත ඖද්ධත්‍ය නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, ප්‍රඥායෙන් පරිගෘහීත සිත අවිද්‍යා නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්, අවභාසයට ගිය සිත අවිද්‍යාන්ධකාර නිමිතින් නො සැලේ නු'යි ආනෙඤ්ජ නම්. ඍද්ධිය පිළිබඳ මේ සොළොස් මූලයෝ ඍද්ධිලාභ පිණිස ඍද්ධිප්‍රතිලාභ පිණිස ඍද්ධිවිකුර්වණ පිණිස ඍද්ධිවිශෙෂ පවත්වන පිණිස ඍද්ධිවශීභාව පිණිස ඍද්ධිවිශාරදභාව පිණිස පවතිත් යයි.

අධිෂ්ඨාන ඍද්ධි නම් කවර යත්: මෙසස්නෙහි මහණ තෙම අනෙකප්‍රකාර වූ ඍද්ධිවිධ වළඳ කෙරෙයි. තෙමේ එකලා වැ සිට බහුප්‍රකාර ද වෙයි, බහුප්‍රකාර වැ සිට එකලා ද වෙයි, ආවිර්භාවය කෙරෙයි, තිරෝභාවය කෙරෙයි, අහස්හි සෙයින් බිතින් පිටතට පවුරින් පිටතට පර්වතයෙන් පරභාගයට නො ලැගෙමින් යෙයි. දියෙහි සෙයින් පොළොවෙහිදු නැගීම් ගැලීම් කෙරෙයි, පොළොවෙහි සෙයින් අභිද්‍යමානඋදකයෙහිදු යෙයි, පියා ඇති ලිහිණියකු සෙයින් අහස්හිදු පලගින් යෙයි, මෙබඳු මහත්ඍද්ධි ඇති මෙබඳු මහත් අනුභාව ඇති මේ සඳහිරු දෙදෙන ද අතින් පරාමර්ශනය කෙරෙයි, පරිමර්ජනය කෙරෙයි, බඹලොව හිම් කොට කයින් වශයෙහි පවත්වයි.

**ඉධ** යනු: මේ දෘෂ්ටියෙහි මේ ක්ෂාන්තියෙහි මේ රුචියෙහි මේ ග්‍රහණයෙහි මේ ධර්මයෙහි මේ විනයෙහි මේ ධර්මවිනයෙහි මේ ප්‍රවචනයෙහි මේ බ්‍රහ්මචර්‍ය්‍යයෙහි මේ ශාස්තෘශාසනයෙහි යි. එයින් කියනුලැබෙයි 'ඉධ' යි.

**භික්ඛු** යනු: කල්‍යාණපෘථග්ජන මහණ හෝ වෙයි, ශෛක්ෂ හෝ වෙයි, අකොප්‍යධර්ම ඇති රහත් හෝ වේ.

**අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති** යනු: නානාප්‍රකාර වූ ඍද්ධි කොටස් වළඳ කෙරෙයි.

**එකොපි හුත්වා බහුධා හොති** යනු: පියවින් එකලා වැ බොහෝ කොට ආවර්ජනා කෙරෙයි. සියක් හෝ දහසක් හෝ සුවහසක් හෝ ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'බොහෝ වෙම්' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි. බොහෝ වෙයි, යම්සේ ආයුෂ්මත් චුල්ලපන්ථක පියවින් එකලා වැ බහුප්‍රකාරයෙන් වේ ද එපරිද්දෙන් මැ ඒ චෙතොවශීප්‍රාප්ත වූ ඍද්ධිමත් තෙම පියවින් එකලා වැ බහුප්‍රකාර ද වෙයි.

**බහුධාපි හුත්වා එකො හොතීති** පකතියා බහුකො එකං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'එකො හොමී'ති එකො හොති. යථායස්මා චූළපන්ථකො බහුධාපි හුත්වා එකො හොති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො බහුධාපි හුත්වා එකො හොති.

**ආවිභාවන්ති** කෙනචි අනාවටං හොති අප්පටිච්ඡන්නං විවටං පාකටං.

**තිරොභාවන්ති** කෙනචි ආවටං හොති පටිච්ඡන්නං පිහිතං පටිකුජ්ජිතං.

**තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙති** පකතියා. ආකාසකසිණසමාපත්තියා ලාභී හොති තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'ආකාසො හොතූ'ති ආකාසො හොති. තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො කෙනචි අනාවටෙ අපරික්ඛිත්තෙ අසජ්ජමානා ගච්ඡන්ති එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති, සෙය්‍යථාපි ආකාසෙ.

**පථවියාපි[1] උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙති** පකතියා ආපොකසිණසමාපත්තියා ලාභී හොති, පථවිං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'උදකං හොතූ'ති උදකං හොති. සො පථවියා උම්මුජ්ජනිමුජ්ජං කරොති. යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො උදකෙ උම්මුජ්ජනිමුජ්ජං කරොන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො පථවියා උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ

**උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පථවියන්ති** පකතියා පථවීකසිණසමාපත්තියා ලාභී හොති, උදකං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති 'පථවී හොතූ'ති පථවී හොති. සො අභිජ්ජමානෙ උදකෙ ගච්ඡති යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො අභිජ්ජමානාය පථවියා ගච්ඡන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො අභිජ්ජමානෙ උදකෙ ගච්ඡති සෙය්‍යථාපි පථවියං.

**ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණොති** පකතියා පථවීකසිණසමාපත්තියා ලාභී හොති. ආකාසං ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති: 'පථවී හොතූති පථවී හොති. සො ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති, යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො පථවියා චඞ්කමන්තිපි තිට්ඨන්තිපි නිසීදන්තිපි සෙය්‍යම්පි කප්පෙන්ති, එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති සෙය්‍යථාපි පක්ඛීසකුණො

**ඉමෙ චන්දිමසූරියෙ[2] එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජතීති** ඉධ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසූරියෙ ආවජ්ජති, ආවජ්ජිත්වා ඤාණෙන අධිට්ඨාති: 'හත්ථපාසෙ හොතූ'ති හත්ථපාසෙ හොති, සො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසූරියෙ පාණිනා ආමසති පරාමසති පරිමජ්ජති, යථා මනුස්සා පකතියා අනිද්ධිමන්තො කිඤ්චිදෙව රූපගතං හත්ථපාසෙ ආමසන්ති පරාමසන්ති පරිමජ්ජන්ති. එවමෙව සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො නිසින්නකො වා නිපන්නකො වා චන්දිමසූරියෙ පාණිනා ආමසති පරාමසති පරිමජ්ජති.

1 පථවියාපි - මජ්ඣ. 2 සූරියෙ - මජ්ඣ.

**බහුධාපි හුත්වා එකො හොති** යනු: පියවිත් බොහෝ වැ එක් පුගුලකු ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි. 'එකලා වෙමි' එකලා වෙයි, යම්සේ ආයුෂ්මත් චූල්ලපන්ථක බොහෝ වැ එකලා වේ ද එපරිද්දෙන් මැ ඒ චෙතොවශිප්‍රාප්ත ඍද්ධිමත් තෙමේ බොහෝ වැ එකලා ද වෙයි.

**ආවිභාවං** යනු: කිසිවකින් ආවෘත නො වූයේ ප්‍රතිච්ඡන්න නො වූයේ විවෘත වූයේ ප්‍රකට වූයේ වෙයි.

**තිරොභාවං** යනු: කිසිවකින් ආවෘත වූයේ ප්‍රතිච්ඡන්න වූයේ වසන-ලද්දේ පිහිකුළු වූයේ වෙයි

**තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ** යනු: පියවිත් ආකාසකසිණ සමාපත්තිය ලබනසුලු වෙයි බිත්හි පරභාගය පවුරෙහි පරභාගය පර්වතයෙහි පරභාගය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'ආකාශය වේවයි' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි, හේ ආකාශ වෙයි. බිත්හි පරභාගයට පවුරෙහි පරභාගයට පර්වතයෙහි පරභාගයට නො පැකිල යෙයි යම්සේ මිනිස්සු පියවිත් ඍද්ධිමත් නො වූවාහු කිසිවකින් අනාවෘත අපරික්ෂිප්ත තැනැ නො පැකිල යෙත් ද එපරිද්-දෙන් මැ ඒ චෙතොවශිප්‍රාප්ත ඍද්ධිමත් තෙමේ බිත්හි පරභාගයට පවුරෙහි පරභාගයට පර්වතයෙහි පරභාගයට අහස්හි සෙයින් නො පැකිල යෙයි.

**පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති සෙය්‍යථාපි උදකෙ** යනු: පියවිත් ආපොකසිණසමාපත්තිය ලබනසුලු වෙයි. පෘථිවිය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'දිය වේවයි' ඥානයෙන් අධිෂ්ඨාන කෙරෙයි, හේ දිය වෙයි, හේ පෘථිවියෙහි නැගීම ගැලීම කෙරෙයි යම්සේ මිනිස්සු පියවිත් ඍද්ධි නැති-යාහු දියෙහි නැගීම ගැලීම කෙරෙත් ද එපරිද්දෙන් මැ හේ චෙතොවශි-ප්‍රාප්ත වූ ඍද්ධිමත් තෙමේ පොළොවෙහි දියෙහි සෙයින් නැගීම ගැලීම කෙරෙයි.

**උදකෙපි අභිජ්ජමානෙ ගච්ඡති සෙය්‍යථාපි පඨවියං**: යනු පියවිත් පළවිකිසුණුසමවත් ලබනසුලු වෙයි. දිය ආවර්ජනා කෙරෙයි. ආවර්ජනා කොට 'පොළොව් වේවයි' නුවණින් ඉටයි, හේ පොළොව් වෙයි, හේ නො බිදෙන දියෙහි යෙයි. යම්සේ මිනිස්සු පියවිත් ඍද්ධි නැතියාහු නො බිදෙන පොළොවෙහි යෙත් ද එසෙයින් මැ ඒ චෙතොවශිප්‍රාප්ත වූ ඍද්ධිමත් තෙමේ නො බිදෙන දියෙහි පොළොවෙහි සෙයින් යේ

**ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී සකුණො** යනු: පියවිත් පළවිකිසුණුසමවත් ලබනසුලු වෙයි, ආකාශය ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'පොළොව් වේවයි' නුවණින් ඉටයි. හේ පොළොව් වෙයි. හේ අහස්හි අන්තරීක්ෂයෙහි සක්මන් කෙරෙයි සිටියි හිඳියි හෙව්මුදු කෙරෙයි, යම්සේ මිනිස්සු පියවිත් ඍද්ධි නැතියාහු පොළොවෙහි සක්මන් කෙරෙත් ද සිටිත් ද හිඳිත් ද හෙව්මුදු කෙරෙත් ද එසෙයින් මැ ඒ සිත් විසීබවට පැමිණි ඉදුහ ඇත්තේ පිනා ඇති ලිහිණියකු සෙයින් අහස්හි අන්තරීක්ෂයෙහි සක්මනුදු කෙරෙයි සිටියි හිඳියි හෙව්මුදු කෙරේ.

**ඉමෙපි චන්දිමසූරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරාමසති පරිමජ්ජති** යනු: මෙ සස්නෙහි ඒ සිත්විසීපත් ඉදුහ ඇතියේ හුන්නේ වේවයි හොත්තේ වේවයි සඳහිරු දෙදෙන ආවර්ජනා කෙරෙයි, ආවර්ජනා කොට 'අත්පසැ වේව'යි නුවණින් ඉටයි, අත්පසැ වෙයි. හෙතෙම හුන්නේ වේව'යි හොත්තෝ වේව'යි සඳහිරු දෙදෙන අතින් ආමර්ශ කෙරෙයි පරාමර්ශ කෙරෙයි පරිමාර්ජන කෙරෙයි. යම්සේ මිනිස්සු පියවිත් ඍද්ධි නැතියාහු අත්පසැ කිසි කවර රූපයක් ආමර්ශ පරාමර්ශ පරිමාර්ජන කෙරෙත් ද එසෙයින් මැ ඒ සිත්විසීපත් ඉදුහ ඇත්තෝ හුන්නේ වේවයි හොත්තෝ වේවයි සඳහිරු දෙදෙන අතින් ආමර්ශ පරාමර්ශ පරිමාර්ජන කෙරේ

යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, දූරෙපි සන්තිකෙ අධිට්ඨාති: 'සන්තිකෙ හොතූ'ති, සන්තිකෙ හොති, සන්තිකෙපි දූරෙ අධිට්ඨාති 'දූරෙ හොතූ'ති දූරෙ හොති. බහුකම්පි ථොකං අධිට්ඨාති 'ථොකං හොතූ'ති ථොකං හොති. ථොකම්පි බහුකං අධිට්ඨාති 'බහුකං හොතූ'ති බහුකං හොති. දිබ්බෙන චක්ඛුනා තස්ස බ්‍රහ්මුනො රූපං පස්සති, දිබ්බාය සොතධාතුයා තස්ස බ්‍රහ්මුනො සද්දං සුණාති, චෙතොපරියඤාණෙන තස්ස බ්‍රහ්මුනො චිත්තං පජානාති; සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො දිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, කායවසෙන චිත්තං පරිණාමෙති, කායවසෙන චිත්තං අධිට්ඨාති. කායවසෙන චිත්තං පරිණාමෙත්වා කායවසෙන චිත්තං අධිට්ඨහිත්වා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා දිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගච්ඡති. සචෙ සො ඉද්ධිමා චෙතොවසිප්පත්තො අදිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගන්තුකාමො හොති, චිත්තවසෙන කායං පරිණාමෙති චිත්තවසෙන කායං අධිට්ඨාති. චිත්තවසෙන කායං පරිණාමෙත්වා චිත්තවසෙන කායං අධිට්ඨහිත්වා සුඛසඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච ඔක්කමිත්වා අදිස්සමානෙන කායෙන බ්‍රහ්මලොකං ගච්ඡති. සො තස්ස බ්‍රහ්මුනො පුරතො රූපං[1] අභිනිම්මිනාති මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං[2] අහීනින්ද්‍රියං. සචෙ සො ඉද්ධිමා චඞ්කමති, නිම්මිතොපි තත්ථ චඞ්කමති, සචෙ සො ඉද්ධිමා තිට්ඨති, නිම්මිතොපි තත්ථ තිට්ඨති. සචෙ සො ඉද්ධිමා නිසීදති, නිම්මිතොපි තත්ථ නිසීදති. සචෙ සො ඉද්ධිමා සෙය්‍යං කප්පෙති, නිම්මිතොපි තත්ථ සෙය්‍යං කප්පෙති. සචෙ සො ඉද්ධිමා ධූමායති, නිම්මිතොපි තත්ථ ධූමායති. සචෙ සො ඉද්ධිමා පජ්ජලති, නිම්මිතොපි තත්ථ පජ්ජලති. සචෙ සො ඉද්ධිමා ධම්මං භාසති, නිම්මිතොපි තත්ථ ධම්මං භාසති. සචෙ සො ඉද්ධිමා පඤ්හං පුච්ඡති, නිම්මිතොපි තත්ථ පඤ්හං පුච්ඡති. සචෙ සො ඉද්ධිමා පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති, නිම්මිතොපි තත්ථ පඤ්හං පුට්ඨො විස්සජ්ජෙති සචෙ සො ඉද්ධිමා තෙන බ්‍රහ්මුනා සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති, නිම්මිතොපි තත්ථ තෙන බ්‍රහ්මුනා සද්ධිං සන්තිට්ඨති සල්ලපති සාකච්ඡං සමාපජ්ජති. යඤ්ඤදෙව සො ඉද්ධිමා කරොති, තං තදෙව හි සො නිම්මිතො කරොතීති. අයං අධිට්ඨානා ඉද්ධි.

කතමා විකුබ්බනා ඉද්ධි: සිඛිස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤාපෙසි.[3] සො දිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි,[4] අදිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි, දිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි, දිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඪකායෙන අදිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඪකායෙන ධම්මං දෙසෙසි. සො පකතිවණ්ණං විජහිත්වා කුමාරවණ්ණං වා දස්සෙති, නාගවණ්ණං වා දස්සෙති, සුපණ්ණවණ්ණං වා දස්සෙති, යක්ඛවණ්ණං වා දස්සෙති, අසුරවණ්ණං වා[5] දස්සෙති, ඉන්දවණ්ණං වා දස්සෙති, දෙවවණ්ණං වා දස්සෙති, බ්‍රහ්මවණ්ණං වා දස්සෙති, සමුද්දවණ්ණං දස්සෙති, පබ්බතවණ්ණං වා දස්සෙති, වනවණ්ණං වා දස්සෙති, සීහවණ්ණං වා දස්සෙති, ව්‍යග්ඝවණ්ණං වා දස්සෙති, දීපිවණ්ණං වා දස්සෙති, හත්ථිම්පි දස්සෙති, අස්සම්පි දස්සෙති, රථම්පි දස්සෙති, පත්තිම්පි දස්සෙති, විවිධම්පි සෙනාබ්‍යූහං දස්සෙතීති. අයං විකුබ්බනා ඉද්ධි.

---

1 රූපි. - මජසං. 2 සබ්බඞ්ගපච්චඞ්ගිං - මජසං 3 විඤ්ඤාපෙති - PTS.
දෙසෙති - PTS 5 අසුරවණ්ණං - මජසං පොත්ථකෙ නත්ථි.

**යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති** යනු: ඉදින් ඒ සිත්-විසීපත් ඍද්ධි ඇත්තේ බඹලොවට යනු කැමැති වෙයි, දුරැදු වුව 'වැළැත් වේව'යි ඉටයි, හේ වැළැත් වෙයි, වැළැතුදු වුව 'දුරු වේව'යි ඉටයි, හේ දුරු වෙයි. බොහෝ ද වුව 'මඳ වේව'යි ඉටයි හේ මඳ වෙයි. මඳ ද වුව, බොහෝ වේව'යි ඉටයි හේ බොහෝ වෙයි, දිවඇසින් ඒ බඹහුගේ රූපය බලයි, දිව්සෝවයින් ඒ බඹහුගේ හඬ අසයි. පරසිත්දත්නා නුවණින් ඒ බඹහුගේ සිත දැනගනියි. ඉදින් ඒ සිත්විසීපත් ඉදුහ ඇත්තේ පැනෙන සිරිරින් බඹලෙව් යාව් වේ නම් කාය වශයෙන් සිත පිරිනමයි කාය වශයෙන් සිත ඉටයි. කා විසින් සිත පිරිනමා කා විසින් සිත ඉටා සුඛසංඥාවට ද ලඝුසංඥාවට ද බැසැගෙන පැනෙන සිරිරින් බඹලොවට යෙයි. ඉදින් ඒ සිත් විසීපත් ඍද්ධි ඇත්තේ නො පැනෙන සිරිරින් බඹලොවට යාව් වේ නම් චිත්ත වශයෙන් කය පිරිනමයි, චිත්ත වශයෙන් කය ඉටයි. චිත්ත වශයෙන් කය පිරිනමා චිත්ත වශයෙන් කය ඉටා සුඛසංඥාවට ද ලඝුසංඥාවට ද බැසැගෙන නො පැනෙන සිරිරින් බඹලොවට යෙයි. හේ ඒ බඹහු ඉදිරියෙහි සියලු අඟපසඟ ඇති නො පිරිහුන් ඉඳුරන් ඇති මනොමයරූපයක් නිර්මාණය කෙරෙයි ඉදින් ඒ ඍද්ධි ඇත්තේ සක්මන් කෙරේ නම් නිර්මිත වූයේ ද එහි සක්මන් කෙරෙයි ඉදින් ඒ ඍද්ධි ඇත්තේ සිටී නම් නිර්මිත වූයේ ද එහි සිටී. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ හිඳී නම් නිර්මිත වූයේ ද එහි හිඳී. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ යහන්හි හොවී නම් නිර්මිත වූයේ ද එහි යහන්හි හොවී. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ දුමා නම් නිර්මිත වූයේ ද එහි දුමයි. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ දිලියේ නම් නිර්මිත වූයේ ද එහි දිලියෙයි. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ බෙණේ නම් නිර්මිත වූයේ ද එහි බෙණෙයි ඉදින් ඒ ඍද්ධි ඇත්තේ පැන පුළුවුසි නම් නිර්මිත වූයේ ද එහි පැන පුළුවුස්සි. ඉදින් ඒ ඍද්ධි ඇත්තේ පැන පුළුවුස්නාලද්දේ විසඳා නම් නිර්මිත වූයේ ද එහි පැන පුළුවුස්නාලද්දේ විසඳයි: ඉදින් ඒ ඍද්ධි ඇත්තේ ඒ බඹුන් හා සමග එක් වැ සිටී නම් සංලාප කෙරේ නම් සාකච්ඡාවට පැමිණේ නම් නිර්මිත වූයේ ද එහි ඒ බඹුන් හා සමග එක් වැ සිටී. සංලාප කෙරෙයි. සාකච්ඡාවට පැමි-ණෙයි. ඒ ඍද්ධි ඇත්තේ යමක් යමක් මැ කෙරේ නම් ඒ නිර්මිත වූයේ ඒ ඒ දැය මැ කෙරේ නු'යි මේ අධිෂ්ඨානඍද්ධි නම.

විකුර්වණඍද්ධි නම් කවර යත්: සිඛී නම් වූ භාග්‍යවත් අර්හත් සම්‍යක්-සම්බුද්ධයන්ගේ අභිභූ නම් ශ්‍රාවක තෙම බඹලොව්හි සිටියේ සහස්‍රීලොක-ධාතුව ස්වරයෙන් විඥාපනය කෙළේ යැ හේ පැනෙන සිරුරිනුදු යුතු වැ දහම් දෙසී, නො පැනෙන සිරුරිනුදු යුතු වැ දහම් දෙසී, පැනෙන යටි අඩකයිනුදු නො පැනෙන උඩු අඩකයිනුදු යුතු වැ දහම් දෙසී, පැනෙන උඩු අඩකයිනුදු නො පැනෙන යටි අඩකයිනුදු යුතු වැ දහම් දෙසී. හේ පියවි පැහැසටහන් හැරපියා කුමරසටහන් හෝ දක්වයි, සර්පසටහන් හෝ දක්වයි, ගුරුළුසටහන් හෝ දක්වයි, යක්සටහන් හෝ දක්වයි, අසුර සටහන් හෝ දක්වයි, සක්සටහන් හෝ දක්වයි, දෙව්සටහන් හෝ දක්වයි, බඹසටහන් හෝ දක්වයි, මුහුදුසටහන් හෝ දක්වයි, පවුසටහන් හෝ දක්වයි, අරනසටහන් හෝ දක්වයි, සිංහසටහන් හෝ දක්වයි, ව්‍යාඝ්‍රසටහන් හෝ දක්වයි, දිවිසටහන් හෝ දක්වයි, ඇතකුදු දක්වයි, අසකුදු දක්වයි, රියදු පාබළ දු දක්වයි, නොයෙක් සෙන්මුළුදු දක්වා නු' යි මේ විකුර්වණ ඍද්ධි නම.

කතමා මනොමයා ඉද්ධි: ඉධ භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං[1] අහීනින්ද්‍රියං, සෙය්‍යථාපි පුරිසො මුඤ්ජම්හා ඊසිකං පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං මුඤ්ජො අයං ඊසිකා, අඤ්ඤො මුඤ්ජො අඤ්ඤා ඊසිකා, මුඤ්ජම්හා චෙව ඊසිකා පවාළ්හා'ති. සෙය්‍යථා වා පන[2] පුරිසො අසිං කොසියා පවාහෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අසි, අයං කොසි. අඤ්ඤො අසි, අඤ්ඤා කොසි. කොසියා චෙව අසි පවාළ්හො'ති. සෙය්‍යථා වා පන පුරිසො අහිං කරණ්ඩා උද්ධරෙය්‍ය, තස්ස එවමස්ස: 'අයං අහි, අයං කරණ්ඩො, අඤ්ඤො අහි, අඤ්ඤො කරණ්ඩො. කරණ්ඩා චෙව අහි උබ්භතො'ති. එවමෙව භික්ඛු ඉමම්හා කායා අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බඞ්ගපච්චඞ්ගං අහීනින්ද්‍රියං. අයං මනොමයා ඉද්ධි.

කතමා ඤාණවිප්ඵාරා ඉද්ධි අනිච්චානුපස්සනාය නිච්චසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති ඤාණවිප්ඵාරා ඉද්ධි. දුක්ඛානුපස්සනාය සුඛසඤ්ඤාය -පෙ- අනත්තානුපස්සනාය අත්තසඤ්ඤාය -පෙ- නිබ්බිදානුපස්සනාය නන්දියා -පෙ- විරාගානුපස්සනාය රාගස්ස -පෙ- නිරොධානුපස්සනාය සමුදයස්ස -පෙ- පටිනිස්සග්ගානුපස්සනාය ආදීනවස්ස පහානට්ඨො ඉජ්ඣතීති ඤාණ-විප්ඵාරා ඉද්ධි. ආයස්මතො බක්කුලස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සඞ්කිච්චස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො භූතපාලස්ස ඤාණවිප්ඵාරා ඉද්ධි. අයං ඤාණවිප්ඵාරා ඉද්ධි.

කතමා සමාධිවිප්ඵාරා ඉද්ධි: පඨමෙන ඣානෙන නීවරණානං පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. දුතියෙන ඣානෙන විතක්ක-විචාරානං පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. තතියෙන ඣානෙන පීතියා පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- චතුත්ථෙන ඣානෙන සුඛදුක්ඛානං පහානට්ඨො ඉජ්ඣතීති-පෙ-ආකාසානඤ්චායතනසමාපත්තියා රූපසඤ්ඤාය පටිඝසඤ්ඤාය නානත්තසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- විඤ්ඤා-ණඤ්චායතනසමාපත්තියා ආකාසානඤ්චායතනසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- ආකිඤ්චඤ්ඤායතනසමාපත්තියා විඤ්ඤාණඤ්චායතන-සඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති -පෙ- නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමා-පත්තියා ආකිඤ්චඤ්ඤායතනසඤ්ඤාය පහානට්ඨො ඉජ්ඣතීති සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සාරිපුත්තස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො සඤ්ජී-වස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි. ආයස්මතො ඛාණුකොණ්ඩඤ්ඤස්ස සමාධිවිප්ඵාරා ඉද්ධි උත්තරාය උපාසිකාය සමාධිවිප්ඵාරා ඉද්ධි, සාමාවතියා උපාසිකාය සමාධිවිප්ඵාරා ඉද්ධි. අයං සමාධිවිප්ඵාරා ඉද්ධි.

1 සබ්බඞ්ගපච්චඞ්ගිං - මජසං   2 සෙය්‍යථාපි වා පන - PTS

මනොමය සෘද්ධි නම් කවර යත්: මෙ සස්නෙහි මහණ මේ කයින් රූපී වූ මනොමය වූ සියලු අඟපසඟ ඇති නො පිරිහුන් ඉඳුරන් ඇති අනිත් කයක් නිර්මාණය කෙරෙයි, යම්සේ පුරුෂයෙක් මුඤ්ජතෘණයෙන් කඩ (ගොබය) අදනේ නම් ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: ''මේ මුඤ්ජතෘණ යැ මේ කඩ යැ මුඤ්ජතෘණය අනෙකෙක, කඩ අනෙකෙකි. මුඤ්ජතෘණයෙන් මැ කඩ අදනාලද්දැ'යි. තවද යම්සේ හෝ පුරුෂයෙක් කඩුව කොපුවෙන් අදනේ නම් ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: මේ කඩුව ය මේ කොපුව යැ. කඩුව අනෙකෙක, කොපුව අනෙකෙකි. කොපුවෙන් මැ කඩුව අදනාලද්දැ' යි. තවද යම්සේ හෝ පුරුෂයෙක් සර්පයකු නිර්මෝක (සැව) යෙන් නඟන්නේ නම් (සර්පයා තමා මැ සැව නඟනු පුරුෂ තෙම සිතින් ගෙනැ'යි යූ සේ යි) ඔහට මෙබඳු සිතෙක් වන්නේ යැ: 'මේ සර්ප යැ මේ නිර්මෝක යැ සර්පයා අනෙකෙක, නිර්මෝකය අනෙකෙකි. නිර්මෝකයෙන් මැ සර්පයා නඟනලද්දැ' යි. එසෙයින් මැ මහණ තෙම මෙ කයින් රූපී වූ මනොමය වූ සියලු අඟපසඟ ඇති නො පිරිහුන් ඉඳුරන් ඇති අනිත් කයක් නිර්මාණය කෙරෙයි මේ මනොමය සෘද්ධි නම.

ඥානවිෂ්ඵාරසෘද්ධි නම් කවර යත්: අනිත්‍යානුදර්ශනයෙන් නිත්‍ය-සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඥානවිෂ්ඵාර සෘද්ධි යැ. දුඃඛානු-දර්ශනයෙන් සුඛසංඥාවගේ ... අනාත්මානුදර්ශනයෙන් ආත්මසංඥාවගේ ... නිර්වේදානුදර්ශනයෙන් නන්දියගේ .. විරාගානුදර්ශනයෙන් රාගයාගේ ... නිරොධානුදර්ශනයෙන් සමුදයාගේ ... පටිනිස්සග්ගානුපස්සනායෙන් ආදීනව-යාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ඥානවිෂ්ඵාර සෘද්ධි යැ. ආයුෂ්මත් බක්කුලහට ඥානවිෂ්ඵාර සෘද්ධි යැ. ආයුෂ්මත් සඞ්කිච්චහට ඥානවිෂ්ඵාර සෘද්ධි යැ. ආයුෂ්මත් භූතපාලහට ඥානවිෂ්ඵාර සෘද්ධි යැ. මේ ඥානවිෂ්ඵාර-සෘද්ධි නම.

සමාධිවිෂ්ඵාර සෘද්ධි නම් කවර යත්: ප්‍රථමධ්‍යානයෙන් නීවරණ-යන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. ද්විතීය ධ්‍යානයෙන් විතර්කවිචාරයන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. තෘතීයධ්‍යානයෙන් ප්‍රීතියගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... චතුර්ථධ්‍යානයෙන් සුඛදුඃඛයන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... ආකාසා-නඤ්චායතනසමාපත්තියෙන් රූපසංඥාවගේ ප්‍රතිඝසංඥාවගේ නානාත්ව සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි...විඤ්ඤාණඤ්චායතනසමාපත්තියෙන් ආකාසානඤ්චායතනසංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි .. ආකිඤ්චඤ්ඤා-යතනසමාපත්තියෙන් විඥානානන්ත්‍යායතනසංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි ... නෙවසඤ්ඤානාසඤ්ඤායතනසමාපත්තියෙන් ආකිඤ්චඤ්ඤායතන සංඥාවගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු' යි සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. ආයුෂ්මත් ශාරිපුත්‍රයන්ට සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. ආයුෂ්මත් සඤ්ජීවයන්ට සමාධි විෂ්ඵාර සෘද්ධි යැ ආයුෂ්මත් ඛාණුකොණ්ඩඤ්ඤයන්ට සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. උත්තරාඋවැසියට සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. සාමාවතීඋවැසියට සමාධිවිෂ්ඵාර සෘද්ධි යැ. මේ සමාධිවිෂ්ඵාර සෘද්ධි නම.

කතමා අරියා ඉද්ධි: ඉධ භික්ඛු සචෙ ආකඞ්ඛති 'පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති, අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති අප්පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරෙය්‍ය'න්ති පටිකූලසඤ්ඤී තත්ථ විහරති. සචෙ ආකඞ්ඛති 'පටිකූලෙ ච අප්පටිකූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරෙය්‍යං සතො සම්පජානො'ති උපෙක්ඛකො තත්ථ විහරති සතො සම්පජානො.

කථං පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරති: අනිට්ඨස්මිං වත්ථුස්මිං මෙත්තාය වා ඵරති, ධාතුතො වා උපසංහරති, එවං පටිකූලෙ අප්පටිකූලසඤ්ඤී විහරති.

කථං අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරති: ඉට්ඨස්මිං වත්ථුස්මිං අසුභාය වා ඵරති, අනිච්චතො වා උපසංහරති, එවං අප්පටිකූලෙ පටිකූලසඤ්ඤී විහරති.

කථං පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරති: අනිට්ඨස්මිං ච ඉට්ඨස්මිං ච වත්ථුස්මිං මෙත්තාය වා ඵරති, ධාතුතො වා උපසංහරති. එවං පටිකූලෙ ච අප්පටිකූලෙ ච අප්පටිකූලසඤ්ඤී විහරති.

කථං අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරති: ඉට්ඨස්මිං ච අනිට්ඨස්මිං ච වත්ථුස්මිං අසුභාය වා ඵරති, අනිච්චතො වා උපසංහරති. එවං අප්පටිකූලෙ ච පටිකූලෙ ච පටිකූලසඤ්ඤී විහරති

කථං පටිකූලෙ ච අප්පටිකූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො: ඉධ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝානෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය නෙව සුමනො හොති න දුම්මනො, උපෙක්ඛකො විහරති සතො සම්පජානො. එවං පටිකූලෙ ච අප්පටිකූලෙ ච තදුභයං අභිනිවජ්ජෙත්වා උපෙක්ඛකො විහරති සතො සම්පජානො. අයං අරියා ඉද්ධි.

කතමා කම්මවිපාකජා ඉද්ධි: සබ්බෙසං පක්ඛීනං සබ්බෙසං දෙවානං එකච්චානං මනුස්සානං එකච්චානං විනිපාතිකානං. අයං කම්මවිපාකජා ඉද්ධි.

ආර්‍ය්‍යා ඍද්ධි නම් කවර යත්: මේ සස්නෙහි මහණ තෙම ඉදින් ‘ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමි’ කැමැති වී නම් එහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමි’ කැමැති වී නම් එහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමි’ කැමැති වී නම් එහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙමි’ කැමැති වී නම් එහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි. ඉදින් ‘ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරෙමි’ කැමැති වී නම් එහි සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරේ.

කිසෙයින් ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි යත්: අනිෂ්ටවස්තුවිෂයෙහි මෛත්‍රීයෙන් අරමුණු කෙරෙයි. ධාතු හෙයින් හෝ එළවයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: ඉෂ්ටවස්තුවිෂයෙහි අශුභසිතින් හෝ ස්පර්‍ශ කෙරෙයි, අනිත්‍ය හෙයින් හෝ එළවයි, මෙසෙයින් අප්‍රතිකූලයෙහි ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: අනිෂ්ට වූ ද ඉෂ්ට වූ ද වස්තුවිෂයෙහි මෛත්‍රීසිතින් හෝ ස්පර්‍ශ කෙරෙයි, ධාතු හෙයින් හෝ එළවයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරේ ද යත්: ඉෂ්ට වූ ද අනිෂ්ට වූ ද වස්තුවිෂයෙහි අශුභසිතින් හෝ ස්පර්‍ශ කෙරෙයි, අනිත්‍ය හෙයින් හෝ එළවයි. මෙසෙයින් අප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලයෙහි ද ප්‍රතිකූලසංඥා ඇති වැ වාසය කෙරෙයි.

කිසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇති වැ සම්‍ප්‍රජ්ඥාන ඇති වැ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි යත්: මෙසස්නෙහි ක්‍ෂීණාශ්‍රව මහණ ඇසින් රූපය දැක නො මැ සොම්නස් ඇති වෙයි, නො මැ දොම්නස් ඇති වෙයි. සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි. කනින් හඬ අසා ... නැහැයෙන් ගඳ අසා ... දිවින් රස විඳ ... කයින් පැහැසියයුතු පැහැස ... මනසින් දහම් දැන නො මැ සොම්නස් ඇති වෙයි නො මැ දොම්නස් ඇති වෙයි, සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරෙයි. මෙසෙයින් ප්‍රතිකූලයෙහි ද අප්‍රතිකූලයෙහි ද එ දෙක හැරපියා සිහි ඇතියේ සම්‍ප්‍රජ්ඥාන ඇතියේ උපෙක්‍ෂක වැ වාසය කෙරේ. මේ ආර්‍ය්‍යාඍද්ධි නම.

කර්‍මවිපාකජ ඍද්ධි නම් කවර යත්: හැම පක්‍ෂීන්ගේ හැම දෙවියනට ඇතැම් මිනිසුනට ඇතැම් විනිපාතිකයනට, මේ කර්‍මවිපාකජ ඍද්ධි නම.

කතමා පුඤ්ඤවතො ඉද්ධි: රාජා චක්කවත්ති[1] වෙහාසං ගච්ඡති සද්ධිං චතුරඞ්ගිනියා සෙනාය අන්තමසො අස්සබන්ධගොබන්ධපුරිසෙ[2] උපාදාය, ජොතියස්ස[3] ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි' ජටිලස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, මෙණ්ඩකස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, ඝොසිතස්ස ගහපතිස්ස පුඤ්ඤවතො ඉද්ධි, පඤ්චන්නං මහාපුඤ්ඤානං පුඤ්ඤවතො ඉද්ධි. අයං පුඤ්ඤවතො ඉද්ධි.

කතමා විජ්ජාමයා ඉද්ධි: විජ්ජාධරා විජ්ජං පරිජපෙත්වා[4] වෙහාසං ගච්ඡන්ති, ආකාසෙ අන්තලික්ඛෙ හත්ථිම්පි දස්සෙන්ති, අස්සම්පි දස්සෙන්ති, රථම්පි දස්සෙන්ති, පත්තිම්පි දස්සෙන්ති, විවිධම්පි සෙනාබ්‍යූහං දස්සෙන්ති, අයං විජ්ජාමයා ඉද්ධි.

කථං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි: නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. අබ්‍යාපාදෙන බ්‍යාපාදස්ස පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහානට්ඨො ඉජ්ඣතීති තත්ථ තත්ථ සම්මාපයොග පච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි. එවං තත්ථ තත්ථ සම්මා පයොගපච්චයා ඉජ්ඣනට්ඨෙන ඉද්ධි ඉමා දස ඉද්ධියො.

ඉද්ධිකථා සමත්තා.

1. චක්කවත්ති - ස්‍යා, PTS. 2. ගොපුරිසෙ - මජසං, ගොපක පුරිසෙ - PTS.
3. ජොතිකස්ස - මජසං, 4. පරිජපෙත්වා - මජසං.

පින්වත්හුගේ ඍද්ධි නම් කවර යත්, සක්විතිරජ සිවුරඟසෙන් හා සමග යටත්පිරිසෙයින් අස්පලු ගොපලු පුරුෂයන් දක්වා ගෙන අහස්හි යෙයි. ජෝතිය ගැහැවිහට පින්වත්හුගේ ඍද්ධි යැ, ජටිල ගැහැවිහට පින්වත්හුගේ ඍද්ධි යැ, මෙණ්ඩක ගැහැවිහට පින්වත්හුගේ ඍද්ධි යැ, ඝෝෂිත ගැහැවිහට පින්වත්හුගේ ඍද්ධි යැ, මහපිනැති පස්දෙනහට පින්වත්හුගේ සාද්ධි යැ මේ පින්වත්හුගේ ඍද්ධි නම.

විද්‍යාමය ඍද්ධි නම් කවර යත්: විද්‍යාධරයෝ මතුරු දපා අහස්හි යෙති, අහස්හි අන්තරීක්ෂයෙහි ඇතකුදු දක්වති, අසකු දු දක්වති, රිය දු දක්වති, පාබල දු දක්වති, නොයෙක් සෙන්මුළු දු දක්වත් මේ විද්‍යාමය ඍද්ධි නම

කිසෙයින් ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් ඍද්ධි වෙයි යත්: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දයාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු’ යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝගහෙතුයෙන් සිද්ධ වන අර්ථයෙන් ඍද්ධි යැ. අව්‍යාපාදයෙන් ව්‍යාපාදයාගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු’ යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් ඍද්ධි යැ ... රහත් මඟින් හැම කෙලෙසුන්ගේ ප්‍රහාණාර්ථය සිද්ධ වේ නු’ යි ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයෝග හේතුයෙන් සිද්ධ වන අර්ථයෙන් ඍද්ධි යැ. මෙසෙයින් ඒ ඒ ධර්මයෙහි සම්‍යක්ප්‍රයොග හෙතුයෙන් සිද්ධ වන අර්ථයෙන් ඍද්ධි නමි. මොහු දශඍද්ධිහු වෙත්.

ඍද්ධිකථා නිමි.

## 3. 3.

## අභිසමය කථා

**අභිසමයොති** කෙන අභිසමෙති: චිත්තෙන අභිසමෙති. හඤ්චි චිත්තෙන අභිසමෙති. තෙන හි අඤ්ඤාණී අභිසමෙති, න අඤ්ඤාණී අභිසමෙති, ඤාණෙන අභිසමෙති.

හඤ්චි ඤාණෙන අභිසමෙති, තෙන හි අචිත්තකො[1] අභිසමෙති: න අචිත්තකො අභිසමෙති, චිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

හඤ්චි චිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති, තෙන හි කාමාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න කාමාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

තෙන හි රූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න රූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අරූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අරූපාවචරචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි කම්මස්සකතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න කම්මස්සකතචිත්තෙන[2] ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි සච්චානුලොමිකචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න සච්චානුලොමිකචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අතීතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අතීතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. තෙන හි අනාගතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න අනාගතචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති තෙන හි පච්චුප්පන්නලොකියචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: න පච්චුප්පන්නලොකියචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති. ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

කථං ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති: ලොකුත්තරමග්ගක්ඛණෙ උප්පාදාධිපතෙය්‍යං චිත්තං ඤාණස්ස හෙතුපච්චයො ච තංසම්පයුත්තං නිරොධගොචරං දස්සනාධිපතෙය්‍යං ඤාණං චිත්තස්ස හෙතුපච්චයො ච තංසම්පයුත්තං ඤාණං නිරොධගොචරං එවං ලොකුත්තරමග්ගක්ඛණෙ පච්චුප්පන්නචිත්තෙන ච ඤාණෙන ච අභිසමෙති.

කින්නු එත්තකොයෙව අභිසමයොති: න හි ලොකුත්තරමග්ගක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි, අභිනිරොපනාභිසමයො සම්මාසඞ්කප්පො, පරිග්ගහාභිසමයො සම්මාවාචා, සමුට්ඨානාභිසමයො සම්මාකම්මන්තො, වොදානාභිසමයො සම්මාආජීවො, පග්ගහාභිසමයො සම්මාවායාමො, උපට්ඨානාභිසමයො සම්මාසති, අවික්ඛෙපාභිසමයො සම්මාසමාධි.

---

1 අචිත්තෙන ච ඤාණෙන ච අචිත්තකො - මජසං.
කම්මස්සකතාචිත්තෙන - ස්‍යා. ස කම්මස්සකචිත්තෙන - PTS

## 3. 3.

# අභිසමය කථා

**අභිසමයො** යනු: කුමකින් අභිසමය (ප්‍රතිවේධ) කෙරෙයි යත්: සිතින් අභිසමය කෙරෙයි. ඉදින් සිතින් අභිසමය කෙරේ නම් එසේ වී නම් ඥාන නැතියේ අභිසමය කෙරේ ද යත්: ඥාන නැතියේ අභිසමය නො කෙරෙයි, ඥානයෙන් අභිසමය කෙරෙයි.

ඉදින් ඥානයෙන් අභිසමය කෙරේ නම් එසේ වී නම් සිත් නැතියේ අභිසමය කෙරේ ද යත්: සිත් නැතියේ අභිසමය නො කෙරෙයි, සිතින් ද නැණින් ද අභිසමය කෙරෙයි.

ඉදින් සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ නම් එසේ වී නම් කාමාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: කාමාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි.

එසේ වී නම් රූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: රූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අරූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අරූපාවචර සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් කර්මස්වකෘත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: කර්මස්වකෘත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් සත්‍යානුලෝමික සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: සත්‍යානුලෝමික සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අතීත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අතීත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් අනාගත සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: අනාගත සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. එසේ වී නම් ප්‍රත්‍යුත්පන්න ලෞකික සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: ප්‍රත්‍යුත්පන්න ලෞකික සිතිනුදු නැණිනුදු අභිසමය නො කෙරෙයි. ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ.

කිසෙයින් ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ ද යත්: ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි උත්පාදය අධිපති කොට ඇති චිත්තය මාර්ගඥානයට හෙතු (ජනක) ද ප්‍රත්‍යය (උපස්ථම්භක) ද වෙයි. ඒ ඥානය හා සමග සම්ප්‍රයුක්ත වූ නිර්වාණාලම්බන වූ දර්ශනාධිපති වූ ඥානය චිත්තයට හේතු ද ප්‍රත්‍යය ද වෙයි ඒ චිත්තය හා සමග සම්ප්‍රයුක්ත වූ ඥානය නිර්වාණාලම්බන වෙයි. මෙසෙයින් ලෝකෝත්තරමාර්ගක්ෂණයෙහි ප්‍රත්‍යුත්පන්න වූ සිතිනුදු නැණිනුදු අභිසමය කෙරේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැත. ලොකොත්තරමාර්ගක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශන (සඞ්ඛ්‍යාත) අභිසමය වෙයි, සම්‍යක්සඞ්කල්පය අභිනිරොපණාභිසමය වෙයි, සම්‍යග්වචනය පරිග්‍රහාභිසමය වෙයි, සම්‍යක්-කර්මාන්තය සමුට්ඨානාභිසමය වෙයි, සම්‍යගාජීවය ව්‍යවදානාභිසමය වෙයි, සම්‍යග්ව්‍යායාමය ප්‍රග්‍රහාභිසමය වෙයි, සම්‍යක්ස්මෘතිය උපස්ථානාභිසමය වෙයි, සම්‍යක්සමාධිය අවික්ෂෙපාභිසමය වේ.

උපට්ඨානාභිසමයො සතිසම්බොජ්ඣඞ්ගො, පවිචයාභිසමයො ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො, පග්ගහාභිසමයො විරියසම්බොජ්ඣඞ්ගො, ඵරණාභිසමයො පීතිසම්බොජ්ඣඞ්ගො, උපසමාභිසමයො පස්සද්ධිසම්බොජ්ඣඞ්ගො, අවික්ඛෙපාභිසමයො, සමාධිසම්බොජ්ඣඞ්ගො, පටිසඞ්ඛානාභිසමයො උපෙක්ඛාසම්බොජ්ඣඞ්ගො.

අස්සද්ධියෙ අකම්පියාභිසමයො සද්ධාබලං, කොසජ්ජෙ අකම්පියාභිසමයො විරියබලං, පමාදෙ අකම්පියාභිසමයො සතිබලං, උද්ධච්චෙ අකම්පියාභිසමයො සමාධිබලං, අවිජ්ජාය අකම්පියාභිසමයො පඤ්ඤාබලං.

අධිමොක්ඛාභිසමයො සද්ධින්ද්‍රියං, පග්ගහාභිසමයො විරියින්ද්‍රියං, උපට්ඨානාභිසමයො සතින්ද්‍රියං, අවික්ඛෙපාභිසමයො සමාධින්ද්‍රියං, දස්සනාභිසමයො පඤ්ඤින්ද්‍රියං.

ආධිපතෙය්‍යට්ඨෙන ඉන්ද්‍රියාභිසමයො, අකම්පියට්ඨෙන බලාභිසමයො, නිය්‍යානට්ඨෙන බොජ්ඣඞ්ගාභිසමයො, හෙතුට්ඨෙන මග්ගාභිසමයො, උපට්ඨානට්ඨෙන සතිපට්ඨානාභිසමයො, පදහනට්ඨෙන[1] සම්මප්පධානාභිසමයො, ඉජ්ඣනට්ඨෙන ඉද්ධිපාදාභිසමයො, තථට්ඨෙන සච්චාභිසමයො, අවික්ඛෙපට්ඨෙන සමථාභිසමයො, අනුපස්සනට්ඨෙන විපස්සනාභිසමයො, එකරසට්ඨෙන සමථවිපස්සනාභිසමයො, අනතිවත්තනට්ඨෙන යුගනද්ධාභිසමයො[2] සංවරට්ඨෙන සීලවිසුද්ධිඅභිසමයො, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධිඅභිසමයො, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධිඅභිසමයො, මුත්තට්ඨෙන අධිමොක්ඛාභිසමයො, පටිවෙධට්ඨෙන විජ්ජාභිසමයො පරිච්චාගට්ඨෙන විමුත්තිඅභිසමයො, සමුච්ඡෙදට්ඨෙන ඛයෙඤාණං අභිසමයො.

ඡන්දො මූලට්ඨෙන අභිසමයො, මනසිකාරො සමුට්ඨානට්ඨෙන අභිසමයො, ඵස්සො සමොධානට්ඨෙන අභිසමයො, වෙදනා සමොසරණට්ඨෙන අභිසමයො, සමාධි පමුඛට්ඨෙන අභිසමයො, සති ආධිපතෙය්‍යට්ඨෙන අභිසමයො, පඤ්ඤා තතුත්තරට්ඨෙන අභිසමයො, විමුත්ති සාරට්ඨෙන අභිසමයො, අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කිත්තු එත්තකොයෙව අභිසමයොති: න හි, සොතාපත්තිමග්ගක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කිත්තු එත්තකොයෙව අභිසමයොති: න හි, සොතාපත්තිඵලක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිසමයො, ඡන්දො මූලට්ඨෙන අභිසමයො, -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

කිත්තු එත්තකොයෙව අභිසමයොති: න හි, සකදාගාමිමග්ගක්ඛණෙ -පෙ- සකදාගාමිඵලක්ඛණෙ -පෙ- අනාගාමිමග්ගක්ඛණෙ -පෙ- අනාගාමිඵලක්ඛණෙ -පෙ- අරහත්තමග්ගක්ඛණෙ -පෙ- අරහත්තඵලක්ඛණෙ දස්සනාභිසමයො සම්මාදිට්ඨි, අභිනිරොපනාභිසමයො සම්මාසඞ්කප්පො -පෙ- පටිප්පස්සද්ධට්ඨෙන අනුප්පාදෙ ඤාණං අභිසමයො. ඡන්දො මූලට්ඨෙන අභිසමයො -පෙ- අමතොගධං නිබ්බානං පරියොසානට්ඨෙන අභිසමයො.

---

1 පදහනට්ඨෙන - මජසං. 2. යුගනන්ධාභිසමයො - සං.

ස්මෘතිසම්බොධ්‍යඞ්ගය උපස්ථානාභිසමය වෙයි, ධර්මවිචයසම්බොධ්‍යඞ්ගය ප්‍රවිචය සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය ප්‍රග්‍රහාභිසමය වෙයි, ප්‍රීතිසම්බොධ්‍යඞ්ගය ඵරණ (ආලම්බනස්පර්ශ) සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රශ්‍රබ්ධිසම්බොධ්‍යඞ්ගය ව්‍යුපශම සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධිසම්බොධ්‍යඞ්ගය අවික්ෂෙපාභිසමය වෙයි, උපෙක්ෂාසම්බොධ්‍යඞ්ගය ප්‍රත්‍යවෙක්ෂාභිසමය වේ.

ශ්‍රද්ධාබලය අශ්‍රද්ධායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යබලය කුසීදභාවයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ස්මෘතිබලය ප්‍රමාදයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධිබලය උද්ධතභාවයෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රඥාබලය අවිද්‍යායෙහි නො සැලීම් සඞ්ඛ්‍යාත අභිසමය වේ.

ශ්‍රද්ධෙන්ද්‍රියය අධිමොක්ෂ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, වීර්‍ය්‍යෙන්ද්‍රියය ප්‍රග්‍රහ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ස්මෘතීන්ද්‍රියය උපස්ථාන (අරමුණට එළඹීම) සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, සමාධීන්ද්‍රියය අවික්ෂෙප සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, ප්‍රඥෙන්ද්‍රියය දර්ශන සඞ්ඛ්‍යාත අභිසමය වේ.

අධිපතිභාවාර්ථයෙන් ඉන්ද්‍රියාභිසමය වෙයි, අකම්ප්‍යාර්ථයෙන් බලාභිසමය වෙයි, නිර්‍ය්‍යාණාර්ථයෙන් බොධ්‍යඞ්ගාභිසමය වෙයි, හෙත්වර්ථයෙන් මාර්ගාභිසමය වෙයි, උපස්ථානාර්ථයෙන් සතිපට්ඨානාභිසමය වෙයි, ප්‍රදහනාර්ථයෙන් සම්‍යක්ප්‍රධානාභිසමය වෙයි, සිද්ධ වන අර්ථයෙන් ඍද්ධිපාදාභිසමය වෙයි, යථාස්වභාවාර්ථයෙන් සත්‍යාභිසමය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් ශමථාභිසමය වෙයි, අනුදර්ශනාර්ථයෙන් විදර්ශනාභිසමය වෙයි, ඒකකෘත්‍යාර්ථයෙන් ශමථවිදර්ශනාභිසමය වෙයි, (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් යුගනද්ධාභිසමය වෙයි, සංවරාර්ථයෙන් ශීලවිශුද්ධි සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, අවික්ෂෙපාර්ථයෙන් චිත්තවිශුද්ධි සඞ්ඛ්‍යාත අභිසමය වෙයි, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි සඞ්ඛ්‍යාත අභියමය වෙයි, මුක්ත්‍යර්ථයෙන් අධිමොක්ෂාභිසමය වෙයි, ප්‍රතිවෙධාර්ථයෙන් විද්‍යාභිසමය වෙයි, පරිත්‍යාගාර්ථයෙන් විමුක්ත්‍යභිසමය වෙයි, සමුච්ඡෙදාර්ථයෙන් ක්ෂයඥාන සඞ්ඛ්‍යාත අභිසමය වේ.

ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි, මනසිකාරය සමුට්ඨානාර්ථයෙන් අභිසමය වෙයි, ස්පර්ශය සමවධානාර්ථයෙන් අභිසමය වෙයි, වෙදනාව සමවසරණාර්ථයෙන් අභිසමය වෙයි, සමාධිය ප්‍රමුඛාර්ථයෙන් අභිසමය වෙයි, ස්මෘතිය අධිපතිභාවාර්ථයෙන් අභිසමය වෙයි, ප්‍රඥාව තදුත්තරාර්ථයෙන් අභිසමය වෙයි, විමුක්තිය සාරාර්ථයෙන් අභිසමය වෙයි, අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති ස්‍රොතාපත්තිමාර්ගක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශනාභිසමය වෙයි ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. ස්‍රොතාපත්තිඵලක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශනාභිසමය වෙයි ... ප්‍රතිප්‍රශ්‍රබ්ධිඅර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය අභිසමය වෙයි, ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

කිම මෙතෙක් මැ අභිසමය වෙයි යත්: නැති. සකෘදාගාමිමාර්ගක්ෂණයෙහි ... සකෘදාගාමිඵලක්ෂණයෙහි ... අනාගාමිමාර්ගක්ෂණයෙහි අනාගාමිඵලක්ෂණයෙහි ... අර්හත්මාර්ගක්ෂණයෙහි ... අර්හත්ඵලක්ෂණයෙහි සම්‍යග්දෘෂ්ටිය දර්ශන සඞ්ඛ්‍යාත අභිසමය වෙයි. සම්‍යක්සංකල්පය අභිනිරොපණ සඞ්ඛ්‍යාත අභිසමය වෙයි ... ප්‍රතිප්‍රශ්‍රබ්ධිඅර්ථයෙන් අනුත්පාදයෙහි ඥානය අභිසමය වෙයි, ඡන්දය මූලාර්ථයෙන් අභිසමය වෙයි ... අමතොගධ සඞ්ඛ්‍යාත නිර්වාණය පර්‍ය්‍යවසානාර්ථයෙන් අභිසමය වේ.

ස්වායං කිලෙසෙ පජහති, අතීතෙ කිලෙසෙ පජහති, අනාගතෙ කිලෙසෙ පජහති, පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති? 'අතීතෙ කිලෙසෙ පජහතී'ති හඤ්චි අතීතෙ කිලෙසෙ පජහති? තෙන හි ඛීණං ඛෙපෙති, නිරුද්ධං නිරොධෙති, විගතං විගමෙති, අත්ථඞ්ගතං අත්ථඞ්ගමෙති, අතීතං යං න අත්ථි, තං පජහතීති න අතීතෙ කිලෙසෙ පජහතීති.

**අනාගතෙ කිලෙසෙ පජහතීති** හඤ්චි අනාගතෙ කිලෙසෙ පජහති, තෙන හි අජාතං පජහති, අනිබ්බත්තං පජහති, අනුප්පන්නං පජහති, අපාතුභූතං පජහති, අනාගතං යං න අත්ථි, තං පජහතීති න අනාගතෙ කිලෙසෙ පජහතීති.

**පච්චුප්පන්නෙ කිලෙසෙ පජහතීති** හඤ්චි පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති. තෙන හි රත්තො රාගං පජහති, දුට්ඨො දොසං පජහති, මූළ්හො මොහං පජහති, විනිබද්ධො මානං පජහති, පරාමට්ඨො දිට්ඨිං පජහති, වික්ඛෙපගතො උද්ධච්චං පජහති, අනිට්ඨංගතො විචිකිච්ඡං පජහති, ථාමගතො අනුසයං පජහති, කණ්හාසුක්කධම්මා යුගනද්ධා සමමෙව වත්තන්ති, සඞ්කිලෙසිකා[1] මග්ගභාවනා හොති.

**න හි අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ කිලෙසෙ පජහති, න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහතීති** හඤ්චි න අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ -පෙ- න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති, තෙන හි නත්ථි මග්ගභාවනා, නත්ථි ඵලසච්ඡිකිරියා, නත්ථි කිලෙසප්පහානං, නත්ථි ධම්මාභිසමයොති: අත්ථි මග්ගභාවනා, අත්ථි ඵලසච්ඡිකිරියා, අත්ථි කිලෙසප්පහානං, අත්ථි ධම්මාභිසමයො, යථාකථං විය: සෙය්‍යථාපි තරුණො රුක්ඛො අජාතඵලො, තමෙනං පුරිසො මූලං ඡින්දෙය්‍ය, යෙ තස්ස රුක්ඛස්ස අජාතඵලා තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවමෙවං උප්පාදො හෙතු උප්පාදො පච්චයො කිලෙසානං නිබ්බත්තියාති උප්පාදෙ ආදීනවං දිස්වා අනුප්පාදෙ චිත්තං පක්ඛන්දති, අනුප්පාදෙ චිත්තස්ස පක්ඛන්නත්තා[2] යෙ උප්පාදපච්චයා කිලෙසා නිබ්බත්තෙය්‍යුං, තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවං හෙතුනිරොධා දුක්ඛනිරොධො. පවත්තං හෙතු, නිමිත්තං හෙතු, ආයූහනා[3] හෙතු, ආයූහන පච්චයො කිලෙසානං නිබ්බත්තියාති ආයූහනෙ ආදීනවං දිස්වා අනායූහනෙ චිත්තං පක්ඛන්දති, අනායූහනෙ චිත්තස්ස පක්ඛන්නත්තා යෙ ආයූහනපච්චයා කිලෙසා නිබ්බත්තෙය්‍යුං තෙ අජාතායෙව න ජායන්ති, අනිබ්බත්තායෙව න නිබ්බත්තන්ති, අනුප්පන්නායෙව න උප්පජ්ජන්ති, අපාතුභූතායෙව න පාතුභවන්ති. එවං හෙතුනිරොධා දුක්ඛනිරොධො. එවං අත්ථි මග්ගභාවනා, අත්ථි ඵලසච්ඡිකිරියා, අත්ථි කිලෙසප්පහානං, අත්ථි ධම්මාභිසමයොති.

**අභිසමයකථා සමත්තා.**

---

1 තං සඞ්කිලෙසිකා - සසං  2. පක්ඛන්දතා - මජසං, පක්ඛන්දත්තා - සසං, PTS
3 ආයූහනා - සසං, PTS.

යමෙක් කෙලෙසුන් දුරු කෙරෙයි, අතීත කෙලෙසුන් දුරු කෙරෙයි, අනාගත කෙලෙසුන් දුරු කෙරෙයි. ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් දුරු කෙරේ. **අතීතෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අතීත කෙලෙසුන් දුරු කෙරේ ද: එසේ වී නම් ක්‍ෂය වූවක් මැ ක්‍ෂය කෙරෙයි, නිරුද්ධ වූවක් මැ නිරුද්ධ කෙරෙයි, අපගත වූවක් මැ අපගත කෙරෙයි, අභාවයට ගියක් මැ අභාවයට යවයි, අතීත වූ යමෙක් නැත් ද එය දුරු කෙරේ නු' යි අතීත කෙලෙසුන් දුරු නො කෙරේ යයි.

**අනාගතෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අනාගත කෙලෙසුන් දුරු කෙරේ ද: එසේ වී නම් නූපන් ක්ලේශය දුරු කෙරෙයි, ස්වභාවයට නො පත් ක්ලේශය දුරු කෙරෙයි, අනුත්පන්න ක්ලේශය දුරු කෙරෙයි, පහළ නො වූ ක්ලේශය දුරු කෙරෙයි, අනාගත වූ යම් ක්ලේශයෙක් නැත් ද, එය දුරු කෙරේ නු' යි අනාගත කෙලෙසුන් දුරු නො කෙරේ යයි

**පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් ප්‍රත්‍යුත්පන්න ක්ලේශයන් දුරු කෙරේ ද, එසේ වී නම් රාගයෙන් රක්ත වූයේ රාගය දුරු කෙරෙයි, ද්වේෂයෙන් දුෂ්ට වූයේ ද්වේෂය දුරු කෙරෙයි, මෝහයෙන් මූඪ වූයේ මෝහය දුරු කෙරෙයි, මානයෙන් බැඳුණේ මානය දුරු කෙරෙයි, දෘෂ්ටියෙන් පරාමෘෂ්ට වූයේ දෘෂ්ටිය දුරු කෙරෙයි, වික්‍ෂෙපයට ගියේ ඖද්ධත්‍යය දුරු කෙරෙයි, නිෂ්ඨාවට නො ගියේ විචිකිත්සාව දුරු කෙරෙයි, තිර බවට ගියේ අනුශය දුරු කෙරෙයි, කෘෂ්ණශුක්ලධර්මයෝ යුගනද්ධ වැ එක්වට මැ පවතිත්. මාර්ගභාවනාව සාංක්ලේශික වේ.

**න හි අතීතෙ කිලෙසෙ පජහති, න අනාගතෙ කිලෙසෙ පජහති, න පච්චුප්පන්නෙ කිලෙසෙ පජහති** යනු: ඉදින් අතීත කෙලෙසුන් දුරු නො කෙරේ ද, අනාගත ... ප්‍රත්‍යුත්පන්න කෙලෙසුන් දුරු නො කෙරේ ද, එසේ වී නම් මාර්ගභාවනාවක් නැත් ද, ඵලසාක්‍ෂාත්ක්‍රියාවක් නැත් ද, ක්ලේශප්‍රහාණයෙක් නැත් ද, ධර්මප්‍රතිවේධයෙක් නැත් ද යත්. මාර්ගභාවනා ද ඇත, ඵලසාක්‍ෂාත්ක්‍රියා ද ඇත, ක්ලේශප්‍රහාණය ද ඇත, ධර්මප්‍රතිවේධය ද ඇති. යේ කිසේ යැ යත්: යම්සේ නො පලගත් තරුණ රුකෙක් වේ ද, ඒ මේ රුක පුරුෂයෙක් මුලින් සිඳුනේ නම් එ රුක්හි යම් නූපන් ඵල කෙනෙක් වෙත් නම් ඔහු නො හටගත්තාහු මැ නො හටගනිති, ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු ම නො පහළ වෙත් ද, එසෙයින් මැ කෙලෙසුන්ගේ නිපැත්මට උත්පාදය හෙතු යැ උත්පාදය ප්‍රත්‍යය යැ' යි උත්පාදයෙහි ආදීනව දැක අනුත්පාදයෙහි සිත ප්‍රස්කන්දනය කෙරෙයි. අනුත්පාදයෙහි සිත ප්‍රස්කන්දනය කළ (පැනගත්) බැවින් යම් කෙලෙස් කෙනෙක් උත්පාද ප්‍රත්‍යයෙන් උපදනාහු නම් ඔහු නො හටගත්තාහු මැ නො හටගනිති. ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු මැ නො පහළ වෙති. මෙසෙයින් හෙතු-නිරොධයෙන් දුඃඛනිරොධය වෙයි. ප්‍රවෘත්තිය හෙතු යැ නිමිත්ත හෙතු යැ ආයූහනය හෙතු යැ, කෙලෙසුන්ගේ උපැත්මට ආයූහනය ප්‍රත්‍යය යැ' යි ආයූහනයෙහි ආදීනව දැක අනායූහනයෙහි සිත ප්‍රස්කන්දනය කෙරෙයි, අනායූහනයෙහි සිත ප්‍රස්කන්දනය කළ බැවින් යම් කෙලෙස් කෙනෙක් ආයූහනප්‍රත්‍යයෙන් උපදනාහු නම් ඔහු නො හටගත්තාහු මැ නො හට-ගනිති, ස්වභාවයට නො පැමිණියාහු මැ ස්වභාවයට නො පැමිණෙති, නූපන්නාහු මැ නූපදිති, නො පහළ වූවාහු මැ නො පහළ වෙති. මෙසෙයින් හෙතුනිරොධයෙන් දුඃඛනිරොධය වෙයි. මෙසෙයින් මාර්ගභාවනා ද ඇත, ඵලසාක්‍ෂාත්ක්‍රියා ද ඇත, ක්ලේශප්‍රහාණය ද ඇත, ධර්මප්‍රතිවේධය ද ඇති යයි.

**අභිසමය කථා නිමි.**

# 3. 4.

## විවෙක කථා

[සාවත්ථිනිදානං:]

‘සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පථවිං නිස්සාය පථවියං පතිට්ඨාය එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව භික්ඛවෙ’ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ග භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. සම්මාසඞ්කප්පං · පෙ- සම්මාවාචං -පෙ- සම්මාකම්මන්තං -පෙ සම්මාආජීවං -පෙ- සම්මාවායාමං -පෙ- සම්මාසතිං -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති, අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති.”[a]

“සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මෙ[1] බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පථවිං නිස්සාය පථවියං පතිට්ඨාය එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සම්මාදිට්ඨිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං, සම්මාසඞ්කප්පං භාවෙති -පෙ- සම්මාවාචං භාවෙති -පෙ- සම්මාකම්මන්තං භාවෙති -පෙ- සම්මාආජීවං භාවෙති -පෙ- සම්මාවායාමං භාවෙති -පෙ- සම්මාසතිං භාවෙති -පෙ- සම්මාසමාධිං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිණාමිං. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙන්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසූ’ති.[b]

සම්මාදිට්ඨියා පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා. සම්මාසඞ්කප්පස්ස -පෙ- සම්මාවාචාය -පෙ- සම්මාකම්මන්තස්ස -පෙ- සම්මාආජීවස්ස -පෙ- සම්මාවායාමස්ස -පෙ- සම්මාසතියා -පෙ- සම්මාසමාධිස්ස පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

---

1 යෙ කෙචි - මජසං, යෙපිමෙ - ස්‍යා PTS.

a. සංයුත්තනිකාය - මහාවග්ග - බලකරණීයවග්ග 1

b. සංයුත්තනිකාය - මහාවග්ග - බලකරණීයවග්ග 2.

# 3. 4.

# විවේක කථා

**[ සැවැත්නිදාන යි: ]**

යම්සේ මහණෙනි, යම් කිසි බාහුබලයෙන් කටයුතු කර්මාන්ත කෙනෙක් කරනුලැබෙත් ද, ඒ හැම කර්මාන්තයෝ පොළොව නිසා පොළොවෙහි පිහිටා කරනුලැබෙති. මෙසේ තෙල බලකරණීය කර්මාන්තයෝ කරනුලැබෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි. ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා.

කිසෙයින් මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩා ද, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා ද යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ ක්ලේශපරිත්‍යාග නිර්වාණප්‍රස්කන්දන සඞ්ඛ්‍යාත ව්‍යෝසර්ගයට පිරිනැමුණු සම්‍යග්දෘෂ්ටිය වඩයි සම්‍යක් සංකල්පය ... සම්‍යග්වචනය ... සම්‍යක්කර්මාන්තය ... සම්‍යගාජීවය ... සම්‍යග්ව්‍යායාමය ... සම්‍යක්සමෘතිය ... විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ ව්‍යෝසර්ගයට පිරිනැමුණු සම්‍යක්සමාධිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩයි, ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩා.

මහණෙනි, යම්සේ යම් කිසි බීජගාමභූතගාම කෙනෙක් වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද, ඒ හැම පොළොව නිසා පොළොවෙහි පිහිටා පැමිණෙත්. මෙසේ තෙල බීජගාමභූතගාමයෝ වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද, එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ·

මහණෙනි, කිසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ ව්‍යෝසර්ගයට පිරිනැමුණු සම්‍යග්දෘෂ්ටිය වඩයි ... සම්‍යක්සංකල්පය වඩයි ... සම්‍යග්වචනය වඩයි ... සම්‍යක්කර්මාන්තය වඩයි ... සම්‍යගාජීවය වඩයි ... සම්‍යග්ව්‍යායාමය වඩයි ... සම්‍යක්සමෘතිය වඩයි ... විවේකය ඇසුරු කළ විරාගය ඇසුරු කළ නිරෝධය ඇසුරු කළ නිර්වාණයට පිරිනැමුණු සම්‍යක් සමාධිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය වඩනුයේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණේ යයි.

සම්‍යග්දෘෂ්ටියට විවේක පසෙක, විරාග පසෙක, නිරෝධ පසෙක, ව්‍යෝසර්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි. සම්‍යක්සංකල්පයට ... සම්‍යග්-වචනයට ... සම්‍යක්කර්මාන්තයට .. සම්‍යගාජීවයට ... සම්‍යග්ව්‍යායාමයට ... සම්‍යක්සමෘතියට ... සම්‍යක්සමාධියට විවේක පසෙක, විරාග පසෙක, නිරෝධ පසෙක, ව්‍යෝසර්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං, පඨමජ්ඣානං භාවයතො. තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමි මග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තං චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච විරාගා: වික්ඛම්භනවිරාගො තදඞ්ගවිරාගො සමුච්ඡෙදවිරාගො පටිප්පස්සද්ධිවිරාගො නිස්සරණවිරාගො. වික්ඛම්භනවිරාගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිරාගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිරාගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිරාගො ච ඵලක්ඛණෙ, නිස්සරණවිරාගො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විරාගා. ඉමෙසු පඤ්චසු විරාගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච නිරොධා: වික්ඛම්භනනිරොධො තදඞ්ගනිරොධො සමුච්ඡෙදනිරොධො පටිප්පස්සද්ධිනිරොධො නිස්සරණනිරොධො. වික්ඛම්භනනිරොධො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො. තදඞ්ගනිරොධො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදනිරොධො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිනිරොධො ච ඵලක්ඛණෙ, නිස්සරණනිරොධො ච අමතා ධාතු,[1] සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච නිරොධා. ඉමෙසු පඤ්චසු නිරොධෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තං චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාදිට්ඨියා කතමෙ පඤ්ච වොස්සග්ගා: වික්ඛම්භනවොස්සග්ගො තදඞ්ගවොස්සග්ගො සමුච්ඡෙදවොස්සග්ගො පටිප්පස්සද්ධිවොස්සග්ගො නිස්සරණවොස්සග්ගො. වික්ඛම්භනවොස්සග්ගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවොස්සග්ගො ච, දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවොස්සග්ගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවොස්සග්ගො ච ඵලක්ඛණෙ, නිස්සරණවොස්සග්ගො ච නිරොධො නිබ්බානං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච වොස්සග්ගා, ඉමෙසු පඤ්චසු වොස්සග්ගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො. චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. සම්මාදිට්ඨියා ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

සම්මාසඞ්කප්පස්ස -පෙ- සම්මාවාචාය -පෙ- සම්මාකම්මන්තස්ස -පෙ- සම්මාආජීවස්ස -පෙ- සම්මාවායාමස්ස -පෙ- සම්මාසතියා -පෙ- සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො, තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධො නිබ්බානං, සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

---

1. නිරොධො නිබ්බානං - PTS.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවිවේකයෝ කවරහ යත්: විෂ්කම්භනවිවේක යැ තදඞ්ගවිවේක යැ සමුච්ඡේදවිවේක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක යැ නිස්සරණවිවේක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භන (දුරුකිරීම් වශයෙන් වන) විවේකය ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවේකය ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේද විවේකය ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේකය ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිස්සරණවිවේකය ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිවේකයෝ වෙති. මේ පඤ්චවිවේකයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි, ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවිරාගයෝ කවරහ යත්: විෂ්කම්භනවිරාග යැ තදඞ්ගවිරාග යැ සමුච්ඡේදවිරාග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග යැ නිස්සරණවිරාග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භනවිරාග ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිරාග ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිරාග ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිස්සරණවිරාග ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිරාගයෝ වෙති. මේ පඤ්චවිරාගයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි, ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චනිරොධයෝ කවරහ යත්: විෂ්කම්භනනිරොධ යැ තදඞ්ගනිරොධ යැ සමුච්ඡේදනිරොධ යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරොධ යැ නිස්සරණ නිරොධ යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භනනිරොධ ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගනිරොධ ද ලොකොත්තර ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදනිරොධ ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරොධ ද අමෘතධාතු වූ නිස්සරණනිරොධ ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චනිරොධයෝ වෙති. මේ පඤ්චනිරොධයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යග්දෘෂ්ටියට පඤ්චවොස්සග්ගයෝ කවරහ යත්: විෂ්කම්භන වොස්සග්ග යැ තදඞ්ග වොස්සග්ග යැ සමුච්ඡේද වොස්සග්ග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධි වොස්සග්ග යැ නිස්සරණ වොස්සග්ග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භන වොස්සග්ග ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ග වොස්සග්ග ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේද වොස්සග්ග ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි වොස්සග්ග ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණ වොස්සග්ග ද වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවොස්සග්ගයෝ වෙති. මේ පඤ්චවොස්සග්ගයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වෙයි. සම්‍යග්දෘෂ්ටියට මේ පඤ්චවිවේකයෝ පඤ්චවිරාගයෝ පඤ්චනිරොධයෝ පඤ්චවොස්සග්ගයෝ දොළොස් නිඃශ්‍රයයෝ වෙත්.

සම්‍යක්සංකල්පයට ... සම්‍යග්වචනයට ... සම්‍යක්කර්මාන්තයට ... සම්‍යගාජීවයට ... සම්‍යග්ව්‍යායාමයට ... සම්‍යක්ස්මෘතියට ... සම්‍යක්සමාධියට පඤ්චවිවේකයෝ කවරහ යත්: විෂ්කම්භනවිවේක යැ තදඞ්ග විවේක යැ සමුච්ඡේදවිවේක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක යැ නිස්සරණවිවේක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භනවිවේක ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවේක ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිවේක ද ඵලක්‍ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවේක ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණවිවේක ද වෙයි. සම්‍යක්සමාධියට මේ පඤ්චවිවේකයෝ වෙති. මේ පඤ්චවිවේකයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වූයේ වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච විරාගා: වික්ඛම්භනවිරාගො තදඞ්ගවිරාගො සමුච්ඡෙදවිරාගො පටිප්පස්සද්ධිවිරාගො නිස්සරණවිරාගො. වික්ඛම්භනවිරාගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිරාගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිරාගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිරාගො ච ඵලක්ඛණෙ, නිස්සරණවිරාගො ච නිරොධො නිබ්බානං, සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විරාගා, ඉමෙසු පඤ්චසු විරාගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච නිරොධා: වික්ඛම්භනනිරොධො තදඞ්ගනිරොධො සමුච්ඡෙදනිරොධො පටිප්පස්සද්ධිනිරොධො නිස්සරණනිරොධො. වික්ඛම්භනනිරොධො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගනිරොධො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදනිරොධො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිනිරොධො ච ඵලක්ඛණෙ, නිස්සරණනිරොධො ච අමතා ධාතු. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච නිරොධා ඉමෙසු පඤ්චසු නිරොධෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං.

සම්මාසමාධිස්ස කතමෙ පඤ්ච වොස්සග්ගා: වික්ඛම්භනවොස්සග්ගො තදඞ්ගවොස්සග්ගො සමුච්ඡෙදවොස්සග්ගො පටිප්පස්සද්ධිවොස්සග්ගො නිස්සරණවොස්සග්ගො වික්ඛම්භනවොස්සග්ගො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවොස්සග්ගො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවොස්සග්ගො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවොස්සග්ගො ච ඵලක්ඛණෙ, නිස්සරණවොස්සග්ගො ච නිරොධො නිබ්බානං. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච වොස්සග්ගා, ඉමෙසු පඤ්චසු වොස්සග්ගෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං. සම්මාසමාධිස්ස ඉමෙ පඤ්ච විවෙකා පඤ්ච විරාගා පඤ්ච නිරොධා පඤ්ච වොස්සග්ගා ද්වාදස නිස්සයා.

“සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි බලකරණීයා කම්මන්තා කරීයන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බලකරණීයා කම්මන්තා කරීයන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙති, සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොති -පෙ- සත්ත බොජ්ඣඞ්ගෙ භාවෙන්තො සත්ත බොජ්ඣඞ්ගෙ බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු -පෙ- පඤ්ච බලානි භාවෙති පඤ්ච බලානි බහුලීකරොති -පෙ- පඤ්ච බලානි භාවෙන්තො පඤ්ච බලානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු. -පෙ- පඤ්චින්ද්‍රියානි භාවෙති පඤ්චින්ද්‍රියානි බහුලීකරොති -පෙ-

සෙය්‍යථාපි භික්ඛවෙ, යෙ කෙචි මෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති, සබ්බෙ තෙ පඨවිං නිස්සාය පඨවියං පතිට්ඨාය, එවමෙතෙ බීජගාමභූතගාමා වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති. එවමෙව ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය පඤ්චින්ද්‍රියානි භාවෙන්තො පඤ්චින්ද්‍රියානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු.

සම්‍යක්සමාධියට පසුව විරාගයෝ කවරහ යත්: විෂ්කම්භණවිරාග යැ තදඞ්ගවිරාග යැ සමුච්ඡේදවිරාග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිරාග යැ නිස්සරණවිරාග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණවිරාග ද නිර්වේදභාගිය සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිරාග ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදවිරාග ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි විරාග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණවිරාග ද වෙයි. සම්‍යක් සමාධියට මේ පසුවිරාගයෝ වෙති. මේ පසුවවිරාගයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යක්සමාධියට පසුවනිරෝධයෝ කවරහ යත්: විෂ්කම්භණනිරෝධ යැ තදඞ්ගනිරෝධ යැ සමුච්ඡේදනිරෝධ යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිනිරෝධ යැ නිස්සරණනිරෝධ යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණ-නිරෝධ ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට තදඞ්ගනිරෝධ ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේදනිරෝධ ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි-නිරෝධ ද අමෘතධාතු වූ නිස්සරණනිරෝධ ද වෙයි. සම්‍යක්සමාධියට මේ පසුවනිරෝධයෝ වෙති. මේ පසුවනිරෝධයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ.

සම්‍යක්සමාධියට පසුව වෝස්සග්ගයෝ කවරහ යත්: විෂ්කම්භණ වෝස්සග්ග යැ තදඞ්ග වෝස්සග්ග යැ සමුච්ඡේද වෝස්සග්ග යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධි වෝස්සග්ග යැ නිස්සරණවෝස්සග්ග යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණ-යන්ගේ විෂ්කම්භණ වෝස්සග්ග ද නිර්වේදභාගියසමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ග වෝස්සග්ග ද ලෝකෝත්තර වූ ක්ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡේද වෝස්සග්ග ද ඵලක්ෂණයෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධි වෝස්සග්ග ද නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය වූ නිස්සරණ වෝස්සග්ග ද වෙයි. සම්‍යක්-සමාධියට මේ පසුවවෝස්සග්ගයෝ වෙති. මේ පසුව වෝස්සග්ගයන්හි හටගත් ධම්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ. සම්‍යක්සමාධියට මේ පසුව විවේකයෝ පසුව විරාගයෝ පසුව නිරෝධයෝ පසුව වෝස්සග්ගයෝ දොළොස් නිස්සයෝ වෙත්.

යම්සේ මහණෙනි, යම් කිසි බලකරණීය වූ කර්මාන්ත කෙනෙක් කරනු ලැබෙත් ද එ හැම පොළොව නිසා පොළොව්හි පිහිටා කරනුලැබෙති මෙසේ තෙල බලකරණීය වූ කර්මාන්තයෝ කරනු ලැබෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා සප්තබොධ්‍යඞ්ගයන් වඩයි, සප්තබොධ්‍යඞ්ගයන් පුනපුනා වඩයි ... සප්තබොධ්‍යඞ්ගයන් වඩනුයේ සප්තබොධ්‍යඞ්ගයන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි ... පඤ්චබලයන් වඩයි, පඤ්චබලයන් පුනපුනා වඩයි ... පඤ්චබලයන් වඩනුයේ පඤ්චබලයන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි ... පඤ්චෙන්ද්‍රියයන් වඩයි, පඤ්චෙන්ද්‍රිය-යන් පුනපුනා වඩයි ...

යම්සේ මහණෙනි, යම් කිසි බීජගාමභූතගාම කෙනෙක් වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද එ හැම පොළොව නිසා යැ පොළොව්හි පිහිටා යැ. මෙසේ තෙල බීජගාමභූතගාමයෝ වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණෙත් ද එසෙයින් මැ මහණෙනි, මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා පඤ්චෙන්ද්‍රියයන් වඩනුයේ පඤ්චෙන්ද්‍රිය-යන් පුනපුනා වඩනුයේ දහම්හි වැඩියට විරූඪ බවට විපුල බවට පැමිණේ.

කථඤ්ච භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය පඤ්චින්ද්‍රියානි භාවෙන්තො පඤ්චින්ද්‍රියානි බහුලීකරොන්තො වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං පාපුණාති ධම්මෙසු: ඉධ භික්ඛවෙ, භික්ඛු සද්ධින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං. විරියින්ද්‍රියං භාවෙති -පෙ- සතින්ද්‍රියං භාවෙති -පෙ- සමාධින්ද්‍රියං භාවෙති -පෙ- පඤ්ඤින්ද්‍රියං භාවෙති විවෙකනිස්සිතං විරාගනිස්සිතං නිරොධනිස්සිතං වොස්සග්ගපරිනාමිං. එවං ඛො භික්ඛවෙ, භික්ඛු සීලං නිස්සාය -පෙ- පාපුණාති ධම්මෙසූ'ති.[a]

සද්ධින්ද්‍රියස්ස පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා. විරියින්ද්‍රියස්ස -පෙ- සතින්ද්‍රියස්ස -පෙ- සමාධින්ද්‍රියස්ස -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස පඤ්ච විවෙකා පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයා.

සද්ධින්ද්‍රියස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො. වික්ඛම්භනවිවෙකො ච නීවරණානං පඨමජ්ඣානං භාවයතො, තදඞ්ගවිවෙකො ච දිට්ඨිගතානං නිබ්බෙධභාගියං සමාධිං භාවයතො, සමුච්ඡෙදවිවෙකො ච ලොකුත්තරං ඛයගාමිමග්ගං භාවයතො, පටිප්පස්සද්ධිවිවෙකො ච ඵලක්ඛණෙ, නිස්සරණවිවෙකො ච නිරොධො නිබ්බානං. සද්ධින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා. ඉමෙසු පඤ්චසු විවෙකෙසු ඡන්දජාතො හොති සද්ධාධිමුත්තො, චිත්තඤ්චස්ස ස්වාධිට්ඨිතං -පෙ- සද්ධින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්චනිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදසනිස්සයා.

විරියින්ද්‍රියස්ස -පෙ- සතින්ද්‍රියස්ස -පෙ- සමාධින්ද්‍රියස්ස -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස කතමෙ පඤ්ච විවෙකා: වික්ඛම්භනවිවෙකො තදඞ්ගවිවෙකො සමුච්ඡෙදවිවෙකො පටිප්පස්සද්ධිවිවෙකො නිස්සරණවිවෙකො -පෙ- පඤ්ඤින්ද්‍රියස්ස ඉමෙ පඤ්ච විවෙකා, පඤ්ච විරාගා, පඤ්ච නිරොධා, පඤ්ච වොස්සග්ගා, ද්වාදස නිස්සයාති.

**විවෙකකථා සමත්තා.**

---

a. සංයුත්තනිකාය

මහණෙනි, කිසෙයිත් මහණ තෙම ශීලය නිසා ශීලයෙහි පිහිටා පඤ්චෙන්ද්‍රියයන් වඩනුයේ පඤ්චෙන්ද්‍රියයන් පුනපුනා වඩනුයේ දහම්හි වෘද්ධියට විරූඪ බවට විපුල බවට පැමිණෙයි. මහණෙනි, මෙ සස්නෙහි මහණ තෙම විවේකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත නිවනට පිරිනැමුණු ශ්‍රද්ධෙන්ද්‍රිය වඩයි ... වීර්‍ය්‍යෙන්ද්‍රිය වඩයි ... සමෘතීන්ද්‍රිය වඩයි ... සමාධීන්ද්‍රිය වඩයි, විවෙකනිඃශ්‍රිත විරාගනිඃශ්‍රිත නිරොධනිඃශ්‍රිත නිවනට පිරිනැමුණු ප්‍රඥෙන්ද්‍රිය වඩයි. මහණෙනි, මෙසෙයින් මහණ තෙම ශීලය නිසා ... දහම්හි විපුලබවට පැමිණේ යයි.

ශ්‍රද්ධෙන්ද්‍රියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි. වීර්‍ය්‍යෙන්ද්‍රියට ... සමෘතීන්ද්‍රියට ... සමාධීන්ද්‍රියට ... ප්‍රඥෙන්ද්‍රියට විවෙක පසෙක, විරාග පසෙක, නිරොධ පසෙක, වොස්සග්ග පසෙක, නිඃශ්‍රය දෙළොසෙකි.

ශ්‍රද්ධෙන්ද්‍රියට පඤ්චවිවෙකයෝ කවරහ යත්: විෂ්කම්භණවිවෙක යැ තදඞ්ගවිවෙක යැ සමුච්ඡෙදවිවෙක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක යැ නිස්සරණ විවෙක යි. ප්‍රථමධ්‍යාන වඩනුවහට නීවරණයන්ගේ විෂ්කම්භණවිවෙක ද නිර්වේදභාගිය වූ සමාධිය වඩනුවහට දෘෂ්ටිගතයන්ගේ තදඞ්ගවිවෙක ද ලොකොත්තර වූ ක්‍ෂයගාමිමාර්ගය වඩනුවහට සමුච්ඡෙදවිවෙක ද ඵලක්‍ෂණ-යෙහි ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක ද නිරොධ සඞ්ඛ්‍යාත නිර්‍වාණය වූ නිස්සරණවිවෙක ද වෙයි. ශ්‍රද්ධෙන්ද්‍රියට මේ පඤ්චවිවෙකයෝ වෙති. මේ පඤ්චවිවෙකයන්හි හටගත් ධර්මච්ඡන්ද ඇත්තේ ශ්‍රද්ධායෙහි අධිමුක්ත වෙයි. ඔහුගේ සිත ද මොනොවට පිහිටියේ වේ ... ශ්‍රද්ධෙන්ද්‍රියට මේ පඤ්චවිවෙකයෝ, පඤ්ච-විරාගයෝ, පඤ්චනිරොධයෝ, පඤ්චවොස්සග්ගයෝ දෙළොස් නිඃශ්‍රයයෝ වෙත්.

වීර්‍ය්‍යෙන්ද්‍රියට .. සමෘතීන්ද්‍රියට ... සමාධීන්ද්‍රියට ... ප්‍රඥෙන්ද්‍රියට පඤ්ච-විවෙකයෝ කවරහ යත්: විෂ්කම්භණවිවෙක යැ තදඞ්ගවිවෙක යැ සමුච්ඡෙදවිවෙක යැ ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිවෙක යැ නිස්සරණවිවෙක යැ ... ප්‍රඥෙන්ද්‍රි-යට මේ පඤ්චවිවෙකයෝ පඤ්චවිරාගයෝ පඤ්චනිරොධයෝ පඤ්ච-වොස්සග්ගයෝ දෙළොස් නිඃශ්‍රයයෝ වෙත් යයි.

**විවෙක කථා නිමි.**

## 3. 5.

## චරියා කථා

**චරියාති** අට්ඨ චරියායො, ඉරියාපථචරියා ආයතනචරියා සතිචරියා සමාධිචරියා ඤාණචරියා මග්ගචරියා පත්තිචරියා ලොකත්ථචරියාති.

**ඉරියාපථචරියාති** චතූසු ඉරියාපථෙසු.

**ආයතනචරියාති** ඡසු අජ්ඣත්තිකබාහිරෙසු ආයතනෙසු.

**සතිචරියාති** චතූසු සතිපට්ඨානෙසු.

**සමාධිචරියාති** චතූසු ඣානෙසු.

**ඤාණචරියාති** චතූසු අරියසච්චෙසු.

**මග්ගචරියාති** චතූසු අරියමග්ගෙසු.

**පත්තිචරියාති** චතූසු සාමඤ්ඤඵලෙසු.

**ලොකත්ථචරියාති** තථාගතෙසු අරහන්තෙසු සම්මාසම්බුද්ධෙසු, පදෙසෙ[1] පච්චෙකබුද්ධෙසු, පදෙසෙ සාවකෙසු.

ඉරියාපථචරියා ච පණිධිසම්පන්නානං, ආයතනචරියා ච ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරානං, සතිචරියා ච අප්පමාදවිහාරීනං, සමාධිචරියා ච අධිචිත්තමනුයුත්තානං, ඤාණචරියා ච බුද්ධිසම්පන්නානං, මග්ගචරියා ච සම්මාපටිපන්නානං, පත්තිචරියා ච අධිගතඵලානං, ලොකත්ථචරියා ච තථාගතානං අරහන්තානං සම්මාසම්බුද්ධානං, පදෙසෙ පච්චෙකබුද්ධානං, පදෙසෙ සාවකානං. ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: අධිමුච්චන්තො සද්ධාය චරති. පග්ගණ්හන්තො විරියෙන චරති. උපට්ඨාපෙන්තො සතියා චරති, අවික්ඛෙපං කරොන්තො සමාධිනා චරති, පජානන්තො පඤ්ඤාය චරති, විජානන්තො විඤ්ඤාණචරියාය චරති. එවං පටිපන්නස්ස කුසලා ධම්මා ආයාපෙන්තීති ආයතනචරියාය චරති, එවං පටිපන්නො විසෙසමධිගච්ඡතීති විසෙසචරියාය චරති. ඉමා අට්ඨ චරියායො.

අපරාපි අට්ඨ චරියායො: දස්සනචරියා ච සම්මාදිට්ඨියා. අභිනිරොපනචරියා ච සම්මාසඞ්කප්පස්ස, පරිග්ගහචරියා ච සම්මාවාචාය, සමුට්ඨානචරියා ච සම්මාකම්මන්තස්ස, වොදානචරියා ච සම්මාආජීවස්ස, පග්ගහචරියා ච සම්මාවායාමස්ස, උපට්ඨානචරියා ච සම්මාසතියා, අවික්ඛෙපචරියා ච සම්මාසමාධිස්ස. ඉමා අට්ඨචරියායොති.

**චරියාකථා සමත්තා**

---

1. පදෙසෙ - සසං, PTS.

## 3. 5.

## චරියා කථා

**චරියා** යනු: චර්‍ය්‍යා අටෙකි. ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා යැ ආයතනචර්‍ය්‍යා යැ ස්මෘතිචර්‍ය්‍යා යැ සමාධිචර්‍ය්‍යා යැ ඥානචර්‍ය්‍යා යැ මාර්ගචර්‍ය්‍යා යැ ප්‍රාප්ති (ඵල) චර්‍ය්‍යා යැ ලොකාර්ථචර්‍ය්‍යා යැ යි

**ඉරියාපථචරියා** යනු: සතර ඉරියව්හි යැ.

**ආයතනචරියා** යනු: ආධ්‍යාත්මිකබාහිර ෂඩායතනයෙහි යැ.

**සතිචරියා** යනු: සතර සතිපට්ඨානයෙහි යැ.

**සමාධිචරියා** යනු: සතර ධ්‍යානයෙහි යැ.

**ඤාණචරියා** යනු: සතර ආර්‍ය්‍යසත්‍යයෙහි යැ.

**මග්ගචරියා** යනු: සතර ආර්‍ය්‍යමාර්ගයෙහි යැ.

**පත්තිචරියා** යනු: සතර ශ්‍රාමණ්‍යඵලයෙහි යැ.

**ලොකත්ථචරියා** යනු: තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයන් කෙරෙහි යැ. එක්දෙසෙකැ ප්‍රත්‍යෙකබුද්ධයන් කෙරෙහි යැ, එක්දෙසෙකැ ශ්‍රාවකයන් කෙරෙහි යි.

ප්‍රණිධිසම්පන්නයනට (සත්හුන් ඉරියව් ඇතියනට) ඊර්‍ය්‍යාපථචර්‍ය්‍යා ද ඉඳුරන්හි වසනලද දොර ඇතියනට ආයතනචර්‍ය්‍යා ද අප්‍රමාදවිහාර ඇතියනට ස්මෘතිචර්‍ය්‍යා ද සමාධියෙහි යෙදුණවුන්ට සමාධිචර්‍ය්‍යා ද බුද්ධි-සම්පන්නයනට ඥානචර්‍ය්‍යා ද සම්‍යක්ප්‍රතිපන්නයනට මාර්ගචර්‍ය්‍යා ද පැමිණි ඵල ඇතියනට ප්‍රාප්තිචර්‍ය්‍යා ද තථාගත අර්හත් සම්‍යක්සම්බුද්ධයනට, ප්‍රත්‍යෙකබුද්ධයනට එකදෙශයෙක්හි ශ්‍රාවකයනට එකදෙශයෙක්හි ලොකාර්ථචර්‍ය්‍යා ද වේ. මොහු අෂ්ටචර්‍ය්‍යා යි.

අන්‍ය වූ ද චර්‍ය්‍යා අටෙකි: අධිමොක්ෂ කරනුයේ ශ්‍රද්ධා වශයෙන් පවතී, ප්‍රග්‍රහ කරනුයේ වීර්‍ය්‍ය වශයෙන් පවතී, අරමුණෙහි සිහි එළවා තබනුයේ ස්මෘති වශයෙන් පවතී, අවික්ෂෙප කරනුයේ සමාධි වශයෙන් පවතී, ප්‍රකාරයෙන් දන්නේ, ප්‍රඥ වශයෙන් පවතී, විජානනය කරනුයේ විඥන-චර්‍ය්‍යා වශයෙන් පවතී, මෙසෙයින් (ඉන්ද්‍රියචර්‍ය්‍යායෙහි) පිළිපන්නහුට (ශමථ-විදර්ශනා විසින් පැවැති) කුශලධර්මයෝ අත්‍යර්ථයෙන් පවතිත් නු' යි ආයතනචර්‍ය්‍යා වශයෙන් පවතී මෙසෙයින් පිළිපන්නේ (විෂ්කම්භනාදි) විශෙෂයට පැමිණේ නු'යි විශෙෂචර්‍ය්‍යා වශයෙන් පවතී. මොහු අෂ්ටචර්‍ය්‍යා වෙත් යි.

අන්‍ය වූ ද චර්‍ය්‍යා අටෙකි: සම්‍යග්දෘෂ්ටියට දර්ශනචර්‍ය්‍යා ද සම්‍යක්සංකල්පයට අභිනිරොපණචර්‍ය්‍යා ද සම්‍යග්වචනයට පරිග්‍රහචර්‍ය්‍යා ද සම්‍යක්-කර්මාන්තයට සමුට්ඨානචර්‍ය්‍යා ද සම්‍යගාජීවයට ව්‍යවදානචර්‍ය්‍යා ද සම්‍යග්-ව්‍යායාමයට ප්‍රග්‍රහචර්‍ය්‍යා ද සම්‍යක්ස්මෘතියට උපස්ථානචර්‍ය්‍යා ද සම්‍යක්-සමාධියට අවික්ෂෙපචර්‍ය්‍යා ද වෙයි. මොහු අෂ්ටචර්‍ය්‍යා වෙත් යයි.

චර්‍ය්‍යා කථා නිමි.

# 3. 6.

## පාටිහාරිය කථා

"තීණිමානි භික්ඛවෙ, පාටිහාරියානි; කතමානි තීණි: ඉද්ධිපාටිහාරියං ආදෙසනාපාටිහාරියං අනුසාසනීපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, ඉද්ධිපාටිහාරියං: ඉධ භික්ඛවෙ, එකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති, බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉදං වුච්චති භික්ඛවෙ, ඉද්ධිපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, ආදෙසනාපාටිහාරියං: ඉධ භික්ඛවෙ එකච්චො නිමිත්තෙන ආදිසති: "එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති. සො බහුං චෙව ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති: 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති. සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං[1] සුත්වා ආදිසති: 'එවම්පි තෙ මනො, ඉත්ථම්පි තෙ මනො, ඉතිපි තෙ චිත්ත'න්ති සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා. ඉධ පන භික්ඛවෙ, එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, නපි විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං සුත්වා ආදිසති, අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති: 'යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස[2] චිත්තස්ස අනන්තරා අමුකං නාම විතක්කං විතක්කයිස්සතී'ති[3] සො බහුං චෙපි ආදිසති, තථෙව තං හොති, නො අඤ්ඤථා ඉදං වුච්චති භික්ඛවෙ ආදෙසනාපාටිහාරියං.

කතමඤ්ච භික්ඛවෙ, අනුසාසනීපාටිහාරියං: ඉධ භික්ඛවෙ, එකච්චො එවමනුසාසති: 'එවං විතක්කෙථ, මා එවං විතක්කයිත්ථ, එවං මනසිකරොථ, මා එවං මනාකත්ථ.[4] ඉදං පජහථ, ඉදං උපසම්පජ්ජ විහරථා'ති. ඉදං වුච්චති භික්ඛවෙ, අනුසාසනීපාටිහාරියං. ඉමානි ඛො භික්ඛවෙ, තීණි පාටිහාරියානී''2.

නෙක්ඛම්මං ඉජ්ඣතීති ඉද්ධි, කාමච්ඡන්දං පටිහරතීති පාටිහාරියං. යෙ තෙන නෙක්ඛම්මෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන නෙක්ඛම්මං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

---

1. විතක්කවිචාරසද්දං - PTS, සයා   2. යථා ඉමස්ස - සයා, PTS.
3. විතක්කෙස්සතීති - සයා, PTS.   4. මනසිකරිත්ථ - මජසං

# 3. 6.

## ප්‍රාතිහාර්‍ය්‍ය කථා

මහණෙනි, මේ තුන් ප්‍රාතිහාර්‍ය්‍ය කෙනෙක් වෙති: කවර තුන් ප්‍රාතිහාර්‍ය්‍ය කෙනෙකැ යත්: සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය යැ ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ අනුශාසනී-ප්‍රාතිහාර්‍ය්‍ය යැ යි.

මහණෙනි, සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරැ යත්: මහණෙනි, මෙසස්නෙහි ඇතැමෙක් අනේකප්‍රකාර වූ සෘද්ධිකොට්ඨාස වලඳ කෙරෙ යි: (තෙමේ) එකලා වැ බහුප්‍රකාරයෙනුදු වෙයි, බහුප්‍රකාර වැ එකලා ද වෙයි. ආවිර්භාවයට තිරෝභාවයට ... බඹලොව තෙක් මැ කයින් (තමන්) වශයෙහි පවත්වයි. මහණෙනි, මේ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය යැ යි කියනු ලැබේ.

මහණෙනි, ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරෙ යත්: මහණෙනි, මෙ ලොව්හි ඇතැමෙක් නිමිතින් කියයි: 'තා සිත (සොම්නස් දොම්නස් විසින්) මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් (මේ මේ දය සිතම්න් පවත්නේත්) වේ' යයි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, එතෙකුදුවත් මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬ අසා කියයි: "තා සිත මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් වේ" යයි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හෝ හඬ අසා නො ද කියයි. එතෙකුදු-වත් විතර්ක කරන්නහුගේ විතර්කසම්ප්‍රයුක්තවිචාර කරන්නහුගේ විතර්ක-විෂ්ඵාරශබ්දය අසා කියයි: "තා සිත මෙබඳුත් වෙයි, තා සිත මෙ අයුරුත් වෙයි, තා සිත මෙසේත් වේ" යයි හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි. අන් අයුරෙකින් නො වෙයි. තවද මහණෙනි, මෙලො වැ ඇතැමෙක් නිමිතින් නො මැ කියයි, මනුෂ්‍යයන්ගේ හෝ අමනුෂ්‍යයන්ගේ හෝ දෙවියන්ගේ හඬ අසා නො ද කියයි, විතර්ක කරන්නහුගේ විතර්ක-සම්ප්‍රයුක්තවිචාර කරන්නහුගේ විතර්කවිෂ්ඵාරශබ්දය අසා නො ද කියයි, එතෙකුදුවත් අවිතර්කඅවිචාරසමාධියට සමවත්හුගේ සිත (තම) සිතින් පිරිසිඳ දැනගනී, "මේ භවත්හුගේ චිත්තසංස්කාරයෝ යම්සෙයින් පිහිටියාහුද මෙසිතට අනතුරු වැ අසෝ නම් විතර්කය කරන්නේ යැ' යි. හේ බොහෝ කොට ද කියයි, ඒ එසේ මැ වෙයි, අන් අයුරෙකින් නො වේ. මහණෙනි, මේ 'ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය' යි කියනු ලැබේ.

මහණෙනි, අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය නම් කවරෙ යත්: මහණෙනි, මෙ ලොව්, ඇතැමෙක් මෙසේ අනුශාසනා කෙරෙයි: "මෙසේ තකව්, නතමක් මෙසේ තකව්, මෙසේ මෙනෙහි කරව්, නතමක් මෙසේ මෙනෙහි කරව්, මෙය දුරු කරව්, මෙයට පැමිණ වාස කරව්" යයි. මහණෙනි, මේ 'අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය' යයි කියනු ලැබේ. මහණෙනි, මොහු තුන් ප්‍රාති-හාර්‍ය්‍යයෝ යි.

නෛෂ්ක්‍රම්‍යය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, කාමච්ඡන්දය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ නෛෂ්ක්‍රම්‍යයෙන් සමන්නාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැලඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ නෛෂ්ක්‍රම්‍යය වනාහි මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ නෛෂ්ක්‍රම්‍යයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීයප්‍රාතිහාර්‍ය්‍ය යි.

අබ්‍යාපාදො ඉජ්ඣතීති ඉද්ධි, බ්‍යාපාදං පටිහරතීති පාටිහාරියං, යෙ තෙන අබ්‍යාපාදෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අබ්‍යාපාදො ,එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ආලොකසඤ්ඤා ඉජ්ඣතීති ඉද්ධි, ථිනමිද්ධං පටිහරතීති පාටිහාරියං. යෙ තාය ආලොකසඤ්ඤාය සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා. අනාවිලසඞ්කප්පාති ආදෙසනාපාටිහාරියං. සා ඛො පන ආලොකසඤ්ඤා 'එවං ආසෙවිතබ්බා, එවං භාවෙතබ්බා, එවං බහුලීකාතබ්බා, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

අවික්ඛෙපො ඉජ්ඣතීති ඉද්ධි, උද්ධච්චං පටිහරතීති පාටිහාරියං. යෙ තෙන අවික්ඛෙපෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අවික්ඛෙපො 'එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ධම්මවවත්ථානං ඉජ්ඣතීති ඉද්ධි, විචිකිච්ඡං පටිහරතීති පටිහාරියං. 'යෙ තෙන ධම්මවවත්ථානෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන ධම්මවවත්ථානං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

ඤාණං ඉජ්ඣතීති ඉද්ධි, අවිජ්ජං පටිහරතීති පටිහාරියං. 'යෙ තෙන ඤාණෙන සමන්නාගතා සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන ඤාණං එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

පාමොජ්ජං ඉජ්ඣතීති ඉද්ධි, අරතිං පටිහරතීති පාටිහාරියං. 'යෙ තෙන පාමොජ්ජෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන පාමොජ්ජං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති, උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං.

අව්‍යාපාදය තෙමේ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ. ව්‍යාපාදය පිළිමල් වැ දුරු කෙරේ නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් කෙනෙක් ඒ අව්‍යාපාදයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’ යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ, ඒ අව්‍යාපාදය වැළින් මෙසේ ආසෙවන කළයුතු යැ, මෙසේ භාවන කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ අව්‍යාපාදයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය’ යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ආලොකසංඥා තොමෝ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ, ථිනමිද්ධය පිළිමල් වැ දුරු කෙරේ නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ, යම් කෙනෙක් ඒ ආලෝකසංඥයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’ යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ, ඒ ආලොකසංඥාව වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනාකළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ. මෙසේ ඒ ආලොකසංඥාවට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය’ යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

අවික්‍ෂෙපය තෙමේ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ, ඖද්ධත්‍යය පිළිමල් වැ දුරුලා නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ අවික්‍ෂෙපයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’ යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ අවික්‍ෂෙපය වැළින් මෙසේ ආසෙවන කළයුතුයැ, මෙසේ භාවනාකළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ අවික්‍ෂෙපයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය’ යි අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍ය යි.

ධර්මනිශ්චය තෙමේ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ, විචිකිත්සාව පිළිමල් වැ දුරු කෙරේ නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ධර්මනිශ්චයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’ යි ආදේශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ධර්මනිශ්චය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ධර්මනිශ්චයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු නු’ යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ඥානය තෙමේ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ. අවිද්‍යාව පිළිමල් වැ දුරු කෙරේ නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ඥානයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ඥානය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ඥානයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය’ යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

ප්‍රාමොද්‍යය තෙමේ සිද්ධ වේ නු’ යි ඍද්ධි යැ. අරතිය පිළිමල් වැ දුරු කෙරේ නු’ යි ප්‍රාතිහාර්‍ය්‍ය යැ. යම් කෙනෙක් ඒ ප්‍රාතිහාර්‍ය්‍යයෙන් සමන්‍වාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්‍ප ඇත්තාහු නු’ යි ආදෙශනාප්‍රාතිහාර්‍ය්‍ය යැ. ඒ ප්‍රාමොද්‍යය වැළින් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ප්‍රාමොද්‍යයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය’ යි අනුශාසනීප්‍රාතිහාර්‍ය්‍ය යි.

පඨමං ඣානං ඉජ්ඣතීති ඉද්ධි, නීවරණෙ පටිහරතීති පාටිහාරියං. යෙ තෙන පඨමෙන ඣානෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. තං ඛො පන පඨමං ඣානං 'එවං ආසෙවිතබ්බං, එවං භාවෙතබ්බං, එවං බහුලීකාතබ්බං, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං -පෙ-

අරහත්තමග්ගො ඉජ්ඣතීති ඉද්ධි, සබ්බකිලෙසෙ පටිහරතීති පාටිහාරියං 'යෙ තෙන අරහත්තමග්ගෙන සමන්නාගතා, සබ්බෙ තෙ විසුද්ධචිත්තා අනාවිලසඞ්කප්පා'ති ආදෙසනාපාටිහාරියං. සො ඛො පන අරහත්තමග්ගො 'එවං ආසෙවිතබ්බො, එවං භාවෙතබ්බො, එවං බහුලීකාතබ්බො, එවං තදනුධම්මතා සති උපට්ඨාපෙතබ්බා'ති අනුසාසනීපාටිහාරියං

නෙක්ඛම්මං ඉජ්ඣතී'ති ඉද්ධි, කාමච්ඡන්දං පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියං. අබ්‍යාපාදො ඉජ්ඣතීති ඉද්ධි, බ්‍යාපාදං පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියං. ආලොකසඤ්ඤා ඉජ්ඣතීති ඉද්ධි, ථිනමිද්ධං පටිහරතීති පාටිහාරියං -පෙ- අරහත්තමග්ගො ඉජ්ඣතීති ඉද්ධි, සබ්බකිලෙසෙ පටිහරතීති පාටිහාරියං, යා ච ඉද්ධි යඤ්ච පාටිහාරියං, ඉදං වුච්චති ඉද්ධිපාටිහාරියන්ති.

පාටිහාරියකථා සමත්තා.

ප්‍රථමධ්‍යානය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. නීවරණයන් පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය යැ. යම් කෙනෙක් ඒ ප්‍රථමධ්‍යානයෙන් සමන්නාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය යැ. ඒ ප්‍රථමධ්‍යානය වැළිත් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනා කළයුතු යැ, මෙසේ ඒ ප්‍රථමධ්‍යානයට අනුකූල වැ සිහි එළවා තැබියයුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය යි ...

අර්හත්මාර්ග තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ. හැම කෙලෙසුන් පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය යැ. යම් කෙනෙක් ඒ අර්හත්මාර්ගයෙන් සමන්නාගත වූහු නම් ඔහු හැම විශුද්ධ සිත් ඇත්තාහු නො කැළඹුණු සංකල්ප ඇත්තාහු නු' යි ආදේශනාප්‍රාතිහාර්‍ය යැ. ඒ අර්හත්මාර්ගය වැළිත් මෙසේ ආසේවන කළයුතු යැ, මෙසේ භාවනා කළයුතු යැ, මෙසේ පුනපුනා භාවනාකළයුතු යැ, මෙසේ ඒ අර්හත්මාර්ගයට අනුකූල වැ සිහි එළවා තැබිය යුතු ය' යි අනුශාසනීප්‍රාතිහාර්‍ය යි.

නෛෂ්ක්‍රම්‍ය තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, කාමච්ඡන්දය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍යයෙකුත් වේ ද, මේ 'සෘද්ධිප්‍රාතිහාර්‍ය' ය යි කියනු ලැබේ. අව්‍යාපාද තෙමේ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ව්‍යාපාදය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍යයෙකුත් වේ ද, මේ 'සෘද්ධිප්‍රාතිහාර්‍ය' යයි කියනු ලැබේ. ආලෝකසංඥා තොමෝ සිද්ධ වේ නු' යි සෘද්ධි යැ, ථිනමිද්ධය පිළිමල් වැ දුරු කෙරේ නු' යි ප්‍රාතිහාර්‍ය යැ ... අර්හත්මාර්ග තෙමේ සිද්ධ වේ නු'යි සෘද්ධි යැ, හැම කෙලෙසුන් පිළිමල් වැ දුරු කෙරේ නු'යි ප්‍රාතිහාර්‍ය යැ, යම් සෘද්ධියකුත් යම් ප්‍රාතිහාර්‍යයෙකුත් වේ ද, මේ සෘද්ධිප්‍රාතිහාර්‍ය' යයි කියනු ලැබේ.

ප්‍රාතිහාර්‍ය කථා නිමි.

## 3. 7.

## සමසීසි කථා [1]

සබ්බධම්මානං සම්මාසමුච්ඡෙදෙ නිරොධෙ ච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං.

**සබ්බධම්මානන්ති** පඤ්චක්ඛන්ධා ද්වාදසායතනානි අට්ඨාරසධාතුයො කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා කාමාවචරා ධම්මා රූපාවචරා ධම්මා අරූපාවචරා ධම්මා අපරියාපන්නා ධම්මා.

**සම්මාසමුච්ඡෙදෙති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සම්මා සමුච්ඡින්දති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං සම්මා සමුච්ඡින්දති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං සම්මා සමුච්ඡින්දති, අවික්ඛෙපෙන උද්ධච්චං සම්මා සමුච්ඡින්දති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං සම්මා සමුච්ඡින්දති, ඤාණෙන අවිජ්ජං සම්මා සමුච්ඡින්දති, පාමොජ්ජෙන අරතිං සම්මා සමුච්ඡින්දති, පඨමෙන ඣානෙන නීවරණෙ සම්මා සමුච්ඡින්දති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සම්මා සමුච්ඡින්දති.

**නිරොධෙති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං නිරොධෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං නිරොධෙති, ආලොකසඤ්ඤාය ථිනමිද්ධං නිරොධෙති, අවික්ඛෙපෙන උද්ධච්චං නිරොධෙති, ධම්මවවත්ථානෙන විචිකිච්ඡං නිරොධෙති, ඤාණෙන අවිජ්ජං නිරොධෙති, පාමොජ්ජෙන අරතිං නිරොධෙති, පඨමෙන ඣානෙන නීවරණෙ නිරොධෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ නිරොධෙති.

**අනුපට්ඨානතාති** නෙක්ඛම්මං පටිලද්ධස්ස කාමච්ඡන්දො න උපට්ඨාති, අබ්‍යාපාදං පටිලද්ධස්ස බ්‍යාපාදො න උපට්ඨාති, ආලොකසඤ්ඤං පටිලද්ධස්ස ථිනමිද්ධං න උපට්ඨාති, අවික්ඛෙපං පටිලද්ධස්ස උද්ධච්චං න උපට්ඨාති, ධම්මවවත්ථානං පටිලද්ධස්ස විචිකිච්ඡා න උපට්ඨාති, ඤාණං පටිලද්ධස්ස අවිජ්ජා න උපට්ඨාති, පාමොජ්ජං පටිලද්ධස්ස අරති න උපට්ඨාති, පඨමං ඣානං පටිලද්ධස්ස නීවරණා න උපට්ඨන්ති -පෙ- අරහත්තමග්ගං පටිලද්ධස්ස සබ්බකිලෙසා න උපට්ඨන්ති.

**සමන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං සමං, බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො සමං, ථිනමිද්ධස්ස පහීනත්තා ආලොකසඤ්ඤා සමං, උද්ධච්චස්ස පහීනත්තා අවික්ඛෙපො සමං, විචිකිච්ඡාය පහීනත්තා ධම්මවවත්ථානං සමං, අවිජ්ජාය පහීනත්තා ඤාණං සමං, අරතියා පහීනත්තා පාමොජ්ජං සමං, නීවරණානං පහීනත්තා පඨමං ඣානං සමං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො සමං.

**සීසන්ති** තෙරස සීසානි: පලිබොධසීසඤ්ච තණ්හා, විනිබන්ධසීසඤ්ච[2] මානො, පරාමාසසීසඤ්ච දිට්ඨි, වික්ඛෙපසීසඤ්ච උද්ධච්චං, සඞ්කිලෙසසීසඤ්ච අවිජ්ජා, අධිමොක්ඛසීසඤ්ච සද්ධා, පග්ගහසීසඤ්ච විරියං, උපට්ඨානසීසඤ්ච සති, අවික්ඛෙපසීසඤ්ච සමාධි, දස්සනසීසඤ්ච පඤ්ඤා, පවත්තසීසඤ්ච ජීවිතින්ද්‍රියං, ගොචරසීසඤ්ච විමොක්ඛො, සඞ්ඛාරසීසඤ්ච නිරොධොති.

**සමසීසකථා සමත්තා.**

1. සමසීස කථා - මජසං, සයා, PTS. 2 විනිබන්ධනසීසඤ්ච - මජසං

# 3. 7.

# ශමශීර්ෂ කථා

සියලු (ත්‍රෛභූමක) ධර්මයන් මොනොවට නිරුද්ධ කිරීමෙහි ද නිරුද්ධ කල කල්හි යළි නො උපදීමෙහි ද ප්‍රඥාව ශමශීර්ෂාර්ථඥාන නම්.

**සබ්බධම්මානං** යනු: පඤ්චස්කන්ධ යැ දොළොස් ආයතන යැ අටළොස් ධාතු යැ කුශලධර්ම යැ අකුශලධර්ම යැ අව්‍යාකෘතධර්ම යැ කාමාවචරධර්ම යැ රූපාවචරධර්ම යැ අරූපාවචරධර්ම යැ අපර්යාපන්නධර්ම යි.

**සම්මාසමුච්ඡෙදෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය මොනොවට සමුච්ඡේද (මුලුසුන්) කෙරෙයි, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ආලෝකසංඥායෙන් ථිනමිද්ධය මොනොවට සමුච්ඡේද කෙරෙයි, අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ධර්මනිශ්‍රයෙන් විචිකිත්සාව මොනොවට සමුච්ඡේද කෙරෙයි, ඥානයෙන් අවිද්‍යාව මොනොවට සමුච්ඡේද කෙරෙයි, ප්‍රාමොද්‍යයෙන් අරතිය මොනොවට සමුච්ඡේද කෙරෙයි, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් මොනොවට සමුච්ඡේද කෙරෙයි ... රහත්මඟින් හැම කෙලෙසුන් මොනොවට සමුච්ඡේද කෙරේ.

**නිරොධෙ** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය නිරුද්ධ කෙරෙයි, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය නිරුද්ධ කෙරෙයි, ආලොකසංඥායෙන් ථිනමිද්ධය නිරුද්ධ කෙරෙයි, අවික්ෂෙපයෙන් ඖද්ධත්‍යය නිරුද්ධ කෙරෙයි, ධර්මනිශ්‍රයෙන් විචිකිත්සාව නිරුද්ධ කෙරෙයි, ඥානයෙන් අවිද්‍යාව නිරුද්ධ කෙරෙයි; ප්‍රාමොද්‍යයෙන් අරතිය නිරුද්ධ කෙරෙයි, ප්‍රථමධ්‍යානයෙන් නීවරණයන් නිරුද්ධ කෙරෙයි ... රහත්මඟින් හැම කෙලෙසුන් නිරුද්ධ කෙරේ.

**අනුපට්ඨානතා** යනු: නෛෂ්ක්‍රම්‍යය ලද්දවුහුට කාමච්ඡන්දය නූපදී. (නො එළඹෙයි), අව්‍යාපාදය ලද්දවුහුට ව්‍යාපාදය නූපදී, ආලොකසංඥා ලද්දවුහුට ථිනමිද්ධය නූපදී, අවික්ෂෙපය ලද්දවුහුට ඖද්ධත්‍යය නූපදී, ධර්මනිශ්‍රය ලද්දවුහුට විචිකිත්සාව නූපදී, ඥානය ලද්දවුහුට අවිද්‍යාව නූපදී, ප්‍රාමොද්‍යය ලද්දවුහුට අරතිය නූපදී, ප්‍රථමධ්‍යානය ලද්දවුහුට නීවරණයන් නූපදී .. රහත්මඟ ලද්දවුහුට හැම කෙලෙස්හු නූපදිත්.

**සමං** යනු: කාමච්ඡන්දය පුහුණු (ප්‍රහීණ) බැවින් නෛෂ්ක්‍රම්‍යය ශම යැ, ව්‍යාපාදය පුහුණු බැවින් අව්‍යාපාදය ශම යැ, ථිනමිද්ධය පුහුණු බැවින් ආලොකසංඥාව ශම යැ, ඖද්ධත්‍යය පුහුණු බැවින් අවික්ෂෙපය ශම යැ, විචිකිත්සාව පුහුණු බැවින් ධර්මනිශ්‍රය ශම යැ, අවිද්‍යාව පුහුණු බැවින් ඥානය ශම යැ, අරතිය පුහුණු බැවින් ප්‍රාමොද්‍යය ශම යැ, නීවරණයන් පුහුණු බැවින් ප්‍රථමධ්‍යානය ශම යැ ... හැම කෙලෙසුන් පුහුණු බැවින් රහත්මඟ ශම යි.

**සීසං** යනු: තෙළෙස් ශීර්ෂයෝ යැ: තෘෂ්ණාව පරිරොධශීර්ෂ ද මානය විනිබන්ධශීර්ෂ ද දෘෂ්ටිය පරාමර්ශශීර්ෂ ද ඖද්ධත්‍යය වික්ෂෙපශීර්ෂ ද අවිද්‍යාව සංක්ලෙශශීර්ෂ ද ශ්‍රද්ධාව අධිමොක්ෂශීර්ෂ ද වීර්‍ය්‍යය ප්‍රග්‍රහශීර්ෂ ද ස්මෘතිය උපස්ථානශීර්ෂ ද සමාධිය අවික්ෂෙපශීර්ෂ ද ප්‍රඥාව දර්ශනශීර්ෂ ද ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිශීර්ෂ ද විමොක්ෂය ගොචරශීර්ෂ ද නිරොධය සංස්කාරශීර්ෂ ද වේ යයි.

**සමසීසකථා නිමි.**

## 3. 8.

# සතිපට්ඨාන කථා

[සාවත්ථිනිදානං:]

"චත්තාරොමෙ භික්ඛවෙ, සතිපට්ඨානා, කතමෙ චත්තාරො: ඉධ භික්ඛවෙ, භික්ඛු කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. වෙදනාසු -පෙ- චිත්තෙ -පෙ- ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්සං. ඉමෙ ඛො භික්ඛවෙ, චත්තාරො සතිපට්ඨානාති".

කථං කායෙ කායානුපස්සී විහරති: ඉධෙකච්චො පඨවිකායං අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති නො සුඛතො, අනත්තතො අනුපස්සති නො අත්තතො, නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි කායං අනුපස්සති. කායො උපට්ඨානං නො සති. සති උපට්ඨානඤ්චෙව සති ච, තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: කායෙ කායානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා.

ඉධෙකච්චො ආපොකායං -පෙ- තෙජොකායං -පෙ- වායොකායං -පෙ- කෙසකායං -පෙ- ලොමකායං -පෙ- ඡවිකායං -පෙ- චම්මකායං -පෙ- මංසකායං -පෙ- රුධිරකායං -පෙ- නහාරුකායං[1] -පෙ- අට්ඨිකායං -පෙ- අට්ඨිමිඤ්ජකායං අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති නො සුඛතො, අනත්තතො අනුපස්සති නො අත්තතො, නිබ්බින්දති, නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි කායං අනුපස්සති. කායො උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං කායං අනුපස්සති. තෙන වුච්චති: කායෙ කායානුපස්සනා සතිපට්ඨානා.

1. නහාරුකායං - මජසං,

# 3. 8.

# සතිපට්ඨාන කථා

**[සැවැත්නිදාන යි:]**

"මහණෙනි, මේ සතිපට්ඨානයෝ සතර දෙනෙක් වෙති: කවර සතර දෙනෙකැ යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ තෙම කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ කාය සඞ්ඛ්‍යාත ලෝකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට කයෙහි කය අනුව බලනසුලු වැ වාසය කෙරෙයි. වේදනාවන්හි ... චිත්තයෙහි ... කෙලෙස් තවන වැර ඇති වැ සම්‍යග්ඥාන ඇති වැ සිහි ඇති වැ ධර්ම සඞ්ඛ්‍යාත ලොකයෙහි අභිධ්‍යාදෞර්මනස්‍යයන් දුරු කොට ධර්මයන්හි ධර්මයන් අනු වැ බලනසුලු වැ වාසය කෙරේ මහණෙනි, මොහු සතර සතිපට්ඨානයෝ" යි.

කිසෙයින් කයෙහි කය අනු වැ බලනසුලු වැ වාසය කෙරේ ද යත් මෙසස්නෙහි ඇතැමෙක් පඨවිධාතුකාය (පෘථිවිධාතු සමූහය) අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ යැ, නිත්‍ය හෙයින් නො දක්නේ යැ, දුඃඛ හෙයින් පුනපුනා දක්නේ යැ, සුඛ හෙයින් නො දක්නේ යැ, අනාත්ම හෙයින් පුනපුනා දක්නේ යැ, ආත්ම හෙයින් නො දක්නේ යැ, කලකිරෙයි, සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි, සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනියි, අනිත්‍ය හෙයින් පුනපුනා දක්නේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් පුනපුනා දක්නේ සුඛසංඥාව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් පුනපුනා දක්නේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කෙරෙනුයේ සමුදය දුරු කෙරෙ යි, හැරපියනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් කය පුනපුනා දක්නේ යි. කය උපස්ථාන යැ සමෘති නො වෙයි. සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කය පුනපුනා දක්නේ යි. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානා'යි.

භාවනා යනු: භාවනා සතරෙක ඒ භාවනාවිශෙෂයෙහි උපන් යුගනද්ධධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යාර්ථයෙන් භාවනා යැ, තදනුකූලවීර්‍ය්‍යවාහිත්‍යාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසස්නෙහි ඇතැමෙක් ආපොකාය ... තේජෝකාය ... වායොකාය ... කෙසකාය ... ලොමකාය ... ඡවිකාය ... චම්මකාය ... මංසකාය ... රුධිරකාය ... නහාරුකාය ... අට්ඨිකාය ... අට්ඨිමිඤ්ජකාය ... අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කෙරෙයි සුඛ හෙයින් නො කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කෙරෙයි ආත්ම හෙයින් නො කෙරෙයි, කලකිරෙයි සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයෙ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි, පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් කය අනුදර්ශනා කෙරේ. කය උපස්ථාන වෙයි සමෘති නො වෙයි, සමෘතිය උපස්ථාන ද සමෘති ද වෙයි. ඒ සමෘතියෙන් ඒ ඥානයෙන් ඒ කය අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'කායෙ කායානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනාති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවීරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා එවං කායෙ කායානුපස්සී විහරති.

කථං වෙදනාසු වෙදනානුපස්සී විහරති? ඉධෙකච්චො සුඛං වෙදනං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි වෙදනං අනුපස්සති. වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා -පෙ- ඉධෙකච්චො දුක්ඛං වෙදනං -පෙ- අදුක්ඛමසුඛං වෙදනං -පෙ- සාමිසං සුඛං වෙදනං -පෙ- නිරාමිසං සුඛං වෙදනං -පෙ- සාමිසං දුක්ඛං වෙදනං -පෙ- නිරාමිසං දුක්ඛං වෙදනං -පෙ- සාමිසං අදුක්ඛමසුඛං වෙදනං -පෙ- නිරාමිසං අදුක්ඛමසුඛං වෙදනං -පෙ- චක්ඛුසම්ඵස්සජං වෙදනං -පෙ- සොතසම්ඵස්සජං වෙදනං -පෙ- ඝානසම්ඵස්සජං වෙදනං -පෙ- ජිව්හාසම්ඵස්සජං වෙදනං -පෙ- කායසම්ඵස්සජං වෙදනං -පෙ- මනොසම්ඵස්සජං වෙදනං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි වෙදනං අනුපස්සති, වෙදනා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන, තං වෙදනං අනුපස්සති. තෙන වුච්චති: වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- එවං වෙදනාසු වෙදනානුපස්සී විහරති.

කථං චිත්තෙ චිත්තානුපස්සී විහරති: ඉධෙකච්චො සරාගං චිත්තං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි චිත්තං අනුපස්සති. චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා.

**භාවනා** යනු: භාවනා සතරෙක: ඒ භාවනාවිශෙෂයෙහි උපන් (යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදනුරූපවීර්‍යධුරාර්ථයෙන් භාවනා යැ, ආසේවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් කයෙහි කායානුදර්ශී වැ වාසය කෙරේ.

කිසෙයින් වෙදනාවන්හි වෙදනානුදර්ශී වැ වාසය කෙරේ යැ යත්: මෙසස්නෙහි ඇතැමෙක් සුඛවෙදනාව අනිත්‍ය හෙයින් පුනපුනා දක්තේ යැ නිත්‍ය හෙයින් නො දක්තේ යැ ... හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් පුනපුනා දක්තේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් වෙදනාව අනුදර්ශනා කෙරේ. වෙදනාව උපස්ථාන වෙයි. ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුදර්ශනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා' යි.

**භාවනා** යනු: භාවනා සතරෙක: ... ආසෙවනාර්ථයෙන් භාවනා යි ... මෙසස්නෙහි ඇතැමෙක් දුක් වෙදනාව ... නො දුක් නො සුව වෙදනාව ... සාමිෂ වූ සුඛවෙදනාව ... නිරාමිෂ වූ සුඛවෙදනාව ... සාමිෂ වූ දුඃඛ වෙදනාව ... නිරාමිෂ වූ දුඃඛවෙදනාව ... සාමිෂ වූ අදුක්ඛමසුඛවෙදනාව ... නිරාමිෂ වූ අදුක්ඛමසුඛවෙදනාව ... චක්ඛුසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... සොතසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ඝානසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... ජිව්හාසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... කායසම්ඵස්සයෙන් උපන් වෙදනාව ... මනොසම්ඵස්සයෙන් උපන් වෙදනාව අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරේ. මේ සත් අයුරින් වෙදනාව අනුදර්ශනා කෙරේ. වෙදනාව උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ වෙදනාව අනුදර්ශනා කෙරෙයි. එයින් කියනු ලැබෙයි: 'වෙදනාසු වෙදනානුපස්සනා සතිපට්ඨානා' යි.

**භාවනා** යනු: භාවනා සතරෙක ... මෙසෙයින් වෙදනාවන්හි වෙදනානුදර්ශී වැ වාසය කෙරේ.

කිසෙයින් චිත්තයෙහි චිත්තානුදර්ශී වැ වාසය කෙරේ යැ යත්: මෙ සස්නෙහි ඇතැමෙක් සරාග සිත අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... පටිනිස්සජ්ජනය කෙරෙයි ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජ්ජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් චිත්තය අනුදර්ශනා කෙරේ. චිත්තය උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ සිත අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනාති චතස්සො භාවනා: -පෙ- ආසෙවනට්ඨෙන භාවනා.

ඉධෙකච්චො වීතරාගං චිත්තං -පෙ- සදොසං චිත්තං -පෙ- වීතදොසං චිත්තං -පෙ- සමොහං චිත්තං -පෙ- වීතමොහං චිත්තං -පෙ- සඞ්ඛිත්තං චිත්තං -පෙ- වික්ඛිත්තං චිත්තං -පෙ- මහග්ගතං චිත්තං -පෙ- අමහග්ගතං චිත්තං -පෙ- සඋත්තරං චිත්තං -පෙ- අනුත්තරං චිත්තං -පෙ- සමාහිතං චිත්තං -පෙ- අසමාහිතං චිත්තං -පෙ- විමුත්තං චිත්තං -පෙ- අවිමුත්තං චිත්තං -පෙ- චක්ඛුවිඤ්ඤාණං -පෙ- සොතවිඤ්ඤාණං -පෙ- ඝානවිඤ්ඤාණං -පෙ- ජිව්හාවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං -පෙ- මනොවිඤ්ඤාණං අනිච්චතො අනුපස්සති නො නිච්චතො -පෙ- පටිනිස්සජ්ජති නො ආදියති. අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති -පෙ- පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි චිත්තං අනුපස්සති. චිත්තං උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තං චිත්තං අනුපස්සති. තෙන වුච්චති: චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා -පෙ- ආසෙවනට්ඨෙන භාවනා. එවං චිත්තෙ චිත්තානුපස්සී විහරති.

කථං ධම්මෙසු ධම්මානුපස්සී විහරති: ඉධෙකච්චො ඨපෙත්වා කායං, ඨපෙත්වා වෙදනං, ඨපෙත්වා චිත්තං තදවසෙසෙ ධම්මෙ අනිච්චතො අනුපස්සති නො නිච්චතො, දුක්ඛතො අනුපස්සති, නො සුඛතො, අනත්තතො අනුපස්සති, නො අත්තතො, නිබ්බින්දති නො නන්දති, විරජ්ජති නො රජ්ජති, නිරොධෙති නො සමුදෙති, පටිනිස්සජ්ජති නො ආදියති, අනිච්චතො අනුපස්සන්තො නිච්චසඤ්ඤං පජහති, දුක්ඛතො අනුපස්සන්තො සුඛසඤ්ඤං පජහති, අනත්තතො අනුපස්සන්තො අත්තසඤ්ඤං පජහති, නිබ්බින්දන්තො නන්දිං පජහති, විරජ්ජන්තො රාගං පජහති, නිරොධෙන්තො සමුදයං පජහති, පටිනිස්සජ්ජන්තො ආදානං පජහති. ඉමෙහි සත්තහි ආකාරෙහි තෙ ධම්මෙ අනුපස්සති, ධම්මා උපට්ඨානං නො සති, සති උපට්ඨානඤ්චෙව සති ච. තාය සතියා තෙන ඤාණෙන තෙ ධම්මෙ අනුපස්සති. තෙන වුච්චති: ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානා.

භාවනාති චතස්සො භාවනා: තත්ථ ජාතානං ධම්මානං අනතිවත්තනට්ඨෙන භාවනා, ඉන්ද්‍රියානං එකරසට්ඨෙන භාවනා, තදුපගවිරියවාහනට්ඨෙන භාවනා, ආසෙවනට්ඨෙන භාවනා. එවං ධම්මෙසු ධම්මානුපස්සී විහරතීති.

සතිපට්ඨානකථා සමත්තං.

භාවනා යනු: භාවනා සතරෙක ... ආසෙවනාර්ථයෙන් භාවනා යි.

මෙසස්නෙහි ඇතැමෙක් වීතරාග සිත ... සදෙස සිත ... වීතදෙස සිත ... සමොහ සිත ... වීතමොහ සිත ... සංක්ෂිප්ත සිත ... වික්ෂිප්ත සිත ... මහද්ගත සිත ... මහද්ගත නො වූ සිත ... සඋත්තර සිත ... අනුත්තර සිත ... සමාහිත සිත ... අසමාහිත සිත ... විමුක්ත සිත ... අවිමුක්ත සිත ... චක්ෂුර්විඥානය ... ශ්‍රොත්‍රවිඥානය ... ඝ්‍රාණවිඥානය ... ජිහ්වාවිඥානය ... කායවිඥානය ... මනොවිඥානය අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි ... පටිනිස්සජනය කෙරෙයි ආදානය නො කෙරෙයි. අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි ... පටිනිස්සජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි. මේ සත් අයුරින් සිත අනුදර්ශනා කෙරේ. සිත උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ සිත අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'චිත්තෙ චිත්තානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙක .. ආසෙවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් චිත්තයෙහි චිත්තානුදර්ශී වැ වාසය කෙරේ.

කෙසෙයින් ධර්මයන්හි ධර්මානුදර්ශී වැ වාසය කෙරෙ යි යත්: මෙ සස්නෙහි ඇතැමෙක් කය තබා වේදනාව තබා සිත තබා තදවශිෂ්ට (ත්‍රෛභූමක) ධර්මයන් අනිත්‍ය හෙයින් අනුදර්ශනා කෙරෙයි නිත්‍ය හෙයින් නො කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කෙරෙයි සුඛ හෙයින් නො කෙරෙයි, අනාත්ම හෙයින් අනුදර්ශනා කෙරෙයි ආත්ම හෙයින් නො කෙරෙයි, කලකිරෙයි සතුටු නො වෙයි, විරක්ත වෙයි නො ඇලෙයි, නිරුද්ධ කෙරෙයි සමුදය නො කෙරෙයි, හැරපියයි නො ගනී, අනිත්‍ය හෙයින් අනුදර්ශනා කරනුයේ නිත්‍යසංඥාව දුරු කෙරෙයි, දුඃඛ හෙයින් අනුදර්ශනා කරනුයේ සුඛසංඥාව දුරු කෙරෙයි. අනාත්ම හෙයින් අනුදර්ශනා කරනුයේ ආත්මසංඥාව දුරු කෙරෙයි, කලකිරෙනුයේ නන්දිය දුරු කෙරෙයි, නො ඇලෙනුයේ රාගය දුරු කෙරෙයි, නිරුද්ධ කරනුයේ සමුදය දුරු කෙරෙයි, පටිනිස්සජනය කරනුයේ ආදානය දුරු කෙරෙයි, මේ සත් අයුරින් ඒ ධර්මයන් අනුදර්ශනා කෙරේ. ධර්ම උපස්ථාන වෙයි ස්මෘති නො වෙයි, ස්මෘතිය උපස්ථාන ද ස්මෘති ද වෙයි. ඒ ස්මෘතියෙන් ඒ ඥානයෙන් ඒ ධර්මයන් අනුදර්ශනා කෙරේ. එයින් කියනු ලැබෙයි: 'ධම්මෙසු ධම්මානුපස්සනා සතිපට්ඨානා' යි.

භාවනා යනු: භාවනා සතරෙක: ඒ භාවනාවිශෙෂයෙහි උපන් (යුගනද්ධ) ධර්මයන් (ඔවුනොවුන්) නො ඉක්ම පවත්නා අර්ථයෙන් භාවනා යැ, ඉන්ද්‍රියයන්ගේ එකකෘත්‍යස්වභාවයෙන් භාවනා යැ, තදනුරූපවීර්‍ය්‍යවාහනාර්ථයෙන් භාවනා යැ, ආසෙවනාර්ථයෙන් භාවනා යි. මෙසෙයින් ධර්මයන්හි ධර්මානුදර්ශී වැ වාසය කෙරේ.

**සතිපට්ඨාන කථා නිමි.**

# 3. 9.

## විපස්සනා කථා

"එවං මෙ සුතං: එකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති, භද්දන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං, භගවා එතදවොච:

සො වත භික්ඛවෙ, භික්ඛු කඤ්චි සඞ්ඛාරං නිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං[1] වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ අනිච්චතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි සඞ්ඛාරං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බසඞ්ඛාරෙ දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති.

සො වත භික්ඛවෙ භික්ඛු කඤ්චි ධම්මං අත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

---

1. අරහත්තඵලං - සයා, PTS

# 3. 9.

## විදර්ශනා කථා

''මා විසින් මෙසේ අසනලද: එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරම්හි වැඩ වාස කරනසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ 'මහණෙනි' යි භික්ෂූන් ඇමැතූසේක. ''භාග්‍යවතුන් වහන්ස,' යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට පිළිවදන් ඇස්වූහ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

මහණෙනි, එකැතින් ඒ මහණ කිසි සංස්කාරයක් නිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාමයට (ලෝකොත්තරමාර්ගයට) බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ හැම සංස්කාරයන් අනිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්ව-නියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ කිසි සංස්කාරයක් සුඛ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාම-යට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ හැම සංස්කාරයන් දුක් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වූයේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්වනියාමයට බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ කිසි ධර්මයක් ආත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්වාගත නො වූයේ සම්‍යක්ත්වනියාම-යට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්වනියාමයට නො බස්නේ සෝවත්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

සො වත භික්ඛවෙ, භික්ඛු සබ්බධම්මෙ අනත්තතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති,

සො වත භික්ඛවෙ, භික්ඛු නිබ්බානං දුක්ඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා අසමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති නෙතං ඨානං විජ්ජති, සම්මත්තනියාමං අනොක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති.

සො වත භික්ඛවෙ, භික්ඛු නිබ්බානං සුඛතො සමනුපස්සන්තො අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො භවිස්සතීති ඨානමෙතං විජ්ජති, අනුලොමිකාය ඛන්තියා සමන්නාගතො සම්මත්තනියාමං ඔක්කමිස්සතීති ඨානමෙතං විජ්ජති, සම්මත්තනියාමං ඔක්කමමානො සොතාපත්තිඵලං වා සකදාගාමිඵලං වා අනාගාමිඵලං වා අරහත්තං වා සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති.” [a]

කතිහාකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතිහාකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති:

චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති. චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති.

කතමෙහි චත්තාරීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති, කතමෙහි චත්තාරීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති:

පඤ්චක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො ඊතිතො උපද්දවතො භයතො උපසග්ගතො චලතො පභඞ්ගුතො අද්ධුවතො අතාණතො[1] අලෙනතො අසරණතො රිත්තතො තුච්ඡතො සුඤ්ඤතො අනත්තතො ආදීනවතො විපරිණාමධම්මතො අසාරකතො අඝමූලතො වධකතො විභවතො සාසවතො සඞ්ඛතතො මාරාමිසතො ජාතිධම්මතො ජරාධම්මතො බ්‍යාධිධම්මතො මරණධම්මතො සොකධම්මතො පරිදෙවධම්මතො උපායාසධම්මතො සඞ්කිලෙසිකධම්මතො.

පඤ්චක්ඛන්ධෙ අනිච්චතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො නිච්චං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ දුක්ඛතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සුඛං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

---

1. අතාණතො - මජසං,　　a. සංයුත්තනිකාය

මහණෙනි, එකැතින් ඒ මහණ හැම ධර්මයන් අනාත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත වූයේ සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි. සම්‍යක්ත්‍වනියාමයට බස්නේ සෝවාන්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ නිර්වාණය දුඃඛ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත නො වූයේ සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි, සම්‍යක්ත්‍වනියාමයට නො බස්නේ සෝවාන්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන නො වෙයි.

මහණෙනි, එකැතින් ඒ මහණ නිර්වාණය සුඛ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත වන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, අනුලෝමක්ෂාන්තියෙන් සමන්‍වාගත වූයේ සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වෙයි, සම්‍යක්ත්‍වනියාමයට බස්නේ සෝවාන්ඵලය හෝ සෙදගැමිඵලය හෝ අනාගැමිඵලය හෝ රහත්බව හෝ සාක්ෂාත් කරන්නේ යැ යන තෙල කරුණ විද්‍යමාන වේ.

කිසි අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබා ද, කිසි අයුරෙකින් සම්‍යක්ත්‍වනියාමයට බස්නේ ද යත්:

සතලිස් අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබයි, සතලිස් අයුරෙකින් සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යි.

කවර සතලිස් අයුරෙකින් අනුලෝමක්ෂාන්තිය ලබා ද, කවර සතලිස් අයුරෙකින් සම්‍යක්ත්‍වනියාමයට බස්නේ ද යත්:

පඤ්චස්කන්ධය අනිත්‍ය හෙයින් දුක් හෙයින් රෝග හෙයින් ගණ්ඩ හෙයින් ශල්‍ය හෙයින් විපත් හෙයින් ආබාධ හෙයින් පර (අවසඟ) හෙයින් බිඳෙන හෙයින් ව්‍යසන හෙයින් උපද්‍රව හෙයින් භය හෙයින් උපසර්ග හෙයින් චල හෙයින් බිඳෙන සුලු හෙයින් අධ්‍රැව හෙයින් අත්‍රාණ හෙයින් අලෙන හෙයින් අසරණ හෙයින් සිස් හෙයින් තුච්ඡ හෙයින් ශූන්‍ය හෙයින් අනාත්ම හෙයින් ආදීනව හෙයින් විපරිණාමස්වභාව හෙයින් අසාර හෙයින් අඝමූල හෙයින් වධක හෙයින් විභව හෙයින් සාස්‍රව හෙයින් සඞ්ඛත හෙයින් මාරාමිෂ හෙයින් ජාතිධර්ම හෙයින් ජරාධර්ම හෙයින් ව්‍යාධිධර්ම හෙයින් මරණධර්ම හෙයින් ශොකධර්ම හෙයින් පරිදේවධර්ම හෙයින් උපායාසධර්ම හෙයින් සාංක්ලෙශිකධර්ම හෙයිනි.

පඤ්චස්කන්ධය අනිත්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිත්‍ය යැ' යි දක්නේ සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය දුක් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය සුව යැ' යි දක්නේ සම්‍යක්ත්‍වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ රොගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ආරොග්‍යං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ගණ්ඩතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අගණ්ඩං[1] නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සල්ලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො විසල්ලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අඝතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනඝො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ආබාධතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාබාධො නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ පරතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරප්පච්චයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පලොකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපලොකධම්මං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ඊතිතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනීතිකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ උපද්දවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපද්දවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ භයතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අභයං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ උපස්සග්ගතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපස්සග්ගං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ චලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අචලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පභඞ්ගුතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපභඞ්ගු නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

---

1. නිගණ්ඩං - සයා,

පඤ්චස්කන්ධය රෝග හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ආරෝග්‍ය යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ගඬ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො ගඬ යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශල්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය විශල්‍ය යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අඝ හෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනඝ යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ආබාධ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනාබාධ යැ’ යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය පර හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරප්‍රත්‍යය නො වේ යැ’යි, දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය බිඳෙන හෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො බිඳෙන සැහැවි යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ව්‍යසන හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ව්‍යසන රහිත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපද්‍රව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපද්‍රව යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයටබස්නේ යැ.

පඤ්චස්කන්ධය භය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අභය යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපසර්ග හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපසර්ග යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය චල හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අචල යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය බිඳෙනසුලු හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො බිඳෙනසුලු යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ අද්ධුවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ධුවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අත්තාණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්න ඛන්ධානං නිරොධො තාණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අලෙණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො ලෙණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අසරණතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සරණං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ රිත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අරිත්තං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ තුච්ඡතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අතුච්ඡං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති .

පඤ්චක්ඛන්ධෙ සුඤ්ඤතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමසුඤ්ඤං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අනත්තතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො පරමත්ථං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ආදීනවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාදීනවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ විපරිණාමධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිපරිණාමධම්මං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති

පඤ්චක්ඛන්ධෙ අසාරකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො සාරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ අඝමූලතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනඝමූලං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ වධකතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවධකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චස්කන්ධය අධ්‍රැව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය ධ්‍රැව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අත්‍රාණ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය ත්‍රාණ යැ' යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අලෙණ හෙයින් දක්නේ, අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය ලෙණ යැ' යි දක්නේ, සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අසරණ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය සරණ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සිස් හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය නො සිස් යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය තුච්ඡ හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය අතුච්ඡ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශූන්‍ය හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරමශූන්‍ය යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අනාත්ම හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරමාර්ථ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ආදීනව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය ආදීනව රහිත යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය විපරිණාම සවභාව හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය අවිපරිණාමසවභාව යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අසාර හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය සාර යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය අඝමූල හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය අඝමූල නො වේ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය වධක හෙයින් දක්නේ අනුලෝමක්ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණය වධක නො වේ යැ' යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චක්ඛන්ධෙ විභවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අවිභවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සාසවතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනාසවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සඞ්ඛතතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසඞ්ඛතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ මාරාමිසතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජාතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ජාතිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජාතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ ජරාධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අජරං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ බ්‍යාධිධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අබ්‍යාධි[1] නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ මරණධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අමතං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සොකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසොකං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ පරිදෙවධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අපරිදෙවං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ උපායාසධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අනුපායාසං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

පඤ්චක්ඛන්ධෙ සංකිලෙසිකධම්මතො පස්සන්තො අනුලොමිකං ඛන්තිං පටිලභති, පඤ්චන්නං ඛන්ධානං නිරොධො අසංකිලිට්ඨං නිබ්බානන්ති පස්සන්තො සම්මත්තනියාමං ඔක්කමති.

1. අව්‍යාධිධම්මං - සයා.

පඤ්චස්කන්ධය විභව හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අවිභව යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සාස්‍රව හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනාස්‍රව යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සඞ්ඛත හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අසඞ්ඛත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය මාරාමිෂ හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය නිරාමිෂ යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ජාතිධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අජාත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ජරාධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අජර යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ව්‍යාධිධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය ව්‍යාධි රහිත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය මරණධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අමෘත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය ශෝකධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අශෝක යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය පරිදේවධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය පරිදෙව රහිත යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය උපායාසධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අනුපායාස යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යැ.

පඤ්චස්කන්ධය සාංක්ලේශිකධර්ම හෙයින් දක්නේ අනුලෝමක්‍ෂාන්තිය ලබයි, පඤ්චස්කන්ධයාගේ නිරෝධ සඞ්ඛ්‍යාත නිර්වාණය අසංක්ලිෂ්ට යැ’ යි දක්නේ සම්‍යක්ත්වනියාමයට බස්නේ යි.

අනිච්චතොති අනිච්චානුපස්සනා.

දුක්ඛතොති දුක්ඛානුපස්සනා.

රොගතොති දුක්ඛානුපස්සනා.

ගණ්ඩතොති දුක්ඛානුපස්සනා.

සල්ලතොති දුක්ඛානුපස්සනා.

අඝතොති දුක්ඛානුපස්සනා

ආබාධතොති දුක්ඛානුපස්සනා

පරතොති අනත්තානුපස්සනා.

පලොකධම්මතොති අනිච්චානුපස්සනා.

ඊතිතොති දුක්ඛානුපස්සනා.

උපද්දවතොති දුක්ඛානුපස්සනා.

භයතොති දුක්ඛානුපස්සනා.

උපස්සග්ගතොති දුක්ඛානුපස්සනා.

චලතොති අනිච්චානුපස්සනා.

පභඞ්ගුතොති අනිච්චානුපස්සනා.

අද්ධුවතොති අනිච්චානුපස්සනා.

අතාණතොති දුක්ඛානුපස්සනා.

අලෙණතොති දුක්ඛානුපස්සනා.

අසරණතොති දුක්ඛානුපස්සනා.

රිත්තතොති අනත්තානුපස්සනා.

තුච්ඡතොති අනත්තානුපස්සනා.

සුඤ්ඤතොති අනත්තානුපස්සනා.

අනත්තතොති අනත්තානුපස්සනා.

ආදීනවතොති දුක්ඛානුපස්සනා.

විපරිණාමධම්මතොති අනිච්චානුපස්සනා

අසාරකතොති අනත්තානුපස්සනා.

අඝමූලතොති දුක්ඛානුපස්සනා.

වධකතොති දුක්ඛානුපස්සනා.

විභවතොති අනිච්චානුපස්සනා.

සාසවතොති දුක්ඛානුපස්සනා.

**අනිච්චතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**දුක්ඛතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**රොගතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ගණ්ඩතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**සල්ලතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**අඝතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ආබාධතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**පරතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**පලොකධම්මතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**ඊතිතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**උපද්දවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**භයතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**උපසග්ගතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**චලතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**පභඞ්ගුතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අද්ධුවතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අතාණතො** යනු දුඃඛානුදර්ශනා යැ.

**අලෙණතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**අසරණතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**රිත්තතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**තුච්ඡතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**සුඤ්ඤතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**අනත්තතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**ආදීනවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**විපරිණාමධම්මතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**අසාරකතො** යනු: අනාත්මානුදර්ශනා යැ.

**අඝමූලතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**වධකතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**විභවතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**සාසවතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

සඞ්ඛතතොති අනිච්චානුපස්සනා.

මාරාමිසතොති දුක්ඛානුපස්සනා.

ජරාධම්මතොති දුක්ඛානුපස්සනා.

ජාතිධම්මතොති දුක්ඛානුපස්සනා.

ව්‍යාධිධම්මතොති දුක්ඛානුපස්සනා.

මරණධම්මතොති අනිච්චානුපස්සනා.

සොකධම්මතොති දුක්ඛානුපස්සනා.

පරිදෙවධම්මතොති දුක්ඛානුපස්සනා.

උපායාසධම්මතොති දුක්ඛානුපස්සනා.

සංකිලෙසිකධම්මතොති දුක්ඛානුපස්සනා.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි අනුලොමිකං ඛන්තිං පටිලභති. ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමති.

ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි අනුලොමඛන්තිං පටිලභන්තස්ස ඉමෙහි චත්තාලීසාය ආකාරෙහි සම්මත්තනියාමං ඔක්කමන්තස්ස කති අනිච්චානුපස්සනා, කති දුක්ඛානුපස්සනා කති අනත්තානුපස්සනා.

පඤ්චවීසති අනත්තානුපස්සනා, පඤ්ඤාසං[1] අනිච්චානුපස්සනා, සතං පඤ්චවීසති චෙව යානි දුක්ඛෙ පවුච්චරෙති.

විපස්සනාකථා සමත්තා.

1. පඤ්ඤාස - මජසං.

**සඞ්ඛතතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**මාරාමිසතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ජාතිධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ජරාධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**ව්‍යාධිධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ

**මරණධම්මතො** යනු: අනිත්‍යානුදර්ශනා යැ.

**සොකධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**පරිදෙවධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**උපායාසධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යැ.

**සඞ්කිලෙසිකධම්මතො** යනු: දුඃඛානුදර්ශනා යි.

මේ සතළිස් අයුරින් අනුලොමඥානය ලබයි. මේ සතළිස් අයුරින් සම්‍යක්ත්වනියාමයට බස්නේ යි

මේ සතළිස් අයුරින් අනුලොමඥානය ලබනුවහට මේ සතළිස් අයුරින් සම්‍යක්ත්වනියාමයට බස්නාහුට අනිත්‍යානුදර්ශනා කෙතෙක් ද, දුඃඛානුදර්ශනා කෙතෙක් ද, අනාත්මානුදර්ශනා කෙතෙක් ද යත්:

ඒ අනාත්මානුදර්ශනා පස්විස්සෙක් ද, අනිත්‍යානුදර්ශනා පනසෙක් ද, යම් අනුදර්ශනා කෙනෙක් දුඃඛයෙහි (පඤ්චස්කන්ධයෙහි) ලා කියනු ලැබෙත් ද, ඒ දුඃඛානුදර්ශනා එක්සියපස්විස්සෙක් ද වේ යයි.

**විදර්ශනාකථා නිමි**

## 3. 10.

## මාතිකාකථා

නිච්ඡාතො, මොක්ඛො[1] විමොක්ඛො, විජ්ජාවිමුත්ති, අධිසීලං, අධිචිත්තං, අධිපඤ්ඤා, පස්සද්ධි, ඤාණං, දස්සනං, විසුද්ධි,[2] නෙක්ඛම්මං, නිස්සරණං, පවිවෙකො, වොස්සග්ගො, චරියා, ඣානවිමොක්ඛො, භාවනා, අධිට්ඨානං, ජීවිතං[3]

**නිච්ඡාතොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො නිච්ඡාතො, අබ්‍යාපාදෙන බ්‍යාපාදතො නිච්ඡාතො -පෙ- පඨමෙන ඣානෙන නීවරණෙහි නිච්ඡාතො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙහි නිච්ඡාතො.[4]

**මොක්ඛො[5] විමොක්ඛොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දතො මුච්චතීති මොක්ඛො විමොක්ඛො -පෙ- පඨමෙන ඣානෙන නීවරණෙහි මුච්චතීති මොක්ඛො විමොක්ඛො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙහි මුච්චතීති මොක්ඛො විමොක්ඛො.

**විජ්ජාවිමුත්තීති** නෙක්ඛම්මං විජ්ජතීති විජ්ජා, කාමච්ඡන්දතො මුච්චතීති විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති. අබ්‍යාපාදො[6] විජ්ජතීති විජ්ජා, බ්‍යාපාදතො මුච්චතීති[7] විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති -පෙ- අරහත්තමග්ගො විජ්ජතීති විජ්ජා, සබ්බකිලෙසෙහි මුච්චතීති[8] විමුත්ති, විජ්ජන්තො මුච්චති, මුච්චන්තො විජ්ජතීති විජ්ජාවිමුත්ති.

**අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤාති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි. යො තත්ථ සංවරට්ඨො, අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා. යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා. අබ්‍යාපාදෙන බ්‍යාපාදං සංවරට්ඨෙන සීලවිසුද්ධි -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ සංවරට්ඨෙන සීලවිසුද්ධි, අවික්ඛෙපට්ඨෙන චිත්තවිසුද්ධි, දස්සනට්ඨෙන දිට්ඨිවිසුද්ධි. යො තත්ථ සංවරට්ඨො අයං අධිසීලසික්ඛා. යො තත්ථ අවික්ඛෙපට්ඨො අයං අධිචිත්තසික්ඛා. යො තත්ථ දස්සනට්ඨො අයං අධිපඤ්ඤාසික්ඛා.

**පස්සද්ධීති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං පටිප්පස්සම්භෙති, අබ්‍යාපාදෙන බ්‍යාපාදං පටිප්පස්සම්භෙති -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ පටිප්පස්සම්භෙති.

**ඤාණන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං ඤාතට්ඨෙන ඤාණං. බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො ඤාතට්ඨෙන ඤාණං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො ඤාතට්ඨෙන ඤාණං.

---

1. විමුච්චතීති - සයා, PTS. 2. සුද්ධි - සයා. 3. භාවනාධිට්ඨානජීවිතං - සයා.
4 නිච්ඡාතො මුච්චති - සයා, PTS 5 'මොක්ඛො'ති - සයා, PTS, පොත්ථකෙසු නත්ථි
6 අබ්‍යාපාදං - සයා 7 මුච්චතීති විමොක්ඛො - සයා, PTS 8 විමුච්චතීති - මජසං

## 3. 10.

## මාතෘකාකථා

නිච්ඡාත යැ මොක්ඛවිමොක්ඛ යැ විජ්ජාවිමුත්ති යැ අධිසීල යැ අධිචිත්ත යැ අධිපඤ්ඤා යැ පස්සද්ධි යැ ඤාණ යැ දස්සන යැ විසුද්ධි යැ නෙක්ඛම්ම යැ නිස්සරණ යැ පවිවෙක යැ වොස්සග්ග යැ චරියා යැ ඣානවිමොක්ඛ යැ භාවනා යැ අධිට්ඨාන යැ ජීවිත යි.

**නිච්ඡාතො** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දයෙන් නො මලා වූයේ, අව්‍යාපාද විසින් ව්‍යාපාදයෙන් නො මලා වූයේ ... ප්‍රථමධ්‍යාන විසින් නීවරණයන් ගෙන් නො මලා වූයේ ... රහත්මග විසින් සර්වක්ලේශයන් ගෙන් නො මලා වූයේ වේ.

**මොක්ඛො විමොක්ඛො** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දය කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ, අව්‍යාපාද විසින් ව්‍යාපාදය කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ ... ප්‍රථමධ්‍යාන විසින් නීවරණයන් කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යැ .. අර්හත්මාර්ග විසින් සර්වක්ලේශයන් කෙරෙන් මිදේ නුයි මොක්ෂ විමොක්ෂ යි.

**විජ්ජාවිමුත්ති** යනු: නෛෂ්ක්‍රම්‍යය විද්‍යමාන වේ නුයි (නොහොත් දත්නා ලැබේ නුයි, ලබා නුයි හෝ) විජ්ජා යැ, කාමච්ඡන්දය කෙරෙන් මිදේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මිදෙයි, මිදෙනුයේ විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති යැ. අව්‍යාපාදය ඇත් නුයි විජ්ජා යැ, ව්‍යාපාදය කෙරෙන් මුක්ත වේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මුක්ත වෙයි, මුක්ත වනුයේ විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති යැ ... අර්හත්මාර්ගය විද්‍යමාන වේ නුයි විජ්ජා යැ, සර්වක්ලේශයන් කෙරෙන් මුක්ත වේ නුයි විමුත්ති යැ, විද්‍යමාන වූයේ මුක්ත වෙයි, මුක්ත වනුයේ (රහත්මග) විද්‍යමාන වේ නුයි විජ්ජාවිමුත්ති නම් වන්නීය.

**අධිසීලං අධිචිත්තං අධිපඤ්ඤා** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් කාමච්ඡන්දය නිවාරණාර්ථයෙන් (ඒ නෛෂ්ක්‍රම්‍යය) ශීලවිශුද්ධි යැ, (එ මැ) අවික්ෂේපාර්ථයෙන් චිත්තවිශුද්ධි යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි යැ. එහි යම් සංවරාර්ථයෙක් වේ ද, මේ තෙම අධිශීලශික්ෂා යැ, එහි යම් අවික්ෂේපාර්ථයෙක් වේ ද, මේ තෙම අධිචිත්තශික්ෂා යැ, එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද, මේ තෙම අධිප්‍රඥාශික්ෂා යි. අව්‍යාපාද විසින් ව්‍යාපාදය නිවරණාර්ථයෙන් (ඒ අව්‍යාපාදය) ශීලවිශුද්ධි යැ ... අර්හත්මාර්ග විසින් සර්වක්ලේශයන් නිවාරණාර්ථයෙන් (ඒ රහත්මග) ශීලවිශුද්ධි යැ, අවික්ෂේපාර්ථයෙන් චිත්තවිශුද්ධි යැ, දර්ශනාර්ථයෙන් දෘෂ්ටිවිශුද්ධි යැ, එහි යම් සංවරාර්ථයෙක් වේ ද, මේ අධිශීලශික්ෂා යැ, එහි යම් අවික්ෂේපාර්ථයෙක් වේ ද, මේ අධිචිත්තශික්ෂා යැ. එහි යම් දර්ශනාර්ථයෙක් වේ ද, මේ අධිප්‍රඥාශික්ෂා යි.

**පස්සද්ධි** යනු: නෛෂ්ක්‍රම්‍ය විසින් (යොගාවචර තෙම) කාමච්ඡන්දය වළහයි, අව්‍යාපාද විසින් ව්‍යාපාදය වළහයි ... රහත්මගින් සර්වක්ලේශයන් වළහයි.

**ඤාණං** යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍යය ඥාතාර්ථයෙන් ඥාන යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාදය ඥාතාර්ථයෙන් ඥාන යැ ... සර්වක්ලේශයන් ප්‍රහීණ බැවින් අර්හත්මාර්ගය ඥාතාර්ථයෙන් ඥාන යි.

**දස්සනන්ති** කාමච්ඡන්දස්ස පහීනත්තා නෙක්ඛම්මං දිට්ඨත්තා දස්සනං. බ්‍යාපාදස්ස පහීනත්තා අබ්‍යාපාදො දිට්ඨත්තා දස්සනං -පෙ- සබ්බකිලෙසානං පහීනත්තා අරහත්තමග්ගො දිට්ඨත්තා දස්සනං.

**විසුද්ධීති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මෙන විසුජ්ඣති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදෙන විසුජ්ඣති -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගෙන විසුජ්ඣති.

**නෙක්ඛම්මන්ති** කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං. රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං. යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, නිරොධො තස්ස නෙක්ඛම්මං. බ්‍යාපාදස්ස අබ්‍යාපාදො නෙක්ඛම්මං. ථිනමිද්ධස්ස ආලොකසඤ්ඤා නෙක්ඛම්මං -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො නෙක්ඛම්මං

**නිස්සරණන්ති** කාමානමෙතං නිස්සරණං යදිදං නෙක්ඛම්මං. රූපානමෙතං නිස්සරණං යදිදං ආරුප්පං. යං ඛො පන කිඤ්චි භූතං සඞ්ඛතං පටිච්චසමුප්පන්නං, නිරොධො තස්ස නිස්සරණං. කාමච්ඡන්දස්ස නෙක්ඛම්මං නිස්සරණං. බ්‍යාපාදස්ස අබ්‍යාපාදො නිස්සරණං -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො නිස්සරණං.

**පවිවෙකොති** කාමච්ඡන්දස්ස නෙක්ඛම්මං පවිවෙකො -පෙ- සබ්බකිලෙසානං අරහත්තමග්ගො පවිවෙකො.

**වොස්සග්ගොති** නෙක්ඛම්මෙන කාමච්ඡන්දං වොස්සජ්ජතීති වොස්සග්ගො, අබ්‍යාපාදෙන බ්‍යාපාදං වොස්සජ්ජතීති වොස්සග්ගො -පෙ- අරහත්තමග්ගෙන සබ්බකිලෙසෙ වොස්සජ්ජතීති වොස්සග්ගො.

**චරියාති** කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මෙන චරති, බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදෙන චරති පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගෙන චරති.

**ඣානවිමොක්ඛොති** නෙක්ඛම්මං ඣායතීති ඣානං, කාමච්ඡන්දං ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣායන්තීති ධම්මා, ඣාපෙන්තීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානඣායී. අබ්‍යාපාදො ඣායතීති ඣානං, බ්‍යාපාදං ඣාපෙතීති ඣානං -පෙ- ආලොකසඤ්ඤා ඣායතීති ඣානං, ථිනමිද්ධං ඣාපෙතීති ඣානං -පෙ- අරහත්තමග්ගො ඣායතීති ඣානං, සබ්බකිලෙසෙ ඣාපෙතීති ඣානං, ඣායන්තො මුච්චතීති ඣානවිමොක්ඛො ඣාපෙන්තො මුච්චතීති ඣානවිමොක්ඛො, ඣායන්තීති ධම්මා, ඣාපෙන්තීති කිලෙසෙ, ඣාතෙ ච ඣාපෙ ච ජානාතීති ඣානඣායී,

**දස්සනං** යනු: කාමච්ඡන්දය ප්‍රහීණ බැවින් නෛෂ්ක්‍රම්‍ය තෙම දෘෂ්ටාර්ථයෙන් දර්ශන යැ, ව්‍යාපාදය ප්‍රහීණ බැවින් අව්‍යාපාද තෙම දෘෂ්ටාර්ථයෙන් දර්ශන යැ ... සර්වක්ලේශයන් ප්‍රහීණ බැවින් රහත්මග දෘෂ්ටාර්ථයෙන් දර්ශන යි.

**විසුද්ධි** යනු: කාමච්ඡන්දය දුරලනුයේ නෛෂ්ක්‍රම්‍යයෙන් විශුද්ධ වෙයි, ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදයෙන් විශුද්ධ වෙයි ... සර්වක්ලේශයන් දුරලනුයේ රහත්මගින් විශුද්ධ වේ.

**නෙක්ඛම්මං** යනු: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන්ගේ නිස්සරණ යැ, යම් ආරූප්‍යයෙක් වේ ද, තෙල රූපයන් ගේ නිස්සරණ යැ, තවද යම් කිසි උත්පන්න වූ සංස්කෘත වූ ප්‍රතීත්‍යසමුත්පන්නයෙක් වේ ද, නිරෝධය ඒ සඞ්ඛතයා ගේ නෛෂ්ක්‍රම්‍ය වේ. අව්‍යාපාදය ව්‍යාපාදයා ගේ නෛෂ්ක්‍රම්‍ය වෙයි, ආලෝකසංඥාව ථීනමිද්ධයා ගේ නෛෂ්ක්‍රම්‍ය වෙයි ... අර්හත්මාර්ගය සර්වක්ලේශයන් ගේ නෛෂ්ක්‍රම්‍ය වේ.

**නිස්සරණං** යනු: යම් නෛෂ්ක්‍රම්‍යයෙක් වේ ද, තෙල කාමයන් ගේ නිස්සරණ යැ, යම් ආරූප්‍යයෙක් වේ ද, තෙල රූපයන් ගේ නිස්සරණ යැ, තවද යම් කිසි උත්පන්න වූ සඞ්ඛත වූ ප්‍රතීත්‍යසමුත්පන්නයෙක් වේ ද, නිරෝධය ඒ සඞ්ඛතයා ගේ නිස්සරණය වෙයි, නෛෂ්ක්‍රම්‍යය කාමච්ඡන්දයා ගේ නිස්සරණ යැ, අව්‍යාපාදය ව්‍යාපාදයා ගේ නිස්සරණ යැ ... අර්හත්මාර්ගය සර්වක්ලේශයන් ගේ නිස්සරණ යි.

**පවිවේකො** යනු: නෛෂ්ක්‍රම්‍යය කාමච්ඡන්දයා ගේ පවිවේක යැ ... අර්හත්මාර්ගය සර්වක්ලේශයන් ගේ පවිවේක යයි.

**වොස්සග්ගො** යනු: නෛෂ්ක්‍රම්‍යයෙන් කාමච්ඡන්දය හැරපියා නුයි වොස්සග්ග යැ, අව්‍යාපාදයෙන් ව්‍යාපාදය හැරපියා නුයි වොස්සග්ග නම් ... රහත්මගින් හැම කෙලෙසුන් හැරපියා නුයි වොස්සග්ග නම්.

**චරියං** යනු: කාමච්ඡන්දය දුරලනුයේ නෛෂ්ක්‍රම්‍යයෙන් හැසිරෙයි, ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදයෙන් හැසිරෙයි රහත්මගින් හැම කෙලෙසුන් දුරලමින් හැසිරෙයි.

**ඣානවිමොක්ඛො** යනු: නෛෂ්ක්‍රම්‍යය ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, කාමච්ඡන්දය දවා නුයි ධ්‍යාන යැ, ධ්‍යාන කෙරෙමින් මිදේ නුයි ඣානවිමොක්ඛ නම, දවමින් මිදේ නුයි ඣානවිමොක්ඛ නම්, 'ඣායන්ති' යනු දහම්හු යැ, 'ඣාපෙන්ති' යනු කෙලෙසුන් යැ, ධ්‍යාන කරන ලදුවත් ද දවන ලදුවත් ද දනී නුයි ඣානඣායී නම. අව්‍යාපාදය ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, ව්‍යාපාදය දවා නුයි ධ්‍යාන යැ ... ආලොකසංඥාව ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, ථීනමිද්ධය දවා නුයි ධ්‍යාන යැ ... රහත්මග ධ්‍යාන කරනු ලැබේ නුයි ධ්‍යාන යැ, හැම කෙලෙසුන් දවා නුයි ධ්‍යාන යැ, ධ්‍යාන කෙරෙමින් මිදේ නුයි ඣානවිමොක්ඛ යැ, දවමින් මිදේ නුයි ඣානවිමොක්ඛ යැ, 'ඣායන්ති' යනු ධර්මයෝ යැ, 'ඣාපෙන්ති' යනු කෙලෙසුන් යැ, ධ්‍යාන කරන ලදුවත් ද දවන ලදුවත් ද දනී නුයි 'ඣානඣායී' නම් වේ.

භාවනා අධිට්ඨානං ජීවිතන්ති කාමච්ඡන්දං පජහන්තො නෙක්ඛම්මං භාවෙතීති භාවනාසම්පන්නො, නෙක්ඛම්මවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානසම්පන්නො, ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො සමං ජීවති, නො විසමං, සම්මා ජීවති, නො මිච්ඡා, විසුද්ධං ජීවති, නො කිලිට්ඨන්ති ආජීවසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති: යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො, තං කිස්ස හෙතු; තථා හි සො භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො.

බ්‍යාපාදං පජහන්තො අබ්‍යාපාදං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- ථීනමිද්ධං පජහන්තො ආලොකසඤ්ඤං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- උද්ධච්චං පජහන්තො අවික්ඛෙපං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- විචිකිච්ඡං පජහන්තො ධම්මවවත්ථානං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- අවිජ්ජං පජහන්තො විජ්ජං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- අරතිං පජහන්තො පාමොජ්ජං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- නීවරණෙ පජහන්තො පඨමං ඣානං භාවෙතීති භාවනාසම්පන්නො -පෙ- සබ්බකිලෙසෙ පජහන්තො අරහත්තමග්ගං භාවෙතීති භාවනාසම්පන්නො· අරහත්තමග්ගවසෙන චිත්තං අධිට්ඨාතීති අධිට්ඨානසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො සමං ජීවති නො විසමං, සම්මා ජීවති නො මිච්ඡා, විසුද්ධං ජීවති, නො කිලිට්ඨන්ති ආජීවසම්පන්නො. ස්වායං එවං භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නො යඤ්ඤදෙව පරිසං උපසඞ්කමති යදි ඛත්තියපරිසං යදි බ්‍රාහ්මණපරිසං යදි ගහපතිපරිසං යදි සමණපරිසං විසාරදො උපසඞ්කමති අමඞ්කුභූතො. තං කිස්ස හෙතු: තථා හි සො භාවනාසම්පන්නො අධිට්ඨානසම්පන්නො ආජීවසම්පන්නොති.

**මාතිකාකථා සමත්තා.**

**පඤ්ඤාවග්ගො තතියො.**

**තස්සුද්දානං භවති:**

**පඤ්ඤා ඉද්ධි අභිසමයො – විවෙකො චරිය පඤ්චමො**
**පාටිහාරිය සමසීසි – සතිපට්ඨානං විපස්සනා**
**පඤ්ඤාවග්ගම්හි තතියෙ – මාතිකාය ච තෙ දසාති.**

# පටිසම්භිදාමග්ගප්පකරණං සමත්තං.

භාවනා අධිට්ඨානං ජීවිතං යනු: කාමච්ඡන්දය දුරලමින් නෛෂ්ක්‍රම්‍යය වඩා නුයි භාවනාසම්පන්න යැ, නෛෂ්ක්‍රම්‍ය විසින් සිත පිහිටුවා නුයි අධිට්ඨානසම්පන්න යැ, ඒ මේ යෝගාවචර මෙසේ භාවනාසම්පන්න වූයේ අධිට්ඨානසම්පන්න වූයේ සම වැ ජීවත් වෙයි, විෂම වැ නො වෙයි, මැනැවින් ජීවත් වෙයි, මිථ්‍යාවෙන් නො වෙයි, විශුද්ධ වැ ජීවත් වෙයි, කලිෂට වැ නො වේ නුයි ආජීවසම්පන්න වේ. හේ මෙසේ භාවනාසම්පන්න වූයේ අධිට්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ යම් යම් පිරිස් කරා එළැඹේ ද, කැත්පිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගැහැවිපිරිසකට හෝ මහණ පිරිසකට හෝ විශාරද වූයේ තෙද ඇති වැ එළැඹෙයි. ඊට හේතු කිමැ යත්: යම් හෙයකින් හේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ ද එහෙයිනි.

ව්‍යාපාදය දුරලනුයේ අව්‍යාපාදය වඩා නුයි භාවනාසම්පන්න යැ ... ථිනමිද්ධය දුරලනුයේ ආලෝකසංඥාව වඩා නුයි භාවනාසම්පන්න යැ ... උද්ධච්චය දුරලනුයේ අවික්ෂේපය වඩා නුයි භාවනාසම්පන්න යැ ... විචිකිච්ඡාව දුරලනුයේ ධම්මවවත්ථානය වඩා නුයි භාවනාසම්පන්න යැ ... අවිද්‍යාව දුරලනුයේ විද්‍යාව වඩා නුයි භාවනාසම්පන්න යැ ... අරතිය දුරලනුයේ ප්‍රාමෝද්‍යය වඩා නුයි භාවනාසම්පන්න යැ .. නීවරණයන් දුරලනුයේ ප්‍රථමධ්‍යානය වඩා නුයි භාවනාසම්පන්න යැ ... හැම කෙලෙසුන් දුරලනුයේ රහත්මග වඩා නුයි භාවනාසම්පන්න යැ. රහත්මග විසින් සිත පිහිටුවා නුයි අධිට්ඨානසම්පන්න යැ, ඒ මේ යෝගාවචර තෙමේ මෙසේ භාවනා-සම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ සම ව ජීවත් වෙයි, විෂම ව ජීවත් නො වේ. සම්මාජීවයෙන් ජීවත් වෙයි, මිථ්‍යාජීවයෙන් ජීවත් නො වේ. විශුද්ධ ව ජීවත් වෙයි, කලිෂට ව ජීවත් නො වේ නුයි ආජීවසම්පන්න යැ. හේ මෙසේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ යම් මැ පිරිස් කරා එළැඹේ ද, කැත්පිරිසකට හෝ බමුණුපිරිසකට හෝ ගැහැවිපිරිසකට හෝ මහණපිරිසකට හෝ විශාරද වූයේ නො හැකුළුණේ (තෙද ඇති වැ) එළැඹෙයි. ඊට කාරණ කිමැ යත්: යම් හෙයකින් හේ භාවනාසම්පන්න වූයේ අධිෂ්ඨානසම්පන්න වූයේ ආජීවසම්පන්න වූයේ ද එහෙයිනැ’ යි.

**මාතෘකාකථා සමාප්ත යි.**

**තුන්වැනි ප්‍රඥාවර්ගය යි.**

**එහි උද්දානය වෙයි:**

ප්‍රඥ කථා යැ, ඍද්ධි කථා යැ, අභිසමය කථා යැ, විවෙක කථා යැ, පස්වැනි වූ චර්‍ය්‍යා කථා යැ, ප්‍රාතිහාර්‍ය්‍ය කථා යැ, සමසීසි කථා යැ, සතිපට්ඨාන කථා යැ, විදර්ශනා කථා යැ යන මොහු ද, මාතෘකා කථාව ද සමග තුන්වැනි ප්‍රඥාවර්ගයෙහි දශ කථාවෝ වෙත්.

## ප්‍රතිසම්භිදාමාර්ගප්‍රකරණ සමාප්ත යි.

## සුත්තන්තපිටකෙ

## පටිසම්භිදාමග්ග දුතියභාග

# ගාථාදිපාදානුක්කමණිකා


| | පිට්ඨඞ්කා |
|---|---|
| අධිමොක්ඛෙ ච පග්ගාහෙ ... ... ... ... | 20 |
| ඉමානි දස ඨානානි ... ... ... ... | 20 |
| ඉමෙහි චතූහි ඨානෙහි ... ... ... ... | 20 |
| ඔභාසෙ චෙව ඤාණෙ ච ... ... ... ... | 20 |
| වික්ඛිපති චෙව කිලිස්සති ච ... ... ... ... | 20 |
| වික්ඛිපති න කිලිස්සති ... ... ... ... | 20 |

සුත්තන්තපිටකෙ

# පටිසම්භිදාමග්ගස්ස

## දුතියභාගෙ පධානවචනසූචි


| | පිට්ඨඞ්කා |
|---|---|
| **අ** | |
| අට්ඨඞ්ගිකමග්ගො | 82, 92 |
| අට්ඨචරියායො | 208 |
| අට්ඨමක- | 166 |
| අට්ඨමග්ගඞ්ග- | 80 |
| අඤ්ඤසහගත- | 8 |
| අත්තකිලමථානුයොගො | 90 |
| අත්ථපටිසම්භිදා | 96, 98, 102, 108 |
| අදුක්ඛමසුඛාභූමි | 182 |
| අධිචිත්ත- | 240 |
| අධිට්ඨානබලං | 132 |
| අධිට්ඨානසම්පන්නා | 244 |
| අධිට්ඨානා | 240, 244 |
| අධිපඤ්ඤ- | 240 |
| අධිමුත්ති | 168 |
| අධිමොක්ඛාභිසමයො | 198 |
| අධිසීලං | 240 |
| අනඤ්ඤාත- | 20 |
| අනත්තානුපස්සනා | 154, 234, 236, 238 |
| අනාගාමිඵලං | 226, 228 |
| අනිච්චං | 30 |
| අනිච්චානුපස්සනා | 154, 234, 236, 238 |
| අනුත්තරං | 30 |
| අනුප්පාදෙ ඤාණං | 54 |
| අනුලොමඛන්තිං | 238 |
| අනුලොමිකං ඛන්තිං | 228, 230, 232, 238 |
| අනුසයා | 2, 4, 6, 10, 18, 168 |
| අනුසාසනීපාටිහාරියං | 210 |
| අන්තා | 90 |
| අප්පමාණ- | 56 |
| අප්පරජක්ඛ- | 168 |
| අබ්‍යාකතං | 28 |
| අබ්‍යාපාදෙ | 240, 242 |
| අභිසමයො | 196, 198 |
| අරහත්තං | 226, 228 |
| අරහත්තප්පත්තං | 214 |
| අරහත්තමග්ගො | 240 |
| අරහත්තං | 166 |
| අරි | 170 |
| අරියමග්ගා | 122 |
| අරියා ඉද්ධි | 192 |
| අවික්ඛෙපාභිසමයො | 196, 198 |
| අවික්ඛෙපො | 4, 6, 12, 14 |
| අවිතථ- | 20 |
| අසඞ්ඛතලක්ඛණං | 28 |
| අසාමන්තපඤ්ඤා | 156, 166 |
| අසෙඛපටිසම්භිදප්පත්තො | 178 |
| අසෙඛබලානි | 134 |
| අස්සාදෙ | 30 |
| **ආ** | |
| ආකඞ්ඛනපටිබද්ධා | 168 |
| ආජීවසම්පන්නා | 244 |
| ආදීනවො | 30 |
| ආදෙසනාපාටිහාරියං | 210 |
| ආනන්දො | 2 |
| ආලොකසඤ්ඤා | 54, 242 |
| ආවජ්ජනපටිබද්ධා | 168 |
| ආවුසො | 2 |
| ආසයානුසයඤාණං | 110 |
| ආසං | 168 |
| ආසෙවනා | 72, 74 |
| **ඉ** | |
| ඉදප්පච්චයා | 58 |
| ඉද්ධි | 182, 210, 212 |
| ඉද්ධිපාටිහාරියං | 210 |
| ඉද්ධිපාද- | 54, 56, 102, 120, 122, 136, 182 |
| ඉද්ධිපාදාභිසමයො | 198 |
| ඉද්ධිමා | 186, 188 |
| ඉද්ධියා පදානි | 182 |

පිට්ඨඞ්කා

ඉ

ඉද්ධියා මූලානි 184
ඉද්ධිවිධං 184
ඉන්ද්‍රිය- 54, 86, 90, 114
ඉන්ද්‍රියපරොපරියත්තඤාණ- 110
ඉන්ද්‍රියාභිසමයො 198
ඉස්සරියබලං 132

උ

උත්තරා උපාසිකා 190
උද්දානං 96
උපට්ඨානාභිසමයො 196, 198
උපත්ථම්භාභිසමයො 198
උපාදානක්ඛන්ධ- 30
උපෙක්ඛාසම්බොජ්ඣඞ්ග-
පරිභාවිතා 70
උප්පාදාධිපතෙය්‍යං 196
උප්පාදෙ 28

එ

එකග්ගතා 4, 6, 14
එකත්තං 22, 24
එකපටිවෙධාති 22, 24, 26
එකරසා 10
එකොදුපට්ඨං 46

ක

කතපරප්පවාද 168
කම්මවිපාකජා ඉද්ධි 192
කම්මස්සකතචිත්ත- 196
කල්‍යාණපුථුජ්ජන- 166
කාමසුඛල්ලිකානුයොගො 90
කායානුපස්සනා 100, 102, 118

කි

කිංජාතික- 32, 34
කිංනිදානං 32, 34
කිංපභව- 32, 34
කිංසමුදය- 32, 34
කොසම්බියං 2

පිට්ඨඞ්කා

ඛ

ඛත්තියපණ්ඩිතා 168
ඛත්තියපරිසං 244
ඛන්ධට්ඨා 108
ඛයෙ ඤාණං 54
ඛාණුකොණ්ඩඤ්ඤ- 190
ඛීණාසවබලානි 134

ග

ගම්භීරපඤ්ඤා 164
ගරුපතිස්සිතො 178
ගහපතිපරිසං 244

ඝ

ඝොසිත ගහපති- 194
ඝොසිතාරාමෙ 2

ච

චක්කවත්ති 194
චක්ඛුපවත්තං 152
චරියා 240, 242
චාතුම්මහාරාජිකා 94
චිත්තවිසුද්ධි 54, 114
චිත්තුප්පාදපටිබද්ධා 168
චූළපන්ථක 184, 186
චෙතොවසිප්පත්තා 184, 186, 188
චෙතොවිමුත්ති 30

ඡ

ඡන්දරාගවිනයො 30
ඡසු බුද්ධධම්මෙසු 110

ජ

ජටිල ගහපති 194
ජවනපඤ්ඤා 154, 158, 174, 176
ජීවිතං 240, 244
ජොතිය ගහපති 194

ඣා

ඣානං 242
ඣානඣායී 242
ඣානවිමොක්ඛා 240, 242

පිටඞ්කා

ඤ

ඤාණ- 168, 240
ඤාණදස්සනං 94
ඤාණමුඛෙ 168

ඨ

ඨිතස්ස අඤ්ඤථත්තං 28

ත

තථ- 20
තථාගතබලං 136
තථාගතො 136, 138
තදුපගවිරියවාහනට්ඨෙන 4
තාවතිංසා 94
තික්ඛපඤ්ඤා 176
තික්ඛින්ද්‍රිය 168
තිපරිවට්ටං 94

ද

දසසහස්සිලොකධාතු 94
දස්සනට්ඨො 116
දස්සනමග්ගො 86
දස්සනං 240, 243
දස්සනවිරාගො 84
දස්සනාධිපතෙය්‍යං 196
දස්සනාභිසමයො 196, 198
දිට්ඨිවිසුද්ධි 86, 114
දිසාඵරණ 66
දුක්ඛං 20, 30
දුක්ඛං අරියසච්චං 92, 96, 110, 116
දුක්ඛට්ඨො 108
දුක්ඛනිරොධගාමිනී පටිපදා 20
දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං 92, 100
දුක්ඛනිරොධො 20, 200
දුක්ඛනිරොධො අරියසච්චං 92, 100
දුක්ඛසච්චං 36
දුක්ඛසමුදයො 20
දුක්ඛසමුදයො අරියසච්චං 92, 98, 116
දුක්ඛානුපස්සනා 154, 234, 236, 238
දුවිඤ්ඤාපයෙ 168
දුස්සකරණ්ඩකො 58

පිටඞ්කා

දෙසනාබහුලො 178
ද්වාකාර- 168
ද්වාදසාකාරං 94

ධ

ධම්මචක්ක- 94, 112, 114, 118, 120, 122
ධම්මචක්ඛු 94, 116
ධම්මපටිසම්භිදා 96, 98, 100, 102, 110
ධම්මවිචයසම්බොජ්ඣඞ්ග- පරිභාවිතා 70
ධම්මවිචයසම්බොජ්ඣඞ්ගො 198
ධම්මානුධම්මපටිපත්ති 160
ධම්මානුපස්සනා 100, 102, 118
ධම්මාභිසමයො 200
ධම්මුද්ධච්චකුසලො 20
ධම්මුද්ධච්චවිග්ගහිතං 4, 16, 18, 20
ධම්මුද්ධච්චවිග්ගහිතමානසො 18
ධාතුට්ඨො 108

න

නිකන්ති 18
නිච්ඡාතො 240
නිබ්බානං 56, 82, 122, 198, 228, 230, 232
නිබ්බෙධිකපඤ්ඤා 176
නිරුත්තිපටිසම්භිදා 96, 98, 102, 104
නිරොධසච්චං 36
නිරොධො 22, 228, 230, 232
නිස්සරණං 30, 240, 242
නෙක්ඛම්මං 240, 242

ප

පග්ගහාභිසමයො 196, 198
පච්චවෙක්ඛණබහුලො 178
පච්චෙකබුද්ධ- 166, 180
පඤ්චක්ඛන්ධ- 228, 230, 232
පඤ්චනිරොධා 202, 204
පඤ්චබල- 78, 122
පඤ්චවග්ගිය- 90, 94
පඤ්චවිරාගා 202, 204

පිට්ඨඞ්කා

ප

පඤ්චවිවේකා 202, 204
පඤ්චවොස්සග්ගා 202, 204
පඤ්චින්ද්‍රිය- 122
පඤ්ඤා 154
පඤ්ඤාබලපරිභාවිතා 68
පඤ්ඤාබාහුල්ලං 170
පඤ්ඤාවුද්ධි 160
පඤ්ඤාවෙපුල්ලං 160
පඤ්ඤින්ද්‍රිය පරිභාවිතා 66, 78
පඤ්හං 168
පටිභානපටිසම්භිදා 96, 98, 102, 104
පටිසඞ්ඛානබලං 128
පටිසඞ්ඛානාභිසමයො 198
පටිසම්භිදප්පත්ත- 176, 178, 180
පටිසම්භිදා- 40, 42, 154, 156, 158
පටිසම්භිදාසීකරණෙ 110
පණ්ඩිච්චං 154
පරනිම්මිතවසවත්තී- 94
පරිග්ගහාභිසමයො 196
පරිඤ්ඤට්ඨො 106
පරිඤ්ඤාතං 96
පරිඤ්ඤාපටිවෙධො 30
පරිභාවිත- 76
පරියාදානං 66
පච්චයාභිසමයො 198
පවිවෙකො 240, 242
පස්සද්ධි 240
පස්සද්ධිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා 70
පහානට්ඨො 106
පාටිහාරියානි 210
පාමොජ්ජං 54
පීතිසම්බොජ්ඣඞ්ගපරිභාවිතා 70
පීතිසුඛභූමි 182
පුඤ්ඤවතො ඉද්ධි 194
පුථුපඤ්ඤා 154, 162
පුථුසමණබ්‍රාහ්මණානං 82, 84
පුනබ්භවො 94
පුබ්බයොගසම්පන්නා 178
පොනොභවිකා 58

ඵ

ඵරණාභිසමයො 198
ඵලසච්ඡිකිරියා 200

පිට්ඨඞ්කා

බ

බක්කුල- 190
බල- 54, 114, 126, 128
බලකරණීයා කම්මන්තා 202
බලාභිසමයො 198
බහුලීකරොති 4, 6, 8
බහුස්සුතො 178
බීජගාමභූතගාමා 202
බොජ්ඣඞ්ග- 38, 40, 42, 44, 46, 48, 50, 52, 54, 56, 72
බොජ්ඣඞ්ගාභිසමයො 198
බොධිසත්ත- 106
බ්‍රහ්මකායිකා 94
බ්‍රහ්මචක්කං 138
බ්‍රහ්මලොක- 94, 188
බ්‍රාහ්මණපණ්ඩිතා 168
බ්‍රාහ්මණපරිසං 244

භ

භගවා 166, 168
භබ්බාභබ්බ 168
භාවනට්ඨො 106
භාවනා 4, 8, 220, 222, 240, 244
භාවනාබලං 128
භාවනාසම්පන්නා 244
භාවෙති 2, 4, 6, 8, 10, 12
භික්ඛු 184
භුම්මා දෙවා 94
භූතපාල- 190
භූරිපඤ්ඤා 170

ම

මග්ගඞ්ගා 74
මග්ගට්ඨො 108
මග්ගභාවනා 200
මග්ගසච්චං 36
මග්ගො සඤ්ජායති 2, 8, 16, 18, 20
මජ්ඣිමා පටිපදා 92
මනසිකාරං 56
මනසිකාර පටිබද්ධා 168
මනොමයා ඉද්ධි 190
මහාපඤ්ඤා 162
මහාරජක්ඛො 168

පිට්ඨඞ්කා

ම

මානසං 4, 16
මුදින්ද්‍රියො 168
මෙණ්ඩක ගහපති 194
මෙත්තා චෙතොවිමුත්ති 66, 70, 72, 74, 76, 78, 80
මොක්ඛා 240

ය

යථාභූතං 30
යානීකතා 80
යාමා 94
යුගනද්ධං 2, 10, 12, 14, 16, 54, 90, 114
යොනිසොමනසිකාරො 160

ල

ලක්ඛණානි 144
ලහුපඤ්ඤා 172
ලොකුත්තර- 122, 124

ව

වණ්ණො 28
වාලවෙධිරූපා 168
විකුබ්බනා ඉද්ධි 188
විජ්ජාධරා 194
විජ්ජාමයා ඉද්ධි 194
විජ්ජාවිමුත්ති 240
විනිපාතික- 74, 76, 78, 80, 192
විපරිණාමධම්මං 30
විපස්සනා 2, 4, 8, 10, 14
විපස්සනා පුබ්බඞ්ගමං 28
විපස්සනාබලං 132, 134
විපස්සනාභිසමයො 198
විපුලපඤ්ඤා 164
විමුත්ති 90
විමොක්ඛ- 240
විරාග- 80, 82
විරියබලපරිභාවිතා 68
විරියබලං 198
විරියසම්බොජ්ඣඞ්ගපරිභාවිතා 70
විරියින්ද්‍රියපරිභාවිතා 66
විවෙකජාභූමි 240

පිට්ඨඞ්කා

ව

විවෙකා 202
විසාරදෙ 244
විසුද්ධි 240, 242
විහාරබහුලො 178
වෙදනා 30
වෙදයිතං 140
වෙය්‍යාකරණසමං 94, 106
වොහිතදන්තා 168
වොස්සග්ගා 204, 240, 242

ස

සකදාගාමි ඵලං 226
සකදාගාමි 166
සඞ්කිච්ච 190
සඞ්ඛාරා 142, 226
සඞ්ගහිතං 28
සච්චං 22, 32
සච්චානං කති ලක්ඛණානි 28
සච්චානුලොමික ඤාණ- 196
සච්ඡිකිරියට්ඨො 106
සච්ඡිකිරියා පටිවෙධො 30
සඤ්ජීව 190
සෙඤ්ඤුජනා 2, 4, 6, 18
සතින්ද්‍රිය පරිභාවිතා 66
සතිපට්ඨාන- 86, 122, 218
සතිබලපරිභාවිතා 68
සතිසම්බොජ්ඣඞ්ගො 198
සතිසම්බොජ්ඣඞ්ග පරිභාවිතා 70
සද්ධම්මසවණං 160
සද්ධාබල- 86, 114, 138, 140, 198
සද්ධාබලපරිභාවිතා 68
සද්ධාවිමුත්තො 204
සද්ධින්ද්‍රිය- 86, 112
සද්ධින්ද්‍රිය පරිභාවිතා 66
සන්තිකෙ 2
සප්පුරිසසංසෙවො 160
සබ්බනිමිත්තානි 82, 84
සමණපණ්ඩිතා 168
සමණ පරිසං 244
සමථ- 2, 8, 54
සමථ පුබ්බඞ්ගමං 2, 4, 8
සමථවිපස්සනං 2, 10, 12, 54, 90
සමථාභිසමයො 198

| | පිට්ඨඞ්කො |
|---|---|
| **ස** | |
| සමයො | 4, 18 |
| සමාධින්ද්‍රිය පරිභාවිතා | 66 |
| සමාධිබල පරිභාවිතා | 68 |
| සමාධිබලං | 132 |
| සමාධිවිප්ඵාරා ඉද්ධි | 190 |
| සමාධිසම්බොජ්ඣඞ්ග පරිභාවිතා | 70 |
| සමුග්ගපටලං | 168 |
| සමුට්ඨානාභිසමයො | 196 |
| සමුදය සච්චං | 36 |
| සමුදයො | 22, 106 |
| සම්බොජ්ඣඞ්ග- | 58 |
| සම්බොධා | 30 |
| සම්මත්තනියාමං | 226, 228, 232, 234, 238 |
| සම්මප්පධාන | 114 |
| සම්මාආජීවො | 196 |
| සම්මාදිට්ඨි | 4, 54, 80, 196, 198, 202 |
| සම්මාදිට්ඨිපරිභාවිතා | 72 |
| සම්මාවාචා | 196 |
| සම්මාසඞ්කප්පො | 4, 196 |
| සම්මාසමාධි | 196 |
| සම්මාසම්බුද්ධ- | 166, 180 |
| සාමඤ්ඤඵලානි | 122 |
| සාමාවතී උපාසිකා | 190 |
| සාවකපාරමිප්පත්ත- | 180 |
| සාවකා | 166 |
| සීඝපඤ්ඤා | 172 |
| සීලක්ඛන්ධො | 174 |
| සීලවිසුද්ධි | 54, 86, 114 |
| සීහනාදං | 136 |
| සුඛං | 30 |
| සුඤ්ඤං | 142, 144, 146, 148, 150, 152 |
| සුඤ්ඤො ලොකො | 140 |
| සුවිඤ්ඤාපයෙ | 168 |
| සුසමාරද්ධ- | 56, 58 |
| සෙඛපටිසම්භිදප්පත්ත- | 178, 180 |
| සෙඛබලානි | 134 |
| සොතාපත්තිඵලං | 226 |
| සොතාපන්නා | 166 |
| සොමනස්සං | 30 |
| ස්වාකාරෙ | 168 |
| ස්වාධිට්ඨිත- | 80 |
| **හ** | |
| හඤ්චි | 196, 200 |
| හාසපඤ්ඤා | 154, 156, 158, 174 |
| හෙතුපච්චයො | 196 |

## සම්බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා - නැවත මුද්‍රණය

| | | |
|---|---|---|
| 1 | පාරාජිකා පාළි | |
| 2 | පාචිත්තිය පාළි | I |
| 3 | පාචිත්තිය පාළි | II |
| 4 | මහාවග්ග පාළි | I |
| 5 | මහාවග්ග පාළි | II |
| 6 | චුල්ලවග්ග පාළි | I |
| 7 | චුල්ලවග්ග පාළි | II |
| 8 | පරිවාර පාළි | I |
| 9 | පරිවාර පාළි | II |
| 10 | දීඝනිකාය 1 | |
| 11 | දීඝනිකාය 2 | |
| 12 | දීඝනිකාය 3 | |
| 13 | මජ්ඣිම නිකාය | I |
| 14 | මජ්ඣිම නිකාය | II |
| 15 | මජ්ඣිම නිකාය | III |
| 16 | සංයුක්ත නිකාය | I |
| 17 | සංයුක්ත නිකාය | II |
| 18 | සංයුක්ත නිකාය | III |
| 19 | සංයුක්ත නිකාය | IV |
| 20 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (1) | |
| 21 | සංයුක්ත නිකාය පඤ්චම භාගය (2) | |
| 22 | අංගුත්තර නිකාය | I |
| 23 | අංගුත්තර නිකාය | II |
| 24 | අංගුත්තර නිකාය | III |
| 25 | අංගුත්තර නිකාය | IV |
| 26 | අංගුත්තර නිකාය | V |
| 27 | අංගුත්තර නිකාය | VI |
| 28 | ඛුද්දක නිකාය - ඛුද්දකපාඨ - ධම්මපදපාළි - උදානපාළි - ඉතිවුත්තකපාළි | |

29 ඛුද්දක නිකාය - සුත්ත නිපාත

30 ඛුද්දක නිකාය - විමානවත්ථු - පේතවත්ථු

31 ඛුද්දක නිකාය - ථෙරගාථා පාලි - ථෙරීගාථා පාලි

32 ඛුද්දක නිකාය - ජාතක පාලි I

33 ඛුද්දක නිකාය - ජාතක පාලි II

34 ඛුද්දක නිකාය - ජාතක පාලි III

35 ඛුද්දක නිකාය - මහා නිද්දේස පාලි

36 ඛුද්දක නිකාය - චූල්ල නිද්දේස පාලි

37 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ I

38 ඛුද්දක නිකාය - පටිසම්භිදාමගගප්පකරණ II

39 ඛුද්දක නිකාය - අපදාන පාලි 1

40 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 1

41 ඛුද්දක නිකාය - අපදාන පාලි 2 - 2

42 ඛුද්දක නිකාය - බුද්ධවංසපාලි - චරියා පිටක පාලි

43 නෙත්තිප්පකරණය

44 පෙටකොපදේස

45 ධමමසංගනිප්පකරණ

46 විභංගප්පකරණ I

47 විභංගප්පකරණ II

48 කථාවත්ථුප්පකරණ I

49 කථාවත්ථුප්පකරණ II

50 කථාවත්ථුප්පකරණ III

51 ධාතුකථාප්පකරණ - පුගගලපඤඤතතිපපකරණ

52 යමකප්පකරණ I

53 යමකප්පකරණ 2 - I

54 යමකප්පකරණ 2 - II

55 පට්ඨාප්පකරණය I

56 පට්ඨානප්පකරණය II

57 පට්ඨානප්පකරණය III

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ සත්කාරයන් හා ආගමික සේවාවන්

1. රජය පිළිගත් පුණ්‍යායතනයක් වශයෙන් කටයුතු කිරීම.
2. බණ්ඩාරගම වීදාගම දරුවන් සියයක් සඳහා ධර්මචක්‍ර ළමා නිවාසය පිහිටුවා දැනට රදැවුන් 50 දෙනෙකුට සෙවණ ලබාදීම.
3. පූර්ණ පහසුකම් සහිත නේවාසික පහසුකම් හා විධිමත් අධ්‍යාපනික පහසුකම් ලබාදීම.
4. ධර්මචක්‍ර ළමා නිවාස සංකීර්ණය තුළ විහාර මන්දිරය, චෛත්‍යය, බෝධිය, භාවනා කුටි හා භාවනා මන්දිරය තනා නිම කිරීම.
5. ලියෙන් සිං ළදරු පාසල ආරම්භ කොට පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය ආරම්භ කිරීම.
6. තණමල්විල ප්‍රදේශයේ ලියෙන් සිං ළදරු අධ්‍යාපන මධ්‍යස්ථාන කීපයක් ආරම්භ කිරීම.
7. දේශීය විදේශීය ධර්ම ග්‍රන්ථ මුද්‍රණය කොට බෙදා හැරීම.
8. පිරුවානා පොත් වහන්සේ මුද්‍රණය කොට සෑම නිවසකටම ලබාදීම සඳහා වසරින් වසර මුද්‍රණය කොට බෙදා දීම. දැනට පිටපත් ලක්ෂ දෙකක් බෙදා හැර ඇත.
9. වියතුන් විසින් රචිත සිංහල ධර්මග්‍රන්ථ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට මුද්‍රණය කොට බෙදා හැරීම.
10. ජාතක පොත් වහන්සේ කාටූන් චිත්‍ර වශයෙන් කුඩා දරුවන් සඳහා සිංහල ඉංග්‍රීසි හා චීන භාෂාවන්ගෙන් මුද්‍රණය කිරීම.
11. වෛද්‍ය ශිෂ්‍යයන්, පාසල් දරුවන්, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ලබන විදේශික ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.
12. දිළිඳු පවුල් සඳහා රෙදි පිළි හා අධ්‍යාපනික උපකරණ පරිත්‍යාග කිරීම.
13. 2003 ජල ගැල්මට ලක්වූ හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, රත්නපුර හා අම්පාර දිස්ත්‍රික්කවල විහාරස්ථාන 63ක් සඳහා රුපියල් කෝටි 2 1/2ක මූල්‍යමය ආධාර සැපයීම.
14. 2004 සුනාමි විපතට භාජනය වූ පිරිස් සඳහා නිවාස දහසක් ඉදිකිරීම හා අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර සැපයීම.
15. වාර්ෂිකව විදේශීය හා දේශීය වෛද්‍යවරුන්ගේ සහභාගිත්වයෙන් වෛද්‍ය සායන පැවැත්වීම.
16. කැළණිය බොල්ලෑගල මානෙල්වතු විහාරයේ ජාත්‍යන්තර බෞද්ධ විශ්ව විද්‍යාලයක් ආරම්භ කිරීම.
17. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ නැවත මුද්‍රණය කොට නොමිලයේ බෙදා හැරීම.

## ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ නිර්මාතෘවරයාණෝ :

තායිවානයේ ප්‍රධාන සංඝනායක තායිපේ ශ්‍රී රතනජෝති ථේරවාදී බෞද්ධ මධ්‍යස්ථානයේ අධිපති, තායිවානයේ එක්සත් සමූහ බෞද්ධ අධ්‍යාපන පදනමේ අනුශාසක ලෝක බෞද්ධ සංඝ සම්මේලනයේ සංස්කෘතික අංශයේ සභාපති, තායිවානයේ සමාධි අධ්‍යාපන සංගමයේ නිර්මාතෘ සහ අනුශාසක, මහා බෝධි චර්යා සංගමයේ නිර්මාතෘ සහ සභාපති,

රත්මලාන ශ්‍රී විජයාරාම වාසී

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමිපාණන් වහන්සේයි.**

*"Wherever the Buddha's teachings have flourished,*

*either in cities or countrysides,*

*people would gain inconceivable benefits.*

*The land and people would be enveloped in peace.*

*The sun and moon will shine clear and bright.*

*Wind and rain would appear accordingly,*

*and there will be no disasters.*

*Nations would be prosperous*

*and there would be no use for soldiers or weapons.*

*People would abide by morality and accord with laws.*

*They would be courteous and humble,*

*and everyone would be content without injustices.*

*There would be no thefts or violence.*

*The strong would not dominate the weak*

*and everyone would get their fair share."*

~THE BUDDHA SPEAKS OF
THE INFINITE LIFE SUTRA OF
ADORNMENT, PURITY, EQUALITY
AND ENLIGHTENMENT OF
THE MAHAYANA SCHOOL~

With bad advisors forever left behind,
From paths of evil he departs for eternity,
Soon to see the Buddha of Limitless Light
And perfect Samantabhadra's Supreme Vows.

The supreme and endless blessings
of Samantabhadra's deeds,
I now universally transfer.
May every living being, drowning and adrift,
Soon return to the Pure Land of Limitless Light!

**✻ The Vows of Samantabhadra ✻**

I vow that when my life approaches its end,
All obstructions will be swept away;
I will see Amitabha Buddha,
And be born in His Western Pure Land of
Ultimate Bliss and Peace.

When reborn in the Western Pure Land,
I will perfect and completely fulfill
Without exception these Great Vows,
To delight and benefit all beings.

**✻ The Vows of Samantabhadra Avatamsaka Sutra ✻**

# NAME OF SPONSOR

## 助印功德主名錄

**Book Title：SRI LANKA PALI BUDDHA JAYANTI TRIPITAKA SERIES,**
**Volume 29～Volume 44**

**書名：斯里蘭卡巴利文大藏經，第二十九冊～第四十四冊**
**Book Serial No., 書號：SR229～SR244**

**N.T. Dollars：**

321,100：美國淨宗學會, AMITABHA BUDDHIST SOCIETY OF USA
1,213,398：財團法人佛陀教育基金會

**Amount：N.T. Dollars 1,534,498；Print 1,000 sets**
**以上合計，新台幣 1,534,498 元；恭印壹仟套。**

回向：天下和順，日月清明，風雨以時，災厲不起，國豐民安，兵戈無用，崇德興仁，務修禮讓，國無盜賊，無有怨枉，強不凌弱，各得其所。
祝願法界一切有情，所有六道四生，宿世冤親，現世業債，咸憑法力，悉得解脫。
祝願現生者增福延壽，發菩提心，常隨佛學，勤修精進，利濟群生。
祝願已故者往生淨土，同出苦輪，共登覺岸，直證阿鞞跋致，圓滿無上菩提。

**附記：本會接受善信委託，代印經書、佛像，其必要之費用，皆經本會審慎評估；若有結餘，均續作本會之印(購)經書及運費使用，為施主廣積陰德；此印經案所需金額龐大，分四批出版，由本會發起印贈，捐助款項若有不足，則由本會負擔其餘之經費。**

## DEDICATION OF MERIT

May the merit and virtue
accrued from this work
adorn Amitabha Buddha's Pure Land,
repay the four great kindnesses above,
and relieve the suffering of
those on the three paths below.
May those who see or hear of these efforts
generate Bodhi-mind,
spend their lives devoted to the Buddha Dharma,
and finally be reborn together in
the Land of Ultimate Bliss.

Homage to Amita Buddha!

**NAMO AMITABHA**

**南無阿彌陀佛**


《斯里蘭卡巴利文大藏經 第三十八冊》

財團法人佛陀教育基金會 印贈

台北市杭州南路一段五十五號十一樓

Printed and donated for free distribution by

**The Corporate Body of the Buddha Educational Foundation**

11F., 55 Hang Chow South Road Sec 1, Taipei, Taiwan, R.O.C.

Tel: 886-2-23951198 , Fax: 886-2-23913415

Email: overseas@budaedu.org

Website: http://www.budaedu.org

**This book is strictly for free distribution, it is not for sale.**

**නොමිලයේ බෙදාදීම පිණිසයි.**

Printed in Taiwan

1,000 copies; October 2013

SR238 - 11591